ශ්‍රී ලංකාව: මානව හිමිකම් 2005

THE LIBRARY
343.4(793)
HUM
L. S. T

නීතිය හා සමාජ භාරය

REFERENCE
ONLY
LIBRARY
L S T

ශ්‍රී ලංකාව:

මානව හිමිකම් තත්ත්වය 2005

REFEREN E
ONLY
LIBRARY
L S

ශ්‍රී ලංකාව:

මානව හිමිකම් තත්ත්වය 2005

මෙම වාර්තාව 2005 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ
මානව හිමිකම් තත්ත්වය පිළිබඳ වූ ඉංග්‍රීසි වාර්තාවේ
ඉතා වැදගත් වූ පරිච්ඡේදයන් 4ක සහ සමස්ථ සමාලෝචනයෙහි
(සංස්කරණය කරන ලද) පරිවර්තනයකි.

නීතිය හා සමාජ භාරය
3, කිංසි ටෙරසය
කොළඹ 8
ශ්‍රී ලංකාව

© නීතිය හා සමාජ භාරය
2006 ඔක්තෝබර්

ISBN 955-1302-05-2

7716

CLASS NO; 343.11(058) 342.7
ACC. NO: 7716

පටුන

I	**සමාලෝචනය**	**1**
	1. හැඳින්වීම	1
	2. මානව හිමිකම් හි අධිකරණමය ආරක්ෂණය	2
	3. ආගම ඇදහීමේ අයිතිය	4
	4. පාර්ලිමේන්තු මැතිවරණය සහ ඡන්දය භාවිතා කිරීමේ අයිතිය	6
	5. කාන්තා අයිතිවාසිකම්	8
II	**මානව හිමිකම් සුරක්ෂණයෙහිලා අධිකරණමය ආරක්ෂණය**	**10**
	1. හැඳින්වීම	10
	2. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණමය ප්‍රතිචාර	12
	2.1 වධහිංසා සහ කෲර අමානුෂික සහ අවමන් සහගත සැලකීම් වලින් වැළකීමේ නිදහස පිළිබඳ අයිතිය සම්බන්ධයෙන් වන අධිකරණමය යුක්ති යුක්ත කිරීම් (11 වන වගන්තිය)	12
	2.2 අදහස් ප්‍රකාශ කිරීමේ සහ සමාගමේ සහ භාෂණයේ නිදහස පිළිබඳ අධිකරණමය තීරණයන් (14(1)(අ)(ආ) සහ (ඇ) ව්‍යවස්ථා)	29
	3. සමානාත්මතාවයේ අයිතිය සම්බන්ධයෙන් අධිකරණයේ ප්‍රතික්‍රියා	33
	3.1 ඉඩම් අත්පත් කරගැනීම	33
	3.2 නීතියට අනුව ක්‍රියා කිරීමට මහජන නිලධාරීන්ට වන යුතුකම	37
	3.3 සුජාතමය අපේක්ෂාව පිළිබඳ සිද්ධාන්තය	37
	4. 2004 වසර තුළ ආගම් වෙනස් කිරීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දෙන ලද තීරණ	39

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන වගන්තිය යටතේ වන අධිකරණ බලය ඔස්සේ අභියාචනාධිකරණයේ අධිකරණමය ප්‍රතිචාරයන් 44

6. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ පළමු වෛකල්පිත සන්ධානය යටතේ තනි පුද්ගල පෙත්සම් සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව විසින් ගන්නා ලද තීරණ 52

7. අවසානය 60

III ආගම ඇදහීමේ අයිතිය 62

1. හැඳින්වීම 62

2. ව්‍යවස්ථාපිත කරන කෙටුම්පත් 64

3. බලහත්කාරයෙන් වෙනත් ආගමකට හැරවීමට එරෙහි ව්‍යවස්ථා කෙටුම්පත 73

4. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව 78

5. අවසානය 82

IV ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය 88

1. ශ්‍රී ලංකාවේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ ව්‍යවස්ථාපිත සහ නෛතික ව්‍යූහය 88

2. ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ ශ්‍රී ලංකාවට ඇති අන්තර්ජාතික බැඳීම් 91

3. ජනමත විචාරණ සහ මැතිවරණ පැවැත්වීම් සඳහා අදාළ වන යන්ත්‍රණ 92

4. පොදු ප්‍රතිපත්ති විවාදය තුළ මැතිවරණ සංශෝධන- මැතිවරණ සංශෝධන පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ අතුරු වාර්තාව (2004 ජනවාරි) 94

5. මැතිවරණ කොමිසම සංස්ථාපනය නොකිරීම සහ 17 වන සංශෝධනයේ 27 වන වගන්තියේ බලපෑම 95

6. රාජ්‍ය මාධ්‍යවල භූමිකාව 97

7. නම් කරන ලද නෛතික සාමාජිකත්වය සහ ජාතික ලැයිස්තුව පිළිබඳ සිද්ධාන්තය 100

8. 2004 අප්‍රේල් මස පැවති මහා මැතිවරණයට
ආනුෂංගික ජාතික ලැයිස්තු නාම යෝජනා 106

9. 104 ඌ ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය
සතු අධිකරණ බලය 107

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 125 වන වගන්තිය
අර්ථනිරූපණය කිරීම 110

11. 2004 වර්ෂයේ අංක. 14 දරණ මැතිවරණ
(විශේෂ විධිවිධාන) පනත 115

12. උතුරු සහ නැගෙනහිර පළාත්වල මහමැතිවරණය 122

13. ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රතිසංස්කරණ
පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය 123

14. මුලින් දිනුම් කණුව පසු කරන්නා (FPP)
එදිරිව සමානුපාතික නියෝජනය (PR) 126

15. සමානුපාතික නියෝජනයේ ශ්‍රී ලාංකික ක්‍රමය:
විවේචන සහ ප්‍රතිචාර 129

16. ජර්මානු මැතිවරණ ක්‍රමය 132

**V ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත් කෙටුම්පත සහ
කාන්තා අයිතිවාසිකම් පනත් කෙටුම්පත පිළිබඳ විශ්ලේෂණය 134**

1. හැඳින්වීම 134

2. කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වය 135

3. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහි ජාතික නෛතික රාමුව 136

4. අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන් සහ
තියි සැලකිල්ල පිළිබඳ සංකල්පය 137

5. ශ්‍රී ලංකාවේ 3 වන සහ 4 වන කාල පරිච්ඡේද
වාර්තාවන් පිළිබඳ සීඩෝ කමිටුවේ සමාප්ති නිරීක්ෂණයන් 139

6. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ කෙටුම්පත්
කර ඇති පනත් කෙටුම්පත 139

6.1 අභිමතාර්ථ, අර්ථනිරූපණ සහ භාෂාව 139

6.2 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වළක්වා ගැනීමට ගත හැකි
අනෙකුත් පියවර 141

6.3 ස්ථිත්‍යය 142

6.4 දණ්ඩනයන් සහ තහනම් කිරීම් 142

6.5 පොදු කරුණු 143

7. කාන්තා අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත 144

7.1 පනත් කෙටුම්පතේ අරමුණු 145

7.2 කොමිෂන් සභාවේ සාමාජිකයෝ 146

7.3 කොමිෂන් සභාවේ බලතල සහ ක්‍රියාකාරකම් 148

7.4 කොමිෂන් සභාවේ මූල්‍යය කටයුතු 153

7.5 අර්ථනිරූපණය 153

8. සමාප්තිය 154

I උපලේඛනය

ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරන ලද මානව හිමිකම් ලේඛන (2004 දෙසැම්බර්) 155

II උපලේඛනය

ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර නොමැති ඇතැම් මානව හිමිකම් ලේඛන 163

III උපලේඛනය

2004 වර්ෂයේදී තීන්දු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් නඩු තීන්දු 165

දායකත්වය

සමාලෝචනය
එලිසබෙත් නිසාන්

මානව හිමිකම් සුරක්ෂණයෙහිලා අධිකරණමය ආරක්ෂණය
කිශාලි පින්ටෝ ජයවර්ධන

ආගම ඇදහීමේ අයිතිය
ආර්. කේ. ඩබ්ලිව්. ගුණසේකර

ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය
අසංග වැලිකල

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත් කෙටුම්පත සහ කාන්තා අයිතිවාසිකම් පනත් කෙටුම්පත පිළිබඳ විශ්ලේෂණය
අම්බිකා සත්කුනනාදන්

සම්බන්ධීකරණය
ජානකී ධර්මසේන

සිංහල පරිවර්තනය හා සෝදුපත් කියවීම
චරිතා උණවටුන, තාරානාථ පල්ලියගුරු, රුක්ෂණ නානායක්කාර, ලක්ෂිත ජයවර්ධන, ජානකී ධර්මසේන

සහාය
සංජීවනී පෙරේරා, අවලා ප්‍රනාන්දු

කවරය
මොහොමඩ් කාඩර්

මුද්‍රණය
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ
අංක 67, කාර්මික ජනපදය
කටුවාන පාර
හෝමාගම

පෙරවදන

මෙම වාර්තාව තුළ 2005 ශ්‍රී ලංකා මානව හිමිකම් පිළිබඳ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් නීතිය හා සමාජ භාරය ගොනු කරන ලද වාර්තාවේ ඉතා වැදගත් වූ පරිච්ඡේදයන් 4 ක සහ සමස්ථ සමාලෝචනයෙහි (සංස්කරණය කරන ලද) පරිවර්තනයන් අඩංගු වේ. මෙකී පරිච්ඡේදයන් වූ කලී:

- මානව හිමිකම් සුරක්ෂණයෙහිලා අධිකරණමය ආරක්ෂණය
- ආගම ඇදහීමේ අයිතිය
- ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත් කෙටුම්පත සහ කාන්තා අයිතිවාසිකම් පනත් කෙටුම්පත පිළිබඳ විශ්ලේෂණය

මෙකී පරිච්ඡේදයන් අදාළ ක්ෂේත්‍රයන් හි ශ්‍රී ලංකාව කෙතෙක් දුරට මේ සම්බන්ධයෙන් වන අන්තර්ජාතික බැඳීම් ඉටු කර ඇත්තේ ද, ඉටු කරන්නේ ද සහ ඒ තුළින් කෙතරම් දුරට ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ ද යන්නත් විමර්ශනයට ලක් කරයි. මේ යටතේ මෙකී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වන ප්‍රවර්ධනයන් සහ පසුබෑම් සාකච්ඡාවට බඳුන් වේ. ශ්‍රී ලංකාවේ මේ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වන අන්තර්ජාතික සහ ගෘහස්ථමය නෛතික බැඳියාවන් මෙම පරිච්ඡේදයන් තුළත් මානව හිමිකම් මුහුණුවරක් යටතේ නිරීක්ෂණය කෙරේ. මෙහි අවසාන ඉලක්කය වන්නේ මෙකී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වන මානව හිමිකම් තත්ත්වය තවදුරටත් යහපත් තත්ත්වයකට ගෙන ඒමයි.

මෙකී වාර්තාවන් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්ෂේත්‍රයෙහි ප්‍රවීනයන් විසින් ගොනු කර ඇති අතර එහි නිරවද්‍යතාවය සනාථ කිරීම උදෙසා එකී සෑම පරිච්ඡේදයක්ම තවදුරටත් ඒ සම්බන්ධයෙන් වන ප්‍රවීනයන් විසින් විමර්ශනයට භාජනය කර ඇත.

මෙම වාර්තාව තුළ ශ්‍රී ලංකාව 2004 දෙසැම්බර් මස 31 වන දින වනවිට අත්සන් තබා ඇති නමුත් අපරානුමත කිරීමට නියමිතව ඇති අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන් වල ලැයිස්තුවක් ද අන්තර්ගත වේ.

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධයෙන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අන්තර් ජාතිකමය බැඳීම් සහ වගකීම් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සියලු අය විසින් ගරු කළ යුතු බවට, ආරක්ෂා කළ යුතු බවට සහ වැඩි දියුණු කළ යුතු බවට වන ප්‍රයත්නයෙහි අත්‍යාන්ත අවධාරණාත්මක වෑයමක් ලෙස අපි විසින් ප්‍රකට කර සිටිමු. මේ යටතේ මානව හිමිකම් සුරක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා කැප වී සිටින සියලු දෙනා මෙකී වාර්තාව ඒ උදෙසා වන කතිකාවක් ලෙස භාවිතා කරනු ඇත යන්න අපගේ අවංක බලාපොරොත්තුව වේ.

සාමාන්‍යයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් පළ කරන මෙකී වාර්තාවේ උපුටා ගත් පරිච්ඡේදයන් හි සිංහල පරිවර්තනයක් ඉදිරිපත් කිරීමෙන් අප බලාපොරොත්තු වූයේ ඉහත සඳහන් කරන ලද කර්තෘ වඩා පුළුල් වූ මණ්ඩපයක් කරා රැගෙන යාමයි. මෙකී පරිවර්තනය මානව හිමිකම් ක්‍රියාකාරීන්ට මෙන්ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද ප්‍රයෝජනවත් වනු ඇතැයි අපි විශ්වාස කරමු. මෙකී දුෂ්කර කර්තව්‍යය සාර්ථක කර ගැනීමට සහය දුන් සියලුම පරිවර්තකයන්ට හා සම්බන්ධීකරණය කරන ලද නිලධාරීන්ට අපි අපගේ අවංක වූ ප්‍රණාමය පුද කර සිටිමු.

නීතිය හා සමාජ භාරය

කොළඹ

2006 ඔක්තෝබර්

REFERENCE
ONLY
LIBRARY
L S T

I

සමාලෝචනය

එලිසබත් නිසාන් *

1. හැඳින්වීම

මෙම වසරේ මානව හිමිකම් පිළිබඳ වෙළුම 2004 වසරේ ශ්‍රී ලංකාවේ විවිධ වූ මානව හිමිකම් සිද්ධීන් විමර්ශනයට ලක් කරයි. ශ්‍රී ලංකා රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර ගැටුම් නැවැත්වීමේ සම්මුතිය 2004 වසර පුරා බලාත්මකව තිබූ නමුත් දෙපාර්ශවය අතර සාම සාකච්ඡා ආරම්භ කිරීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් ඇති නොවූ අතර උතුරු නැගෙනහිර මානව හිමිකම් තත්ත්වය ඉතා නොසන්සුන් තත්ත්වයක පැවතුණි. මෙම තත්ත්වය අප්‍රේල් 02 පැවති පාර්ලිමේන්තු මැතිවරණ සමයේ සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නැගෙනහිර කලාපයේ කර්නල් කරුණා කණ්ඩායමෙන් ඉවත් වීමෙන් පසුව එළඹුණු මාස වලින් වඩාත් ප්‍රකටව පැහැදිලි විය. නොවැම්බර් අවසානයේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ කොන්දේසි ප්‍රකාර සාම සාකච්ඡා වලට නොඑළඹෙන්නේ නම් නැවත ගැටුම් වලට එළඹෙන බවට වේළුපිල්ලේ ප්‍රභාකරන් විසින් "වීර දින" කරන ලද ප්‍රකාශයත් සමඟ නැවත යුද්ධමය තත්ත්වයක් ඇතිවන බවට තර්ජනාත්මක තත්ත්වයක් උද්ගත විය. දෙසැම්බර් මස

---

* මානව හිමිකම් උපදේශක.

26 වෙනි දින පුද්ගලයන් 30,000 ජීවිතක්ෂයට පත් කරමින් සහ 400,000 කට ආසන්න පිරිසක් අවතැන් කරමින් සුනාමි ඛේදවාචකය ඇතිවන දින තුරු ගැටුම්කාරී තත්ත්වයක් ඇති නොවිණි. දකුණු සහ නැගෙනහිර පදිංචි ජනතාව ඉතා බරපතල පීඩාවට පත් වූ අය විය. වසර අවසානයේ, සිදුවූ සුනාමි ඛේදවාචකය තුළින් මානව අයිතිවාසිකම් පිළිබඳ නව තත්ත්වයක් ඇති කරන ආකාර සිද්ධීන් මතු වූ බව පැහැදිලිය. කෙසේ නමුත්, මෙකී තත්ත්වයන් 2004 අවසානයේ මතු වූ බැවින් ඒ පිළිබඳ මෙම වෙළුමෙහි වැඩිපුර දැක්විය නොහැකිය.

2. මානව හිමිකම් සුරක්ෂණයෙහිලා අධිකරණමය ආරක්ෂණය

ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ඵලදායී නිවාරණ පියවර ගන්නා ලෙස ජාතික පොලිස් කොමිසමට, පොලිස් දෙපාර්තමේන්තුවට සහ අනිකුත් අදාළ ආයතනයන්ට නියම කර තිබියදීත් වධහිංසාව ශ්‍රී ලංකාව තුළ තවදුරටත් නොවිසඳුන ප්‍රශ්නයක් වශයෙන් පවතී. සමහර අවස්ථාවන්හිදී වින්දිතයන්ට අදාළ වන්දි මුදල නියමිත ආකාරයෙන් නොලැබී ඇති නමුත් ප්‍රමාණයෙන් ඉහළ වන්දි ලබාදී ඇති අතර, රජයේ වගකීම ඉටු කිරීමට මහජන මුදල් භාවිතය මතභේදයට තුඩු දෙන කාරණයක් ලෙස පවතී. මානව හිමිකම් හි අධිකරණමය ආරක්ෂණය පිළිබඳ පරිච්ඡේදයේ කිශාලි පින්ටෝ දක්වන ආකාරයට "සාකච්ඡාව අධිකරණය විසින් නියම කළ යුතු වන්දියේ ප්‍රමාණයේ සිට (මෙය කෙසේ නමුත් විකාර රූපී ප්‍රශ්නයකි) වඩා වැදගත් කරුණු වූ දඬුවම් නොලැබීම යන්න" දක්වා හුවමාරු විය යුතුය. බොහෝ අවස්ථා වලදී තනි නිලධාරීන් වධහිංසාවට වගකිව යුතු බව හඳුනාගෙන ඇති අතර අධිකරණය මගින් ඔවුනට විරුද්ධව විනයානුකූල පියවර ගත යුතු බව දන්වා ඇති මුත් දඬුවම් ලබා නොදීම තවදුරටත් ක්‍රියාත්මක වේ. කිශාලි පින්ටෝ ජයවර්ධන අසන්නේ, *"තනි (කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ) පොලිස් නිලධාරීන් වගකිව යුතු බව හඳුනා ගෙන තිබියදීත් ඔවුනට විරුද්ධව අභ්‍යන්තර දෙපාර්තමේන්තු විනය පරීක්ෂණයක් හෝ අධිකරණමය නඩු පැවරීමක් සිදුවී නොමැත්තේ ඇයි ද යන්නයි. මෙවැනි විනය පියවර ගෙන නඩු පැවරීම් තුළින් ඇති විය හැකි බලපෑම ඉතා විශාල වේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම නිර්දේශ නිෂේධනයකට ලක්වී ඇති අතර වචනාර්ථයෙන්ම ඒවා පිළිපැදීමට කිසිවක් සිදු නොවේ."*

පොලිස් අත්අඩංගුවේ සිටින අයකු මිය යනවිට වැදගත් අධිකරණමය කරුණු කිහිපයක් ඉස්මතු වේ. මියගිය පුද්ගලයා වෙනුවෙන් එම අයගේ ඥාතියකුට අධිකරණයේ පෙනී සිටිය හැකිද? වධහිංසාව හේතුවෙන් මරණයක් සිදු වී ඇති විට මියගිය අයගේ උරුමකරුවන්ට අධිකරණය

වෙතට නඩුවක් ගෙන යා හැකි සේ මේ සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකාවේ නෛතික ප්‍රවර්ධනය ජයවර්ධන සාකච්ඡා කරයි. වර්තමානයේදී වින්දිතයකුගේ අයිතිවාසිකම් උල්ලංඝණයට විසඳුමක් තිබිය යුතුය යන පදනම මත සහ එහි ප්‍රතිඵලයක් ලෙස මෙම තත්ත්වය එම අයගේ ඥාතීන් කරා දිවෙන බව යන තත්ත්වයට අදාළ වේ. මේ සම්බන්ධයෙන් තවදුරටත් වන ප්‍රවර්ධනය සඳහා ජයවර්ධන මානව හිමිකම් කමිටුව මගින් දක්වා ඇති හේතු පැහැදිලි කිරීම් අදාළ කර ගනී. "මෙම තත්ත්වය වින්දිතයකුට ලැබී ඇති සැලකීම් යටතේ 11 ව්‍යවස්ථාව දීර්ඝ ලෙස අර්ථනිරූපණය කිරීම යන්නට 126(2) ව්‍යවස්ථාව යටතේ <u>සෘජු උල්ලංඝණයක්</u> යන්නට වින්දිතයකුගේ අයිතිවාසිකම් පමණක් නොව වින්දිතයා විඳින ලද එකී අව සැලකිලි හේතුවෙන් එම අයගේ පවුලේ සාමාජිකයිනුත් කෲර අමානුෂික සහ අවමන් සහගත සැලකීමකට ලක් නොකිරීම අදහස් කෙරේ."

අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය හා අදාළ නඩු තීරණ කෙරෙහි අවධානය යොමු කිරීමේදී රනිල් වික්‍රමසිංහ අගමැති ලෙස දිවුරුම්දීම ආවරණය කිරීමට ජනාධිපති මන්දිරයට ගිය ප්‍රවෘත්ති කර්තෘ වරයෙකුට සහ ඔහුගේ කණ්ඩායමට ප්‍රවේශ වීමට අවසර නොදීමේ සිද්ධිය ජනාධිපති විනිර්මුක්තිය කරා දිවෙන තීරණයක් දක්වා යොමු විය. අධිකරණය දැක්වූයේ මෙම ප්‍රතිශතය අහිමි කිරීම "අමු අමුවේ වෙනස්කමකට ලක් කිරීමක්" බවත්, නීති විරෝධී සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවක් යුක්ති යුක්ත කරලීමට, උප නිලධාරියකුට ජනාධිපති නියෝගයක් ආරක්ෂණයක් ලෙස භාවිත නොකළ හැකි බවත්ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කරන ලද අයිතීන් ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ආරක්ෂා කරදීම යන්න සමානාත්මතාවයේ අයිතිය යටතේ දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගය ඉදි කිරීමට ඉඩමක් පවරා ගත් නඩුවක් යටතේ තවදුරටත් සාකච්ඡාවට භාජනය වේ. මෙහි අධිකරණ තීරණය තුළ "පොදු භාර" සිද්ධාන්තය දැඩි ලෙස සාකච්ඡා කර ඇත. කිශාලි පින්ටෝ පැහැදිලි කරන ආකාරයට *"මහජන අධිකාරීන් සතු බලය අත්‍යන්ත හෝ කිසිදු සීමාවකට යටත් නොවන ඒවා නොවන අතර ඒවා භාරයක් ලෙස දරා ගත යුතු බවත්, ඒවා ප්‍රදානය කළ අරමුණු සඳහා ඒවා යොදා ගත යුතු බවත්, ඒවා එම කරුණු සඳහා භාවිතා කරන්නේ ද යන්න අධිකරණමය විමර්ශනයකට භාජනය කළ හැකි බවත් පැහැදිලිය."*

කිශාලි පින්ටෝ ස්වකීය පරිච්ඡේදය මූලික මිනිස් අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන අධිකරණමය තීරණයන්ට පමණක් සීමා නොකරමින් ආගම් වෙනස් කිරීම සඳහා වන පනත් කෙටුම්පතක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය සහ බුද්ධ ධර්මය ජනරජයේ රාජ්‍ය ආගම බවට පත් කරන තත්ත්වයක් පිළිබඳව විග්‍රහයක් කරයි. නෛතික අයිතීන් අහිමි කිරීම මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වගන්තිය ප්‍රකාර අභියාචනාධිකරණයට යොමු වූ රිට් පෙත්සම් පිළිබඳව ද ඇය සාකච්ඡා කරන අතර නඩු විස්තර පෙන්වා දෙමින් තහවුරු කරන්නේ "මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ රිට් සහන ලබා ගැනීම අතර අන්තර් සම්බන්ධතාවය නිරන්තරයෙන්ම වැඩි වන අතර මෙකී තත්ත්වය මූලික මිනිස් අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ආරක්ෂා වීම අභියාචනාධිකරණයේ රිට් අධිකරණ බලය මත ධනාත්මක බලපෑමක් කර ඇති බවට වන අධිකරණමය නිරීක්ෂණය යටතේ ගොනු වී ඇත.''

මෙම පරිච්ඡේදයේ අවසාන නව කොටස වන්නේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ පළමු වෛකල්පිත සන්ධානය යටතේ ඉදිරිපත් කර ඇති තනි පුද්ගල පෙත්සම් සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව මගින් ලබා දී ඇති තීරණ ඇතුළත් කිරීමයි. 2004 තුළදී මානව හිමිකම් කමිටුව පෙන්වා සිටියේ රාවය කර්තෘ වික්ටර් අයිවන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට 1996 හා 1997 වසර දෙක තුළදී අපහාස කිරීම් පිළිබඳ නඩු තුනක් ගෙන ඒම තුළින් පීඩාවට පත් වී ඇති බවයි. මෙම චෝදනා වසර ගණනාවක් තිස්සේ නඩු විභාගයට යටත් වීමට නියමිතව පැවතීම ඔහුගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය යටපත් කිරීමට හේතු වී ඇත. මානව හිමිකම් කමිටුවේ දෙවන තීරණය වන, සිංගරාසා තීරණයේදී, මානව හිමිකම් කමිටුව දක්වා සිටියේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ස්වකීය අන්තර්ජාතික බැඳීම් ඉටු කිරීම සඳහා රජය විසින් සංශෝධනය හෝ පරිච්ඡින්න කළ යුතු බවයි. කිශාලි පින්ටෝ පෙන්වා දෙන්නේ මෙම තීරණ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ යටපත් කරන බවත් ශ්‍රේෂ්ඨාධිකරණය ස්වකීය තීරණ දීමේදී සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය හා එකඟව තීරණය දිය යුතු බවත්ය.

3. ආගම ඇදහීමේ අයිතිය

ආගම හා අදාළව පනත් කෙටුම්පත් දෙකක් සම්බන්ධයෙන් එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය තීරණය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මැදිහත් වීම් දක්වන ලද නඩු තීරණ කෙරෙහි සමහර ආගමික

කණ්ඩායම් වල බොහෝ අවධානය මතු වූ අතර මෙය මෑත කාලයේ ශ්‍රී ලංකාව තුළ එවැන්ජලිකල් ක්‍රිස්තියානි පල්ලිවල ක්‍රියාකාරීත්වය සහ පසුගිය වසර කිහිපය තුළ එවැනි පල්ලිවල සිදු වූ වර්ධනය හා අදාළ විය. ''ආගමික අයිතිය'' පිළිබඳ මෙම පරිච්ඡේදයෙහි ආර්. කේ. ඩබ්. ගුණසේකර මේ හා අදාළ පසුබිම් කරුණු සාකච්ඡා කරන අතර ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධයෙන් වූ නඩු වලදී ආගමික නිදහස පිළිබඳ මූලික අයිතිය සීමා කළ ආකාරය විග්‍රහ කෙරේ. එවැන්ජලිකල් පල්ලි වෙනුවෙන් පාර්ලිමේන්තුව වෙත ගෙන ආ පනත් සම්බන්ධයෙන් ඒවායේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය ප්‍රතික්ෂේප කරමින්, එක් නඩුවකදී අධිකරණය තීරණය කරන ලද්දේ මෙවැනි කණ්ඩායමක ආර්ථිකමය කටයුතු හුදෙක් ආගමික නොවන අතර, යෝජනා කර සිටියේ මෙවැනි තත්ත්වයක් සම්බන්ධයෙන් වන බාධාව ජනතාවට ස්වකීය ආගම් තෝරා ගැනීමේ නිදහසට බාධා කරනු ඇත යන්නයි. මේ හා සමාන ආකාරයෙන්ම, වසර දෙකකට පෙර අධිකරණය තීරණය කළේ පරාර්ථකාමී සේවය උදෙසා ආර්ථික හා සමාජයීය තත්ත්වයන් වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලිය මත පුද්ගල නිදහස යටතේ වූ ආගමක් ඇදහීමට ඇති නිදහසට බාධා විය හැකි බවයි. 2003 වසරේදී, පනත් කෙටුම්පතට විරුද්ධව ඉදිරිපත් වූ අදහස වූයේ භෞතික සම්පත් ලබාදීමේ පදනම මත ක්‍රිස්තියානි ධර්මය ප්‍රවර්ධනය කිරීම මත ලංකාවේ බුද්ධ ධර්මයට අනාගතයේදී බලපෑම් එල්ල විය හැකි බවයි. මීට ප්‍රතිචාර ලෙස අධිකරණය හේතු දක්වා සිටියේ ආගමක් ඇදහීම යන්නට ආගම ප්‍රචාරණය ඇතුළත් නොවන බවත්, ගුණසේකර තර්ක කර පෙන්වා දෙන ආකාරයට, ''මෙය වැරදි සහගත ලෙස 9 සහ 10 ව්‍යවස්ථාවන් තුළ ඇති ආගමික නිදහසට ඇති අයිතියේ විෂය පථය 14(1)(ඊ) ව්‍යවස්ථාව තුළට සීමා කිරීමක් බවත්ය.''

එවැන්ජලිකල් පල්ලිවල වර්ධනයත් සමඟම වෙනත් ආගමකට හැරවීම වළක්වන පනතක් සම්මත කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ බලපෑම් ඇති විය. මේ යටතේ බෞද්ධ භික්ෂුවක් විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ''බලහත්කාරයෙන් වෙන ආගමකට හැරවීම වරදක්'' ලෙස නිර්මාණය කරමින් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී. මෙම පනත් කෙටුම්පතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පෙත්සම්කරුවන් 21 මඟින් අභියෝගයකට ලක් කළ අතර මීට සමාන අන්තර්වාර පෙත්සම්කරුවන් ගණනක් ද ඉදිරිපත් විය. ගුණසේකර දක්වන විග්‍රහය පනත් කෙටුම් පතේ විවිධ ප්‍රතිපාදනයන් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසා බලන අතර ඔහු අවසන් වශයෙන් පෙන්වා සිටින්නේ, ''මෙහි ජයග්‍රාහකයන් හෝ පරාජිතයන් නොමැති බවයි. මෙමඟින් දෙපාර්ශවයටම,

යමක් තීරණය මගින් ලැබී ඇති අතර එමගින් අන්‍ය ආගමකට හැරවීම පිළිබඳ නීතියට පූර්ණ බාධා මතු කර ඇත.'' තීරණය මගින් මතු කර ගත හැකි විවිධ අර්ථනිරූපණ ඔස්සේ පැන නගින දුෂ්කරතා සාකච්ඡා කරමින් ගුණසේකර තර්ක කර සිටින්නේ, ''ආගමික නිදහස පිළිබඳ පූර්ණ අර්ථනිරූපණයක් ලබා දීමට තීරණය අසමත් වී ඇති බවයි. ආගමික විශ්වාසය සඳහා වන අයිතිය සහ ආගමක් වැළඳ ගැනීම පිළිබඳ අයිතිය කොන්දේසි විරහිත විය හැකි නමුදු ආගමක් පැතිරීම සම්බන්ධයෙන් කුමන සීමා පැනවිය හැකිද යන්න තවදුරටත් ප්‍රශ්නයක් ලෙස පවතී'' මෙම කරුණු තවමත් නොවිසඳී පවතී.

4. පාර්ලිමේන්තු මැතිවරණය සහ ඡන්දය භාවිතා කිරීමේ අයිතිය

අප්‍රේල් මස 02 දින පැවැතුණු පාර්ලිමේන්තු මැතිවරණය උතුරු නැගෙනහිර ප්‍රදේශ හැරෙන්නට, බොහෝ දුරට සාධාරණ වූ මැතිවරණ ව්‍යාපාරයක නිරත වූ, ජනාධිපතිනියගේ ප්‍රධානත්වයෙන් වූ එක්සත් ජනතා නිදහස් සන්ධානයට ජය ලබා දුණි. උතුරු නැගෙනහිර ඡන්දය විශේෂයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සහය ලබන ජාතික ද්‍රවිඩ සන්ධානයට (TNA) විරුද්ධ වූ අපේක්ෂකයන්ට එරෙහි වූ මැරවර ක්‍රියා, බියගැන්වීම් සහ මිනීමැරුම් වලින් යුක්ත එකක් විය. මැතිවරණයේදී TNA උතුරු නැගෙනහිර ප්‍රදේශවල අති බහුතරයක් හිමිකර ගත්තේය. මෙම වෙළුමේ අසංග වැලිකල විසින් ලියන ලද ''ඡන්දය භාවිතා කිරීමේ අයිතිය'' පිළිබඳ පරිච්ඡේදයේ උතුරු නැගෙනහිර පවත්වන ලද මැතිවරණය සම්බන්ධයෙන් මතු සඳහන් වැදගත් ප්‍රකාශය හමුවේ. බොහෝ බිය ගැන්වීම් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සහය ලද TNA කණ්ඩායමට විරුද්ධව වූ අපේක්ෂකයන්ට සහ පක්ෂ වලට එල්ල වූ බව සඳහන් කිරීම වටී. එල්.ටී.ටී.ඊ. සංවිධානයට උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි විශේෂයෙන් කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කයන්ට පරිබාහිරවත් හඳුනාගත හැකි ආකාරයේ දේශපාලන බලයක් හිමිකර ගෙන සිටී. උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි පාලනය පවත්වා ගෙන යාම සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද අදහස් ප්‍රකාර සහ එම ප්‍රදේශයන්හි එල්.ටී.ටී.ඊ. සංවිධානයට හිමි නෛතික රාමුවකට නොගැනෙන එහෙත් ප්‍රමාණාත්මක බලය යටතේ එම සංවිධානයට බලතල හිමි ප්‍රදේශ යටතේම සාධාරණ හා නිදහස් මැතිවරණයක් පවත්වාගෙන යාමට නොහැකි වීම අපගේ තදබල අවධානයට යොමු විය යුතුය.

මැතිවරණ ව්‍යාපාරය තුළ තවත් අවධානයට යොමු විය යුතු, වැලිකල විසින් ද පෙන්වා දෙන ලද දකුණේ මැතිවරණය මත බලපෑමක් කරන ලද රජයේ මාධ්‍ය ආයතන හා ඒවා පාලනය කරන දේශපාලන පක්ෂ අතර සැබෑ තත්ත්වය පෙන්වා දෙන රාජ්‍ය මාධ්‍යයන්හි හැසිරීම අපගේ අවධානයට යොමු විය යුතු කරුණකි. මැතිවරණ කොමසාරිස් විසින් සාධාරණ සහ සමබල වාර්තාකරණයක් සඳහා, පාලක පක්ෂය වෙත රාජ්‍ය මාධ්‍ය විසින් සිදු කරන පක්ෂපාතීත්වය මැඩලීම සඳහා උත්සාහ කරද්දී, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් අසාර්ථක වූ ප්‍රයත්නයක් යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය තුළින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් යටතේ ඔහුගේ ක්‍රියාවන් යටපත් කිරීමට උත්සාහ කරන ලදී.

වැලිකල ශ්‍රී ලංකාවේ ඡන්දය දීමේ අයිතිය හා අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහා ව්‍යවස්ථාමය නීති ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක වන ආකාරය හා ඡන්ද ක්‍රමය සංශෝධනය කිරීම පිළිබඳ වර්තමාන විවාදයන් විමර්ශනයට ලක් කරමින් සිය පරිච්ඡේදය ගොනු කර ඇත. ඔහු පෙන්වා දෙන්නේ 2004 අප්‍රේල් මස පවත්වන ලද මැතිවරණය 2001 වසර තුළ මැතිවරණ කොමසාරිස් තනතුර අවලංගු කරමින් ඒ වෙනුවට ස්වාධීන මැතිවරණ කොමිසමක්, නිදහස් සහ සාධාරණ මැතිවරණයක් උදෙසා නිර්මාණය කරන ලද 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පැවැත්වීමට නියමිත ප්‍රථම මැතිවරණය වෙයි. ජනාධිපතිනිය විසින් මැතිවරණ කොමිසමේ සභාපතිවරයකු පත් කිරීම ප්‍රතික්ෂේප කිරීම (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත) යටතේ මැතිවරණ කොමිසමක් පත් නොකරන ලදී. ඒ වෙනුවට එහි බලතල තනි කොමසාරිස්වරයකු විසින් භාවිත කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ක්‍රියා කිරීමට ජනාධිපතිනිය විසින් ප්‍රතික්ෂේප කිරීම 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මූලික හරය විනාශ කර දැමීමක් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී වේ. *"ජනාධිපති දේශපාලන පක්ෂයක නායකයකු සහ පත්වූ ප්‍රධාන විධායක වශයෙන් මෙම නව ආයතනයට පුද්ගලයන් පත් කිරීම පිළිබඳ ස්වකීය අභිමතය භාවිතා කරන්නේ නම් 41(ආ) ව්‍යවස්ථාව යටතේ නිර්මාණය කරන ලද තත්ත්වය සම්පූර්ණයෙන් නිෂේධනය වේ. 17 වන ව්‍යවස්ථාවේ හරයට ප්‍රතිවිරුද්ධව යමින් මේ දක්වාම මැතිවරණ කොමිසම ස්ථාපනය නොකර පවතී."*

වැලිකල පෙන්වා දෙන පරිදි, "ශ්‍රී ලංකාව වැනි විභේදනය වූ සමාජයන්හි වාර්ගික-දේශපාලන කැළඹීම තුළින් මහ පෙන්වා දෙන ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදය සහ එය කෙසේ ක්‍රියාත්මක වන්නේද යන්න

අත්‍යන්තයෙන්ම ගැටළු සහගත වේ.'' 1931 සිට 1978 ක්‍රියාත්මක වූ කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමය බහුතරවාදීත්වය තහවුරු කළ අතර සමානුපාතික නියෝජන ක්‍රමය (1978 ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දෙන ලද) විවිධත්වය සහ සුවිශේෂීතාවය ප්‍රවර්ධනය කළ යුතුය. කෙසේ නමුත් වැලිකල පෙන්වා දෙන පරිදි, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සමානුපාතික නියෝජනය තුළ එයට අනන්‍ය වූ දුර්වලතා පවතී. අවසාන වශයෙන්, වැලිකල මැතිවරණ කොට්ඨාශයට සහ දේශපාලන පක්ෂයට වෙන වෙනම ඡන්දය භාවිතා කළ හැකි ඡන්ද පත්‍ර දෙකක් සහිත, කේවල හා සමානුපාතික නියෝජන යන ක්‍රම දෙකේම යහපත් අංග අඩංගු, මැතිවරණ ක්‍රමය තුළ දේශපාලන පක්ෂ නායකත්වය තුළින් යෝග්‍ය පියවර ගැනීමට අවශ්‍ය වන්නා වූ, ස්ථාවරත්වය අවශ්‍ය කරන, සාධාරණ නියෝජන ක්‍රමයක්, නැතිනම් සමාජයේ සියලු කණ්ඩායම් එකතු කරන ජර්මානු ආකෘතිය මත පදනම් වූ ක්‍රමයට සහය දක්වයි.

5. කාන්තා අයිතිවාසිකම්

''කාන්තා අයිතිවාසිකම්'' පිළිබඳ පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරලීම හා අදාළ නෛතික රාමුව සවිමත් කිරීම අරමුණු කරගත් පනත් කෙටුම්පත් දෙකක් සාකච්ඡා කෙරේ. එනම්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත් කෙටුම්පත සහ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ පනතයි, කර්තෘ අම්බිකා සත්කුනනාදන්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා අදාළ ජාතික හා අන්තර්ජාතික නීතිය, අදාළ පනත් කෙටුම්පත් හා ඒවායේ ඌනතා සාකච්ඡා කිරීමට පෙර විමර්ශනය කරයි. විශේෂයෙන්ම, පනත් කෙටුම්පත සුවිශේෂි රැකවරණ නියෝග කෙරෙහි අවධානය යොමු කරන අතර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පරිපූර්ණ මුහුණුවරක් ගැනීම විශේෂයෙන්ම එය අපරාධයක් ලෙස සැලකීමට අසමත් වේ. සත්කුනනාදන්ගේ විශ්ලේෂණය ප්‍රකාර, ''ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ පනත් කෙටුම්පත රජය විසින් නීතියේ ප්‍රායෝගික ජාලය හෝ කාන්තාවන් ප්‍රායෝගිකව මුහුණ දෙන සමාජ, ආර්ථික යථාර්ථයන් පිළිබඳ අවබෝධයකින් තොරව හුදෙක් ස්වකීය අන්තර්ජාතික බැඳීම් ඉටු කිරීම සඳහා ගත් පියවරක් පමණක්ම වේ. කාන්තා අයිතිවාසිකම් පනත පිළිබඳ සත්කුනනාදන්ගේ විග්‍රහය වඩා සුභවාදී වේ. මෙම පනත් කෙටුම්පත ජාතික කාන්තා කමිටුව වඩා බලතල සහිත කාන්තා කොමිසමක් බවට පරිවර්තනය කිරීම බලාපොරොත්තු වේ. සත්කුනනාදන් කොමිසමේ අරමුණු හා අදාළ ප්‍රතිපාදන, සාමාජිකත්වය බලතල සහ මූල්‍ය කටයුතු විග්‍රහ කරමින්

පවසන්නේ මෙම පනත ''කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාව සඳහා වන අවංක වෑයමක් බවයි.'' ඇය තවදුරටත් පවසන්නේ, කාන්තාවන්ගේ තත්ත්වය හුදෙක් නීතිය මත පමණක් රඳා නොපවතින බවත්, ඓතිහාසික, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික යථාර්ථයන් සැලකිල්ලට ගත් ආයතනික හා අනන්‍ය වූ අසමානතා දුරු කරලීමට රජය පියවර ගත යුතු බවයි.

II

මානව හිමිකම් සුරක්ෂණයෙහිලා අධිකරණමය ආරක්ෂණය

*කිශාලි පින්ටෝ ජයවර්ධන**

1. හැඳින්වීම

යම් නීති ක්‍රමයක එහි නීතීන් පර්යේෂණයට ලක් කරමින්, එහි අධිකරණයක් විසින් දෙන ලද තීරණ, එම නීති ක්‍රමය කොතරම් දුරට නීතියේ ආධිපත්‍යය අනුගමනය කරන්නේ ද යන්න සත්‍ය ලෙස පිළිගැනීම සඳහා නිශ්චිත වූ සහ වඩාත්ම සූක්ෂ්ම ලෙස තුලනය වූ මැනීම වන්නේය.

මෙය ඉතා සරල කරුණකින් පැහැදිලි වේ. හොඳම සහ වඩාත්ම යුක්ති සහගත වූ විනිසුරුවරයකුට මුරණ්ඩු වූ නීතියකින් හෝ නීති ප්‍රතිපාදනයකින් නීතිය පසිඳලීමේ මූලික හරයට ගරු කරමින් විශ්මිත වූ කාර්යයන් කළ හැක. අනිත් අතට, සදාචාරසම්පන්න නොවූ හෝ දේශපාලනීකරණය වූ විනිසුරකු වඩාත් අගනා නීතියක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදනයක් ඉදිරියේ නිහඬව සිටිය හැක. සුවිශේෂයෙන්ම

* එල්. එල්. බී. (ගෞරව), නීතිඥ; නියෝජ්‍ය අධ්‍යක්ෂක සහ අංශාධිපති, නීති අංශය, නීතිය හා සමාජ භාරය, කර්තෘ (නීති) උපදේශක / කතුවැකි කර්තෘ, සන්ඩේ ටයිම්ස් කොළඹ.

රටේ ප්‍රජාතන්ත්‍රික ආයතනයන්හි යහපත් ක්‍රියාකාරිත්වය මත ප්‍රබල බලපෑම් කළ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් හි දරුණු උල්ලංඝණයන් සම්බන්ධයෙන් 2004 වසර තුළ අධිකරණමය තීරණයන් සලකා බැලීමේදී මෙකී නිරීක්ෂණය විශේෂයෙන්ම අදාළ වේ.

මෙම පරිච්ඡේදය අදාළ වසර තුළදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීරණ මෙන්ම ස්වකීය විමර්ශන සඳහා ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අධිකරණය ලබා දුන් තීරණ විශ්ලේෂණය කරයි. මීට අමතරව පුරවැසි අයිතිවාසිකම් මත ඇති කරන ලද අතිශය වැදගත් වූ බලපෑම් හේතු කොටගෙන මෙම පරිච්ඡේදය, අභියාචනාධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 ව්‍යවස්ථාව මත පිහිටා ක්‍රියාත්මක කරන ලද රිට් අධිකරණමය බලය මත ලබාදුන් තීරණ ද විභාගයට ලක් කෙරේ. මේ අනුව මෙම පරිච්ඡේදය මීට පෙර මෙම විෂය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික මිනිස් අයිතිවාසිකම් විශ්ලේෂණය කරමින් ලියන ලද පූර්ව පරිච්ඡේදයන්ගෙන් සැලකිය යුතු වෙනස් මුහුණුවරක් ගනී.[1]

මෙම පරිච්ඡේදයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව මගින් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ පළමු වෛකල්පිත සන්ධානය යටතේ ශ්‍රී ලංකාවට හිමි අධිකරණමය බලය ඔස්සේ කමිටුවට ඉදිරිපත් කරන ලද තනි පුද්ගල පෙත්සම් මත ලබා දෙන ලද අදාළ තීරණයන් හි විශ්ලේෂණයක් ද ඇතුළත්ය. මෙම පෙත්සම්හි සාපේක්ෂ නව්‍යතාවය සහ අන්තර්ජාතික සම්මුති අපරානුමත කිරීම සහ හෝ ඒවා පවරා ගැනීම තුළින් රටකට අනුගමනය කළ යුතු වගකීම් මත ඇති කරන බලපෑම යන කාරණා හේතුවෙන්, මෙම විශ්ලේෂණය මෙම පරිච්ඡේදය තුළ අත්‍යාවශ්‍ය වේ.

---

1 මේ සඳහා බලන්න: පළමුව අභියාචනාධිකරණයේ අයිතිවාසිකම් හා අදාළ තීරණ මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික මිනිස් අයිතිවාසිකම් තීරණ පිළිබඳ අදහස් පළමුව දක්වන ලද "මානව අයිතිවාසිකම් සුරක්ෂණයෙහිලා අධිකරණමය ආරක්ෂණය" *ශ්‍රී ලංකාව: මානව හිමිකම් තත්ත්ව වාර්තාව 2004.*

2. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණමය ප්‍රතිචාර

2.1 වධහිංසා සහ කෲර අමානුෂික සහ අවමන් සහගත සැලකීම් වලින් වැළකීමේ නිදහස පිළිබඳ අයිතිය සම්බන්ධයෙන් වන අධිකරණමය යුක්ති යුක්ත කිරීම් (11 වන වගන්තිය)

වගාච්චිගේ දයාරත්න එදිරිව පොලිස්පති සහ අනිකුත් අය[2]

ශ්‍රී ලාංකිකයකු කුමන අවස්ථාවේදී අන්‍ය යහපත සඳහා ඉදිරිපත් විය යුතුද? එසේත් නැතිනම් අනික් අතට මෙවැනි ඉදිරිපත් වීමකින් පැන නැගිය හැකි කටුක සහගත තත්ත්වයන් හේතුවෙන් මෙවැනි මැදිහත් වීමක් සම්පූර්ණයෙන්ම අත්හැර දැමිය යුතුද? සිවිල් සමාජයක් විසින් අනුගමනය කළ යුතු නීති පිළිපැදීම රීතියක් වෙනුවට ව්‍යතිරේඛයක් වූ අප ජීවත් වන්නා වූ වැනි සමාජයක මෙවැනි ප්‍රශ්නයක් අපට ඉතා වැදගත් වේ.

මෙම නඩුව මාරාන්තික රිය අනතුරක් සම්බන්ධයෙන් තම අසල්වැසියාගේ පුත්‍රයා පොලිසිය විසින් රැගෙන යාමේදී මැදිහත් වීමට තීරණය කිරීමේදී පනස්පස් වියැති ජ්‍යෙෂ්ඨ නීතිඥයකු මුහුණ දුන් දෙලොවක් අතර ප්‍රශ්නය නිදර්ශනයක් ලෙස පෙන්නුම් කරයි.

අදාළ ළමයා මව වෙත ආයාචනා කරද්දීම ඔහුව කාර් රථයෙන් ඇද දමා පොලිසියට යන අතරතුරදී පා පහරවල් වලට ලක් කරන ලදී. ළමයාට පහර නොදී පොලිසියට ඔහු රැගෙන යා යුතු බවට නීතිඥවරයා ආයාචනා කළ විට, එම ස්ථානයට පැමිණි අනිකුත් පොලිස් නිලධාරීන් විසින් ඔහුට පරුෂ වචනයෙන් බැන වැදී පහර දෙන ලදී. ඔහු පැන යාමට තැත් කරන විට, කිසිවකු විසින් ''වෙඩි තියන්න'' යන්න කෑ ගසනු ඇසීමෙන් ඔහු නැවතුණි. ඔහුට තවදුරටත් පහර දුන් අතර, පොලිස් ජීප් රථය වෙතට ඇදගෙන ගොස් පොලිසිය වෙත ගෙනවිත් ඔහු නිදහස් කරන තුරු එහි රඳවා තබා ගන්නා ලදී.

---

[2] ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 337/2003, 2004.05.17 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් සී.වී. විග්නේස්වරන් විනිසුරු විසින් තීරණය ලබා දුන් අතර යාපා සහ ජේ.ඒ.එන්. ද සිල්වා විනිසුරුවරු ඒ හා එකඟ වන ලදී. මෙය ලේඛිකාව විසින් ලියන ලද 2004 මැයි මස 30 වන දින සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළ වූ "Focus on Rights" යන විශ්ලේෂණයේ තවදුරටත් පැහැදිලි කිරීමකි.

අධිකරණය හමුවේ වූ ප්‍රශ්නය වූයේ පොලිස්පති විසින් පිළිගන්නා ලද නීතිඥයාහට පහරදීම සහ රඳවා තබා ගැනීම නොව මෙම කරුණු සම්බන්ධයෙන් වගකිව යුතු පොලිස් නිලධාරීන් කෙසේ හඳුනා ගන්නේද යන්නයි. මෙම අදාළ නිලධාරීන් මුලින් ළමයා රැගෙන ගිය පොලිස් නිලධාරීන් නොව, ඊට වෙනස් පිරිසකි.

වරද පැවරිය හැකි පොලිස් නිලධාරීන් හඳුනාගත නොහැකි තත්ත්වයක් මත, පෙත්සම්කරුගේ වධහිංසාවට එරෙහි වූ හා කෲර අමානුෂික හා අවමන් සහගත සැලකීම් වලින් වැළකීමේ නිදහස, නීතිය ඉදිරියේ සමානාත්මතාවය සහ අත්තනෝමතික ලෙස සිර භාරයට ගැනීම සහ රඳවා තබා ගැනීමට එරෙහි වූ නිදහස යන අයිතිවාසිකම් උල්ලංඝණය වීම සම්බන්ධයෙන් රජයට වරද පවරන ලදී. මේ අනුව රු. 500,000 ක් වන්දි වශයෙන් ගෙවීමේ වගකීම පැවරුණි.

> සිද්ධිය සිදුවූ තැනට රැස් වූ පොලිස් නිලධාරීන් එකට එක්ව කරන ලද ක්‍රියාවක් හා පසුව පෙත්සම්කරුව බලහත්කාරයෙන් අත්අඩංගුවට ගෙන බම්බලපිටිය පොලිස් ස්ථානයට රැගෙන යාම සහ ඉන් අනතුරුව රඳවා තබා ගැනීම යන ක්‍රියාවන්හි වගකීම සාධාරණ ලෙස සහ ඍජුවම රජය මත පැවරිය යුතුය. රජය ස්වකීය නිලධාරීන්ගේ ක්‍රියාවන් සඳහා වගකිව යුතුය.[3]

ඉතා තියුණු ලෙස, සමාන ලෙස සැලකීම් ලැබීමේ අයිතිය පොලිසිය විසින් නීතිඥවරයාට (අන්‍ය යහපත සඳහා ක්‍රියා කරන සහ කාරුණික අසල්වැසියකු වූ,) ලබාදීමට අසමත් වීම යන කරුණු මත උල්ලංඝණය වූ බව දක්වනු ලැබීය. විශේෂයෙන්ම අසල්වැසියාගේ පුත්‍රයා සම්බන්ධ වූ අනතුරේදී පොලිස් නිලධාරියකු අනතුරට පත්වීමත්, වියරු වැටුණු පොලිස් නිලධාරීන් වෙත ස්වකීය ක්‍රියාවන්ගෙන් වළකින ලෙස කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර නොදැක්වීමත් මීට හේතු සාධක විය.

රජය මත පවරන ලද වගකීම සහ ඒ මත පදනම් වූ වන්දි ගෙවීම

අයිතිවාසිකම් උල්ලංඝණයකදී වගකිව යුතු පොලිස් නිලධාරීන් හඳුනාගත නොහැකි විට, රජය මත වගකීම පැවරීම ඇත්තවශයෙන්ම ඉතා පැරණි

3 ඉහත අංක 2, නඩු තීරණයේ පිටු අංක 24.

සහ ඉතා හොඳින් පිළිගත් මූලධර්මයක් වේ.[4] පොලිස් බලකාය වූකලී රජයේ අංශයකි. රජය, අයිතිවාසිකම් කඩ වූ අයට වන්දි ගෙවිය යුතුය.

මෙවැනි ප්‍රදානයන් සඳහා වන මූල්‍යම වගකීම රටේ බදු ගෙවන්නන් විසින් දැරිය යුතු නිසා මෙවැනි වූ වන්දි ගෙවීම් වලදී සැලකිය යුතු මුදලක් ගෙවීමට රජයට නියම කිරීමේ අධිකරණමය ස්ථාවරය මේ සම්බන්ධයෙන් මහජන කථිකාවතක් ඇති කිරීමට සමත් වී ඇත. දයාරත්න නඩුවේදී තනි පොලිස් නිලධාරීන් කරන ලද ක්‍රියාවන්ට වන්දි ගෙවීම රජයට නියම කළ විට ''අදාළ වරදට වගකිව යුතු වූ අය නිදහස් වීම'' සහ මහජන මුදල් මේ සම්බන්ධයෙන් වැයවන බව යන කරුණට අවධානය යොමු කිරීමේදී මේ කරුණ පිළිබඳ අධිකරණයේ අවධානය යොමු වූ බව පැහැදිලිය.[5]

එරන්දක සහ තවත් අයෙකු එදිරිව හලේවෙල පොලිස් ස්ථානාධිපති, හක්මන[6] හි දක්වන ලද ආකාරයට වෛද්‍ය වාර්තා වලින් පැහැදිලි වන ආකාරයට සිරමැදිරියේ සිටියදී පෙත්සම්කරුවන්ට පහර දුන් අවස්ථාවන් හිදී අධිකරණය විශාල මුදලක් වන්දි වශයෙන් නියම කිරීමෙන් වැළකී ඇත. අදාළ පහරදීමට සම්බන්ධ බන්ධනාගාර නිලධාරීන් හඳුනාගැනීමට අසමත් වීම මත පෙත්සම්කරුවන් දෙදෙනාගෙන් එක් එක් අයකුට රු. 25,000/- බැගින් ගෙවීමට රජයට නියම කරන ලදී.

අනික් අතට, ඉතා දරුණු ලෙස අයිතිවාසිකම් උල්ලංඝණය වීම් උදෙසා අදාළ වගකිව යුතු පොලිස් නිලධාරීන් හඳුනා ගත් අවස්ථා වලදීත් මෙම නිලධාරීන්ට පුද්ගලිකව තමන් විසින් වන්දි ගෙවීමට නියම කර ඇත. *සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ*[7] හිදී පොලිසිය විසින් අත්අඩංගුවට

---

[4] *අමල් සුදත් සිල්වා එදිරිව කොඩිතුවක්කු, පොලිස් පරීක්ෂක සහ අනිකුත් අය,* (1987)2 ශ්‍රී.නී.වා. පිටු 119 අතුකෝරාල විනිසුරු.

[5] ඉහත අංක. 2 නඩු තීරණයේ පිටු අංක. 24 අධිකරණය මෙහිදී පෙත්සම්කරුවන් 'තමන් හොඳින්ම දන්නා කරුණු' මත වරදකාරීත්වය තනි පොලිස් නිලධාරීන් මත පැටවීමට අකමැති වීම පිළිබඳ අවධානය යොමු කරන ලදී.

[6] (2004)1 ශ්‍රී.නී.වා. 268, *තවදුරටත් අධිකාරී සහ අධිකාරී එදිරිව අමරසිංහ සහ තවත් අය,* ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 251/2002, 2003.02.14 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්.

[7] මාර්ක් ප්‍රනාන්දු විනිසුරුගේ තීරණය (2003)2 ශ්‍රී.නී.වා. 63 මෙම තීරණය මත වන සාකච්ඡාවක් සඳහා බලන්න ''මානව හිමිකම් සුරක්ෂණයෙහිලා අධිකරණමය ආරක්ෂණය'' *ශ්‍රී ලංකාව: මානව හිමිකම් තත්ත්ව වාර්තාව 2004* (කොළඹ: නීතිය හා සමාජ භාරය 2004) මෙම පරිච්ඡේදයේ මතු දැක්වෙන මෙම තීරණයෙන් පසු ඇති වූ මෑත අධිකරණමය ප්‍රවර්ධනයන් පිළිබඳ සාකච්ඡාව.

ගත් හමුදාවෙන් පැන ගිය අයකු රිමාන්ඩ් රැකවරණයේ සිටියදී මිය ගොස් ඇත. අධිකරණය විසින් ඔහුගේ මරණය සම්බන්ධයෙන් නොව, මියගිය අයට ලැබිය යුතුය යන පදනම මත ඔහුගේ භාර්යාවට සහ ළමයාට වන්දි ගෙවන ලදී. රු. 700,000/- රජය වෙතින් ගෙවීමට නියම වූ අතර වගකිව යුතු පොලිස් නිලධාරීන්ට පුද්ගලිකව රු. 50,000 බැගින් ගෙවීමට නියම විය.

වේවලගේ රාණි ප්‍රනාන්දු[8] නඩුවේදී පොලිස් නිලධාරීන් විසින් කරන ලද පහරදීමකින් ඇතිවූ මරණයකදී රජයට රු. 925,000/- ක් සහ දශ ලක්ෂයක් සැකසෙන පරිදි සමානව අදාළ නිලධාරීන් තිදෙනාට රු. 25,000/- බැගින් ගෙවීමට නියම විය. මෙම සැලකිය යුතු මුදල් ප්‍රදානය නියම කිරීමේදී මියගිය පුද්ගලයා කුඩා ළමුන් තිදෙනෙකුගේ පියකු යන කරුණ අධිකරණය සැලකිල්ලට ගන්නා ලදී. සිරකරුවා මීගමු සිරමැදිරියේ සිටියදී කිසිදු සරණක් නොමැති සිරකරුවකුට ඉතා අමානුෂික ලෙස පහරදී තනිකර දමා යකඩ ලෑල්ලක බැඳ තබා ඔහුගේ අවසන් හුස්ම හෙළීමට අවස්ථාව සැලසීම මෙම වන්දි මුදලට දායක වූ කරුණු විය.

මෙම නඩු විමර්ශනය කර බැලීමේදී, සාක්ෂිමය ලෙස පැහැදිලි වන්නේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් කරන අතිශය ම්ලේච්ඡ වූ හැසිරීම් මිස, අධිකරණය විසින් ප්‍රදානය කරන්නට යෙදුණු විශාල වන්දි ප්‍රදානයන් නොවේ. උදාහරණයක් ලෙස, ජෙරාල්ඩ් පෙරේරා නඩුවේදී නමගිය අපරාධකරුවකු වූ "ජෙරාඩ්" යැයි වැරදි වැටහීමකින් සාමාන්‍ය සේවකයකු අත්අඩංගුවට ගෙන පහර දුන් අවස්ථාවේදී, ඔහු හදවත් අකර්මන්‍යතාවයකට පාත්‍ර විය. මෙහිදීත් පෙත්සම්කරුගේ 11, 13(1) සහ 13(2) ව්‍යවස්ථාවන් යටතේ වූ අයිතිවාසිකම් උල්ලංඝණය වීම් සම්බන්ධයෙන් මේ සඳහා වගකිව යුතු පොලිස් නිලධාරීන්ට සහ රජයට රු. 800,000/- වන්දි ප්‍රමාණයක් ගෙවීමට අධිකරණය නියම කරන ලදී.[9] මීට අමතරව, පෙත්සම්කරු වෛද්‍ය ප්‍රතිකාර වශයෙන් වැය කරන ලද මුදල ඉතා අධික සහ එය රජයේ රෝහලකින් ලබා ගත

[8] ජේ.ඒ.එන් ද සිල්වා සහ නිහාල් ජයසිංහ විනිසුරුවන් එකඟ වෙමින් (ආචාර්ය) ශිරාණි බණ්ඩාරනායක විනිසුරුවරිය විසින් ලබා දෙන ලද තීරණය ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 700/2002, දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.07.26.

[9] සංජීව එදිරිව සුරවීර, (2003)1 ශ්‍රී.නී.වා. 317, එදිරිසූරිය විනිසුරු සහ විග්නේස්වරන් විනිසුරු එකඟ වෙමින් විනිසුරු මාර්ක් ප්‍රනාන්දු විසින් ලබා දෙන ලද තීරණය.

හැකි බවට වගඋත්තරකරුවන් විසින් තර්ක කර සිටියදීත් අධිකරණය විසින් දරුණු වධහිංසා නිසා පෙත්සම්කරු පුද්ගලික රෝහලකින් ලබාගත් වෛද්‍ය ප්‍රතිකාර සම්බන්ධයෙන් වූ වැය වීම් ගෙවීමට රජයට නියම කරන ලදී.

මෙහිදී ප්‍රශ්නය වූයේ පෙත්සම්කරුට දරන්නට සිදුවූ මානසික පීඩනය පසක තිබියදීත්, කෙතරම් මුදල් ප්‍රමාණයක් ඔහුගේ පවතින සෞඛ්‍ය ප්‍රශ්න සඳහා ප්‍රමාණවත් වන්නේ ද යන්නයි. කෙසේ නමුත්, මෙම ප්‍රශ්නය ඛේදනීය අධ්‍යාතික ප්‍රශ්නයට පමණක් සීමා කරමින්, 2004 නොවැම්බර් මස 21 වැනි දින ජෙරාල්ඩ් පෙරේරා වෙඩි තැබීමකට ලක් වූ අතර මීට පසු ආරෝග්‍ය ශාලාවේදී ඔහු මිය ගියේය. මෙම සිද්ධිය වූයේ වධ හිංසාවට එරෙහි පනත යටතේ, නීතිපති දෙපාර්තමේන්තුව මගින් මහාධිකරණයේ පවරන ලද නඩුවකදී ඔහු විසින් සාක්ෂි ලබාදීමට නියමිතව සිටියදීය. පරීක්ෂණ වාර්තාවන්ට අනුව දැන් හඳුනාගෙන ඇත්තේ වධහිංසාවට වගකිව යුතු පොලිස් නිලධාරීන්ම මෙම සිද්ධියට සම්බන්ධ බවය. විශේෂයෙන්ම පැහැදිලි වන්නේ, ඔහුගේ මරණය සිදුවන විට, වෛද්‍ය වියදම් සඳහා ගෙවිය යුතු විශාල මුදල් ප්‍රමාණයක් ඔහු වෙත ගෙවා නොමැති බවය.

මෙම සියලුම නඩු වලින් මතු වන්නේ නඩු හබයන්ට ලක්වීමේ කරදරවලට මුහුණ දෙන සහ ඉතා විශාල වන්දි ප්‍රදානයන් ලැබුණත් එවැනි ප්‍රදානයන් මගින් තමන් මුහුණ දුන් කටුක අත්දැකීම් විසඳිය නොහැකි, වධහිංසාවට ලක් වූවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයගේ කතාන්දරයි. එමනිසා මතු දැක්වෙන විශ්ලේෂණය පරිදි මේ සම්බන්ධයෙන් වන විවාදය කෙතරම් මුදල් ප්‍රමාණයක් ගෙවිය යුතුද (ඕනෑම අවස්ථාවකදී එය විකාර රූපී ප්‍රශ්නයකි) යන්නේ සිට වරදට දඬුවම් ලැබිය යුතු අයට දඬුවම් නොලැබීම යන කරුණට මාරු විය යුතුය.

මෙම පරිච්ඡේදයේ අවධානයට යොමු වන කාලය තුළදී මෙම පරිච්ඡේදයේ මතු සාකච්ඡාවට භාජනය වන, ෂාවුල් හමීඩ් මොහොමඩ් නිලාම් සහ අනිත් අය එදිරිව කේ. උඩුගම්පොල සහ අනිකුත් අය[10] යන නඩුවේ එක් සැලකිය යුතු අවස්ථාවක් වන්නේ මරණයක් හෝ ශාරීරික

[10] ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 68/2002, 73/2002, 74/2002, 75/2002, 76/2002, 2004.01.29 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්, අග විනිසුරු සරත් එන්. ද සිල්වා සහ විනිසුරු පී. එදුස්සූරිය එකඟ වෙමින් (ආචාර්ය) ශිරාණි බණ්ඩාරනායක විනිසුරුවරිය විසින් ලබා දෙන ලද තීරණය.

පහරදීමකින් තොරව විශාල වන්දි මුදලක් ප්‍රදානය කරන ලද අවස්ථාවක් ලෙසයි. මෙහිදී සෑම පෙත්සම්කරුවකුටම රජය විසින් රු. 750,000/- ගෙවීමට නියම වූ අතර අයිතිවාසිකම් උල්ලංඝණය වූ සෑම පෙත්සම්කරුවකුටම පළමු වගඋත්තරකරු වෙතින් රු. 50,000/- බැගින් ගෙවීමට නියම විය. පෙත්සම්කරුවන් රහස් ඔත්තු සේවා අංශයේ නිලධාරීන් විය.

බලයලත් නිලධාරීන්ගේ ප්‍රතිපුරුෂ වගකීම

සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ හි පළමු වගඋත්තරකරුගේ වගකීම සහ නෛතික බැඳියාවන් පෙත්සම්කරු වෙත කරන ලද වධහිංසා සහ කුරිරු සහගත සැලකීම්වල ක්‍රියාකාරීත්වයට සහභාගී වීම, අවසර දීම, හවුල් වීම සහ / හෝ දැනීමට පමණක් සීමා නොවේ. පෙත්සම්කරුට නීතියේ දක්වා ඇති ආකාරයට නොසැලකීම සම්බන්ධයෙන් ඔහු වගකීමට ලක් කරන ලදී. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම් තමා යටතට ගැනෙන නිලධාරීන්ගේ කටයුතු වලින් පෙත්සම්කරුට තවදුරටත් විය හැකි අකටයුතු හිරිහැර විමසා බැලීමට සහ යම් අකටයුත්තක් පිළිබඳ වැඩිදුර පර්යේෂණ කිරීමට තමන්ගේ නිල බලය මත සිට කිරීමට අපොහොසත් වීම වගඋත්තරකරුට වගකීම් පැවරීමට හේතු වේ.

එසේම, වේවලගේ රාණි ප්‍රනාන්දු නඩුවේ 3වන, 4වන සහ පස්වන වගඋත්තරකරුවන්, අනුපිළිවෙළින් පොලිස් ස්ථානාධිපති, මීගමුව බන්ධනාගාරය, ප්‍රධාන සිරමැදිරිකරු සහ සිරමැදිරි පාලන - මීගමුව බන්ධනාගාරය (මියගිය අයට ඔවුන් පහර දුන් බවට සාක්ෂි නොමැති නමුදු) අධිකරණය මගින් ස්වකීය යුතුකම් පැහැර හැරීම සම්බන්ධයෙන් වගකීමට ලක් කරන ලදී.

ඉහත සඳහන් කළ *එරන්දක එදිරිව හල්වෙල පොලිස් ස්ථානාධිපති,* හක්මන හි කරුණු වලින් පැහැදිලි වන ආකාරයට එක් එක් නඩුවේදී නොකර හැරීම් සම්බන්ධයෙන් වගකීම් පැවරීම එම නඩුවේ කරුණු මත පදනම් වේ. සිරමැදිරියේ පෙත්සම්කරු වධහිංසා වලට ලක්වූ බවට වෛද්‍ය වාර්තා සඳහන් කරන නමුදු නඩුවේ වගඋත්තරකරුවන් ලෙස සඳහන් වූ ජ්‍යෙෂ්ඨ බන්ධනාගාර නිලධාරීන් අධිකරණය මගින් වගකීමට ලක් නොකරන ලදී. ඒ වෙනුවට, සම්පූර්ණයෙන් රජය මත වගකීම පැවරීමට අධිකරණය තීරණය කරන ලදී.

මෙම කාලපරිච්ඡේදය තුළදී ලබා දෙන ලද තවත් නඩු තීරණයකදී[11] මහපොළ ප්‍රදර්ශන සහ වෙළෙඳ සැණකෙළියක් පැවැත්වූ ස්ථානයකදී අතිරේක පොලිස් කොස්තාපල්වරයකුගේ නොහික්මුණු සහ නීති විරෝධී ක්‍රියා කලාපය සහ පෙත්සම්කරුට පහරදීම සම්බන්ධයෙන් අධිකරණය වෙත ගෙන එන ලද පැමිණිල්ලකදී විනිසුරන් අදාළ සිද්ධිය සිදුවන විට එතැන සිටි නමුදු සිද්ධිය වැළැක්වීමට කිසිවක් නොකරන ලද ගොකරුල්ල පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිහට දැඩිසේ අවවාද කරන ලදී. මීට අමතරව පෙත්සම්කරුට අදාළ පහරදීම සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ල වහාම ලියා ගැනීමට සහ ඒ සම්බන්ධයෙන් විභාගයක් පැවැත්වීමට අසමත් වීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානාධිපති පුද්ගලිකව වගකීමට ලක් කරන ලදී.

ජාතික පොලිස් කොමිසමට සහ පොලිස් දෙපාර්තමේන්තුවට අධිකරණය විසින් දෙන ලද නිර්දේශ

> පොලිස් අත්අඩංගුවේ සිටියදී සිදුවන වධහිංසා සහ කෲර අමානුෂික සහ අවමන් සහගත සැලකීම් පිළිබඳ ලැබෙන විශ්වසනීය පැමිණිලි සංඛ්‍යාවෙහි අඩුවක් පෙන්නුම් නොකෙරේ. වධහිංසාවෙන් තොරව ජීවත් වීමේ නිදහස ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) ව්‍යවස්ථා යටතේ පවරා ඇති යුතුකම වන මූලික මිනිස් අයිතිවාසිකම් වලට ගරු කිරීම සහ වැඩි දියුණු කිරීම රජයේ සියලුම ආයතනයන් කරා දිවෙන අතර මේ සම්බන්ධයෙන් පොලිස්පතිට ව්‍යතිරේඛයක් සැපයිය නොහැක. අවම වශයෙන්වත්, විශේෂයෙන් පත් කරන ලද පොලිස් නිලධාරීන් මගින් සහ/හෝ නිලධාරීන් හෝ ජාතික මානව හිමිකම් කොමිසමේ නියෝජිතයින් සහ/හෝ අත්අඩංගුවේ සිටින පුද්ගලයන්ගේ තත්ත්වය සහ ඔවුන්ට ලැබෙන සැලකිලි සම්බන්ධයෙන් ඔවුන්ගෙන් ප්‍රශ්න කොට වාර්තා කිරීමට අවසරලත් ප්‍රජා නායකයන් මෙවැනි ස්ථානයන්ට නොදන්වා වාර්තා කිරීමට පොලිස්පති විසින් කටයුතු සැකසිය යුතුය.

---

[11] *ඒ.එම්. විජිත අලගියවන්නවේ එදිරිව එල්.පී.ජී. ලලිත් ප්‍රේමා, අතිරේක පොලිස් කොස්තාපල් සහ අනිකුත් අය ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක.* 433/2003, 2004.11.30 *දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් විනිසුරු එච්. එස්. යාපා සහ විනිසුරු රාජා ප්‍රනාන්දු එකඟ වෙමින් අගවිනිසුරු සරත් එන්. ද සිල්වා විසින් ලබා දෙන ලද තීරණය ප්‍රතිපුරුෂ වගකීම සම්බන්ධයෙන් සමස්ත විග්‍රහයක් උදෙසා බලන්න, බණ්ඩා එදිරිව ගජනායක* (2002)1 *ශ්‍රී.නි.වා.* 365 *සහ දේශප්‍රිය එදිරිව වීරකෝන්, ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක.* 42/2002, 2003.08.08 *දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්.*

> 11 ව්‍යවස්ථා උල්ලංඝණය වීම වැළැක්වීම උදෙසා එලදායී උපදෙස් දීමට කාලාන්තරයක් තිස්සේ අසමත් වීම සහ විනය හෝ අපරාධ නඩු විභාගයකදී සිදු කෙරෙන පරිදි මෙම උල්ලංඝණයන්හට සම්බන්ධ වූවන් සම්බන්ධයෙන් නිසි පරීක්ෂණයක් කිරීමට අසමත් වීම මෙම කටයුතු සම්බන්ධයෙන් එකඟ වීම සහ සමාව දීම එසේත් නැත්නම් අනුමැතිය දීම සහ බලය ලබාදීම සාධාරණීකරණය කරයි.[12]

සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ සහ දයාරත්න නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය අදාළ වරදකාරී පොලිස් නිලධාරීන් නිසි විනය පරීක්ෂණයන්ට ලක් කිරීමට දැඩි පියවර ගන්නා ලෙස ජාතික පොලිස් කොමිසමට සහ පොලිස් දෙපාර්තමේන්තුවට නිර්දේශ කරන ලදී. මේ හා අදාළව මෙම නඩු තීන්දුවේ පිටපත් පොලිස්පතිට මෙන්ම ජාතික පොලිස් කොමිසමට යැවීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරී තැනට උපදෙස් දෙන ලදී.

මෙකී නඩු තීරණයන් දෙක පසුගිය දශක දෙක තුළදී මේ හා සමාන නිර්දේශ ලබා දුන් නඩු තීරණ ගණනාවට එකතු වේ. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පොලිස් නිලධාරීන් (කනිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ) හඳුනාගෙන තිබියදීත් මෙම පුද්ගලයන් සම්බන්ධයෙන් සාර්ථක නඩු, අධිකරණයකදී හෝ අභ්‍යන්තර දෙපාර්තමේන්තු විනය පරීක්ෂණයක් නොපවත්වන්නේ කුමන හේතුවක් නිසාද? මෙවැනි නඩු විභාගයක හෝ විනය පරීක්ෂණයක නිවාරණ (ඉදිරියේදී මෙවැනි සිද්ධීන් නැවත ඇතිවීම වැළැක්වීමට) හැකියාව ඉතා විශාල විය හැක. ශ්‍රේෂ්ඨාධිකරණ ලබාදී ඇති නිර්දේශ ආයතන සංග්‍රහයේ ඇති අඩුපාඩු නිසා නිෂ්ඵල සහ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අවලංගු දෙයක් බවට පත්ව ඇති බව, මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහි පියවර ගැනීමට නොහැකිවීම හේතුව වශයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් විසින් දක්වන අතර මේ සම්බන්ධයෙන් මෙම ගැටළුව මහ හැරීම උදෙසා සිවිල් සමාජය සමඟ සංවාදයකට එළැඹ ඇත.[13] කෙසේ නමුත්, මේ සම්බන්ධයෙන්

---

[12] පූර්ව 9 වෙනි පාද සටහන බලන්න. විනිසුරු මාර්ක් ප්‍රනාන්දු විසින් ලබා දෙන ලද තීරණය.

[13] බලන්න නීතිය හා සමාජ භාරය, LST Review, 15 එකතු කලාපය අංක. 208 සහ 209 (පෙබරවාරි/මාර්තු 2004) තමන්ගේ භාරයේ සිටි පුද්ගලයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කරන ලද නිලධාරීන් සිටින දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට සමාන ආකාරයේ නිර්දේශ අධිකරණය මගින් නිකුත් කර ඇත. උදාහරණයක් වශයෙන් වේවලගේ රාණි ප්‍රනාන්දු නඩුවේදී බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත නියෝග නිකුත් කර ඇත. ඉහත 8 වෙනි පාද සටහන බලන්න. මෙම නියෝග හා එකඟ වීමක් නම් පෙන්නුම් නොකෙරේ.

වගකිව යුතු පියවර ගැනීම උදෙසා පොලිස්පති හෝ ජාතික පොලිස් කොමිසම පෙළඹෙන බවක් නොපෙනේ.

වේවලගේ රාණි ප්‍රනාන්දු (මියගිය ළමා හේවගේ ලාල්ගේ භාර්යාව) සහ අනිකුත් අය එදිරිව පොලිස් ස්ථානාධිපති, සුළු අපරාධ, සීදූව පොලිස් ස්ථානය, සීදූව සහ තවත් අය අට දෙනෙක්[14]

මෙකී නඩුව 11 ව්‍යවස්ථා (කෲර අමානුෂික සහ අවමන් සහගත සැලකීම් වලින් වැළකීමේ නිදහස) උල්ලංඝණය වීම සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ පවරා ඇති නඩුවල පොදු ලක්ෂණයක් වූ සුළු වරදක් සම්බන්ධයෙන් පුද්ගලයකු පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම සහ ඉන් අනතුරුව රාජ්‍ය නිලධාරීන් භාරයේ සිටියදී මිය යාම යන්න කදිමට පෙන්නුම් කරයි.

මියගිය පුද්ගලයා පොලිස් අත්අඩංගුවේ නොව රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටියදී මරණය සිදුවිය. අධිකරණයේදී තීරණය කළ යුතු වූයේ බන්ධනාගාර නිලධාරීන්ගේ ක්‍රියාවක ඵලයක් ලෙස මරණය සිදුවූයේ ද යන්නයි. බන්ධනාගාර නිලධාරීන් භාරයේ සිටියදී සිදුවූ සාහසික සහ අඛණ්ඩව සිදු වූ පහරදීමකින් මියගිය අයගේ මරණය සිදු වූ බවට ඒත්තු ගැනීමෙන්, රජය විසින් රු. 925,000/- සහ අදාළ වගකිව යුතු නිලධාරීන් විසින් රු. 25,000/- බැගින් ගෙවීමටත් මතු දැක්වෙන මූලධර්මයනුත් අධිකරණය මඟින් නිර්දේශ කරන ලදී.

<u>මියගිය අයගේ උරුමකරුවන්ට සහ/හෝ යැපෙන්නන්ට අධිකරණයට පැමිණිය හැකි වන සේ ජීවත් වීමේ අයිතිවාසිකම උල්ලංඝණය වී තිබේද?</u>

ස්වකීය අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සිදු වී නොමැති බැවින් සහ හුදෙක් මියගිය අයගේ අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් පමණක් වී ඇති බැවින් පෙත්සම්කරුවන්ට නඩුව පවත්වා ගෙන යාම සඳහා නෛතික ස්ථිත්‍යයක් (locus standi) නොමැති බවට වගඋත්තරකරුවන් විසින් මූලික විරෝධයක් දක්වන ලදී. වගඋත්තරකරුවන්ගේ විරෝධය ප්‍රතික්ෂේප කරමින් මේ සම්බන්ධයෙන් වන ප්‍රාරම්භක අනුගම්‍ය

---

[14] ඉහත පාද සටහන් 8 බලන්න.

නිදර්ශණයක්[15] දක්වමින් අධිකරණය දක්වා සිටියේ ජීවත් වීමේ අයිතිය පිළිගැනීම උදෙසා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඍජු ප්‍රතිපාදනයක් නොමැති නමුදු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) වගන්තිය යටතේ අත්‍යවශ්‍යයෙන්ම දක්වන පරිදි පුද්ගලයකුට ජීවත් වීමේ අයිතිවාසිකම හිමි බවත් එය අධිකරණ නියෝගයකින් පමණක් අහිමි කළ හැකි බවත්ය. 13(4) ව්‍යවස්ථාව දක්වන්නේ: 'කිසිදු පුද්ගලයකු බලලත් අධිකරණයකින් ලබා ගත් නියෝගයක් යටතේ මිස මරණ දඬුවමකට හෝ සිරගත කිරීමකට ලක් කළ නොහැක'.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) වගන්තිය ජීවත් වීමේ අයිතිය නිර්මාණය කරන්නේ නම් එය කඩ වූ විට එයට විසඳුමක් නොමැති තත්ත්වයක් පැවතිය නොහැක. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(2), මූලික අයිතිවාසිකමක් කඩ වූ අයෙකුට තමා විසින්ම හෝ නීතිඥයෙකු යටතේ අධිකරණයේ පෙනී සිටීමේ අයිතිය ලබාදේ. 11 ව්‍යවස්ථාව උල්ලංඝණය වීමෙන් මරණයක් ඇති වූ විටෙක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(2) සහ 13(4) වගන්තීන් එක්ව ගත් කල නෛතික උරුමකරුවන්ට සහ/හෝ යැපෙන්නන්ට නඩුවක් ගෙන ඒමේ හැකියාව ලැබේ.

සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ සහ *වේවලගේ රාණි ප්‍රනාන්දු* නඩුවල අධිකරණය මගින් ප්‍රගතිශීලී ලෙස දක්වන ලද පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් ප්‍රතිපාදනයක් ව්‍යංග ලෙස ජීවත් වීමේ අයිතිය පිළිගනී නම් මේ හා සමාන උග්‍ර අයිතිවාසිකම් උල්ලංඝණයකදී තවදුරටත් ප්‍රගතිශීලී වූ අධිකරණමය අර්ථනිරූපණයකට හැකියාව ලැබේ. මේ යටතේ 126(2) සහ 11 ව්‍යවස්ථාව එක්ව ගත් කල අයිතිවාසිකම් කඩවූ අයට ලැබී ඇති සැලකීම්වල ඵලයක් ලෙස අයිතිවාසිකම් කඩ වූ අය පමණක් නොව එම අයගේ පවුලේ අය ද කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකීමට ලක් නොකළ යුතුය යන ප්‍රගතිශීලී අර්ථනිරූපණයට එළඹිය හැක. මෙම තත්ත්වය ඉහත සාකච්ඡා කළ නඩුවල දක්වන ලද නෛතික අයිතිවාසිකම් කඩ වූ අයගේ එකී අයිතිවාසිකම් එම අයගේ

---

15 *සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ* හි අධිකරණය විසින් නඩුව පවත්වාගෙන යාමට අවසර දීම (2003)1 ශ්‍රී.නී.වා. 14 ශිරාණි බණ්ඩාරනායක විනිසුරුවරිය මෙන්ම එම නඩුවේ අධිකරණය ලබා දුන් අවසන් තීරණය බලන්න. ඉහත 7 වන පාද සටහන එහිදී අධිකරණය ප්‍රකාශිතවම හඳුනාගෙන දක්වන ලද්දේ (මාර්ක් ප්‍රනාන්දු විනිසුරු විසින්) "ජීවිතය මිනිසකුට අත්‍යාවශ්‍ය පූර්ව කොන්දේසියක් වන හෙයින් යමෙකුගේ අවසරය නොමැතිව හෝ කැමැත්තට විරුද්ධව එම අයගේ ජීවිත අයිතිය නීති විරෝධී ලෙස අහිමි කිරීම නිශ්චිත වශයෙන්ම අමානුෂික සැලකීමක් වේ."

නෛතික උරුමකරුවන්ට සහ/හෝ යැපෙන්නන්ට එකතු කිරීම හෝ ඒ හා විකාශනය කිරීමේ තත්ත්වයට වඩා අත්‍යාවශ්‍යයෙන්ම වෙනස් වන්නේය.

අයිතිවාසිකම් කඩ වූ අයගේ අයිතිවාසිකම් කඩවීම තුළින් පවුලේ සාමාජිකයන්ගේත් අයිතිවාසිකම් කඩවන බව සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ පළමු වෛකල්පිත සන්ධානය යටතේ ලැබෙන තනි පුද්ගල පෙත්සම් තීරණය කිරීමේ මානව හිමිකම් කමිටුව මගින් පිළිගෙන ඇත.

මූලික අවධියේදී මානව හිමිකම් කමිටුව මගින් දක්වන ලද පරිදි, අතුරුදහන්වීම් පිළිබඳ සිද්ධීන්හි, අතුරුදහන් වූ අයගේ පවුලේ සාමාජිකයන් අතුරුදහන් වූ අය මුහුණ දුන් අයිතිවාසිකම් කඩවීම් හා අන්තර්ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 9 වෙනි වගන්තිය (නිදහස හා ආරක්ෂාව සඳහා වන පුද්ගල අයිතිය), 10(1) වගන්තිය, (නිදහස අහිමි වූ සියලු අයට මානුෂවාදීව සැලකීම් ලැබීමේ අයිතිය සහ ඒ යටතේ මනුෂ්‍යයෙකුට උරුම ගරුත්වයට ගරු කිරීමේ අයිතිය) යන අය අයිතිවාසිකම් කඩවීම් වලටම භාජනය වේ.[16] ඉතා මෑතකදී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පියකු විසින් 1990 ගණන් වලදී හමුදා අත්අඩංගුවේ සිටියදී අතුරුදහන් වූ පුත්‍රයා වෙනුවෙන් ගොනු කළ නඩුවේදී ශ්‍රී ලංකාවට එරෙහිව ලබාදුන් තීරණයේදී, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව පවසා සිටියේ:

> පිටස්තර පරිසරයේ කිසිදු සම්බන්ධයකින් තොරව රඳවා සිටි ස්වකීය පුත්‍රයා, මෙම පෙත්සම්කරුට හදිසියෙන් මෙන් මාස පහළොවකට පසුව දකින්නට ලැබුණු අතර මෙම තත්ත්වය තුළින් ඔහුට විඳින්නට සිදුවූ කණගාටුදායක තත්ත්වය මානව හිමිකම් කමිටුවට හඳුනාගත හැක. මේ අනුව ඔහුව 7 වන ව්‍යවස්ථාව කඩ වූ අයකුගේ තත්ත්වයට පත්වේ. (කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් වලට ලක් නොවීමේ අයිතිය).
>
> තවදුරටත්, පෙත්සම්කරුගේ පුත්‍රයා අතුරුදහන්වීමෙන් සහ ඔහුගේ ආගිය තැන් පිළිබඳ කිසිදු ආරංචියක් නොලැබීම තුළින් පෙත්සම්කරුගේ පවුලේ අයට විඳින්නට සිදු වූ දුක් ගැහැට හේතු

[16] ක්යින්ටරස් එදිරිව උරුගුවේ, නඩු අංක. 107/1981, අදහස් උපුටා දක්වන ලද්දේ 1983 ජූලි මස 21 වන දින.

> කොට ගෙන පෙත්සම්කරුගේ සහ ඔහුගේ භාර්යාවගේ අයිතිවාසිකම් එනම්, 7 වන ව්‍යවස්ථාව උල්ලංඝණය වූ බව කමිටුවට පෙනේ. මේ අනුව කමිටුව තීරණය කරන්නේ පෙත්සම්කරුගේ පුත්‍රයාගේත් පවුලේ අයගෙත් සම්මුතියේ 7 වන ව්‍යවස්ථාව යටතේ පිළිගෙන ඇති අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවයි.[17]

මෙම තත්ත්වය ස්වෙච්ඡාවෙන් තොරව සිදුවන අතුරුදහන්වීම් වලදී මානව හිමිකම් කමිටුව හඳුනාගෙන ඇති අතර බරපතල වධහිංසා හේතුවකින් පුද්ගලයකු මියගොස් ඇති විට ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සමක් ගොනු කර ඇති විට මෙම තත්ත්වයම අදාළ කර යොදාගත හැක්කේ මන්ද යන්න ගැටළුවකි.

මෙකී අර්ථනිරූපණය අධිකරණය මඟින්, 11 වන ව්‍යවස්ථාව සහ 13(4) ව්‍යවස්ථාව යටතේ ජීවත් වීමේ අයිතිය පිළිගෙන ඇති බව සහ 126(2) ව්‍යවස්ථාවේ පුද්ගලයා යන්නට එම පුද්ගලයාගේ නෛතික උරුමකරුවන් සහ/හෝ යැපෙන්නන් ඇතුළත් වන බව පිළිගෙන ඇති අර්ථනිරූපණය හා එකට යා වෙන්නේය.[18]

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පුද්ගල නිදහස පිළිබඳ අයිතිය දරුණු අපරාධකරුවන්හටද ලබාදීම</u>

වේවලගේ රාණි ප්‍රනාන්දු නඩුවේදී මියගිය පුද්ගලයා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පොලිසිය විසින් දුන් මුල් හේතුව වූයේ ඔහු විසින් කෙසෙල්කැන් දෙකක් සොරකම් කිරීමයි. අධිකරණය මඟින් පෙන්වා දුන්නේ, සොරකම පිළිබඳ චෝදනාව පුද්ගල නිදහස පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල අයිතිය උදුරා ගැනීමට හේතුවක් නොවන බවයි. මේ සම්බන්ධයෙන් වූ පූර්ව තීරණ මූලික මූලධර්මය පිළිගැනීම සඳහා ගෙන හැර දක්වන ලදී.

---

17 ජෙගතීස්වරන් සර්මා එදිරිව ශ්‍රී ලංකාව නඩු අංක. 950/2000. අදහස් උපුටා ගන්නා ලද්දේ 2003 ජුලි 31 දින ශ්‍රී ලංකාව හා අදාළව මානව හිමිකම් කමිටුව විසින් ලබා දෙන ලද තීරණ උදෙසා බලන්න මෙම පරිච්ඡේදයේ 6 වන කොටස.

18 මෙ සම්බන්ධයෙන්, සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ සහ වේවලගේ රාණි ප්‍රනාන්දු නඩුව අදාළ වේ. බලන්න ඉහත 14 සහ 15 පාද සටහන්, මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන වගන්තිය ප්‍රකාර අයිතියක් උල්ලංඝණය වීම සම්බන්ධයෙන් අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමේදී ව්‍යවස්ථා 126(2) සහ ව්‍යවස්ථා 17 අතර ඇති සම්බන්ධතාව හඳුනා ගන්නා ලදී.

> පෙත්සම්කරු කිසිදු අනුකම්පාවක් හිමි නොවන දරුණු ගණයේ අපරාධකරුවකු වුවත්, අපගේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හිමිකර දුන් සුරක්ෂිතයන් අර්ථ පූර්ණ වීමට නම්, ඔහුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ලබාදුන් සුරක්ෂිතයන් අහිමි නොකිරීම අත්‍යාවශ්‍ය වේ.[19]

<u>බන්ධනාගාර නිලධාරීන් වෙත පවරන ලද රැකබලාගැනීම පිළිබඳ යුතුකමෙහි අත්‍යාවශ්‍යභාවය</u>

මේ සාකච්ඡාවට සම්බන්ධ කරගත යුතු තවත් ප්‍රධාන මුහුණුවරක් තිබේ. එනම්, වරදකරුවන් ලෙස හඳුනාගත් සිරකරුවන්ගෙන් වෙන්වූ රිමාන්ඩ් බන්ධනාගාරගත වූවන්ට ලබාදෙන සැලකිලියි. රඳවාගත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සෘජුවම පිළිනොගන්නා නමුදු, ශ්‍රී ලංකාව යටත් වන අන්තර්ජාතික නීතිය යටතේ වන, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 10 වන ව්‍යවස්ථාව යටතේ මෙය පිළිගෙන ඇත. මෙම 10(1) ව්‍යවස්ථාව ප්‍රකාර පුද්ගල නිදහස අහිමි වූ සියලු පුද්ගලයන් මානවවාදී සහ ඔවුන්ගේ ගරුත්වයට සරිලන සැලකිලි වලට භාජනය විය යුතු අතර රිමාන්ඩ් බන්ධනාගාරගත වූවන් ස්වකීය තත්ත්වයට සරිලන ලෙස වෙන්ව රඳවා තබා සිටිය යුතුය. මෙම මූලධර්මය හා සම්බන්ධ අන්තර්ජාතික නීතිය ඉතා පැහැදිලිය.

මෙම නඩුවේදී අධිකරණය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 10 වන ව්‍යවස්ථාවට අනුව යමකු වැරදිකරුවකු බවට ඔප්පු කරන තුරු නිදහස් පුද්ගලයකු වන බවට වන පූර්ව නිගමනය යටතේ

---

[19] *අමල් සුදත් සිල්වා එදිරිව කොඩිතුවක්කු* (1987)2 ශ්‍රී.නී.වා. 119. *තවදුරටත් සෙන්තිල්නායගම් එදිරිව සෙනෙවිරත්න* (1981)2 ශ්‍රී.නී.වා. 187 *දිසානායක එදිරිව අධීක්ෂක*, මාතර බන්ධනාගාරය (1991)2 ශ්‍රී.නී.වා. 247, *ප්‍රේමලාල් ද සිල්වා එදිරිව පොලිස් පරීක්ෂක රොද්‍රිගු* (1991)2 ශ්‍රී.නී.වා. 307 *පියසේන වෙනුවට පැල්ලවත්තගේ (AAL) එදිරිව පොලිස් ස්ථානාධිපති වාද්දුව*, ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 433/93, 1994.08.31 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්. *සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ හි*, ඉහත පාද සටහන් 7 බලන්න. මෙහිදී පෙත්සම්කරුගේ අයහපත් චරිතය පිළිබඳ විස්තර ඔහුට එරෙහි වන කරුණු ලෙස කරන ලද තර්කය අධිකරණය විසින් නිෂ්ප්‍රභා කරමින් දක්වා සිටියේ නිර්දෝෂිභාවයේ පූර්ව නිගමනය මෙහිදී අදාළ වනවා මෙන්ම වගඋත්තරකරු විසින් පෙත්සම්කරුගේ ජීවිතය අහිමි කිරීම තුළින් අයහපත් චරිතය පිළිබඳ කරුණු පිළිබඳව ප්‍රතිවිරුද්ධ කරුණු කියා පෑමට ද ඔහුට අවස්ථාව අහිමි වී ගොස් ඇත.

ඔහුහට වෙනම සැලකීම් ලැබිය යුතු බව සඳහන් නොකරන ලදී. කෙසේ නමුත්, මියගිය පුද්ගලයාට ලබාදුන් දරුණු වධහිංසා හෙළා දකිමින් අධිකරණය, සිරකර රැඳවීමේ ආඥා පනතේ වන ගෘහස්ථ නීතිය පමණක් නොව රඳවා තබා ගන්නේ අයිතිවාසිකම් පිළිගත් අන්තර්ජාතික සම්මුතිය හා ප්‍රකාශනයක් මෙන්ම මානව හිමිකම් කමිටුව විසින් ගෙන හැර දක්වන ලද අදහස් ද ඉදිරිපත් කරන ලදී.[20]

විශේෂයෙන්ම ශිරාණි බණ්ඩාරනායක විනිසුරුවරිය ගෙන හැර දක්වන ලද අදහස් වැදගත් වේ.

> රාජ්‍ය නිලධාරීන් වන බන්ධනාගාර නිලධාරීන් විසින් රැඳවුම්කරුවන්ට කරන පහරදීම් ඉතා දරුණු සණයේ අයුතු සැලකීම් වේ. මෙම තත්ත්වය නිලධාරීන් විසින් රැඳවුම්කරුවන්ගේ අසරණභාවය අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීමකි.[21]

ෂාවුල් හමීඩ් මොහොමඩ් නිලාම් සහ අනිකුත් අය එදිරිව කේ. උඩුගම්පොල සහ අනිකුත් අය[22]

මෙම නඩුවේදී හමුදා ආරක්ෂිත නිවාසයක් පොලිසිය විසින් වැටලීමක් හේතු කොටගෙන පෙත්සම්කරුවන් අධිකරණයට පැමිණෙන ලදී. මෙය ලංකාවේ පුවත්පත් වලින් ඉතා විශාල ප්‍රසිද්ධියට ලක්වූ පුවතක් වූ අතර මෙය නිවසක් සහ නිවසකට සමාන ස්ථානයක් හඳුනා ගැනීම සම්බන්ධයෙන් වූ කදිම උදාහරණයක් විය. පෙත්සම්කරුවන්ට සහනයක් ප්‍රදානය කිරීමේදී ලිබරල් ලෙස ස්වකීය තීරණයට ළඟා වූ අවස්ථාවක් ලෙසත් මෙය ප්‍රකට වේ.

---

20 තෝමස් එදිරිව ජැමෙයිකාව සන්නිවේදන අංක. 266/1989 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටු නිර්දේශ, 1983 නොවැම්බර් 02 තවදුරටත් මහා මණ්ඩල යෝජනාව සම්මත 43/174, 1988 දෙසැම්බර් 09 සහ එක්සත් ජාතීන්ගේ කොංග්‍රසය මගින් අපරාධ වැළැක්වීම සහ වැරදිකරුවන්ට සැලකීම සම්බන්ධයෙන් උපුටා ගත් සිරකරුවන්ට සැලකීම සම්බන්ධයෙන් අවම ප්‍රමිති රීතීන්, ජිනීවා, 1955. මෙම රීතීන් ආර්ථික සහ සමාජයීය සභාව මගින් යෝජනා සම්මත 663 C (XXIV), 1957 ජූලි 31 සහ 2076 (LXII) 1977 මැයි 13 මගින් සම්මත කර ගන්නා ලදී.

21 ඉහත පාද සටහන් 8 බලන්න. නඩු තීන්දු පිටු අංක 14.

22 ඉහත පාද සටහන් 10 බලන්න. පොදු පෙරමුණු රජයේ ඉහළ පෙළේ අමාත්‍යවරු කිහිප දෙනෙක් එම අවස්ථාවේ අදාළ වැටලීම ව්‍යංගයෙන් අනුමත කළ හෙයින් මෙම තීරණය දේශපාලනමය වශයෙන් ඉතා සංවේදී වේ.

7716

පෙත්සම්කරුවන් පස් දෙනා මහනුවර පොලිස් අධිකාරිවරයකු විසින් තමන්ගේ සුරක්ෂිත නිවස වැටලීම සහ තමන් විසින් ස්වකීය රාජකාරිය සිදු කරන බවට කරුණු පැහැදිලි කර තිබියදීත් ඔවුන් අත්අඩංගුවට සහ රඳවා තබා ගෙන ප්‍රශ්න කරන ලදී. ඔවුන් විසින් 11, 12(1), 13(1) සහ 13(2) ව්‍යවස්ථා උල්ලංඝණය වූ බවට කරුණු දක්වන ලදී.

අදාළ චෝදනා ප්‍රතික්ෂේප කරමින් පොලිස් අධිකාරිවරයා පවසා සිටියේ භයානක අවි ආයුධ රාශියක් ජනාකීර්ණ වාසස්ථාන ප්‍රදේශයක රඳවා තබාගෙන සිටින බවට තමන්ට ලැබුණු ඔත්තුවක් අනුව මෙම වැටලීම සිදු කළ බවයි. ඕනෑම විටක සුරක්ෂිත හමුදා නිවසක් සම්බන්ධයෙන් ඒ ප්‍රදේශයේ පොලිසියට දැනුම් දිය යුතු බවත් එසේ සිදු නොකළ හෙයින් මෙම පරීක්ෂණය ඔහු විසින් කළ බවත් තවදුරටත් කරුණු ඉදිරිපත් කරන ලදී.

නීත්‍යානුකූල නොවන අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම්

කරුණු විශ්ලේෂණය කරමින් අධිකරණය නිගමනය කළේ පළමු වගඋත්තරකාර පොලිස් නිලධාරියාගේ ප්‍රකාශය විශ්වසනීය නොවන බවත්, පෙත්සම්කරුවන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පළමු වගඋත්තරකරුට ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයිතියක් නොපැවති බවත්ය. නීත්‍යානුකූලව සිදුකළ යුතු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් හේතු පැහැදිලි කිරීම ද මෙහිදී සිදු කෙරිණි. මේ අනුව 13(1) ව්‍යවස්ථාව උල්ලංඝණය වී ඇත.

13(2) යටතේ නීත්‍යානුකූල නොවන රඳවා තබා ගැනීමක් ද සිදුවී ඇත. අත්අඩංගුවට ගත් පුද්ගලයකු පැය 72 කට නොවැඩි කාලයක් තුළ රඳවා තබා ගත හැකි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (1979 අංක. 48 සංශෝධිත) 7(1) වගන්තිය යටතේ පෙත්සම්කරුවන් රඳවා තබා ගන්නා ලදී. එම පනතේම 9 වගන්තිය ප්‍රකාර ආරක්ෂක ඇමතිවරයාගේ නියෝග යටතේ තවදුරටත් රඳවා තබා ගත හැක. එසේ නොමැති නම් රැඳවියන් මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම නඩුවේදී ආරක්ෂක අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද රැඳවුම් නියෝග කිසිවක් ඉදිරිපත් නොකරන ලදී. පෙත්සම්කරුවන් අධිකරණ නිලධාරියකු වෙත ඉදිරිපත් කර නොතිබිණි.

7716

<u>ප්‍රමාණාත්මක ලෙස සිදු වූ මානසික වේදනාවක් 11 ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමට ප්‍රමාණවත් වේ.</u>

වධහිංසාව සහ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ සමච්චලයට ලක් කිරීම් සම්බන්ධයෙන් ලබා දෙන තීරණය සම්බන්ධයෙන් මෙම නඩුව වැදගත් වේ. මෙය කිසිදු කායික ආබාධයකින් තොරව 11 ව්‍යවස්ථාව උල්ලංඝණය වූ බව පිළිගත් දුර්ලභ අවස්ථාවකි. මෙහිදී පෙත්සම්කරුවන් විසින් තමන් රඳවා සිටි මානුෂික තත්ත්වය ප්‍රශ්න කරන ලදී. මෙම පෙත්සම්කරුවන් බීමතින් සිටි සිරකරුවන් විසින් වමනය දමා ඉතා අපවිත්‍ර වූ අවකාශය මද වූ හා දුහඳ වූ සිරමැදිරියක රඳවා සිටි අතර ඒ හා සමාන තත්ත්වයක් යටතේ එක් පොලිස් ස්ථානයක සිට තවත් ස්ථානයකට මාරු කර හරින ලදී.

11 වන ව්‍යවස්ථාව උල්ලංඝණය වූ බව දක්වමින් දක්වා සිටියේ ප්‍රමාණාත්මක මානසික වේදනාවක් අයිතිවාසිකම් උල්ලංඝණයකට තුඩු දෙන බවයි. මේ හා රැකුල් දෙන දේශීය හා කලාපීය මූලධර්මයන් අධිකරණය මඟින් දක්වන ලදී.[23]

හදිසි වැටලීම නිසා පෙත්සම්කරුවන්ට මුහුණ දීමට සිදුවූ අවදානම කෙරෙහි අධිකරණයේ අනුකම්පාව මෙහිදී විශේෂයෙන් කැපී පෙනේ. මේ යටතේ පෙත්සම්කරුවන් ඉතා රහසිගත ත්‍රස්තවාදී කණ්ඩායමක සාමාජිකයන් බව ප්‍රකාශ කරන ලදී. තමන්ගේ අනන්‍යතාවය ප්‍රකාශයට පත් කිරීමෙන් තමන්ට අනතුරක් සිදුවිය හැකි බවට පෙත්සම්කරුවන් කරන ලද ප්‍රකාශය කෙරෙහි වගඋත්තරකරුවන් කිසිදු අවධානයක්

---

23 විශේෂයෙන්ම කුමාරසේන එදිරිව උප පොලිස් පරීක්ෂක ශ්‍රියන්ත සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 257/93, 1994.05.23 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්. මෙහිදී කායික ආබාධයක් ඇති කරමින් පහරදීමක් සිදු නොවුණත් විඳින්නට සිදු වූ ගැහැට 11 ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමට තරම් සමත් බව අධිකරණය දක්වන ලදී. වැදගත්ම ලෙස පෙනී යන්නේ ප්‍රනාන්දු එදිරිව සිල්වා, ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 7/89, 1991.05.03 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් හිදී අධිකරණය දැක්වූයේ පුද්ගලයකු ආහාර සහ බෙහෙත් සහ පුද්ගලයකුගේ ශරීර අවශ්‍යතාවයන් පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික පහසුකම් නොමැති වීම 11 ව්‍යවස්ථාව උල්ලංඝණය වීමක් බවයි. යුරෝපියානු මානව හිමිකම් කොමිසම මඟින් දෙන ලද තීරණ ද සලකා බලන ලදී. විශේෂයෙන්ම *Tyrer v. UK* (1978)2 EHHR 1, *the Greek Case* 127 B (1969) Com. Rep. 70, *Campbell and Cosans* v. UK (Case law of the EUCT, 1, 170).

යොමු නොකරන ලදී. මෙම තත්ත්වය, උල්ලංඝණය සම්බන්ධයෙන් ඉහළ වන්දි ප්‍රමාණයක් ගෙවීමේ සාධකයක් විය.[24]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝණය වීමකදී යුක්තිය සොයන්නා වූ පෙත්සම්කරුවන් මත අවශ්‍ය ඔප්පු කිරීමේ භාරයක් නොපැවරිය යුතු බවට අධිකරණය ප්‍රකාශ කරන ලදී.[25]

<u>අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් වෙනස් සහගත වූ සැලකීම්</u>

අධිකරණය මගින් එළඹෙන ලද තීරණය වූයේ පෙත්සම්කරුවන් අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔවුනට ලබා දෙන ලද සැලකීම් අනුව 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය වීමේ තත්ත්වයක් ද ඇතිවී ඇති බවයි. නීති විරෝධී අත්අඩංගුවට ගැනීමක් සහ රඳවා තබා ගැනීමක් හෝ වධහිංසාව හෝ කෲර අමානුෂික අවමන් සහගත සැලකීමක් හෝ දඬුවමක් ඇති ඕනෑම අවස්ථාවක, එවැනි තත්ත්වයක් වෙනස් සහගත සැලකීම් වලට තුඩු දී ඇති විට, ප්‍රාථමික වශයෙන් සමානාත්මතාවයේ අයිතිය උල්ලංඝණය වේද? මේ සම්බන්ධයෙන් මෙම අයිතිවාසිකම් ද්විත්වය අතර ඇති සම්බන්ධය මතු සඳහන් කරන නඩුවකදී වඩා හොඳින් පැහැදිලි වේ.

---

[24] ඉහත පාද සටහන් 10 නඩු තීන්දුවේ 40 පිටුව බලන්න. ඒ සියලු පෙත්සම්කරුවන්ට එකතුව වශයෙන් රු. 800,000/- ක් ගෙවීමට නියම වූ අතර එයින් රු. 750,000/- රජය විසින් ගෙවීමට සහ රු. 50,000/- ක් පුද්ගලිකව පළමු වගඋත්තරකරු වූ පොලිස් අධිකාරීට ගෙවීමට සිදු විය.

[25] ඇතුළත් කිරීම සඳහා විමර්ශනය කරන ලද නඩු තීන්දු වූයේ *වෙල්මුරුගු එදිරිව නීතිපති* (1980)1 (FRD) 180, *අබේවික්‍රම එදිරිව දයාරත්න* ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් අංක. 125/88, 1989.07.12 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්, *වත්ත පිරිස් සහ අනිකුත් අය එදිරිව නීතිපති* (1994)1 ශ්‍රී.නී.වා. 1.

2.2 අදහස් ප්‍රකාශ කිරීමේ සහ සමාගමේ සහ භාෂණයේ නිදහස පිළිබඳ අධිකරණමය තීරණයන් (14(1). (අ). (ආ) සහ (ඇ) ව්‍යවස්ථා)

එම්. එන්. ඩී. පෙරේරා එදිරිව බාලපටබැඳි සහ තවත් අය.[26]

මෙම පෙත්සම 2001 වසරේ දෙසැම්බර් මුල් කාලයේදී එවකට අගමැති රනිල් වික්‍රමසිංහ දිවුරුම් දීම පටිගත කිරීම සඳහා ජනාධිපති මන්දිරයට ගිය එක්තරා රූපවාහිනී නාලිකාවක ප්‍රවෘත්ති සම්පාදක සහ ඔහුගේ පිරිසට එම ස්ථානයට ඇතුළු වීම ප්‍රතික්ෂේප කිරීම හේතු කොට ගෙන ගොනු විය. මෙම ප්‍රතික්ෂේප කිරීම ජනාධිපතිනිය දුන් නියෝගයක් මත ක්‍රියාත්මක වූ අතර අදාළ පුද්ගලික මාධ්‍ය කණ්ඩායම එවකට පැවති මහ මැතිවරණයේදී ජනාධිපතිනියගේ මූලිකත්වයෙන් මෙහෙය වූ කණ්ඩායමට නොව එක්සත් ජාතික පක්ෂයට සහය දුන් මාධ්‍ය කණ්ඩායමක් විය.

අධිකරණයේ බහුතර මතය ප්‍රකාරව (විග්නේස්වරන් විනිසුරු විසින් සහ ශිරාණි තිලකවර්ධන විනිසුරුවරිය ඊට එකඟ වෙමින්) මෙම ප්‍රතික්ෂේප කිරීම ද කඩ වූ වෙනස්කමකට භාජනය කිරීමක් වන අතර කොතරම් ඉහළ ගණයේ නිලධාරියකු අතින් එය සිදු වුවත් එවැනි තත්ත්වයක් යුක්ති යුක්ත කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී. ප්‍රතික්ෂේප කරන ලද කණ්ඩායමේ සමානාත්මතාවයේ අයිතිය වන භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස උල්ලංඝණය වූ බව තීරණය විය.

රජය වෙනුවෙන් පවසා සිටියේ, නියමිත නිලධාරීන් ඉදිරියේ දිවුරුම් දීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර නියමිත ජනාධිපති හෝ ඉහළ අධිකරණවල නිලධාරීන් මෙන් අගමැතිවරයාට දිවුරුම් දීමට නියමිත ස්ථානයක් නොමැති බවයි. මේ අනුව එම පුද්ගලයාගේ දිවුරුම් දීම මහජන උත්සවයක් නොවන බවත් මහජනතාවට ඒ සඳහා අවසර ලබා දුන්නත්, (එය පොදුව පවතී නම්) මේ අවස්ථාවේදී එය පොදු ස්ථානයක් නොවන ජනාධිපති මන්දිරයේ පැවති බවත් ඒ අනුව අදාළ

---

[26] ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 27/2002, 2004.10.19 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්, ශිරාණි තිලකවර්ධන විනිසුරුවරිය එකඟ වෙමින් සහ එන්. දිසානායක විනිසුරු එකඟ නොවෙමින් සී.වී. විග්නේස්වරන් විනිසුරුවිසින් ලබා දෙන ලද තීරණය ලේකිකාව *'සන්ඩේ ටයිම්ස්'* පුවත්පතේ 'Focus on Rights' හි 2004 ඔක්තෝබර් 24 වෙනි දින ලියන ලද පුවත්පත් ලිපිය තුළ වූ අධිකරණයේ හේතු දැක්වීම මෙහිදී තවදුරටත් දීර්ඝව සාකච්ඡා කර ඇත.

මාධ්‍ය කණ්ඩායමට එහි යාමට පොදු අයිතියක් නොමැති බවත්ය. මාධ්‍ය කණ්ඩායම් සඳහා ඇරයුම් කර ඇත්තේ හුදු සුහදභාවය දැක්වීමට පමණක් වන අතර එය අහිමි වූ කණ්ඩායමකට එවැනි තත්ත්වයක් ස්වකීය අයිතිවාසිකම් කඩ වූ තත්ත්වයක් ලෙස කියා පෑමට නොහැකි බවත්ය.

මෙම තර්කය ප්‍රතික්ෂේප කරමින් අධිකරණය දක්වා සිටියේ අදාළ සිද්ධියේ සියලු කාරණා පදනම් කරගෙන මෙය පොදු උත්සවයක් ද නැද්ද යන්න තීරණය කළ යුතු බවයි. මේ අවස්ථාවේදී ජනාධිපතිනිය විසින් පැවැති මැතිවරණයේ බහුතරය දිනාගත් ප්‍රතිවිරුද්ධ දේශපාලන කණ්ඩායමකින් පුද්ගලයකු අගමැති ලෙස පත් කිරීමට තීරණය කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වගන්තිය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව ජනාධිපති මන්දිරයේදී ජනරජ මුද්‍රාව යටතේ අගමැති පත් කිරීමට ඇය තීරණය කර ඇත.

නිල උත්සවයක් ජනාධිපති නිල මන්දිරයේ පැවැත්වීමට තීරණය කර තිබියදී එය නිල උත්සවයක් නොවෙතත් සහ සමහරක් මාධ්‍ය කණ්ඩායම් ඊට පැමිණීමත් ජනාධිපතිට වැළැක්විය හැකිද? මෙම තත්ත්වය අධිකරණ විමර්ශනයට භාජනය කළ හැකි පරිදි ආරක්ෂක හේතු මත සියලුම මාධ්‍ය කණ්ඩායම් මත වූ පොදු තහනමක් වූවා නම් තත්ත්වය වෙනස්විය හැකිව තිබිණි. මෙහිදී, කෙසේ නමුත්, මෙවැනි විත්ති වාචකයක් ගෙන එන ලදී. මීට ප්‍රතිවිරුද්ධව පැහැදිලි අරමුණක් රහිත වූ ජනාධිපතිගේ නිර්දේශය අදාළ කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන හේතුව ලෙස දක්වන ලදී.[27]

---

[27] මෙම තීරණය හා සමානුපාතික තීරණයක් ලබා දෙමින් ශිරාණි තිලකවර්ධන විනිසුරුවරිය පවසා සිටියේ මහජන සහ නිල කාරණා හා සම්බන්ධව තීරණ ගැනීමේදී පුද්ගලික ප්‍රියතාවන් දැක්වීම යටපත් කළ යුතු බවයි. මෙය අත්‍යාවශ්‍යයෙන්ම ප්‍රමාණාත්මක ලෙස සැලකිය යුතු තීරණ සම්බන්ධයෙන් පමණක් නොව තීරණ ගැනීමේ සමස්ත ක්‍රියාවලියටම සම්බන්ධ විය යුතුය. දිසානායක විනිසුරු එකඟ නොවෙමින් පවසා සිටියේ රජයේ දේපළ සහ පොදු ස්ථාන එකිනෙකට සමාන කළ නොහැකි බවත්, රජයට අයිති දේපළ රජයේ වන නමුත් පොදු ස්ථාන ඒ ගණයට නොවැටේ. රාජ්‍ය නායකයාගේ නිල නිවස පොදු ස්ථානයක් නොවන බවත් එම නිසා එයට ප්‍රවේශ වීමේ අයිතියක් නොමැති බවත්ය.

<u>ජනාධිපති විනිර්මුක්තියේ සීමාවන් මත දක්වන ලද තීරණය</u>

සුවිශේෂී ලෙස බහුතර විනිසුරු මතය තීරණය කරන ලද්දේ ජනාධිපතිගේ හුදු නිර්දේශයක් පමණක් මත අන් අය ගන්නා ලද තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල නොවන බව පෙන්වීමට ප්‍රමාණවත් නොවන බවයි. මතු දක්වන ලද නඩුව අනුගමනය කරමින්,[28] ජනාධිපතිගේ නිර්දේශය ඊට පහළින් ඉන්නා වූ අයගේ නීති විරෝධී වැඩ උදෙසා විත්ති වාචකයක් නොවන බව තීරණය විය.

> සෙවරී රාජ්‍යයක රාජ්‍ය නායකයකු, ඔහුගේ යටතේ සිටින අය ප්‍රකෝපකාරී ලෙස ක්‍රියා කළද අභිමානුසාරී ලෙස එම පුද්ගලයාට ක්‍රියා කළ නොහැක. නායකයන් පොදු මනුෂ්‍යයන්ය. ඔවුන් තමාගේ සගයන් විසින් බලය සහ වරප්‍රසාද ලබාදෙන ලද පුද්ගලයන්ය. මෙම බලය මෙම සගයන්ගේ අගතිය උදෙසා යොදා ගත නොහැක.

උස්හෙට්ටිගේ නිහාල් පෙරේරා සහ අනිකුත් අය එදිරිව පොලිස්පති සහ අනිකුත් අය[29]

ජාඇල ප්‍රාදේශීය සභාවේ පොදු පෙරමුණේ සාමාජිකයන් වූ පෙත්සම්කරුවන් ස්වකීය අයිතිවාසිකම් වන සමානාත්මතාවයේ සහ

---

[28] අධිකරණය මෙහිදී *විජුවලිංගම් සහ අනිකුත් අය එදිරිව ලියනගේ සහ තවත් අය* (අංක. 01) පූර්ණ විනිසුරු මඩුල්ලක් සහිතව ලබා දෙන ලද තීරණය, (1983), 1 ශ්‍රී.නී.වා. 203 පිටු 204 ශර්වානන්ද විනිසුරුගේ තීරණයට සහ *විජේසූරිය එදිරිව රජය* 77 න.නී.වා. 25 පිටු 56 යන තීරණයට අවධානය යොමු කරන ලදී. මේ සම්බන්ධයෙන් තවදුරටත් බලන්න, *කරුණාතිලක එදිරිව දිසානායක* (1999)1 ශ්‍රී.නී.වා. 157 සහ *සේනසිංහ එදිරිව කරුණාතිලක*, ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 431/2001 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්.

[29] ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 93/2002, 2004.01.28 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්. ප්‍රනාන්දු විනිසුරු සහ විග්නේස්වරන් විනිසුරු එකඟ වෙමින් ටී.බී. වීරසූරිය විනිසුරු විසින් ලබා දෙන ලද තීරණය, මෙම කාලය සඳහා තවදුරටත් බලන්න අමීර් ඉස්මයිල් විනිසුරු සහ එච්.එස්. යාපා විනිසුරු එකඟ වෙමින් අග විනිසුරු සරත් එන්. සිල්වා විසින් ලබා දෙන ලද තීරණය - *බී.ඒ. තිලකරත්න එදිරිව එම්. එඩ්වින් අල්විස්, සභාපති දිවුලපිටිය ප්‍රාදේශීය සභාව සහ අනිකුත් අය* - දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති සහ පොලිසිය එක්ව බලහත්කාරයෙන් ත්‍රිරෝද රථ රියදුරකු ස්වකීය රථය කුලියට භාවිතයට දීම වැළැක්වීම සහ ඔහුගේ බදු බලපත්‍රය සහ රක්ෂණ සහතිකය ඉවත් කිරීම මත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව පිළිගෙන ඇති නීත්‍යානුකූල රැකියාවක් කිරීමේ අයිතිය (ව්‍යවස්ථා 14(1)(උ)) උල්ලංඝණය වූ බව අධිකරණය තීරණය කරන ලදී.

වෙනස් කොට නොදැක්වීමේ අයිතිය, අදහස් ප්‍රකාශනයේ නිදහස, සාමකාමී ලෙස රැස්වීමේ සහ සමාගමේ නිදහස ප්‍රධාන විපක්ෂය වූ එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් විසින්, 2001.12.21 වන දින පැවැත්වීමට නියමිත වූ එහෙත් පසුව 2001.12.31, 2001.01.11 සහ 2001.01.22 කල් දමන ලද ප්‍රාදේශීය සභාවේ 57 වැනි මාසික රැස්වීමට සහභාගි වීම පොලිසිය සමඟ එක්ව වැළැක්වීමෙන් කඩ වූ බවට ප්‍රකාශ කරන ලදී. 2001.01.22 පැවැත්වීමට නියමිත වූ රැස්වීමට 3 වන පෙත්සම්කරු සහභාගි වීමට තැත් කිරීමේදී එම පුද්ගලයා පහරදීමට ලක් විය.

වගඋත්තරකරුවන් පවසා සිටියේ තම හැසිරීම පෙත්සම්කාර පාර්ශවය විසින් ප්‍රදේශයේ මස්හල් වෙන්දේසි කිරීමේ කාර්ය පටිපාටියේ දැක්වූ අසාධාරණ ක්‍රියාවන්ට ප්‍රතිචාරයක් ලෙස තමන් එසේ කරන ලද බවයි.

සාක්ෂි විමසා බැලීමේදී අධිකරණය මෙම තර්කය නොපිළිගත්තා ලදී. වෙන්දේසි කටයුතු මෙහෙයවීමේ කමිටුව පොදු පෙරමුණේ සහ එක්සත් ජාතික පක්ෂය යන පක්ෂ දෙකේම සාමාජිකයන්ගෙන් සමන්විත වූ අතර අසාධාරණ ටෙන්ඩර් පටිපාටිය සම්බන්ධයෙන් පොලිසියට කිසිදු පැමිණිල්ලක් ද නොකර තිබිණි. කමිටුවේ සාමාජිකයන් ද මේ සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් ඉදිරිපත් කර නොතිබිණි. අධිකරණ සොයා ගැනීම අනුව පහරදීමට හේතු වූයේ ටෙන්ඩර් පටිපාටිය නොව 2001 මහ මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය ජය ගැනීමයි. අධිකරණය තීරණය කළේ වගඋත්තරකාර පොලිස් නිලධාරීන් පෙත්සම්කරුවන්ට ප්‍රාදේශීය සභාවේ කටයුතු වලට සහභාගි වීමට සහ ඔවුනට ආරක්ෂාව සපයා දීමට නොහැකි වීම සම්බන්ධයෙන් වගකිව යුතු බවයි. විපක්ෂ ප්‍රාදේශීය සභා නිලධාරීන් සහ පොලිසිය අතර සම්බන්ධතාවයක් ඔප්පු නොකරන ලද හෙයින් විපක්ෂ ප්‍රාදේශීය සභා නිලධාරීන් වගකීමට භාජනය නොවන ලදී.

3. සමානාත්මතාවයේ අයිතිය සම්බන්ධයෙන් අධිකරණයේ ප්‍රතික්‍රියා

3.1 ඉඩම් අත්පත් කරගැනීම

හෙදර් තෙරේස් මුන්ඩි එදිරිව මධ්‍යම පරිසර අධිකාරිය සහ අනිකුත් අය[30]

දකුණු අධිවේගී මාර්ගය ඉදිකිරීම උදෙසා අක්මීමන සහ බණ්ඩාරගම ප්‍රදේශයේ ස්වකීය ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධයෙන් අභියාචනා අධිකරණයට ඉදිරිපත් කරන ලද රිට් පෙත්සම් ප්‍රතික්ෂේප කිරීම හේතු කොට ගෙන මෙම අභියාචනාව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලදී. අභියාචනා අධිකරණය විසින් 2000 අංක. 53 සහ 1988 අංක. 56 දරණ සංශෝධිත පනත් යටතේ සංශෝධිත 1980 අංක. 47 දරණ ජාතික පාරිසරික පනත ප්‍රකාර, මාර්ග සංවර්ධන අධිකාරිය ඉඩම් අයිතිකරුවන්ට නොදන්වා අධිවේගී මාර්ගයේ මාර්ග පථය වෙනස් කිරීමට ගත් තීරණය, නෛතිකව නිවැරදි නොවන බව දක්වමින් මෙම අභියාචනාව ගොනු කරන ලදී.

අධිවේගී මාර්ගයේ පළමු වරට හඳුනාගත් හා දෙවන වරට හඳුනාගත් මාර්ග දෙක, පාරිසරික අධ්‍යයනයන් ඔස්සේ නෛතික ප්‍රකාරව හඳුනාගත් මාර්ග විය. අභියාචනකරුවන් විසින් අවසන් වරට හඳුනා ගත්, පාරිසරික තක්සේරු බලපෑම් වාර්තාවක් මත පදනම් නොවන, තුන්වන මාර්ග පද්ධතිය ප්‍රශ්නයට භාජනය කරන ලදී.

රජය තර්ක කර සිටියේ මධ්‍යම පරිසර අධිකාරිය මගින් අවසන් වරට හඳුනාගත් මාර්ග පථය නිර්දේශ කළ බවත් එය දෙවන වරට හඳුනාගත් මාර්ග පථය වේරැස් ගඟ/බොල්ගොඩ වැව තෙත් බිම් ප්‍රදේශය මඟ හැරීම සඳහා ප්‍රථම වරට හඳුනාගත් මාර්ග පථයට වෙනස් කළ යුතු වූ බවත්ය. අභියාචනාකරුවන් පවසා සිටියේ මෙම වෙනස් කිරීම, මධ්‍යම

[30] *හෙදර් මුන්ඩි එදිරිව මධ්‍යම පරිසර අධිකාරිය සහ අනිකුත් අය*, අභියාචනාධිකරණ අංක. 58/03, 2004.01.20 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්, ඉස්මයිල් විනිසුරු සහ විග්නේස්වරන් විනිසුරු එකඟ වෙමින් මාර්ක් ප්‍රනාන්දු විනිසුරු ලබා දෙන ලද තීරණය, පිටු අංක. 13 පොදු භාර සිද්ධාන්තයේ සීමා පිළිබඳ අධිකරණයේ මතවාදයන් උදෙසා තවදුරටත් බලන්න. *පෙරේරා එදිරිව පතිරණ*, ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් අංක. 453/97, දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්. *සේරසිංහ එදිරිව කරුණාතිලක* (2003)1 ශ්‍රී.නී.වා. 172 සහ *තවනීදන් එදිරිව දිසානායක* (2003)1 ශ්‍රී.නී.වා. 75.

පරිසර අධිකාරිය මගින් නිර්දේශ කරන ලද මාර්ගයට වඩා වෙනස් වන බවත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් බලපෑමට ලක් වූ දේපළ අයිතිකරුවන් එම බලපෑම ගැන කිසිවක් දැන නොසිටි බවත්ය.

අභියාචනාකරුවන්ගේ වාසියට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය ලබා දුන් නමුත් වන්දි ලබා දීමේදී දේපළ හිමිකරුවන්ට ප්‍රචාරණාත්මක දැනුම් දීමක් ලබා නොදී සිටීම සම්බන්ධයෙන් පමණක්ම සීමා කරන ලදී. අධිකරණයේ තීරණය කාරණාවන් දෙකක් මත වැදගත් වේ. පළමුව පොදු භාර සිද්ධාන්තය මත ලබා දෙන ලද තීරණයයි. මේ යටතේ පොදු අධිකාරීන් මත පැවරී ඇති බලය අවසානාත්මක නොවන බවත් එය මහජන භාරයක් වන බවත්, එය එහි අරමුණු උදෙසා පමණක් භාවිතා කළ යුතු බවත්, මෙම භාවිතය අධිකරණ විමර්ශනයට භාජනය වන බවත්ය. මේ යටතේ විධායක බලය අධිකරණ විමර්ශනයට යටත් වන බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය ප්‍රකාර සමානාත්මතාවයේ අයිතිය සියලු දෙනාටම හිමි විය යුතු බවත්ය. නීතියේ රැකවරණය යන්නට ප්‍රමාණාත්මක දැනුම් දීමක් ලැබීමත්, කරුණු කියා පෑමට අවස්ථාවක් හිමි වීමත් ඇතුළත් වේ. පොදුභාර සිද්ධාන්තයට එරෙහි වූ හෙයින් මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය කරන්නා වූ පරිපාලන ක්‍රියා සීමා ඉක්මවා ගිය බලය අයුතු ලෙස භාවිතයක් වන අතර එම නිසාවෙන් ඒවා ශූන්‍ය සහ අවලංගු වේ.

දෙවනුව, අභියාචනාධිකරණයේ ඉදිරිපත් වූ නඩුවක් හෙයින් මෙහිදී අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සඳහන් නොවිය යුතුය. කෙසේ නමුත් මෙහිදී, වූයේ තමන්ගේ ඉඩම් වලට බලපෑමක් නොවන ලෙස මාර්ග පථය වෙනස් වීමෙන් තමන්ට කරුණු කියා පෑමට අවස්ථාවක් ලබා දීම උදෙසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව යටතේ අභියාචකයන්ට හිමි අයිතිය කියා පෑම උදෙසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(3) උපයෝගී කර ගනිමින් එම අයිතිය උල්ලංඝණය වීමට පමණක් වන්දි ගෙවීමයි. 12(1) සියලු දෙනා නීතිය ඉදිරියේ සමාන බව සහ සියලු දෙනාට නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතු බව පිළිගනී.

සුවිශේෂයෙන්ම, මාර්ක් ප්‍රනාන්දු විනිසුරු පවසා සිටියේ:

(අ) අක්මීමන සහ බණ්ඩාරගම ප්‍රදේශයේදී මාර්ගය වෙන් කිරීම ජාතික පාරිසරික පනතේ 23ඉඉ රෙගුලාසි 17(i)(අ), සහ මධ්‍යම පරිසර අධිකාරියේ කොන්දේසි III ප්‍රකාර වෙනස්

වීමක් සංයුක්ත කරන බවයි. වෙනස්වීම් ප්‍රමාණාත්මක වන අතර, අභියාචනාධිකරණය මහින් පත් කරන ලද කමිටුවක් ඔස්සේ බලපෑමට ලක් වූ ප්‍රදේශ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කළ යුතු අතර, ඒ තුළින් සොයා ගත්තේ මෙම තත්ත්වය අභියාචකයන් මත සහ ඔවුනගේ දේපළ වලට විශේෂ බලපෑමක් කරන බවත්, මෙම වෙන්වීම මාර්ග පථය සම්බන්ධයෙන් වූ වෙනස් වීම වන අතර මෙම ව්‍යාපෘතියේ මූලිකතම අංගය මෙය වන අතර ව්‍යාපෘතිය ඇරඹීමට පෙර කරන ලද යෝජිත වෙනස් වීම් වේ.

(ආ) බලපෑමට ලක් වූ ගම්වැසියන්, බලපෑමට ලක් වූ පුද්ගලයන් වශයෙන්, දැනුම් දීමකට හිමිකම් ලබන අතර, ස්වාභාවික යුක්ති මූලධර්ම ප්‍රකාර කරුණු කියා පෑමකට හිමිකම ලබයි. ඔවුනගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල සමානාත්මතාවයේ අයිතිය හේතුකොට ගෙන පසු දැනුම් දීමකට සහ කරුණු කියා පෑමකට හිමිකම් ලබන බවයි. අදාළ මාර්ග වෙනස්කම් ප්‍රාථමික වෙනස්කමක් නොවන විටදීත් ඔහුට ප්‍රමාණාත්මක බලපෑම් එල්ල වන විටත් මෙම අයිතිය හිමිවේ.

(ඇ) ජාතික පාරිසරික පනතේ වගන්ති - 23ඉඉ සහ රෙගුලාසි 17(i)(අ) අනුව මාර්ග සංවර්ධන අධිකාරිය අදාළ වෙනස්කම සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියට දැනුම් දී අවසර ලබා ගත යුතු අතර මෙය මධ්‍යම පරිසර අධිකාරී කොන්දේසි III මහින් ද නියමිත කටයුත්තකි. 17(ii) රෙගුලාසි ප්‍රකාර අතිරේක වාර්තාවක් අවශ්‍ය වේ.

(ඈ) අරමුණු සහ පටිපාටිය ප්‍රකාර, මධ්‍යම පරිසර අධිකාරිය විසින් මූලික මාර්ග පථ දෙක මෙන් අවසන් එකද සලකා බැලීමේ යුතුකමක් ඇත. මෙය මහජන භාරය යටතේ පැවරෙන යුතුකමකි. මෙය අනුන්ට පැවරිය නොහැකි යුතුකමකි. 1999 වසරේ මධ්‍යම පරිසර අධිකාරිය මහින් ලබා දෙන ලද අවසරය වෙනස් කළ නොහැකි අවසානාත්මක අවසර දීමක් නොවේ.

(ඉ) යම් විටක මධ්‍යම පරිසර අධිකාරියේ IX කොන්දේසිය අවශ්‍ය කරන විටදී අවසාන පථය පළමු පථයට වෙනස් කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ අවසරයට පටහැනිව යාමකි.

අභියාචනාධිකරණයේ තීරණය විශ්ලේෂණය කරමින් ප්‍රනාන්දු විනිසුරු තීරණය කළේ යම් කාරණාවන් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය එකඟ වන අතර (ගම්වැසියන්ගේ අයිතිවාසිකම් වලට බලපෑම් වී ඇති බව, ඔවුන්ගේ කැප කිරීම නියි ලෙස හඳුනාගත නොහැකි බව, අධිකරණය ඔවුන්ගේ අයිතිවාසිකම් මත වන බලපෑම අවම කළ යුතු බව) කාරණාවන් දෙකක් අතරින් එකක් පමණක් තීරණය කිරීමට එම අධිකරණයට සිදු වී ඇති බවයි. එනම්, සහනය ප්‍රදානය කිරීම හෝ පෙත්සම ඉවත දැමීමයි. මෙම තත්ත්වය රීට් ආඥාවක් වෙතින් යවන මූලික මිනිස් අයිතිවාසිකම් වල බලපෑම තීරණය කොට ඇත. එම හේතුන්:

(අ) වියදම සහ වියදමක් ඇතුළත් වන කල් දැමීම හේතු කොටගෙන අවස්ථා පථය වෙනස් නොකළ යුතු බවට අභියාචනාධිකරණය තීරණය කළ යුතුව තිබිණි. මේ මත, රජය වෙනුවෙන් තීරණය ලබා දීමට නම් ස්වකීය අයිතීන් උල්ලංඝණය වෙනුවෙන් ගම්වැසියන්ට වන්දි ලබා දීම සාධාරණ වේ.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(3) ප්‍රකාර මෙය ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කළේ නම් පාරිසරික තක්සේරු බලපෑම් වාර්තාවක් වෙනුවට ගම්වැසියන්ට වන්දි ගෙවීමට නියම කළ හැකිව තිබිණි. මේ අනුව වන්දි නියම කිරීම නිවැරදිය.

මෙම නඩුවේ තීරණය පොදු භාර සිද්ධාන්තය මත පදනම්ව සහ අභියාචනාධිකරණයේ රීට් අධිකරණමය බලය සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික මිනිස් අයිතිවාසිකම් හා සම්බන්ධව යා කිරීමෙන් වැදගත් නඩුවක් බවට පත්වේ. කෙසේ නමුත්, ගම්වැසියන්ගේ ඉල්ලීම වූ මානව-පරිසර බලපෑම් වාර්තාවක් සකස් කරන ලෙස කරන ලද ඉල්ලීම ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ඉටු නොකරන ලදී.

තවදුරටත්, මෙවැනි නිර්දේශයක් ලබා දීම වෙනුවට අධිකරණය ස්වභාවික යුක්ති මූලධර්මයන්ට පමණක් සිය තීරණය සීමා කරන ලදී. මේ අනුව තමන්ගේ ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් අදාළ තොරතුරු හෙළි නොකිරීම මත ඇති වූ අයිතිවාසිකම් කඩවීම ගැන අධිකරණය කිසිවක් ප්‍රකාශ නොකරන ලදී.

3.2 නීතියට අනුව ක්‍රියා කිරීමට මහජන නිලධාරීන්ට වන යුතුකම

ෆාමින් එදිරිව විජේසිරි, (විභාග කොමසාරිස් සහ තවත් අය)[31] යන නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය මහින්, ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 13 වගන්තියේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය, රාජ්‍ය වගකීම් යටතේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(2)(ඌ) යටතේ පිළිගෙන ඇති වගකීම අවධාරණය කරමින් ප්‍රකාශ කර සිටියේ විභාගයේ ගරුත්වය ආරක්ෂා කිරීමට නියමිත ආරක්ෂිත විධි විධාන ඔස්සේ විභාගය පැවැත්විය යුතු බවත්, පිළිතුරු පත්‍රිකා අනිසි ලෙස භාවිතා නොකළ යුතු බවත් එවැනි චෝදනා වේ නම් එය නිසි ලෙස විභාග කළ යුතු බවත්ය. මෙම අවස්ථාවේදී, 2002 අප්‍රේල්-මැයි උසස් පෙළ විභාගයට පෙනී සිටි පෙත්සම්කාරියගේ පිළිතුරු පත්‍රයෙන් කොළ දෙකක් ඉරා දැමීමත් පසුව ඒවා ඇයගේ පියා වෙත යැවීම මත සිදුවූ 12(1) වගන්තිය උල්ලංඝණය සම්බන්ධයෙන් 3 වන වගඋත්තරකාර නියෝජ්‍ය විභාග කොමසාරිස් මහින් කිසිදු පරීක්ෂණයක් පවත්වා නැත.

3.3 සුජාතමය අපේක්ෂාව පිළිබඳ සිද්ධාන්තය

2001/2002 අධ්‍යයන වසර උදෙසා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC) මහින් නිකුත් කරන ලද පොත් පිංචක් මත වූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙහි ප්‍රවේශ ප්‍රතිපත්ති වන විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට සිසුන් ඇතුළත් කරගැනීම සම්බන්ධයෙන් තීරණ දෙකක් 2004 වසර තුළදී ලබා දෙන ලදී.[32] පෙත්සම්කරුවන් තර්ක කර සිටියේ විශ්ව විද්‍යාලයට ඇතුළත් කරන අවම ලකුණු නිර්ණය කිරීමේදී අදාළ ප්‍රතිපත්ති අදාළ කරගැනීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම අසමත් වී ඇති බවත් ශිෂ්‍යයන්ට හිමි විය යුතු ප්‍රතිපත්ති තමන්ට අහිමි වීම මත තමන්ගේ සුජාතමය අපේක්ෂාව බිඳී ගිය බවයි. අදාළ වසරේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම ශිෂ්‍යයන් 900 වෛද්‍ය විද්‍යාලයට

---

[31] (2004)1 ශ්‍රී.නි.වා. 99, විග්නේස්වරන් සහ වීරසූරිය විනිසුරුවරුන් එකඟ වෙමින් මාර්ක් ප්‍රනාන්දු විනිසුරු විසින් ලබා දෙන ලද තීරණය.

[32] ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 280/2001, *අනුෂිකා මාධවී ජයතිලක සහ තවත් අය එදිරිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම සහ තවත් අය*, ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 307/2001, 2004.10.25 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්, නිහාල් ජයසිංහ සහ රාජා ප්‍රනාන්දු විනිසුරන් එකඟ වෙමින් (ආචාර්ය) ශිරාණි බණ්ඩාරනායක විනිසුරුවරිය විසින් ලබා දෙන ලද තීරණය.

ඇතුළත් කරගත යුතු බවත් (ස්වකීය ප්‍රතිපත්තිය ප්‍රකාර) තමන් විසින් ඇතුළත් කරගත් සිද්ධාන්තයක් මත 800 ක් පමණක් ඇතුළත් කරගැනීමෙන් පෙත්සම්කරුවාට වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වීම අහිමි වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) උල්ලංඝණය වීමකි.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම ප්‍රකාශ කර සිටියේ සිසුන් 900 ඇතුළත් කරගත නොහැකි වූයේ උතුරු නැගෙනහිර පවතින තත්ත්වය මත යාපන විශ්ව විද්‍යාලයට සිසුන් යැවීමට නොහැකි වීම මත බවයි. මෙම තත්ත්වය ප්‍රතික්ෂේප කරමින් අධිකරණය පවසා සිටියේ තම ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරන අවස්ථාවේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මෙය දැන සිටිය යුතු බවත්, අතීතයට බලපාන පරිදි මෙය දැන් වෙනස් කළ නොහැකි බවත්ය. මෙම තීරණය සුජාතමය ආරක්ෂාව අදාළ කර ගැනීම ප්‍රතික්ෂේප කරන ලද මෙම කාල වකවානු තුළදීම තීරණය වූ *එච්. ආර්. ද සිල්වා එදිරිව කොළඹ මහ නගර සභාව සහ තවත් අය සහ එම්. එන්. ශ්‍රී ස්කන්දරාජා එදිරිව ලේකම්, සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය*[33] යන නඩු සමඟ සසඳා බැලිය යුතුය. මුල් සඳහන් නඩුවේදී කොළඹ මහ නගර සභාවේ නියෝජ්‍ය කොමසාරිස් විසින් තමා නාගරික කොමසාරිස් බවට පත් කළ යුතු බවට තමාට සුජාතමය අපේක්ෂාවක් ඇති බවට ප්‍රකාශ කරමින් ගොනු කරන ලද නඩුවේදි ශ්‍රේෂ්ඨාධිකරණය එය ප්‍රතික්ෂේප කරමින් පවසා සිටියේ ජ්‍යෙෂ්ඨත්වය හෝ ස්වකීය සුදුසුකම් මත ඔහුට එවැනි අයිතිවාසිකමක් කියා සිටිය නොහැකි බවයි. අධිකරණ මතයට පදනම් වූ තවත් කරුණක් වූයේ පෙත්සම්කරු මධ්‍යම රජයේ රාජ්‍ය සේවා කොමිසම මඟින් ස්ථිරවම මුදා නොමැති බවත් පළාත් රාජ්‍ය සේවයට අයත් මහ නගර සභාවේ තනතුරත් ඔහුට දැරිය නොහැකි බවත්ය.

මේ හා සමාන පසුව සඳහන් නඩුවේදී ප්‍රසව විද්‍යාව සහ කාන්තා කායික විද්‍යාව පිළිබඳ උපදේශකවරයකු තමා පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ ප්‍රසව විද්‍යාව සහ කාන්තා කායික විද්‍යාව පිළිබඳව

---

[33] ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 209/2001, 2004.10.21 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්, අගවිනිසුරු සරත් එන්. ද සිල්වා සහ විග්නේස්වරන් විනිසුරු එකඟ වෙමින් ශිරාණි තිලකවර්ධන විනිසුරුවරිය විසින් ලබා දෙන ලද තීරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 490/2000, 2004.10.25 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්, නිහාල් ජයසිංහ විනිසුරු සහ රාජා ප්‍රනාන්දු විනිසුරු එකඟ වෙමින් (ආචාර්ය) ශිරාණි බණ්ඩාරනායක විනිසුරුවරිය විසින් ලබා දෙන ලද තීරණය.

උපදේශකවරයකු බවට පත් නොකිරීම වගඋත්තරකරුවන් විසින් අසාධාරණ ලෙස පැහැර හැර ඇති බවට කරුණු ඉදිරිපත් කර සිටි අවස්ථාවේදී අධිකරණය පවසා සිටියේ අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී අතින් ලියන ලද අසම්පූර්ණ අයදුම්පතක් තුළින්, තම අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී මණ්ඩල සහතිකය සඳහා වන අයිතිය එහි ප්‍රකාශ නොකළ හෙයින් ඒ සඳහා පෙත්සම්කරුට සුජාතමය අයිතියක් නොමැති බවයි.

මෙම නඩු තීරණයන් දෙකේදීම පෙත්සම්කරුවන් දෙදෙනාම පෙත්සම් ඉදිරිපත් කරන විට තමන් අයදුම් කරන ලද තනතුරෙහි වැඩ බලමින් සිටියහ. මෙකී කරුණ අතිකුත් අදාළ වෙනත් කරුණු හා සැසඳීමේදී නොසැලකිය යුතු තත්ත්වයකට භාජනය වූ බැවින් අදාළ සහනය ලබාගැනීමට නොහැකි විය.[34]

4. 2004 වසර තුළ ආගම් වෙනස් කිරීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දෙන ලද තීරණ

මීට පෙර වසර වලදී ආගමික තත්ත්වයන් නියම කිරීම සම්බන්ධයෙන් අදාළ වන පනත් කෙටුම්පත්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් මත ප්‍රකාශ කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටිය විටදී ශ්‍රේෂ්ඨාධිකරණය එකී ක්‍රියා මාර්ගය තුළදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වෙනි වගන්තිය, එනම් ජනරජය තුළ බුද්ධ ධර්මයට වඩා ප්‍රමුඛස්ථානයක් ලබා දෙන්නා වූ වගන්තිය තුළ අඩංගු වන්නා වූ මූලධර්ම ගෙන හැර දක්වන ලදී. උදාහරණයක් වශයෙන් *"Provincial of the Teaching Sisters of the Holy Cross of the Third Order of Saint Francis in Menzinger of Sri Lanka (Incorporation)*[35] පිළිබඳ පනත් කෙටුම්පතේ හිදී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරන ලද්දේ පාර්ලිමේන්තු

---

[34] තවදුරටත් බලන්න අමුන්පුර සීලවංස හිමි සහ අනිකුත් අය එදිරිව අතිරේක ලේකම්, රාජ්‍ය සේවා කොමිසම් සභාව සහ අනිකුත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුපත් අංක. 575/2003, 2004.11.23 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්, සහ අබ්දුල් මුතාලිෆ් ෆාරුක් එදිරිව සභාපති, රාජ්‍ය සේවා කොමිසම, ඌව පළාත සහ අනිත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් අංක. 508/2002, 2004.10.25 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්, නීති විරෝධීභාවය මත පදනම්ව අයිතිවාසිකමක් තහවුරු කළ නොහැකිය යන පොදු වශයෙන් පිළිගත් සිද්ධාන්තයෙහි අධිකරණ විග්‍රය සම්බන්ධයෙන් මෙම තීරණ ඉතා වැදගත් වේ.

[35] ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ අංක. 19/2003 (ආචාර්ය) ශිරාණි බණ්ඩාරනායක, එච්. එස්. යාපා සහ නිහාල් ජයසිංහ යන අයගෙන් සැදුම්ලත් විනිසුරු මණ්ඩලය.

මන්ත්‍රීවරයකු විසින් රෝමානු කතෝලික සම්ප්‍රදායක් පිහිටුවීම සඳහා ඉදිරිපත් කරන ලද මෙම පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සිතීමේ, හෘද සාක්ෂියේ සහ ආගමික නිදහස තහවුරු කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වෙනි වගන්තියට පමණක් නොව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වෙනි වගන්තියටත් පටහැනි බවයි. විනිසුරුවන් දක්වන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යමකුගේ ආගම් පැතිරීම, ඇදහීම සහ ඒ මත ක්‍රියා කිරීම සහතික කරන මුත් මෙහිදී බුද්ධ ධර්මයේ සහ බුද්ධ ශාසනයේ පැවැත්මට හානි කරන හෙයින් ක්‍රිස්තියානි ධර්මය ප්‍රවර්ධනය සහ පැතිරීමට අවසර දිය නොහැකි බවයි.[36]

සියලු පුරවැසියන්ට තනිව හෝ අන් අය සමඟ එකතුව පුද්ගලිකව හෝ ප්‍රසිද්ධියේ තමන්ගේ ආගම හෝ විශ්වාසය වැඳීමට, ඇදහීමට පුරුදු කිරීම හෝ ඉගැන්වීමට ඇති අයිතිය ලබා දෙන 14(1)(ඉ) වගන්තියේ බලපෑම තියමාකාරයෙන්ම මෙකී තීරණයන් හිදී සලකා බලන ලද්දේ ද යන්න අතීතයට බලපාන ආකාරයෙන් සැලකිල්ලට ගත යුතු කරුණකි. සලකා බලන වසර තුළදී ආගම් අතර පැවති සුහදමය වාතාවරණය උණුසුම් සහගත වූ වසරක් විය. මෙය නෛතික ක්‍රියාදාමය තුළ ද ප්‍රවර්ධනය විය. වසර මැදදී "බලහත්කාරයෙන් වෙනත් ආගමකට හැරවීම" සම්බන්ධයෙන් වූ පනත් කෙටුම්පතක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ මත දැක්වීමට ශ්‍රේෂ්ඨාධිකරණයට සිදුවිය. වෙනත් කාරණා අතර මෙම පනත් කෙටුම්පතේ බලාපොරොත්තු සහ ඉලක්ක අතර එක් ඉලක්කයක් වූයේ එක් ආගමකින් වෙනත් ආගමකට ඊට සම්බන්ධව හෝ ඊට අදාළ වන වෙනත් කරුණු වලදී යමෙකු බලහත්කාරයෙන් හෝ අල්ලසක් මගින් හෝ වංචනික ක්‍රියාවක් මගින් මාරු කිරීම තහනම් කිරීමයි.[37] පනත් කෙටුම්පතේ ආණ්ඩුක්‍රම

---

36 ක්‍රිස්තියානි සහනය දොරටුව යාඥා කේන්ද්‍රය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ අංක. 2/2001, අග විනිසුරු සරත් නන්ද සිල්වා සහ ශිරානි බණ්ඩාරනායක සහ අමීර් ඉස්මයිල් ගෙන් සැදුම්ලත් විනිසුරු මඩුල්ලකි. විනිසුරන් තීරණය කරනු ලැබුයේ අතිකුත් අරමුණු අතර පුද්ගලයන්ට ස්වයං රැකියා සහ අතිකුත් රැකියා අවස්ථා ලබාදීම අරමුණු කරගත් පනත් කෙටුම්පතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වෙනි වගන්තියට පටහැනි බවයි. සිතීමේ, හෘද සාක්ෂියේ සහ ආගමේ නිදහස හා සම්බන්ධ සංවේදීත්වය සැලකිල්ලට ගනිමින් එය වාණිජමය හා ආර්ථික කටයුතු වලට සම්බන්ධ කිරීම ඇදහීම හා එකට ගත් විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නියමයන්ට පටහැනි වන බව අධිකරණය පවසන ලදී. *New Wine Harvest Ministries (Incorporation)* නඩුව සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දෙස බලන්න. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක. 2/2003 - මෙහිදී මේ හා සමාන නඩු තීන්දුවක් අග විනිසුරු එස්.එන්. සිල්වා සහ විනිසුරු එච්.එස්. යාපා සහ ටී.බී. වීරසූරිය විසින් ලබා දෙන ලදී.

37 ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ අංක. 2-22/2004 ටී.බී. වීරසූරිය, එන්.ඊ. දිසානායක සහ රාජා ප්‍රනාන්දු යන විනිසුරුවන්ගෙන් සැදුම්ලත් විනිසුරු මඩුල්ලකි.

ව්‍යවස්ථානුකූලභාවය අභියෝග කරමින් පෙත්සම් විසි එකක් ඉදිරිපත් වූ අතර, ඒවායේ ප්‍රාථමික පදනම වූයේ මෙම පනතේ වගන්තීන් වල පූර්ණ බලපෑම විශ්වාසය මත පදනම් වූ අවංකවම සිදුවන ආගම් වෙනස් කිරීම් වලටත් එමඟින් බලපෑමක් සිදුවිය හැකි බවයි.[38]

සිය තීරණයේදී, පනත් කෙටුම්පතට සහය ලබා දෙමින් ඉදිරිපත් වූ අන්තර්වාර පෙත්සම් විසි එක සමඟ මෙකී අභියෝගයන් සලකා බලමින් අධිකරණය මෙකී පනත් කෙටුම්පතේ සමහරක් ප්‍රතිපාදන නීතියට පටහැනි බවට තීරණය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී බවට තීරණය වූ වගන්ති අතර වූයේ වෙනස් කිරීම, වෙනස් කිරීමේ උත්සවය පවත්වන්නා සහ සාක්ෂිකරු ඒ බව ප්‍රාදේශීය ලේකම්ට දැනුම් දීමට අවශ්‍ය බව දැක්වූ 3(අ) සහ 3(ආ) (එම නිසාවෙන්ම ඒ බව ක්‍රියාත්මක කිරීමට අදාළ 4(ආ)) වගන්තීන්ය. මෙකී වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිතීමේ සහ හෘද සාක්ෂියේ නිදහස තහවුරු කරන 10 වන වගන්තියට පටහැනි බවට තීරණය විය. මෙකී වගන්තීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) වගන්තිය ප්‍රකාර විශේෂ බහුතරයක් මත සම්මත කිරීමට අවශ්‍ය වූ අතරම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 83(අ) ප්‍රකාර ජනමත විචාරණයකින් සම්මත කිරීම අවශ්‍ය විය.

පනත් කෙටුම්පතේ 5 වෙනි වගන්තිය, මෙකී වගන්තිය උල්ලංඝණය වීම සම්බන්ධයෙන් නීතිඥවරයකුගෙන් අමාත්‍යවරයා විසින් අවසර ලබා දෙන ලද පුද්ගලයකු ද ඇතුළත් වන සේ නිශ්චිත පුද්ගල කණ්ඩායමකට මහේස්ත්‍රාත් ඉදිරියේ නඩු පැවරීමට බලය ලබාදීම අත්තනෝමතික බව දක්වා අභියෝගයට ලක් කරන ලදී. මෙකී වගන්තිය 12(1) වගන්තිය උල්ලංඝණය කරන පදනම් විරහිත සහ අත්තනෝමතික බවට තීරණය විය. ඕනෑම අපරාධමය නඩු පැවරීමක් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 වගන්තිය ප්‍රකාර සිදුවිය යුතු බවත් නීතිපතිවරයාගේ ලිඛිත නිර්දේශයට යට විය යුතු බවටත් නිර්දේශ කරන ලදී.

නැවතත්, අමාත්‍යවරයාට පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සඳහා වන රීති හෝ රෙගුලාසි පැනවීමට බලය ලබා දෙන හය වැනි වගන්තිය ඉතා පුළුල් සහ අපැහැදිලි යන පදනම මත

[38] "බෞද්ධාගමිකයන් සහ බෞද්ධ නොවන අන්‍යාගමිකයන්ට බලය පෑමෙන්, අල්ලස් දීමෙන් හෝ වංචාවෙන් අන්‍යාගමකට හැරවීමට" යත්න දරන බවට වන සඳහන් කිරීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වගන්තිය සඳහන් කරමින් පනත් කෙටුම්පතේ පූර්විකාව සඳහන් විය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76(1) වගන්තිය උල්ලංඝණය කරන හෙයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී බවට තීරණය විය.[39]

පනත් කෙටුම්පතේ 8 වෙනි වගන්තිය අල්ලස් දීමනාව, බලය පෑම සහ වංචාව කුමක්ද යන්න නිර්වචනය කරන අර්ථනිරූපණ වගන්තියයි. මෙකී වගන්තිය "කිසිම පුද්ගලයකු ඍජුවම හෝ අන් ආකාරයකින් එක් ආගමකින් තවත් ආගමකට බලය පෑමෙන් හෝ අල්ලස් දීමෙන් හෝ වෙනත් වංචනික මාර්ගයකින් හැරවීමට හෝ හැරවීම තැත් කිරීම හෝ කිසිදු පුද්ගලයෙක් එවැනි හැරවීමකට ආධාර හෝ උදව් නොකළ යුතුය" බවට වන පනත් කෙටුම්පතේ දෙවන වගන්තිය හා බැඳේ. අධිකරණය දෙවන වගන්තියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමයභාවය පිළිගත් අතර තවදුරටත් අදහස් දක්වමින් කියා සිටියේ බලය පෑම සහ වංචනික ක්‍රියා මාර්ගය යන්න දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථනිරූපණය කර ඇති බැවින් පනත් කෙටුම්පතේ මෙය ඇතුළත් කිරීමෙන් විශේෂයෙන් කිසිවක් සිදු නොවන බවයි. කෙසේ නමුත් "අල්ලස් දීම"[40] ඇතුළත් කිරීම සම්බන්ධයෙන් අධිකරණය කිසිවක් නොපවසන ලද අතර මෙය බලහත්කාරයෙන් සිදු කරන මාරු කිරීම් උදෙසාම ප්‍රාථමික වශයෙන්ම හඳුන්වා දෙන ලද නව වචනයකි.

අර්ථනිරූපණ වගන්තිය පනත් කෙටුම්පතේ ප්‍රාථමික අරමුණු හා යාවෙන පරිදි අර්ථනිරූපණයට ඉඩ ලැබෙන සේ විශේෂ සංශෝධනයන් අධිකරණය විසින් නිර්දේශ කරන ලද මුත් එකී වගන්තිය එය පවතින ආකාරයෙන්ම නීති විරෝධී වන බවට අධිකරණය විසින් තීරණය නොකරන ලදී. මෙකී නිර්දේශයන් 8(අ) වගන්තියේ ඇතුළත් වූ පෙළඹවීම යන වචනයට පසුව සඳහන් වූ යම් පුද්ගලයකු එක් ආගමකින් තවත්

---

39 මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදනයේ සඳහන් වන්නේ පාර්ලිමේන්තුව ස්වකීය නීති සෑදීමේ බලය වෙන අයෙකු හෝ ආයතනයක් වෙත පැවරීම නොකළ යුතු බවයි.

40 'අල්ලස' යන්න 8(අ)(i) සහ (ii) ව්‍යවස්ථාවේ නිර්වචනය කරන ලද පරිදි ත්‍යාගයක් හෝ සන්තෘෂ්ටියක් ලබාදීමේ අරමුණ යමකු දිරිගැන්වීම, මුදල් හෝ වෙනත් භෞතික ලෙස හඳුනාගත හැකි ආකාරයේ දීමනාවක් දීම මුදල් හෝ වෙනත් ආකාරයේ දීමනාවක් දීම හෝ උසස් වීමක් ලබාදීම ඇතුළත් වේ. 8(ඇ) හි "බලය" යන්න නිර්වචනය කර ඇති ආකාරයට තර්ජනය, විධාව හෝ අනතුරු හෝ ඕනෑම ආකාරයක් සහ යම් ආගමක් විශ්වාසය හෝ ආගමක්, සම්බන්ධයෙන් අසතුට පළ කිරීම හෝ හෙළා දැකීම ඇතුළත් වන පරිදි බලය පෑම අදහස් වේ. 'වංචනික මාර්ගය' යන්නට 8(ඈ) හි සඳහන් පරිදි වැරදි ලෙස අර්ථනිරූපණය හෝ "වෙනත් ඕනෑම ආකාරයක් වංචනික ප්‍රයෝගයක්" ඇතුළත් වේ.

ආගමකට මාරු කිරීම යන්න සහ 8(ඇ) සහ 8(ඈ) වගන්තිවල ඇතුළත් වූ අවසාන කොටස්වල එකතුවකි. ඊට අමතරව එය 8(ඇ) අවසානයේ ඇතුළත් කිරීමට යන්න අමතරව "කැමැත්තෙන්" යන වචනය එකතු කරන ලෙසට ද නිර්දේශ කළේය.

සමහරක් පෙත්සම්කරුවන් ඉදිරිපත් කරන ලද තර්කයක් වූයේ පනත් කෙටුම්පතේ 4 වන වගන්තියේ වන අතුරු විධිවිධානය, කාන්තාවන්ට (අඩු වයස් සහ මානසික ආබාධිත තැනැත්තන් ද ඇතුළත් වන සේ අදාළ ලැයිස්තුවේ දක්වා ඇති පුද්ගල කණ්ඩායම්) අදාළ අවස්ථාවන්හිදී වඩා වැඩි දඬුවම් ලබාදීම නූතන ව්‍යවස්ථාවක හඳුනා ගත නොයුතු යල් පැනගිය එකක් බවයි. නමුත් මීට අධිකරණය එකඟ නොවන ලදී. මේ උදෙසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(4) වගන්තිය (කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා වෙනම නීති ඇගයීමේ අවශ්‍යතාවය දක්වන) ස්වකීය මතය තහවුරු කිරීම සඳහා ගෙන හැර පාන ලදී. අවාසනාවන්ත ලෙස මීට ප්‍රතිවිරුද්ධ මතයක් වූ කාන්තාවන්ගේ අභිවෘද්ධිය යන්න අදාළ වගන්ති ඇතුළත් කිරීමෙන් පමණක් ළඟා කරගත නොහැකි බවට වන මතයට අධිකරණයේ අවධානය යොමු නොවීය.

වසර අගභාගයේදී අනික් කරුණු අතර බුද්ධ ධර්මය ජනරජයේ නිල ආගම බවට පත් කිරීමට අරමුණු කරගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය දහනම වෙනි සංශෝධනය යන මැයෙන් වූ පනත් කෙටුම්පතක් අධිකරණයේ විමර්ශනයට භාජනය විය.[41] මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II වන පරිච්ඡේදය පරිච්ජින්න කිරීමට බලාපොරොත්තු වූ අතර (9 වෙනි වගන්තිය) ඒ වෙනුවට නව පරිච්ඡේදයක් හඳුන්වා දීමට, එනම් බුද්ධ ධර්මය ජනරජයේ නිල ආගම බවට පත් කිරීම (ප්‍රමුඛස්ථානයක් ලබාදීම වෙනුවට) අරමුණු කර ගන්නා ලදී. එය තවදුරටත් අන් ආකාරයේ ආගම් සහ ඇදහීම් බුද්ධ ශාසනය සමඟ සාමයෙන් සහ සහයෝගයෙන් පුරුදු කළ යුතු බවට සඳහන් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 9 වෙනි වගන්තිය පරිච්ජින්න කිරීමට අවශ්‍ය හෙයින් මෙකී පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී සහ එය සම්මත කිරීමට නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක (2/3) ඡන්ද බලය සහ ජනමත විචාරණයකින් සම්මත කිරීම අවශ්‍ය බව තීරණය විය.

[41] ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ අංක. 32/2004. වී.බී. වීරසූරිය, ශිරාණි තිලකවර්ධන සහ රාජා ප්‍රනාන්දු විනිසුරන්ගෙන් සැදි විනිසුරු මඬුල්ලකි.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන වගන්තිය යටතේ වන අධිකරණ බලය ඔස්සේ අභියාචනාධිකරණයේ අධිකරණමය ප්‍රතිචාරයන්

විමර්ශනයට හසුවන වසර තුළදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වගන්තිය ප්‍රකාර අභියාචනාධිකරණය තුළ රිට් පෙත්සම් ගොනු කිරීම සංඛ්‍යාත්මකව වර්ධනය විය. මූලික මිනිස් අයිතිවාසිකමක් උල්ලංඝණය යටතට ගැනෙන නඩු වෙනස් ආකාරයට පරිවර්තනය වෙමින් බොහෝ විට දුෂ්කර තත්ත්වයකට පත් කරලමින් මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් වෙනුවට හුදු රිට් අධිකරණ බලයට නතු වන නෛතික උල්ලංඝණයන්ට පරිවර්තනය විය. මූලික අයිතිවාසිකම් ආරක්ෂණය සහ රිට් ආධාර ලබා ගැනීම එකිනෙක සම්බන්ධ වූ අතර එය තවදුරටත් ශක්තිමත් විය. එසේම මෙකී ප්‍රවර්ධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික මිනිස් අයිතිවාසිකම් ඇතුළත් කිරීම, අභියාචනාධිකරණයේ රිට් අධිකරණ බලය මත ධනාත්මක ලෙස බලපෑම් කළ බවට වන අධිකරණමය සොයා ගැනීමෙන් තවදුරටත් තහවුරු විය.

1995 වසරේදී මෙකී මූලධර්මය පෙරේරා එදිරිව එදිරිසිංහ[42] නඩුවේදී රිට් අධිකරණ බලය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(3) වගන්තිය අතර සම්බන්ධය පැහැදිලි කිරීමෙන් අධිකරණය එය විස්තර කළේය. මේ යටතේ රිට් අයදුම්පතක් ඉදිරිපත් කර ඇති විටෙක මූලික මිනිස් අයිතිවාසිකමක් උල්ලංඝණය වී ඇත්තේ නම් ඊට සුදුසු සාධාරණ හා යුක්තිසහගත විසඳුමක් උදෙසා එය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ හැක.[43]

මේ යටතේ, අධිකරණයේ ආකල්පය වූයේ මෙවැනි තත්ත්වයන් හිදී අධිකරණය තවදුරටත් රිට් අධිකරණ බලය ක්‍රියාත්මක කරන නමුදු, එහි විමර්ශන බලය සහ සහන ලබාදීම අතර බලාත්මක රිට්

---

[42] (1995)1 ශ්‍රී.නී.වා. 148 මාර්ක් ප්‍රනාන්දු විනිසුරු, පිටු 156.

[43] 126(3) ව්‍යවස්ථාව පවසන්නේ, හබයාස් කෝපුස්, සර්ෂියෝරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මැන්ඩාමුස් හෝ ක්වෝ වරන්ටෝ ස්වභාවයේ වූ රිට් ආඥා සඳහා කරන ලද ඉල්ලීමක් අභියාචනාධිකරණයේ හි විභාග කිරීමේදී ඒ ඉල්ලීමේ පාර්ශවකරුවකු වීමත් III වන පරිච්ඡේදය හෝ IV වන පරිච්ඡේදයේ විධි විධාන කඩකර ඇති බවට හෝ කඩකිරීමට පැවරීමට අත්‍යාවශ්‍යව ඇති බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ඇති බවට ඒ අධිකරණයට පෙනී ගිය අවස්ථාවක ඒ කාරණය තීරණය කිරීම සඳහා ඒ අධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත නොපමාව යොමු කළ යුත්තේය.

ආඥාවන්ට පමණක් සීමා නොවිය යුතු බවයි. අනික් අතට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වගන්ති සහ ප්‍රතිපාදන පරිපාලනමය අභිමතානුසාරීබව සහ විනිර්මුක්තීන් සීමා කර ඇති අතර, මීට සාපේක්ෂව මහජන සේවයේ ස්වභාවය සහ ක්ෂේත්‍රය මැන්ඩාමුස් ආඥාවන්ට යටත් වන සේ සහ වැරදි සහගත ක්‍රියා සහ තීරණ සර්ෂියෝරාරි සහ තහනම් ආඥාවන්ට යටත් වන සේ අධිකරණමය විමර්ශනය සහ සහන පුළුල් කර ඇත.[44]

2004 හි තීරණය කරන ලද නඩු තීන්දුවකින්,[45] මාර්ක් ප්‍රනාන්දු විනිසුරු ප්‍රකාශ කරන ලද්දේ,

> 140 වගන්තියේ අධිකරණ බලය රිට් ආඥා හෝ සුවිශේෂ සහනයන්ට පමණක් යටත් නොවේ. ඒවා සර්ෂියෝරාරි ආදී රිට් ආඥාවන් ලබා ගත හැකි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අනිකුත් ප්‍රතිපාදන දක්වා ව්‍යාප්ත වේ.

අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලධර්ම සහ ප්‍රතිපාදන යටතේ මෙකී නියෝගයන් අයුතුමය සහ අතිරේකමය විධායක බලය භාවිතය සම්බන්ධයෙන් සුරක්ෂණයක් සපයන අතර මේ යටතේ විධායක බලය යටතේ ජනතාවට වන හානිය වැළැක්වීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වගන්තිය යටතේ අධිකරණයට බලය ලබා දේ.

ආචාර්ය විෂකුන්තරම් කුනනාදන් එදිරිව යාපනය විශ්ව විද්‍යාලය සහ අනිකුත් අය,[46] නඩුවේදී විශ්ව විද්‍යාල පනත සහ පොදුභාර සිද්ධාන්තයන් යටතේ විශ්ව විද්‍යාල පත්කිරීම් වලදී විශ්ව විද්‍යාල බලධාරීන්ට සාධාරණ සහ වෙනස්කමකට භාජනය නොකර කටයුතු

---

[44] මෙම තීරණයේදී ප්‍රනාන්දු විනිසුරු මෙම අයිතිය පොදු නීතිය යටතේ මෙන්ම ව්‍යවස්ථා හෝ රෙගුලාසි යටතේ උද්ගත විය හැකි බව පෙන්වන ලදී. ඒ අනුව 12(1) දැක්වෙන සමානාත්මතාවය හෝ සමාන සැලකීම එම අයිතිය පොදු නීතිය ව්‍යවස්ථා හෝ රෙගුලාසි යටතේ හිමි නොවන විටත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 3 සහ 4 (ඇ) සහතික කරන පරිදි හිමි වන බවයි. නඩුවේ සිද්ධි ප්‍රකාර, විභාග සහ රීති සහ ප්‍රතිපාදන 2 වන ව්‍යවස්ථාව සමඟ එක්ව කියවන කල ප්‍රශස්ථ ලෙස සුදුසුකම් ලත් අයකුට උපාධිය ප්‍රදානය කිරීමට අවස්ථාව ලබා දෙන අතර වෙනස්කමකට ලක් නොකර මෙය විශ්ව විද්‍යාලය විසින් අදාළ අය වෙත ලබා දිය යුතුය.

[45] නඩුවේ 13 වන පිටුවේ ඇතුළත් වන 30 වන පාද සටහන බලන්න.

[46] අභියාචනාධිකරණ (රිට්) අයදුම්පත්‍ර අංක. 1559/2003, අභියාචනාධිකරණ සටහන් 2004.11.01 එස්. ශ්‍රීස්කන්ධරාජා සහ සලීම් මර්සූෆ් විනිසුරු විසින් ලබා දෙන ලද තීරණය වර්තමානයේ මෙය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා වී ඇත.

කිරීමේ යුතුකම අධිකරණය සාකච්ඡා කරන ලදී. මේ නඩුවේදී, ශල්‍ය කර්ම පිළිබඳ බාහිර දේශක, හිටපු අංශාධිපති ශල්‍ය කර්ම අංශය, යාපනය විශ්ව විද්‍යාලය සහ යාපනය ශික්ෂණ රෝහලේ ස්නායු ශල්‍ය පිළිබඳ ගෞරව උපදේශක, යාපනය විශ්ව විද්‍යාලය ආරාධනයක් සහ එම විශ්ව විද්‍යාලයේ ස්ථිර තනතුරක් ලබා දෙන බවට සහතිකය මත මෙරටට ආපසු පැමිණ ඇත.

ශල්‍ය කර්ම පිළිබඳ විශ්ව විද්‍යාලයේ බාහිර මහාචාර්යවරයකු වශයෙන් ඔහුගේ ගිවිසුම වසර පහකට වඩා වැඩි කාලයක් තුළ වරින් වර දීර්ඝ කරන ලද නමුදු, ස්ථිර තනතුරක් සඳහා වන ඔහුගේ අයදුම් පත්‍රය ඔහු අන් ආකාරයෙන් සුවිශේෂි ලෙස සුදුසුකම් ලද අයකු වුවත්, වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩල සහතිකය ලබා නොගැනීම මත එක දිගටම ප්‍රතික්ෂේප වූ අතර, අදාළ තනතුර තවදුරටත් නොපුරවා පැවතිණි.

පෙත්සම්කරු යාපනය විශ්ව විද්‍යාලයේ ශල්‍ය කර්ම පිළිබඳ පළමු පෙළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙස පත් කරන ලෙස 1 සිට 6 වන වගඋත්තරකරුවන් වෙත මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරමින් අභියාචනාධිකරණය දක්වා සිටියේ කොළඹ විශ්ව විද්‍යාලයේ සෙනෙට් සභාවේ අනුමැතියට යටත්ව වගඋත්තරකරු වෙත මණ්ඩල සහතික වරප්‍රසාදය ලබා දීමට වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය (PGIM) තීරණය කර ඇති බවයි. නීතිය යටතේ උසස් අධ්‍යාපන ආයතනයන්හි ආඥා නිකුත් කිරීමට, බඳවා ගැනීමේ සුදුසුකම් සහ බඳවා ගැනීමේ ක්‍රියාවන් පිළිබඳ නියෝග නිකුත් කිරීමට බලය ඇති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවක් පෙත්සම්කරු පළමු පෙළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙස බඳවා ගන්නා ලෙසට විශ්ව විද්‍යාලයෙන් ඉල්ලා ඇත. නඩුවේ කරුණු යටතේ, මණ්ඩල සහතිකය අත්‍යාවශ්‍ය පූර්ව අවශ්‍යතාවයක් ලෙස අධිකරණය විසින් නොදකින ලද අතර පෙත්සම්කරු පත්කිරීම සඳහා හිමිකම් ලබන බව ප්‍රකාශ කරන ලදී.

පෙත්සම්කරුගේ පැමිණිල්ල විශ්ව විද්‍යාලය සමඟ පැවති ගිවිසුම තුළින් පැන නැඟෙන හෙයින් එහි රිට් ආඥාවක් නිකුත් කිරීම මග නොපාදන බවට රජය විසින් ඉදිරිපත් කරන ලද විරෝධය ඉවත හෙලීමේ අධිකරණමය ස්ථාවරය මත මෙම නඩුව උපදේශාත්මක වේ. අභියාචනාධිකරණය පූර්ව අවස්ථාවන්හිදී (පී. විජේරත්න විනිසුරු විසින් දෙන ලද නියෝගය) අන්තර්වාර නියෝගයක් මේ හා සම්බන්ධ තත්ත්වයක් දක්වා දීර්ඝ කරන ලද අතර ඒ යටතේ අදාළ ගැටළුව සේවා

ගිවිසුම හා බැඳුන නමුත් අදාළ ගිවිසුම ව්‍යවස්ථාමය සම්බන්ධකම් වලින් සැදුණු හෙයින්, සහ විශ්ව විද්‍යාල පනතේ ප්‍රතිපාදනයන්හි අදාළත්වය සහ පෙත්සම්කරුගේ සුජාතමය අපේක්ෂා මත අදාළ තත්ත්වය රිට් අධිකරණමය බලයකට නතු කළ හැකි හෙයින් සුදුසු පුද්ගලයකු හමුවන තුරු පෙත්සම්කරු අදාළ තනතුරට පත් කළ යුතු බව තීරණය විය.[47]

2004 වසර තුළදී අධිකරණය විසින් ගන්නා ලද සමහරක් තීරණයන් විශ්ව විද්‍යාල විනය සම්බන්ධයෙන් බැඳුණු ඒවා විය. පොදු පෙත්සම් සහ විරස්ථායි ලෙස සමාන කරුණු මත පදනම් වූ අවස්ථාවන් දෙකකදී අධිකරණය සමාන්තරික ලෙස වෙනස් වූ අධිකරණමය මතයන් ගෙන හැර පෑම සාක්ෂිමය ලෙස පැහැදිලි වූ අතර මේ යටතේ අවස්ථාවන් දෙකකදී වෛද්‍යවරයකුට සහ කාන්තා හෙදියකට පහරදීම සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල සිසුන් වෙත චෝදනා ඉදිරිපත් කර ඇති විටදී පහත කරුණු මත ඔවුනට විරුද්ධව ගෙන ඇති විනයානුකූල පියවර ස්වභාවික යුක්ති මූලධර්ම මත ඔවුනට විරුද්ධව ගෙන ඇති අයිතිය උල්ලංඝණය වීමක් බව ප්‍රකාශ කරන ලදී. ඒ යටතේ,

(අ) පැමිණිල්ල විභාගයේදී ඉදිරිපත් කරන ලද ලියකියවිලි පරීක්ෂා කර බැලීමේ අයිතිය සහ ඔවුනට විරුද්ධ සාක්ෂි ඉදිරිපත් කරන ලද අය හරස් ප්‍රශ්න ඇසීමට ලක් කිරීමට අවසර දීමේ අයිතිය ඔහුට ලබා නොදීම.

(ආ) පැමිණිල්ල වෙනුවෙන් වූ සාක්ෂිකරුවන් සහ ලියවිලි සම්බන්ධ ලැයිස්තුවක් ඔවුනට ලබා නොදුන් අතර තමන් වෙනුවෙන් සාක්ෂිකරුවන් කැඳවීමට අවස්ථාව ලබා නොදෙන ලදී.

---

[47] අධිකරණයේ අතුරු නියෝග - 2003.12.19 දින. තම තීරණයේදී අධිකරණය ඩබ්.කේ.සී. පෙරේරා එදිරිව මහාචාර්ය දයා එදිරිසිංහ සහ තවත් අය බලන්න 42 පාද සටහන සහ හිදර් මුන්ඩි එදිරිව මධ්‍යම පරිසර අධිකාරිය සහ අනිකුත් අය බලන්න 30 සහ 45 පාද සටහන් සඳහන් කරන ලදී. මේ හා සම්බන්ධ ගැටළු ගිවිසුම් හා බැඳී පවතින බවත්, ඒ අනුව අධිකරණයේ අධිකරණ බලයට යටත් නොවන බවත් තීරණය විය. බලන්න සී.ඒ. ගලප්පත්ති සහ තවත් අය එදිරිව අධ්‍යාපන ඇමති සහ අනිකුත් අය, අභියාචනාධිකරණ (රිට්) අයදුම්පත්‍ර අංක. 1033/98, අභියාචනාධිකරණ සටහන් 2004.07.16 - ගාමිණී අමරතුංග විනිසුරු, එච්.එම්.අයි. කරුණාරත්න එදිරිව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ අනිකුත් අය, අභියාචනාධිකරණ (රිට්) අයදුම්පත්‍ර, අභියාචන සටහන් 2004.01.21 විනිසුරු පී. විජේරත්න, ශාර්මල් දර්ශනී ප්‍රනාන්දු එදිරිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ අනිකුත් අය අභියාචන (රිට්) අයදුම්පත්‍ර අංක. 737/2002 අභියාචන සටහන් 2004.07.08, පී. විජේරත්න විනිසුරු.

ඔවුනගේ අයදුම්පත සලකා බලමින් එක් අධිකරණයක් ශිෂ්‍යයන්ගේ නෛතික නියෝජිත්වයට ඇති අයිතිය පිළිගත් අතර ඒ තුළින් ඔවුනට විරුද්ධව නගා ඇති චෝදනාව සොයා බැලීමටත් ඊට විරුද්ධව හරස් ප්‍රශ්න ඇසීමට ඇති අයිතියත් පිළිගන්නා ලදී. මීට ප්‍රතිවිරුද්ධව මීට පෙර වසරේ තවත් අධිකරණ මණ්ඩලයක් මහින් රිට් ආඥාවක් ලබා නොදෙමින් පවසා සිටියේ විශ්ව විද්‍යාලය මහින් අදාළ විනය පරීක්ෂණය සාධාරණව පවත්වා ඇති බවත් පෙත්සම්කාර ශිෂ්‍යයන්ගේ ඉල්ලීම් පිළිගැනීම අදාළ විමර්ශනයේ අරමුණු වලට පටහැනි බවත්ය.[48]

පසුව සඳහන් කළ අවස්ථාවේ (2003 වසරේ ලබා දෙන ලද තීරණයකි) ශිරාණි තිලකවර්ධන විනිසුරුවරිය දක්වා සිටියේ: "යම් අවස්ථාවක් ඉතා තදබල විපාක ඇති කරන්නේ නම් මිස අදාළ ගැටළුව සම්පූර්ණයෙන්ම විශ්ව විද්‍යාලයේ පාලනයට යටත් වන බවයි." පීඨයේ සියලු වෛද්‍ය ශිෂ්‍යයන්, වගඋත්තරකාර විශ්ව විද්‍යාලයේ නිලධාරීන්, ශික්ෂණ රෝහලේ වෛද්‍යවරුන් හා හෙද හෙදියන් මෙන්ම විශ්ව විද්‍යාල අසල සිය ප්‍රවාහන සේවය පවත්වාගෙන යන ත්‍රීරෝද රථ රියදුරන් ද ඇතුළත් වන පරිදි දීර්ඝ සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් සලකා බලන ලෙස පෙත්සම්කාර ශිෂ්‍යයන් විසින් කරන ඉල්ලීම අදාළ සහනය ලබා නොදීමට අධිකරණය පාදක කරගත් ප්‍රධාන හේතුන් ලෙස ගැනිය හැක.

මීට ප්‍රතිවිරුද්ධව, 2004 වසරේදී, ස්වකීය තීරණය ලබා දෙමින් කේ. සිරිපවන් විනිසුරු විසින් සැලකිල්ලට ගත් කරුණු වූයේ ශිෂ්‍යයන් අධ්‍යාපනික කටයුතු වලට විශේෂයෙන් බලපෑම් එල්ල කරන ඕනෑම විමර්ශනයක් සාධාරණ නඩු විභාගයක සියලු අවශ්‍යතා ප්‍රකාර ඉටු කළ යුතු බවයි. ඔහු දක්වා සිටියේ:

> විශ්ව විද්‍යාල විනය පරීක්ෂණයන් හිදී, උදාහරණ වශයෙන් දැක්විය හැකි විභාගයක සමත් වීම හෝ අසමත් වීම දැක්වෙන අධ්‍යාපනික ගැටළු හා සම්බන්ධ තීරණ හා අධ්‍යාපනික නොවන හෝ විනය හා අදාළ ගැටළු වෙන්කර දැක්වීම කළ හැකියි. මුල් අවස්ථාවේදී යුක්තිය පිළිබඳ මූලධර්ම සාමාන්‍ය අර්ථයෙන් නොයෙදේ.

---

48 *රාජකරුණා එදිරිව රුහුණු විශ්ව විද්‍යාලය සහ අනිකුත් අය අභියාචනාධිකරණ* (රිට්) අයදුම්පත්‍ර අංක. 1317/2002 අභියාචන සටහන් 2004.07.19, කේ. සිරිපවන් විනිසුරු (වර්තමානයේ අභියාචනාවකට බඳුන් වී ඇත). මේ හා පරස්පර මත දැක්වීමක් සඳහා බලන්න *රාජකරුණා එදිරිව රුහුණු විශ්ව විද්‍යාලය* අංක. 1316/2002 අභියාචන සටහන් 2003.07.30, ශිරාණි තිලකවර්ධන විනිසුරුවරිය.

අධ්‍යාපනික තීරණ සුවිශේෂයෙන්ම කථිකාචාර්යවරුන් හා විභාග පරීක්ෂකවරුන්ගේ බලය මත පිහිටන බැවින් අධිකරණය අධිකරණමය තීරණ හා මැදිහත් වීම ප්‍රතික්ෂේප කළ හැක. කෙසේ නමුත්, තමා පුහුණුව ලබන්නා වූ ක්ෂේත්‍රයට යම් දිනක ඇතුළත් විය නොහැකි පරිදි ශිෂ්‍යයකුට විරුද්ධව විශ්ව විද්‍යාලය විසින් චෝදනා නගා ඇති අධ්‍යනික නොවන හෝ විනය හා සම්බන්ධ ගැටළුවකදී වෙනස් වූ මිනුම් දණ්ඩක් භාවිත වේ.

විශ්ව විද්‍යාල විනය පරීක්ෂණයක් සම්බන්ධ වූ තවත් නඩුවකදී (*චින්තක විපුලංග එදිරිව ආචාර්ය සුජීව අමරසේන සහ අනිකුත් අය*[49]) ඔහු මෙම තත්ත්වය නැවතත් අවධාරණය කර සිටින ලදී. මෙහිදීත් ශිෂ්‍යයකු සාධාරණව, සද්භාවයෙන් සහ නිවැරදි සාධක මත දඬුවම් කිරීමට අසමත් වීම මත විශ්ව විද්‍යාල ආචාර්යවරයකුට විරුද්ධව සර්ෂියෝරාරී ආඥාවක් නිකුත් කරන ලදී.

කේ.එල්.ඩී. දයාසාගර සහ අනිත් අය එදිරිව ජාතික මැණික් සහ ආභරණ අධිකාරිය සහ අනිකුත් අය,[50] නඩුවේදී මැණික් සහ ආභාරණ පර්යේෂණ සහ පුහුණු ආයතනයට ස්ථිර ලෙස බඳවා ගත් සහ වගඋත්තරකරුගේ අනිකුත් සේවා දායකයන් විසින් භුක්ති විඳින හිමිකම් සහ වරප්‍රසාද පිළිබඳ දැනුවත් වූ පෙත්සම්කරුගේ විසිහතර දෙනෙකුගේ පෙත්සමක් අභියාචනාධිකරණය සලකා බලන ලදී. පෙත්සම්කරුවන් පවසා සිටියේ මෙවැනි කපාහැරීම් තහනම් කරන 1993 අංක. 50 දරණ පනතේ (මේ යටතේ පළමු වගඋත්තරකාර පාර්ශවය පිහිටවන ලද අතර දෙවන වගඋත්තරකාර පාර්ශවය ආරම්භ කරන ලදී.) 54(2)(උ) වගන්තිය ප්‍රකාර මෙවැනි වරප්‍රසාද සහ හිමිකම් කප්පාදු කළ නොහැකි බවයි. මේ අනුව, දෙවන වගඋත්තරකරු විසින් කළ කප්පාදු කිරීම් නීති විරෝධී සහ නෛතික බලාධිකාරයකින් තොරව කළ ඒවා විය.

තමන් වෙනුවෙන් වගඋත්තරකාර පාර්ශවය ගත් තත්ත්වය වූයේ අදාළ කප්පාදු කිරීම් රජය විසින් ගත් ප්‍රතිපත්ති තීරණයක් මත පදනම් වූ බවත් මෙකී ප්‍රතිලාභ ලබාදීම අරමුදල් ලැබෙන ආකාරය මත පදනම් වන බවත්ය.

---

[49] අභියාචනාධිකරණ (රිට්) අයදුම්පත්‍ර අංක. 95/2004 අභියාචන සටහන් 2004.09.16.

[50] අභියාචන (රිට්) අයදුම්පත්‍ර අංක. 393/2002, අභියාචන සටහන් 2004.04.27.

අදාළ තීරණය මැන්ඩාමුස් ආඥාවක් තුළින් අවලංගු කරමින් සහ අදාළ වරප්‍රසාද සහ ප්‍රතිලාභ ගෙවන ලෙස වගඋත්තරකරුවන් වෙත සර්ෂියෝරාරි ආඥාවක් නිකුත් කරමින් පී. විජේරත්න විනිසුරු අවධාරණය කර සිටියේ 1993 අංක. 50 දරණ පනතේ 54(20)(උ) වගන්තිය රජයේ ප්‍රතිපත්තියක් ව්‍යවස්ථාවක් තුළට ඇතුළත් කිරීම නිරූපණය කරන බවත්, වගඋත්තරකරුවන් ස්වකීය තත්ත්වය යුක්ති යුක්ති කිරීම සඳහා පදනම් කරගත් චක්‍රලේඛනයක් අභිබවා යන බවත්ය. මේ හා සමානවම 2 වන වගඋත්තරකාර ආයතනය එහි කාර්යයන් මත පදනම්ව ලාභ ලබන ආයතනයක් නොවන බැවින් ලාභ ඉපයීම යන්න අදාළ වරප්‍රසාද සහ ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් අදාළ නොවේ.

මේ අතරතුර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය ප්‍රකාරව ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගහට මැතිවරණ කොමිසමට සාමාජිකයන් පත් කරන ලෙසට නියම කරන ලෙසට මහජන යහපත යොමු කරගත් ආයතනයක් විසින් ගෙන එන ලද අයදුම් පත්‍රය අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.[51]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ වගන්තිය (17 ව්‍යවස්ථා සංශෝධනයෙහි) බලය පවරන පරිදි ජනාධිපති විසින් 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ මහජන ආයතනයක් තුළ දේශපාලනමය ලෙස ගොනු නොවූ පත් කිරීම් සඳහා බිහි කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ප්‍රකාර එහි උපදේශනය පරිදි මැතිවරණ කොමිසමට සාමාජිකයන් පත්කළ යුතුය. පෙත්සම්කරු තර්ක කරන ලද ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ආ) වගන්තිය මැතිවරණ කොමිසමට සාමාජිකයන් පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිට පූර්ණ අභිමත බලයක් ලබා නොදේ. මේ අනුව ඇයට අභිමතානුසාරී බලයක් හිමි නොවන අතර ඒ සඳහා සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කරන තුරු සිටිය යුතුය.

---

[51] මහජන අර්ථසිද්ධි නීති පදනම එදිරිව නීතිපති සහ තවත් අය, අභියාචන අංක. 1396/2003, අභියාචන සටහන් 2003.12.17 එන්. උදලාගම විනිසුරු එකඟ වෙමින් කේ. සිරිපවන් විනිසුරු ලබා දෙන ලද තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ලබා දෙන ලද නිර්දේශය නිකුත් කර වසර දෙක හමාරක් ගත වී ඇතිමුත් කොමිසමේ සභාපති ලෙස පත් කළ යුතු පුද්ගලයා සම්බන්ධව සභාව හා ජනාධිපති අතර ඇති නොඑකඟතාවය මත මැතිවරණ කොමිසම පත් නොකර පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන කොමසාරිස් හට තම ආධිපත්‍යය පැවතියදීත් මැතිවරණ කිහිපයක නිරීක්ෂණය ඇතුළු මැතිවරණ රාජකාරී කිරීමට සිදුවී ඇත. ඔහු කිහිප වරක්ම මැතිවරණ කොමිසම පත් කරන ලෙස ජනාධිපති කුමාරතුංගහට ආයාචනා ද කර ඇත.

කෙසේ නමුත්, අධිකරණය මෙම තර්කය පිළිගැනීමට මැළි වී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35(1) ජනාධිපති වෙත ලබා දෙන සමස්ථ විනිර්මුක්තිය ඉතා සීමිතව වූ අවස්ථාවලදී එනම් අතිකුත් කරුණු අතර ජනාධිපති වෙත පැවරූ අමාත්‍යාංශ විෂය සහ කාර්ය සහ මැතිවරණ පෙත්සම් හැරෙන්නට ඇයගේ තිල හෝ පුද්ගලික නාමයෙන් කරන ලද කරුණු මත ඇය මත නඩු පැවරීම අහිමි කරයි. මෙම නඩුව ව්‍යතිරේකී අවස්ථාවන්ට නොවැටෙන බවට තීරණය වූ අතර 35(1) හි අදාළත්වය මත අදාළ පෙත්සම් නෛතික ප්‍රකාර නොවන බවට තීරණය විය.[52]

මෙකී තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා යම් අවිධිමත් තත්ත්වයකට විසඳුමක් සෙවීමේදී යම් කරුණකට ඔබ්බෙන් යාම විනිසුරුන් වෙත අහිමි කරන නමුත් එවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන මත බැඳ තබන ජනතාව වෙත අවාසනාවන්ත තත්ත්වයක් හිමි කර දෙන අවස්ථාවක් උද්දීපනය කර දක්වයි.

41 ආ ව්‍යවස්ථාව වෙත ලබා දිය හැකි එක් ව්‍යවස්ථාමය සංශෝධනයක් වන්නේ ජනාධිපති හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අතර පත්කිරීම් උදෙසා වන නිර්දේශයන් සම්බන්ධයෙන් මත ගැටුමක් පවතින්නේ නම් තමා සඳහන් කරන ලද හේතූන් මත ස්වකීය නිර්දේශ නැවත සලකා බලන ලෙස ජනාධිපති විසින් ඉල්ලීමක් කිරීමට අවකාශ ලබා දීමයි. නැවත සලකා බැලීමෙන් පසු සභාව එම නිර්දේශයන්ම ඉදිරිපත් කරන්නේ නම් සහ ජනාධිපති එම පත්කිරීම් කිරීමට අසමත් වන්නේ නම් මසක් ඇතුළත එම පුද්ගලයන් එම තනතුරු වලට එලෙස පත්වූ බවට සැලකිය යුතුය.[53]

[52] මෙම අවස්ථාව උප නිලධාරීන්ගේ වැඩ ජනාධිපතිගේ නියෝග මත යුක්ති යුක්ත කිරීම අරමුණු කරගත් අවස්ථාවන්ගේ මෙන් කළ යුතුය. මෙවැනි අවස්ථා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී බව තීරණය වී ඇත. බලන්න කරුණාතිලක එදිරිව දිසානායක සහ සේනසිංහ එදිරිව කරුණාතිලක පාද සටහන් 28 බලන්න. එසේම බලන්න, එම්.එන්.ඩී. පෙරේරා එදිරිව බාලපටබැඳි සහ තවත් අය, 26 පාද සටහන බලන්න.

[53] කෙසේ නමුත් කිසිදු දේශපාලන පක්ෂයක් මෙම තත්ත්වය විසඳීමට උනන්දුවක් නොදක්වන බව පෙනේ.

6. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ පළමු වෛකල්පිත සන්ධානය යටතේ තනි පුද්ගල පෙත්සම් සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව විසින් ගන්නා ලද තීරණ

ජිනීවා නුවර පිහිටි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව මගින් වික්ටර් අයිවන් සහ සිංගරාසා නඩු වලදී 2004 වසර තුළදී සම්මුතියේ වගන්ති කඩ වූ බවට ගන්නා ලද තීරණ ශ්‍රී ලංකාව මත තදබල බලපෑම් එල්ල කරයි.[54]

අවස්ථා දෙකම අදහස් කියා පෑම සහ මුද්‍රණය මෙන්ම සාධාරණ නඩු විභාගයකට ඇති අයිතියට හා බැඳුණු මූලධර්මානුකූල කරුණු කෙරෙහි අවධානය යොමු කරන අතර දෙවන නඩුව එහි ප්‍රශ්න සහගත සහ සංශෝධනය නොකරන ලද ස්වභාවයෙන් තවදුරටත් පවතින ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත කෙරෙහි සුවිශේෂ අවධානය යොමු කරයි.

ශ්‍රී ලංකාව වර්තමානයේදී, රටෙහි ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයන් අභියෝගයට ලක් කරමින් කමිටුව වෙත යන අවස්ථාව වැඩි වී ඇති අතර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය යටතේ ලබා දෙන ලද අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් ධනාත්මක ප්‍රතිචාර ලබා ගැනීමේ හැකියාව ලබා ගෙන ඇත. ශ්‍රී ලංකාව පිළිවෙළින් 1980 දී සහ 1997 දී සිවිල් හා දේශපාලන සම්මුතියට සහ එහි වෛකල්පිත සන්ධානයට පාර්ශවකරුවන් වූ අතර අදාළ සම්මුතිය යටතේ වන අයිතිවාසිකම් උල්ලංඝණය වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය යටතේ සහනයක් ලබා නොගෙන ඇති විටදී, තනි පුද්ගලයන්ට ජිනීවා නුවර පිහිටි මානව අයිතිවාසිකම් කමිටුව වෙත

[54] කර්තෘවරිය *Sunday Times* පුවත්පතේ, 2004 සැප්තැම්බර් 05 සහ 2004 සැප්තැම්බර් 12 දින "Focus on Rights" යටතේ ලියන ලද සාකච්ඡාවෙන් කරුණු ගෙන හැර පා ඇත. ලංකාව සම්බන්ධව කමිටුවේ තීරණ උදෙසා බලන්න. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව - සන්නිවේදන අංක. - 950/2000: ශ්‍රී ලංකාව, 2003/07/31 (CCPR/C/78/D/950/2000) (Jurisprudence) - ජෙගතීස්වරන් ශර්මා නඩුව සහ මානව හිමිකම් කමිටුවේ අදහස් අංක. 916/2000: ශ්‍රී ලංකාව, 2002/07/26 (CCPR/C/75/D/916/2000) – Jurisprudence – ජයලත් ජයවර්ධන නඩුව, අන්තිමට සඳහන් නඩුව ජයලත් ජයවර්ධනගේ ජීවිතයට තර්ජන සම්බන්ධයෙන් පොදු පෙරමුණු රජය විමර්ශනය නොකිරීම සහ සම්බන්ධ විය. මෙය ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සහ එල්.ටී.ටී.ඊ. හා සම්බන්ධ විය. මුලින් සඳහන් කළ නඩුවේ 1990 දී තම පුතු හමුදා භාරයේ සිටියදී අතුරුදහන් වීම සම්බන්ධයෙන් පියකු කළ පැමිණිල්ලක් මත පදනම් විය.

පෙත්සම් යැවීමේ හැකියාව ලැබී ඇත. උප මහද්වීපය තුළ ශ්‍රී ලංකාව සහ නේපාලය පමණක් ස්වකීය පුරවැසියන්ට කමිටුව වෙත අභියාචනා කිරීමේ අවස්ථාව ලබා දී ඇති අතර අනිකුත් දකුණු ආසියානු රටවල් සම්මුතිය පමණක් අපරානුමත කර ඇති හෙයින් සම්මුතියේ වගන්ති ක්‍රියාවට නැංවීම උදෙසා තමන් ගන්නා වූ පියවර දක්වමින් වරින් වර කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කළ යුතුය.

ඒවා ඉදිරිපත් කරන ලද රටවල් සම්බන්ධයෙන්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව මගින් ඉදිරිපත් කර ඇති අදහස් අන්තර්ජාතික නීතිය තුළ වැදගත් ස්ථානයක් ගනී. යම් රාජ්‍යයක් විසින් සම්මුතිය හෝ වෛකල්පිත සන්ධානය අපරානුමත කළ පසු, එම රාජ්‍ය මත එම ප්‍රොටකෝලය බලාත්මක වූ දින සිට කළ ක්‍රියා, නොකර හැරීම් ප්‍රවර්ධනයන් සහ සිද්ධීන් මත හෝ එම දිනට පසු යම් ක්‍රියාවන්, නොකර හැරීමත්, ප්‍රවර්ධනයක් හෝ සිද්ධීන් මත වන තීරණයන් අදාළ සම්මුතියේ අයිතීන් උල්ලංඝණය කරයි නම් පුරවැසියන්ට කමිටුව වෙත තනි පුද්ගල පෙත්සම් යැවිය හැක. අදාළ පැමිණිලිකරු සියලුම ගෘහස්ථ සහන ලද හැකි මාර්ග අවසන් කර තිබිය යුතු අතර අදාළ ගැටළුව තවත් අන්තර්ජාතික විමර්ශනයකට හෝ සහන ලද හැකි මාවතකට යොමු නොවී පැවතිය යුතුය.

දශක ගණනාවක් තිස්සේ කමිටුවේ සාමාජිකයන් දහඅට දෙනා තනි පුද්ගල පෙත්සම් සම්බන්ධයෙන් ස්ට්‍රාස්බර්ග් ආයතනය මෙන් (යුරෝපියානු මානව හිමිකම් අධිකරණය, පෙර මානව හිමිකම් සම්බන්ධයෙන් වන යුරෝපියානු කොමිසම) බලාත්මක ස්වභාවයෙන් තම තීරණ ගෙන හැර පෑමෙන් වැළකී ඇත. මෑත කාලයේදී, මත ගෙන හැර පෑම් (සම්මුතියේ වගන්ති විස්තර කරමින් ඉදිරිපත් කරන මතයන්) සහ තනි පුද්ගල පෙත්සම මත දෙන ලද තීරණ විශේෂයෙන්ම ලංකාව සම්බන්ධයෙන් වන තීරණ විමසා බැලීමේදී මෙම තත්ත්වය වෙනස් වී ඇති බව පැහැදිලිය.

නමුත්, ලංකාවේ ස්වෛරීභාවය මත මේවා සියල්ලක්ම නොවැදගත්ය යන මත ගෙන හැර පාන විවේචකයන්ගේ විවේචන තුළ මේවා කොතරම් වැදගත් වේද? මේ සම්බන්ධයෙන් ඉතා සරල එහෙත් වැදගත් වූ පිළිතුරක් පවතී. නූතන අවධියේ එක් වැදගත් ප්‍රවර්ධනයක් වන්නේ මානව හිමිකම් වලට ගරු කිරීමට අකමැති හිතුවක්කාරී පරිපාලනයන් හැරෙන්නට සියලු රටවල් එක්ව බඳනා අන්තර්ජාතික නීති නියාමයන් හි විකාශනයයි. මෙය ගෘහස්ථ නීතියේ පවතින ප්‍රමිතීන් බිඳ දැමීමට යම් විටක උපකාරී වේ. උදාහරණයක් වශයෙන් නාසි යුගයේ කරන ලද අපරාධ එම නීති

සහ අධිකරණ ප්‍රකාර නීත්‍යානුකූල වීම මෙම තත්ත්වය සත්‍ය බව පිළිගැනීමට වන හොඳම සාධකය වේ. එතැන සිට වසර ගණනාවක් පුරා රාජ්‍ය සෛවරීභාවයට පරිබාහිරව රටවල් එකඟ විය යුතු අන්තර්ජාතික නියාමයන් රැසක් අප ගොඩනගා ගෙන ඇත. උදාහරණයක් වශයෙන්, දේශීය නීතියේ ඒ සඳහා ප්‍රතිපාදන නොමැති වුවත් රටක අධිකරණයක තීරණ එම රටේ දේශ සීමා වලින් බාහිරව පැවති ආයතනයකට ප්‍රශ්න කළ හැකි අතර ඒ යටතේ එවැනි මානව හිමිකම් තත්ත්වයන්ට ඉඩ දෙන රීතීන්ට ක්‍රියාත්මක වීමට එම රට අවසර දී ඇත.

ශ්‍රී ලංකාවේ රජයට විරුද්ධව අහිතකර නිර්දේශ ඉදිරිපත් කළ 2004 වසරේදී තීරණය වූ පෙත්සම් පළමු අවස්ථාවේ පුවත්පත් කර්තෘවරයකු හා දෙවන අවස්ථවේදී බූස්ස සිරමැදිරියේ අවුරුදු 35 ක කාලයක සිර දඬුවමක් ගත කරන රැඳවුම්කරුවකු විසින් ගොනු කරන ලද ඒවා වේ.

පළමු (වඩා පළපුරුදු) අභියාචනාව රාවය පුවත්පතේ කර්තෘ විසින් ගොනු කරන ලද 1993, 1998 කාලය තුළ ඔහු වෙත සාපරාධී අපහාසය මත චෝදනා නගමින් ශ්‍රී ලංකාවේ නීතිපතිවරයා විසින් මහාධිකරණයේ ගොනු කරන ලද අධිචෝදනා මත, ඔහු සාපරාධී අපහාසය හා සම්බන්ධ වන අවස්ථා වලදී අවශ්‍ය වන ආකාරයට කරුණු සම්බන්ධව නිසි තක්සේරුවක් කිරීම උදෙසා වන ව්‍යවස්ථාමය ගරු උපදේශයන් අනුගමනය කිරීම සම්බන්ධයෙන් වන අභිමතානුසාරී බලය ක්‍රියාත්මක කිරීමට අසමත් වීම මත පදනම් විය. ඔහු සම්මුතියේ 19 වන ව්‍යවස්ථා ප්‍රකාර ප්‍රකාශනයේ නිදහස සහ 26 ව්‍යවස්ථා ප්‍රකාර නීතිය ඉදිරියේ සමානාත්මතාවය සහ සමානව සැලකීම උල්ලංඝණය වීම පදනම් කර ගන්නා ලදී. ලංකාවේ හිටපු නීතිපතිවරුන් වන තිලක් මාරපන සහ සරත් නන්ද සිල්වා විසින් ඔහුට අධිචෝදනා බාර දී ඇත.

තමාට එලදායී විසඳුමක් ලබා ගැනීමට නීතිපතිවරයාට විරුද්ධව ගොනු කරන ලද මූලික මිනිස් අයිතිවාසිකම් පෙත්සමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නඩු විභාග කිරීමේ අවස්ථාව අහිමි කිරීම මත සම්මුතියේ 2(3) ව්‍යවස්ථාව උල්ලංඝණය වූ බවට ද රාවය කර්තෘවරයා පවසා සිටින ලදී.[55]

---

[55] *වික්ටර් අයිවන් එදිරිව සරත් එන්. සිල්වා* (1998)1 ශ්‍රී.නී.වා. 301, මාර්ක් ප්‍රනාන්දු සහ වඩුගොඩපිටිය හා බණ්ඩාරනායක විනිසුරු එකඟ වෙමින් ලබා දෙන ලද තීරණය.

ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වූ ප්‍රශ්නය වූයේ රාවය කර්තෘවරයාට විරුද්ධව අධිචෝදනා නැඟීමෙන් නීතිපතිවරයා හිතුවක්කාරී ලෙස ක්‍රියා කර ඇත්තේ ද සහ ඒ මත ඔහුගේ සමානාත්මතාවයේ අයිතිය (12(1) ව්‍යවස්ථාව), මුද්‍රණය ඇතුළු භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස (14(1)(අ)) සහ නීති ප්‍රකාර රැකියාවක නියුතු වීමේ අයිතිය (14(1)(උ) ව්‍යවස්ථාව) උල්ලංඝණය වී ඇත්තේද යන්නයි.

මෙහිදී අධිකරණය තහවුරු කර සිටියේ නීතිපතිවරයා විසින් අධිචෝදනා ගොනු කිරීම හෝ එසේ නොකිරීම මූලධර්මානුකූලව සලකා බැලිය යුතු බවයි. උදාහරණ ලෙස, සාක්ෂි ප්‍රමාණවත් නොවීම, විමර්ශනයක් කර නොතිබීම, අදාළ තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සාධකයන් මත පදනම් වීම යනාදියයි. මේ අනුව අදාළ තීරණය ව්‍යවස්ථාමය වර්ගීකරණයක් මත පදනම් විය යුතු අතර අභිමතානුසාරී නොවූ මහජන සුභ සිද්ධිය ගොනු කරගත් එකක් විය යුතුය. කෙසේ නමුත්, අධිකරණය පවසා සිටියේ අප්‍රමාණවත් විමර්ශනය මත එක් අධිචෝදනාවක් හෝ නිවැරදි ලෙස ගොනු කර නොමැත්තේ නම් මෙය විමර්ශනයේ ඇති වරදක් බවත් එය නීතිපතිවරයා වෙත පැවරිය නොහැකි බවත්ය.

එනමුදු එම අවස්ථාවේදී තර්ක කරන ලද්දේ දෝෂාරෝපණය විමර්ශන නිලධාරීන් හෝ අධිචෝදනා නගන්නන් වෙත යොමු කළ හැකි වුවද වගකීම රජය මත පැවරෙන බවයි. යම් අධිචෝදනාවක් නිවැරදි නොවන විමර්ශනයක් මත ගොනු කර ඇති විටකදී, අදාළ නඩුවේදී නීතිපතිවරයා විසින් නියෝජනය කරන ලද විටකදී, අදාළ නඩුවේදී නීතිපතිවරයා විසින් නියෝජනය කරන ලද ආකාරයට ප්‍රාථමික වගකීම රජය මත පැවරේ. මේ දක්වා දුර යාමට ශ්‍රේෂ්ඨාධිකරණය මැළි වූ කාරණාව වූයේ, අධිකරණයේ මැදිහත් වීම සාධාරණීයකරණය කිරීම වස් නීතිපතිවරයා මත පැවරුණු "සාවද්‍ය නොදැනුවත්කම හෝ නොසැලකිල්ල" සම්බන්ධයෙන් වන දැඩි ඔප්පු කිරීමේ භාරයයි.[56]

[56] මෙම කොටස කර්තෘවරිය විසින් 2001 නීතිය සහ සමාජ භාරය මගින් පවත්වන ලද "ශ්‍රී ලංකාවේ යුක්තිය හා රාජ්‍ය පාලනය" සම්බන්ධයෙන් පවත්වන ලද සමුළුවකදී ඉදිරිපත් කරන ලද "Justicising the Law; Public Accountability of the Sri Lankan Legal Profession During the Past Fifty Years" යන්න මගින් උපුටා ගන්නා ලදී. නීතිපතිවරයාගේ අභිචෝදනාත්මක අභිමතය හා මහජන වගකීවයුතුභාවය සහ සාධාරණ නඩු විභාගය යන්න සම්බන්ධයෙන් වන වැඩිදුර සාකච්ඡාවක් සඳහා බලන්න LST Review 15, Issue 211 (2005 මැයි) සහ The Sri Lanka Journal of International Law - නීති පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

එක්සත් ජාතීන්ගේ කමිටුව අවධාරණය කරන ලද ආකාරයට එය නිරවද්‍යතාවයේ අරමුණු හි වැදගත්කම හේතු කොටගෙන මෙම අයදුම් පත්‍රයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හේතු දැක්වීම හෝ එහි අවසාන තීරණය හා එකඟ නොවීමට නොහැකි වේ. ඒ වෙනුවට, කමිටුව දක්වා සිටියේ සම්මුතියේ වගන්තීන් උල්ලංඝණය වීම වෙනත් හේතු දැක්වීමක් මත පදනම් වන බවයි.

සාපරාධී අපහාස අධිචෝදනා හා බැඳුණු කාරණා සහ නීතිපතිවරයා විසින් පනවන ලද තහංචි මත සම්මුතියේ වගන්ති උල්ලංඝණය වූවේද යන්න සම්බන්ධයෙන් එය කරුණු නොදක්නා ලදී. මෙයින් තේරුම් යන්නේ යම් නඩුවක සිද්ධීන් පදනම් කරගෙන ජාතික අධිකරණ බේරුම්කරණයක් වෙත කමිටු ලබා දෙන ස්වාධීනත්වයයි.

ඒ වෙනුවට කමිටුව ස්වකීය තීරණය රාවය කර්තෘවරයා වෙත 1996 සහ 1997 කාලයන්හි දී හා ඒ හා බැඳුණු වසර ගණනාවක් තිස්සේ (පාර්ශවයන් විසින් අවසන් වසරට අයදුම් පත්‍ර ඉදිරිපත් කරන කාලය වන විටත් ලබා දෙන ලද සාපරාධී අධිචෝදනා බාර දීම තුළින් සම්මුතියේ 14 හා 3 (ඇ) පරිච්ඡේදය, අයුතු කාලයක් ගතවීමෙන් තොරව නඩු විභාගයක් ඇසීම) උල්ලංඝණය වීම මත පදනම් කරගන්නා ලදී. තවදුරටත් මෙම ප්‍රමාදවීම කර්තෘවරයා අවිනිශ්චිතභාවයකට හා බිය ගැන්වීමකට ලක් කළ අතර, අදාළ නඩු ඔහු විසින් ගත් වැයම වෙනුවට ඒවා තවදුරටත් ඇදී යාම තුළින් සම්මුති 2(3) (ඵලදායී සහායට ඇති අයිතිය) සමඟ එක්ව කියවෙන සම්මුති 19 වන වගන්තිය (භාෂණයේ නිදහස) උල්ලංඝණය වීමකට මඟ පාදන ලදී.[57]

සිංගරාසා නඩුව[58] තුළින් දෙවන වරට ඉදිරිපත් වූ සන්නිවේදනය යටතේ සාධාරණ නඩු විභාගයකට සහතිකය හා නොබැදුණු 1979 අංක. 45

---

[57] මානව හිමිකම් කමිටුවේ අදහස්-අයදුම්පත්‍ර අංක. 909/2000: ශ්‍රී ලංකාව 2004.08.26 (CCPR/C/81/D/909/2000) (Jurisprudence) - වික්ටර් අයිවන් නඩුව අධික ප්‍රමාද වීමකින් තොරව යුක්තිය ලබා ගැනීමේ අයිතිය සඳහා වන දේශීය නඩු තීරණයක් උදෙසා බලන්න. ජයසිංහ එදිරිව නීතිපති (1994) 2 ශ්‍රී.නී.වා. 74, පඩි රහිතව සේවයෙන් සේවකයකු පහ කළ විටදී ප්‍රමාදයකින් තොරව විමර්ශනයක් පැවැත්විය යුතු බවට තීරණය විය. සාධාරණ නඩු විභාගයක් උදෙසා 13(3) වගන්තියේ ඇති අයිතිය හැරෙන්නට මේ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල රැකවරණයක් නැත.

[58] මානව හිමිකම් කමිටුවේ තීරණ-අයදුම්පත්‍ර අංක. 1033/2004: ශ්‍රී ලංකාව 2004.08.26 (CCPR/C/81/D/1033/2001) (Jurisprudence) - සිංගරාසා නඩුව.

දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (PTA) වගන්තීන් සංශෝධනය කරන ලෙස රජයට ලබා දෙන ලද තිසැක උපදෙස් මත වැදගත් වේ. මෙහිදී විශේෂයෙන්ම PTA හි 16(2) වගන්තිය විමර්ශනයට භාජනය විය. මේ යටතේ නීතියේ විශේෂ විධිවිධාන යටතේ රැඳවුම් කර ඇති චූදිතයකු සහකාර පොලිස් අධිකාරිවරයකුට ස්වෙච්ඡාවෙන් කර ඇති පාපොච්චාරණයක් ඔප්පු කිරීමේ භාරය එම චූදිතයා මතම පැවරේ.

අදාළ අයදුම් පත්‍රය PTA යටතේ සහකාර පොලිස් අධිකාරිවරයෙකුට ලබා දෙන ලද පාපොච්චාරණයක් පමණක් මත රැඳවුම්කරුවකු රැඳවුම් කර තැබීම ප්‍රශ්න සහගත විය. මේ යටතේ සහකාර පොලිස් අධිකාරිවරයා පොලිස් කොස්තාපල් කෙනෙකු මේ අවස්ථාවේ පරිවර්තකයකු ලෙස ක්‍රියා කළ තවත් පොලිස් නිලධාරියකු විසින් පරිවර්තනය හා යතුරු ලියනය කරන ලද ප්‍රකාශයකට අත්සන් තබන ලෙස ඉල්ලා සිටින ලදී. තමාට එය තේරුම්ගත නොහැකි හෙයින් සිංගරාසා මේ සඳහා අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ විටදී, සහකාර පොලිස් අධිකාරීවරයා බලහත්කාරයෙන් ඔහුගේ මාපට ඇඟිලි සළකුණ යතුරු ලියනය කරන ලද ප්‍රකාශය මත තබන ලදී.

සිංගරාසා හට නෛතික නියෝජනය නොතිබුණු අතර පාපොච්චාරණයට බලහත්කාරයෙන් අත්සන් කිරීමට සිදු වූ බවත් 16(2) ප්‍රකාර එය බලය කියා පෑම යටතේ ඔහු වෙතින් ලබාගත් බවත් එය ස්වෙච්ඡාවෙන් සිදු කළ එකක් නොවන බවත්, ඔප්පු කිරීමේ භාරය ඔහු වෙත පවරන ලදී. ඔහුව වධහිංසාවට ලක් කරන ලද පොලිස් නිලධාරීන් ඉදිරියේම පාපොච්ඡාරණයට අත්සන් කිරීමට බල කිරීම යටතේ 16(2) වගන්තියේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම අපහසු වේ.[59]

මහාධිකරණයේ විභාග වූ නඩුවේදී අධිකරණය අවසාන වශයෙන් දක්වා සිටියේ PTA හි 16(1) වගන්තිය යටතේ පාපොච්චාරණය ඇතුළත් කළ හැකි බවත්, මේ යටතේ ස්වෙච්ඡාවෙන් සහකාර පොලිස් අධිකාරි තනතුරට වඩා පහල නොවන ඕනෑම ප්‍රකාශයක් නඩුවකදී ඇතුළත් කරගත හැකි බවත්ය. අදාළ පුද්ගලයාගේ සිරුරේ තුවාල කැළැල්

---

59 මහාධිකරණ නඩු විභාගයේදී ඉදිරිපත් වූ අධිකරණ වෛද්‍ය වාර්තා ප්‍රකාර මොහුගේ පිටේ තුවාල කැළැල් සහ වම් ඇසේ කර්ණිකාවේ තදබල තුවාලයක් පෙන්නුම් කර ඇත. වාර්තාව තවදුරටත් සඳහන් කරන්නේ, පපුවේ සහ ඇසේ වම් කොටසේ යටි පැත්තට මොට්ට ආයුධයකින් තුවාල සිදුකර ඇති බවත්, පිටේ මැද කොටසට තියුණු ලෙස බලය පෑමකින් තුවාල වී ඇති බවයි.

තිබුණත් අදාළ සිද්ධියට පෙර හෝ පසුව ඒවා සිදු වූ බව අධිකරණය විසින් පිළිගත්තත් අදාළ පාපොච්චාරණය අධිකරණය අදාළ කරගන්නා ලදී. මහේස්ත්‍රාත්වරයා ඇතුළු වෙනත් අයකුට, අදාළ පහරදීම් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට ද ඔහු අසමත් වී ඇත. 1995 දී සිංගරාසාව වරදකරු කර වසර 55 ක සිරදඬුවමකට යටත් කරන ලදී.[60]

ඔහුගේ දඬුවම් කාලය අඩු කළ මුත් අභියාචනාධිකරණයට ඉදිරිපත් කළ ඔහුගේ අභියාචනාව ප්‍රතික්ෂේප විය. 2000 ජනවාරි මසදී ශ්‍රේෂ්ඨාධිකරණයට ඔහු ඉදිරිපත් කළ පෙත්සම විභාග කිරීමට අවසර දීමට ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතික්ෂේප කළ අතර මේ මත පදනම් වෙමින් සිංගරාසා ජිනීවා නුවර කමිටුවට පැමිණිලි කරන ලදී.

මෙහිදී ප්‍රශ්නය වූයේ පාපොච්චාරණයට අත්සන් කිරීමට බලකිරීම සහ එහි ස්වෙච්ඡාසහගත ස්වභාවය ඔප්පු කරන කියා පැමෙත් සම්මුතියේ 14 වගන්තියේ 3(උ) පරිච්ඡේදය උල්ලංඝණය වූවේද යන්නයි. එක්සත් ජාතීන්ගේ කමිටුව මීට ධනාත්මක ලෙස ප්‍රතිචාර දක්වන ලදී. එසේ කරමින් තමන් විසින් ගොඩනගන ලද නීති විද්‍යාත්මක සංකල්පයන්ට අවධාරණය යොමු කරමින් කමිටුව පවසා සිටියේ කිසිදු පුද්ගලයකු තමන් විසින්ම වැරදිකරු බව දැක්වීමට හෝ පාපොච්චාරණය කිරීමට බල නොකළ යුතු බවත් මෙකී තත්ත්වය අදාළ පාපොච්චාරණය ලබා ගැනීමට යත්න දරන විමර්ශන නිලධාරීන්ගේ කායික හෝ මානසික තර්ජනය කිරීමකට ලක් නොවී සිදුවිය යුත්තක් බවත්ය.

මූලධර්මය යටතේ තේරුම් ගත යුත්තේ අදාළ පාපොච්චාරණය බල කිරීමකින් තොරව සිදු වූ බව අධිචෝදකයන් විසින් ඔප්පු කළ යුතු බවයි. වඩා වැදගත් ලෙස කමිටුව දැක්වූ කරුණක් වූයේ ලංකා රජය අදාළ පාපොච්චාරණයේ බල කරන ලද ස්වභාවය ඔප්පු කිරීම අඩු මට්ටමක දැමුවත් ස්වෙච්ඡා සහගත නොවන බවට වන ඉතා අඩු ඉඩ ප්‍රමාණයක් වුවත් අදාළ තීරණය චූදිතයාගේ වාසියට හැරවීමට සමත් වන බවට තර්ක කර සිටියත් අදාළ ඔප්පු කිරීමේ භාරය පෙත්සම්

---

60 *අදාළ දඬුවම් පැවරීම 1988 අංක. 28 (සංශෝධිත) මහජන ආරක්ෂක පනත යටතේ 1989 රෙගුලාසි අංක. 01 යටතේ පනවන ලද හදිසි නීති රෙගුලාසි (අනිකුත් ප්‍රතිපාදන සහ බලය) 23 (අ) යටතේ, ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව පත් කරන ලද රජයක් නීති විරෝධී ලෙස බලයෙන් පහ කිරීමට කුමන්ත්‍රණය කිරීම සහ (ත්‍රස්තවාදය වැළැක්වීම පිළිබඳ පනතේ ප්‍රතිපාදන සමඟ කියවන විට) මෙම අරමුණ සපුරා ගැනීම උදෙසා හමුදා කඳවුරු 04 කට පහරදීම මත පදනම් විය.*

ගොනු කළ අය සතු වන බවයි. ගැටළුවකින් තොරව කමිටුව දක්වා සිටියේ:

> වධහිංසාව සහ අයුතු සැලකීම් හි පෙත්සම් හුදෙක් වෛද්‍ය වාර්තා මත පදනම්ව (විශේෂයෙන්ම ප්‍රශ්න කිරීම හා පාපොච්චාරණය සිදුවී වසරකට පසු) ඉවත ලෑම පෙන්නුම් කරන්නේ මෙම භාරය පිළි නොපදින බවයි. තවදුරටත්, මහේස්ත්‍රාත්වරයාට තමාට කරන ලද අකටයුතු පැමිණිලි කිරීමට අසමත් වීම මත අදාළ චෝදනාවන්හි විශ්වාසනීයත්වය බිඳී යාම සම්බන්ධයෙන් කමිටුව දක්වා සිටියේ ඔහුගේ අපේක්ෂිත පොලිසියට බාර කිරීම මත මෙම තත්ත්වය චිරස්ථායී නොවන බවයි.

එක්සත් ජාතීන්ගේ කමිටුව දක්වා සිටියේ මෙම තත්ත්වයන් සම්මුතියේ ව්‍යවස්ථා 2 පරිච්ඡේද 3 සහ සම්මුතියේ ව්‍යවස්ථා 7 සමඟ එක්ව කියවෙන 14 ව්‍යවස්ථාවේ 3(උ) පරිච්ඡේදය (කිසිදු පුද්ගලයකු තමන්ට විරුද්ධව විභාග කිරීමට හෝ පාපොච්චාරණය කිරීමට බල නොකළ යුතු බව) උල්ලංඝණය වී ඇති බවයි.

මීට අමතරව, නඩු අංක. 6825/1994 යටතේ වරදකරු කිරීම සහ අභියාචකගේ ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනාව අවසන් වරට ප්‍රතික්ෂේප කිරීම ප්‍රමාද වීම (1995 සැප්තැම්බර් 29 සිට 2000 ජනවාරි 28) තුළින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ එක්ව කියවෙන 14 වගන්තියේ 3(ඇ) හා 5 පරිච්ඡේදයන් උල්ලංඝණය වන බවයි. මෙම වගන්තීන් යටතේ නඩු විභාගයක විමර්ශනයන් ප්‍රමාදයකින් තොරව පැවැත්වීමේ අයිතිය ලබා දේ. මෙහිදී සිංගරාසා වෙත නිදහස් කිරීමක් හෝ නඩු විභාගයක් සහ වන්දි ගෙවීම ඇතුළුව ඵලදායි සහ සුදුසු විසඳුමක් ලබා දීමේ බැඳියාවට රජය යටත් කරන ලදී. ඉදිරියේදී මෙවැනි උල්ලංඝණයන් වළක්වන ලෙසත්, PTA හි අදාළ වගන්ති සම්මුතියේ ව්‍යවස්ථාව හා යාවෙන පරිදි සංශෝධනය කරන ලෙසත්, රජයට නියෝග කරන ලදී. වික්ටර් අයිවන් සහ සිංගරාසා නඩුව ඇතුළු එක්සත් ජාතීන්ගේ කමිටුව මඟින් ශ්‍රී ලංකාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය උල්ලංඝණය වූ බවට තීරණය වූ අනිකුත් නඩු තීරණයන්ගෙන් තහවුරු වන්නේ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දේශීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලියවිල්ලේ ප්‍රතිපාදනයන් පුළුල් කිරීම උදෙසා රජයේ බැඳියාවන් සේ ඇති සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය වෙත යොමු වීමයි.

ඉතාමත් වැදගත් වශයෙන්, වීරවංශ එදිරිව නීතිපති,[61] නඩුවේදී අධිකරණය නම්‍යශීලී ලෙස දක්වා සිටියේ:

> "පුද්ගල නිදහස අහිමි වූ අයකුට අධිකරණයට ප්‍රවේශ වීමට අයිතිය ඇති අතර වර්තමානයේ එකී අයිතිය ප්‍රතික්ෂේප වූ අයට මානව හිමිකම් කමිටුව පැමිණිලි කළ හැකි සේ අන්තර්ජාතික නීතිය සුරක්ෂණයක් සපයයි."

මෙම අධිකරණය අදාළ සම්මුතියේ ප්‍රතිපාදනයන්ට අවධානයක් යොමු කළ යුතුද? මා සිතන ලෙස එසේ කළ යුතුමය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(15) වගන්තිය අවශ්‍යතාවයක් ලෙස රජය අන්තර්ජාතික නීතියට හා අන් රාජ්‍යයන් හා ගණුදෙනු කිරීමේදී සම්මුති බැඳීම් වලට ගරු කිරීමට යත්න දැරීමට උත්සුක විය යුතුය. මෙය හඟවන්නේ රජය ස්වකීය පුරවැසියන් හා ගණුදෙනු කිරීමේදී විශේෂයෙන්ම ඔවුන්ගේ නිදහස හා සබැඳි කාරණා වලදී රජය මේ ආකාරයෙන්ම අන්තර්ජාතික නීතියට සහ සම්මුති බැඳීම් වලට ගරු කළ යුතු බවයි. අන්තර්ජාතික නීතිය දක්වන සුරක්ෂණයක් රජය විසින් ඔවුනට ලබා දිය යුතුවේ.

7. අවසානය

ඉතා සියුම් ලෙස ගොඩ නඟන ලද අධිකරණමය ඇඳුම් ඇඟලා ගත් දාර්ශනික රජකු මෙන්, මනුෂ්‍යත්වය අභිබවා ගිය හැකියාවන්, ඉවසීම සහ තීක්ෂණභාවයන්ගෙන් බොහෝ සේ පිදුම් ලත් තමන් වෙත පැමිණෙන රළු සිද්ධීන් පවතින නෛතික සම්පත් ඔස්සේ නිර්මාණාත්මක ලෙස අර්ථනිරූපණය කරන විනිසුරු හර්කියුලස් තුළින් රොනල්ඩ් ඩෝකින් ස්වභාවයෙන්ම අධිකාරී බවක් දරයි.[62] නමුත් දාර්ශනික විනිසුරන්ගේ පැමිණීම මටසිළුටු නොවූ යුගයන්හි දී දුර්ලභ වේ.

කෙසේ නමුත්, නීතිය අග මුල සොයාගත නොහැකි ලෙස බැඳි ගිය ජාලයක්[63] සේ තේරුම් ගනිමින් මෙවැනි දැඩි සුභවාදී තත්ත්ව දර්ශකයන්

---

61 (2000)1 ශ්‍රී.නී.වා. 387 පිටු 409.

62 *R. Dworkin, Taking Rights Seriously* (Cambridge: Harvard University Press, 1977), 116-117.

63 ඉහත පාද සටහන.

අධිකරණය වෙත අරෝපණය කිරීමෙන් වැළකිය හැකි මුත්, විශේෂයෙන්ම පොදු නීතිය සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයන් එක්ව බැඳී ගිය යුක්ති සහගත ඒවා බවට බලාපොරොත්තු වීම යුක්ති සහගත වේ.

2004 වසර තුළදී මෙම තත්ත්ව දර්ශකය යටතේ තීරණය වූ නඩු තීරණ මැන බැලීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අයිතිවාසිකම් පරිච්ඡේදය පුළුල් කිරීමට සමහර විනිසුරන් උත්සාහ දැරුවද මෙකී ප්‍රවර්ධනයන් ඒකාත්මක නොවේ. කණගාටුදායී ලෙස මෙවැනි තීරණයන්හි අධ්‍යාපනික විශ්ලේෂණය (ධනාත්මක ලෙස හෝ ඍණාත්මක ලෙස) දුර්ලභ වන අතර ශක්තිමත් හා කාර්යක්ෂම වූ නීති විද්‍යාවක් ගොඩ ගැනීම උදෙසා අධ්‍යයනික කාර්යාවලිය සහ අධිකරණමය චින්තනය එකිනෙකට බැඳී ගිය අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවක් සේ ගැනිය හැක.

අධිකරණයේ විභාග කිරීමේ අවස්ථාව ලබා නොදීම සහ ඊට හේතු වූ අධිකරණමය සාධකයන් විභාග කිරීම උදෙසා ක්‍රියාකාරීන් විසින් නඩු තීරණ ගොනු කිරීම ද දක්නට නොහැක. ශ්‍රී ලංකාවේ නීති සහ අධිකරණමය ක්‍රියාවලියෙහි නිසි ක්‍රියාකාරීත්වය උදෙසා සිවිල් සමාජයේ විවේචනාත්මක මැදිහත් වීම තවදුරටත් අවශ්‍යව ඇත. මෙවැනි ධනාත්මකව සහ (වැදගත්) දේශපාලනික විමර්ශනයක් සහිත සහභාගීත්වය සාක්ෂිමය වශයෙන් සොයා ගත නොහැකිව ඇත. වෙනස් වූ තලයක් යටතේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාව වෙත වන බැඳීම් යටතේ එක්සත් ජාතීන්ගේ කමිටුවෙහි ඍජු මැදිහත් වීම සමහරක් අයට නොරුස්සන මුත් පැමිණිලි දේශීය අධිකරණමය තලයෙන් බැහැරට ගෙන යාම පෙන්නුම් කරයි.

කෙසේ නමුත්, සමහර අවස්ථාවන්හිදී දේශීය අධිකරණයන් ජනතාවගේ විශ්වාසය දිනා ගැනීමට අසමත් වන විටදී, ශ්‍රී ලංකාවේ කැමැත්තෙන් අන්තර්ජාතික නීතිය පිළිගත් බැඳීම් යටතේ වෙනස් වූ යාන්ත්‍රණයක් වෙත යොමු වීම නොවැළැක්විය හැක. 2004 වසරේ වැදගත් ලෙස පෙන්නුම් කරන ලද පරිදි මෙය අපට සමීප කරගත යුතු විය හැකි යම්තාක් දුරකට කැඳවීම් සහිත යථාර්ථයක් වේ.

ඉතාමත් වැදගත් වශයෙන්, වීරවංශ එදිරිව නීතිපති,[61] නඩුවේදී අධිකරණය නම්‍යශීලී ලෙස දක්වා සිටියේ:

> "පුද්ගල නිදහස අහිමි වූ අයකුට අධිකරණයට ප්‍රවේශ වීමට අයිතිය ඇති අතර වර්තමානයේ එකී අයිතිය ප්‍රතික්ෂේප වූ අයට මානව හිමිකම් කමිටුව පැමිණිලි කළ හැකි සේ අන්තර්ජාතික නීතිය සුරක්ෂණයක් සපයයි."

මෙම අධිකරණය අදාළ සම්මුතියේ ප්‍රතිපාදනයන්ට අවධානයක් යොමු කළ යුතුද? මා සිතන ලෙස එසේ කළ යුතුමය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(15) වගන්තිය අවශ්‍යතාවයක් ලෙස රජය අන්තර්ජාතික නීතියට හා අන් රාජ්‍යයන් හා ගණුදෙනු කිරීමේදී සම්මුති බැඳීම් වලට ගරු කිරීමට යත්න දැරීමට උත්සුක විය යුතුය. මෙය හඟවන්නේ රජය ස්වකීය පුරවැසියන් හා ගණුදෙනු කිරීමේදී විශේෂයෙන්ම ඔවුන්ගේ නිදහස හා සබැඳි කාරණා වලදී රජය මේ ආකාරයෙන්ම අන්තර්ජාතික නීතියට සහ සම්මුති බැඳීම් වලට ගරු කළ යුතු බවයි. අන්තර්ජාතික නීතිය දක්වන සුරක්ෂණයක් රජය විසින් ඔවුනට ලබා දිය යුතුවේ.

7. අවසානය

ඉතා සියුම් ලෙස ගොඩ නඟන ලද අධිකරණමය ඇඳුම් ඇඟලා ගත් දාර්ශනික රජකු මෙන්, මනුෂ්‍යත්වය අභිබවා ගිය හැකියාවන්, ඉවසීම සහ තීක්ෂණභාවයන්ගෙන් බොහෝ සේ පිදුම් ලත් තමන් වෙත පැමිණෙන රළු සිද්ධීන් පවතින නෛතික සම්පත් ඔස්සේ නිර්මාණාත්මක ලෙස අර්ථනිරූපණය කරන විනිසුරු හර්කියුලස් තුළින් රොනල්ඩ් ඩෝකින් ස්වභාවයෙන්ම අධිකාරී බවක් දරයි.[62] නමුත් දාර්ශනික විනිසුරන්ගේ පැමිණීම මටසිළුටු නොවූ යුගයන්හි දී දුර්ලභ වේ.

කෙසේ නමුත්, නීතිය අග මුල සොයාගත නොහැකි ලෙස බැඳී ගිය ජාලයක්[63] සේ තේරුම් ගනිමින් මෙවැනි දැඩි සුභවාදී තත්ත්ව දර්ශකයන්

---

[61] (2000)1 ශ්‍රී.නි.වා. 387 පිටු 409.

[62] *R. Dworkin, Taking Rights Seriously* (Cambridge: Harvard University Press, 1977), 116-117.

[63] ඉහත පාද සටහන.

අධිකරණය වෙත අරෝපණය කිරීමෙන් වැළකිය හැකි මුත්, විශේෂයෙන්ම පොදු නීතිය සම්බන්ධයෙන් අභියාවනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයන් එක්ව බැඳී ගිය යුක්ති සහගත ඒවා බවට බලාපොරොත්තු වීම යුක්ති සහගත වේ.

2004 වසර තුළදී මෙම තත්ත්ව දර්ශකය යටතේ තීරණය වූ නඩු තීරණ මැන බැලීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අයිතිවාසිකම් පරිච්ඡේදය පුළුල් කිරීමට සමහර විනිසුරන් උත්සාහ දැරුවද මෙකී ප්‍රවර්ධනයන් ඒකාත්මක නොවේ. කණගාටුදායී ලෙස මෙවැනි තීරණයන්හි අධ්‍යාපනික විශ්ලේෂණය (ධනාත්මක ලෙස හෝ ඍණාත්මක ලෙස) දුර්ලභ වන අතර ශක්තිමත් හා කාර්යක්ෂම වූ නීති විද්‍යාවක් ගොඩ ගැනීම උදෙසා අධ්‍යයනික කාර්යාවලිය සහ අධිකරණමය චින්තනය එකිනෙකට බැඳී ගිය අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවක් සේ ගැනිය හැක.

අධිකරණයේ විභාග කිරීමේ අවස්ථාව ලබා නොදීම සහ ඊට හේතු වූ අධිකරණමය සාධකයන් විභාග කිරීම උදෙසා ක්‍රියාකාරීන් විසින් නඩු තීරණ ගොනු කිරීම ද දක්නට නොහැක. ශ්‍රී ලංකාවේ නීති සහ අධිකරණමය ක්‍රියාවලියෙහි නිසි ක්‍රියාකාරීත්වය උදෙසා සිවිල් සමාජයේ විවේචනාත්මක මැදිහත් වීම තවදුරටත් අවශ්‍යව ඇත. මෙවැනි ධනාත්මකව සහ (වැදගත්) දේශපාලනික විමර්ශනයක් සහිත සහභාගිත්වය සාක්ෂිමය වශයෙන් සොයා ගත නොහැකිව ඇත. වෙනස් වූ තලයක් යටතේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාව වෙත වන බැඳීම් යටතේ එක්සත් ජාතීන්ගේ කමිටුවෙහි ඍජු මැදිහත් වීම සමහරක් අයට නොරුස්සන මුත් පැමිණිලි දේශීය අධිකරණමය තලයෙන් බැහැරට ගෙන යාම පෙන්නුම් කරයි.

කෙසේ නමුත්, සමහර අවස්ථාවන්හිදී දේශීය අධිකරණයන් ජනතාවගේ විශ්වාසය දිනා ගැනීමට අසමත් වන විටදී, ශ්‍රී ලංකාවේ කැමැත්තෙන් අන්තර්ජාතික නීතිය පිළිගත් බැඳීම් යටතේ වෙනස් වූ යන්ත්‍රණයක් වෙත යොමු වීම නොවැළැක්විය හැක. 2004 වසරේ වැදගත් ලෙස පෙන්නුම් කරන ලද පරිදි මෙය අපට සමීප කරගත යුතු විය හැකි යම්තාක් දුරකට කැඳවීම් සහිත යථාර්ථයක් වේ.

III

ආගම ඇදහීමේ අයිතිය

*ආර්. කේ. ඩබ්. ගුණසේකර**

1. හැඳින්වීම

ඉවැන්ජලිකල් (ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කරන) ක්‍රිස්තියානි පල්ලිවල මතුවීම හා යෝජිත ව්‍යවස්ථාපිත සංශෝධනයන් කුපිත වූ, ආගමික වන්දනාමානයන් හි නිරත වීමට ඇති නිදහස පිළිබඳ වාදය, අලුත් දෙයක් නොවේ. තම නිවාස අසල පිහිටි ප්‍රදේශවල පිටස්තරයින් විසින් අලුතින් ක්‍රිස්තියානි පල්ලි ගොඩනැංවීමත්, එළිමහනේ හෝ කුලියට ගත් නිවසක හෝ කාමරවල යාඥා රැස්වීම් (Prayer meetings) පැවැත්වීමත් සම්බන්ධයෙන් දැනට වසර කිහිපයක සිටම බෞද්ධ සහ හින්දු ආගමික ජනයා වෙතින් විරෝධතා එල්ල වෙමින් පැවතිණි. මෙමගින් ඇමරිකානු ඉතිහාසයේදී, ආගන්තුකයෙකු අසු පිට නැඟී නව නියම් ගමක් වෙත ගොස් එහි කුඩා ශාලාවක් ඉදි කර ඒ ගමේ වැසියන්ට ක්‍රිස්තියානි ආගමික වත් පිළිවෙත් හි නිරත වීමට මඟ පෙන්වූ ආකාරය සිහිපත් කරවයි. නමුත් මෙකී මුල් වසර වලදී, ඇමරිකාවට පැමිණි ජනයා ක්‍රිස්තියානි රටවල් වලින් පැමිණි අතර ඔවුන් ක්‍රිස්තු වහන්සේගේ වචනය අවබෝධයෙන් පිළිගත් පිරිසක් විය. නමුත් මෙහිදී එලෙස නොවූයේ,

* නීතිඥ.

ක්‍රිස්තියානි ආගම ඇතුළුව බොහෝ ආගම් මෙහි මුල් බැසගෙන තිබූ නිසාත්, මෙලෙස අනනගාමිකයන් ඇද ගැනීමට උත්සුක වූ නව පල්ලි විවෘතව එම ක්‍රියාවේ යෙදීමත් සියුම් නොවන ආකාරයට ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම හෝ ක්‍රිස්තියානි විශ්වාසයන් වෙනස් කිරීමේ යෙදී සිටීමත් නිසා එම පල්ලි ඉතාමත් වෙනස් වූ ආකාරයට පෙනෙන්නට විය. කැළඹිලිකාරී සිදුවීම් කිහිපයක් බොහෝ ලෙස නොපෙනීම අවසන් වී ගියේය. රැස්වීම් ශාලාවක් ගොඩනැඟීම සඳහා ක්‍රිස්තියානි ආගමික කණ්ඩායමකට අවසරය ලබා දුන් කොළඹට ආසන්න ප්‍රාදේශීය අධිකාරියක් විසින්, මීට වසර 10 කට පමණ පෙර ගාස්තු ගෙවා නීති උපදෙස් ලබා ගැනීමට පැමිණි ආකාරය මට මතක් වේ. එම ශාලාව යාඥා රැස්වීම් පවත්වන්නට යොදා ගන්නා බව දැනගත් විටම ඉතා නිස්සාර වූ කාරණාවක් මත බලපත්‍රය අවලංගු කළ අතර, ගොඩනැගිලි බලපත්‍රයක් ලබාගැනීම සඳහා නව ඉල්ලුම් පත්‍රයක් ලබා දෙන ලෙස කළ ඉල්ලීම ද ප්‍රතික්ෂේප විය. සැබැවින්ම සිදුවී ඇත්තේ මෙම පල්ලියේ ක්‍රියාකාරකම් වලට එම ප්‍රදේශයේ ප්‍රබල බෞද්ධයින්ගෙන් විරෝධය එල්ල වීමත්, ඔවුන් ප්‍රකාශ කරන පරිදි මෙම පල්ලිය යාබද නගරයේ ප්‍රකෝප වූ බෞද්ධයින් විසින් එම නගරයෙන් ද නෙරපා හැර තිබීමත්ය. මගේ නඩුව දිනීමට බලාපොරොත්තු තබාගත නොහැකි එකක් වූ අතර ඉල්ලුම් පත්‍රයක් ලබා දීමටත් එය නියමාකාරයෙන් සලකා බැලීමටත් වගකීම භාරගත් බැවින් එම වගකීම මත මා සතුටින් සමථයකට එළඹුණි.

ඉතා කෙටි කාල පරාසයක් තුළ රටේ සෑම තැනකම - නගරවල, ග්‍රාමීය ප්‍රදේශවල, වතුකරයේ, යුද්ධයෙන් විනාශ වූ දිස්ත්‍රික්කවල, සරණාගත කඳවුරු ආශ්‍රිතව යනාදි තැන්වල ඉවැන්ජිලිකල් පල්ලි වශයෙන් පොදුවේ හඳුන්වණු ලබන මෙම පල්ලි තව තවත් මතුවන්නට විය. මේවා විවිධ නම් වලින් හැඳින්වුණු අතර, සමහර අවස්ථාවල ගොඩනැගිලි තාප්පවල නම් පැහැදිලිව පෙනෙන සේ පින්තාරු කර තිබිණි.

මේවා එකිනෙකින් වෙන්ව ස්වාධීනව පෙනෙන්නට තිබුණ අතර අනුග්‍රහය ලබාදෙන දේව ගැති කෙනෙක් විය. ඒවා ඒකාබද්ධ කර දක්වන කාරණය වූයේ යාඥාව හා බයිබලය කියවීමයි.

සාක්ෂි ප්‍රදායික ක්‍රිස්තියානි ආගමික පුදපූජා විධි වලින් වෙනස් වූ ඉවැන්ජලිකානු ආගම, නොදන්නා දෙයක් නොවුණු අතර මීට පෙර පල්ලි කිහිපයක් ආරම්භ කර සහ පිළිගෙන තිබුණි. විශ්වාසය

පැතිරවීමේ ලා ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලට බාධා නොකෙරුණු අතර සමහර අවස්ථා වලදී හිරිහැරකාරී දෙයක් ලෙස පමණක් දක්නා ලදී. නමුත්, මෙහි ඇති වෙනස නම් පල්ලි විශාල ගණනක් බිහිවීම සහ විධිමත් සැලැස්මක් නොමැති වීමයි. ක්‍රිස්තියානි නොවන අය පමණක් නොව ක්‍රිස්තියානුවෝ පවා ඔවුන්ගේ සම්ප්‍රදායික පල්ලි වෙතින් ඈදී ආහ. ජනාධිපති බුෂ් මහතා මධ්‍ය-බටහිර ප්‍රදේශවාසී ජනතාවගෙන් යුත් සභාවක් අමතා මෑතකදී කළ මැතිවරණ ප්‍රචාරණ කතාවකදී (කතුවරයා විසින් සවන් දුන්), සිත් ඇදගැනීමෙහි සමත් ගරු පූජක. බිලී ග්‍රැහැම් මහතාට ස්තුතිවන්නට තමා ''නැවත උපන් ක්‍රිස්තියානුවකු'' වූ බව ආඩම්බරයෙන් ප්‍රකාශ කළ අතර, එබැවින් තමා තරුණයකු කල ඇති කරගත් මත්පැන් බීමේ දැඩි පුරුද්ද අත්හැරීමට හැකි වූ බවද ප්‍රකාශ කර සිටියේය. ආදර්ශමත් ලෙස ජීවත්වීම සහ නරක පුරුදු අතහැරීම යනාදිය ඉවැන්ජලිකානු ආගම පැතිරවීම හා සම්බන්ධිතව තිබේ. ඔවුන්ගේ ආගමික පිළිවෙත් සහ දේව ගැති සභා නායකවරුන්ගෙන් යුත් මණ්ඩලය කෙරේ යම් තරමින් හෝ අවඥාවක් පෙන්නුම් කළ ක්‍රිස්තියානි ආගමේම වර්ගයක් කෙරෙහි ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය පිළිබඳ ප්‍රතිෂ්ඨාපිත ක්‍රිස්තියානි පල්ලි අවිනිශ්චිත වීම පුදුමසහගත දෙයක් නොවේ. නමුත්, ඔවුන්ගේ ආගමට හරවා ගන්නන් දිනාගන්නා විධි සහ සමහර අවස්ථාවල දී වෙනත් ඇදහිලිවල අනුගාමිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ වෙනස් ආකාරයට සැලකීම යනාදිය නිසා විශේෂයෙන්ම බෞද්ධාගමිකයින් හා හින්දු ආගමිකයින් අතර නියත ලෙසම තරහක් ඇති කරන ලදී.

2. ව්‍යවස්ථාපිත කරන කෙටුම්පත්

දැනට රටේ පවතින ආගමික සාධාරණත්වය යන යහපත් හැඟීම මගින් දේපළ හා ජීවිත වලට තර්ජනයක් ඇති කරමින් මතුවිය හැකි දරුණු සට්ටනයන් වළක්වන ලද නමුත් පොදු හැඟීම වූයේ ඉවැන්ජලිකානු ආගම මැඩලිය යුතු බවයි. ඒ සම්බන්ධව වූ මුල් අභියෝගය අසාමාන්‍ය ආකාරයක් ගත් අතර එම අභියෝගය වූයේ වසර කිහිපයක් පුරා විද්‍යාමානව තිබූ පල්ලියක්, ව්‍යවස්ථාපිතව සංස්ථාපනය කිරීම වැළැක්වීමයි. එලෙස ආගමික සහ වෙනත් ආයතන, රජයේ මූලිකත්වයකින් තොරව, නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික ව්‍යවස්ථා කෙටුම්පතක් මගින් සංස්ථාපනය කිරීම, අසාමාන්‍ය දෙයක් නොවිණි. පාර්ලිමේන්තුව විසින් ව්‍යවස්ථාදායකය මත තම බලය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා, පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල,

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික ව්‍යවස්ථා කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය විශේෂ කාර්යපටිපාටිය දක්වා තිබේ.[1]

වසර 2001 දී "ක්‍රිස්තියානි සහනයේ දොරටුව යාඥා කේන්ද්‍රය" ("The Christian Sahanaye Doratuwa Prayer Centre") යන තේමාවෙන් වූ කෙටුම්පතක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික ව්‍යවස්ථා කෙටුම්පතක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් විය. එය නියෝග පත්‍රයට ඇතුළත් කරන ලද අතර පාර්ලිමේන්තුවේ යෝජනා සම්මුතියකින් එයට අවසර ලබා දෙන ලදී. මෙය එම කෙටුම්පතේ ප්‍රථම කියවීම විය. එහි ව්‍යවස්ථානුකූල බව පුරවැසියකු විසින් 121 වන වගන්තිය යටතේ අභියෝගයට ලක්කළ අතර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රජයේ ව්‍යවස්ථා කෙටුම්පතක් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික ව්‍යවස්ථා කෙටුම්පතක් යනු කුමක්දැයි වෙන්කොට හඳුනා ගැනීමට උත්සාහයක් නොදරාම එම පෙත්සම සලකා බැලීමට බාරගන්නා ලදී. රටේ ක්‍රියාත්මකව පවතින පුණ්‍ය කටයුතුවල නිරත, ආගමික සහ සමාජ සංවිධාන රාශිය අතරින්, අනුමාන කළ හැක්කේ සමහර සංවිධාන වලට යම්කිසි ලාභයක් උපයා ගැනීමට හැකි නොවන්නේ නම් ඒවා පාර්ලිමේන්තුවේ පනතක් මගින් සංස්ථාපනය වීම සඳහා බාධා නොවන බවයි. එලෙස ලාභයක් පවරාදීම ව්‍යවස්ථා විරෝධී ද යන්න මීට පෙර ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට පැමිණි කාරණයක් නොවූ නමුත් දැන් එය අධිකරණය විසින් විනිශ්චය කළ යුතු කරුණක් බවට පත්ව ඇත.

අධිකරණයේ තර්කය වූයේ, මෙම කෙටුම්පත සම්මත වුවහොත්, එමගින් මෙම යාඥා කේන්ද්‍රයට මුදල් රැස්කිරීමට හා වියදම් කිරීමට ව්‍යවස්ථාපිත බලයක් ලබා දෙන නීතියක් පැනවෙන බවත්, ඔවුන්ගේ අරමුණු නිර්මල ආගමික අරමුණු නොවන නිසා එමගින් තම ආගම වෙනස් කිරීමට පුද්ගලයින් මත අයුතු බලපෑමක් පැනවිය හැකි බවයි. "10 වන

[1] ස්ථාවර නියෝග 47 සහ 48 බලන්න. දෙවෙනි වරට කියවීමෙන් පසුව එම කෙටුම්පත ස්ථාවර කාරක සභාවට හෝ තේරීම් කමිටුව වෙත පවරන අතර, එම කමිටුවට "මෙම කෙටුම්පත සම්මත කිරීම ඉතා නුවණට හුරු ක්‍රියාවක් බවට පෙන්නුම් කිරීමට එම කෙටුම්පතේ සෘජුව දක්වා ඇති කරුණු සහ වෙනත් චෝදනා සඳහා සාක්ෂි ඉල්ලා සිටිය හැකි අතර, එයට අවශ්‍ය යැයි සිතන වාචික සහ වෙනත් සාක්ෂි ලබා ගැනීමට හැකියාව ඇත." මෙම කෙටුම්පතේ වගන්ති පිළිබඳව මෙම කමිටුව වෙත අති විශාල බලයක් ඇති අතර එය පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කරයි. නමුත්, පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වෙත මෙම කෙටුම්පත සහ එය හඳුන්වා දෙන මෝසම භාර දෙන මුල්ම අවස්ථාවේදීම මෙම කෙටුම්පත පාර්ලිමේන්තුවේ නියෝග පත්‍රයට ඇතුළත් කිරීම වැදගත්ම කරුණ වේ.

වගන්තියෙන්[2] සහතික කර ඇති සෑම පුද්ගලයෙකුටම තමාගේ කැමැත්ත අනුව ආගමක් හෝ ඇදහීමක් පිළිගැනීමට ඇති නිදහස" පිළිබඳ අධිකරණය කියා සිටින්නේ එමගින් "යෝජනා වන්නේ, එම තෝරා ගැනීමට කුමන හෝ ආකාරයකින් ඇදයක් ඇති කරවිය හැකි, පෙළඹවීම මගින් සිදු කළ හැකි බාධා කිසිවකින් තොරව කෙනෙකුගේ සිතිවිලි සහ හොඳ නරක වටහා ගැනීමේ බුද්ධිය නිදහසේ භාවිතා කිරීම තුළින් එම තෝරාගැනීම පැන නගින බවයි."[3] මෙම තර්කයට අනුබල දුන් කරුණක් වන්නේ, එම සංගමයේ බලතල මගින් කේන්ද්‍රයට වාණිජමය සහ ආර්ථිකමය ක්‍රියාකාරකම් වල නිරත වීමට අවසර ලබා දිය හැකි බව සොයා ගැනීමයි. අතීතයේදී සමාන බලතල වලින් යුත් විවිධ ආගමික සංවිධාන සංස්ථාපනය කිරීමට අවසර ලබාදී තිබීම යන කරුණ අධිකරණය ඉදිරියේ ඇති කෙටුම්පතේ ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට නොගැලපේද යන්න සලකා බැලීම ප්‍රතික්ෂේප කිරීමට අධිකරණයට හේතුවක් නොවීය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඉ)[4] වගන්තිය මගින් සෑම පුරවැසියෙකුටම සහතික කර ඇති ආගමක් අනුගමනය කිරීමට සහ වන්දනාමානයන්හි නිරත වීමට සහ තමා විසින් හෝ අන් අය සමඟ සම්බන්ධ වී පිළිවෙත් පිළිපැදීමට ඇති නිදහස, 14(1)(උ)[5] වගන්තිය මගින් සහතික කර ඇති නිදහසට වඩා වෙනස් වූ දෙයක් ලෙස සැලකිය යුතුය. වසර ගණනක් පුරා පැවති බුද්ධිමත් ලිබරල් චින්තනය නැමති සමාජ රැල්ලට එරෙහිව යමින්, ආණ්ඩුක්‍රම

---

[2] තමාගේ කැමත්ත අනුව ආගමක් හෝ ඇදහීමක් පවත්වා ගැනීමට හෝ පිළිගැනීමට ඇති නිදහස ඇතුළත්ව, සෑම පුද්ගලයෙකුටම සිතීමේ, හෘද සාක්ෂියේ සහ ආගමික නිදහසට අයිතියක් ඇත.

[3] අංක. 2/2001 දරණ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව.

[4] "තමා විසින්ම හෝ අන් අය සමඟ එක්වී සහ පොදු හෝ පෞද්ගලික ස්ථානයක, වන්දනාමාන කිරීම, පිළිපැදීම, අනුගමනය සහ ඉගැන්වීම මගින් තමාගේ ආගම හෝ ඇදහීම ප්‍රකාශයට පත්කිරීමට ඇති නිදහස..."

[5] "තමා විසින් තනිවම හෝ අන් අය සමඟ එක්වී, ඕනෑම නීත්‍යානුකූල රක්ෂාවක, වෘත්තියක, කර්මාන්තයක හෝ ව්‍යාපාරයක නිරතවීමට" පුරවැසියකු සතු නිදහස ආගමික සංවිධානවල බලතල පිළිබඳ ලබාදී ඇති පටු අර්ථකථනයෙහි සංසන්දනාත්මක වෙනස බැලූ විට ඒවා අනුගමනය කරන ආකාරයට එදිරිව යන අතර, ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, 25(2)(අ) වගන්තිය මගින් ආගමික සංවිධානයකට "ආගමික අනුගමනය කිරීම් හා සම්බන්ධ වුණු ඕනෑම ආර්ථිකමය, මූල්‍යමය, දේශපාලනමය හෝ වෙනත් ලෞකික ක්‍රියාකාරකම්වල නිරත වීමට" හැකි බව පිළිගන්නා නමුත්, එම ක්‍රියාකාරකම් විධිමත් කිරීමට හෝ සීමා කිරීමට ඇති අයිතිය රජය වෙත තබා තිබේ.

ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිපාදන, ආගමික ක්‍රියාකාරකම් මත සීමාවන් පැනවීමට භාවිතා කරන ලදී.

පාර්ලිමේන්තුවේ තේරීම් හෝ ස්ථාවර කාරක සභාව විසින් ඉතා වැදගත් සහ තීරණාත්මක කරුණු යැයි සැලකීමට ඉඩ තිබූ, යාඥා කේන්ද්‍රය හෝ එහි ක්‍රියාකාරකම් වලට සම්බන්ධිත වූ කරුණු, පරීක්ෂා කිරීමකින් තොරවම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම කෙටුම්පත පිළිබඳ තීන්දුවට එළඹ තිබේ. ඇත්තවශයෙන් කියතොත්, "සලකා බැලීම සඳහා මතුවී තිබෙන නෛතික ගැටළු වලට ඍජු අදාළත්වයක් නොමැති හෙයින්" විරුද්ධත්වය පාන්නා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පරීක්ෂා කිරීම අනවශ්‍ය වූ බව අධිකරණය ප්‍රධාන වශයෙන්ම ප්‍රකාශ කර සිටි අතර එබැවින්, මෙම තීන්දුව අනුමානයන් මත පදනම් වූ එකක් බවට පත්විය. ප්‍රකාශිත පරිදි, විශේෂයෙන්ම සංවිධානයක් සංස්ථාපනය කිරීමට වැනි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික කෙටුම්පතක් සලකා බැලීමට වඩාත් යෝග්‍යතම කාලය වන්නේ, පාර්ලිමේන්තු කමිටුවේ වැඩකටයුතු අවසන් වීමෙන් පසු කාලය බවත්, එම අවස්ථාවේදී අධිකරණයට අඩු වූ බලසීමාවක් ඇති බවත්ය. නමුත් මෙම කරුණ පිළි නොගන්නා ලදී.

වසර දෙකකට පසුව "නව මිදි එළදාවේ දේව සභා (සංස්ථාපන)"- "[New Wine harvest Ministries (Incorporation)]" යන මැයෙන් යුතු වූ කෙටුම්පතක් මේ ආකාරයටම අභියෝගයට ලක්විය. පෙර කෙටුම්පත මෙන් නොව, මේ කෙටුම්පතට අනුබලයක් වීම සඳහා පෙත්සමක් ගොනු කෙරුණු අතර එවිට විරෝධතා වලට එදිරි වූ තර්කයන් අධිකරණය ඉදිරියේ තැබීමට හැකි විය. විශ්වාසයන් පැතිරවීමට සහ ප්‍රවර්ධනය කිරීමට උපකාර වන ආර්ථිකමය ක්‍රියාකාරකම් වල නිරත වීමට තරම් ආගමික නිදහස් පුළුල් නොවන බවට විරෝධය පාන්නා විසින් තරයේ කියා සිටි විට, එයට එදිරි වෙමින් ඉදිරිපත් වූ තර්කය නම්, "ඇදහීම්, න්‍යායන්, අනුගමනයන් ප්‍රවර්ධනය කිරීම සෑම ආගමකම කොටසක් සහ, සෑම ආගමක්ම අනුගමනය කිරීමේදී පුද්ගලයින්ගේ විශ්වාසයන් හෝ පරිශීලනයන් කුමක්ද යන්න නොසලකමින් ඔවුන්ගේ සමාජ ආර්ථිකමය තත්ත්වයන් නඟා සිටුවීමේ පරහිතකාරී අරමුණු ද අන්තර්ගත වේ"[6] යන තර්කයයි. පෙනෙන පරිදි, අධිකරණය එකඟ විය හැකිව

[6] අංක. 2/2003 දරණ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන්.

තිබුණේ මෙම "නහා සිටුවීම" එකම ආගමකට බැඳී සිටින පුද්ගලයින්ට සීමා වූයේ නම් වන අතර, නමුත් එය වෙනත් ආගම්වල පුද්ගලයින් දක්වා ව්‍යාප්ත වන විට නොවේ. "මෙලෙස සමාජ ආර්ථිකමය තත්ත්වයන් නහා සිටුවීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි පෙළඹවීම මගින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන වගන්තියෙන් සහතික කර ඇති සෑම පුද්ගලයෙකුටම තමාගේ කැමැත්ත පරිදි ආගමක් හෝ ඇදහීමක් පිළිපැදීම සඳහා තිබිය යුතු නිදහස විකෘති කරනු ඇත."[7]

මාස කීපයකට පසු "මෙන්සින්ගන් හි සාන්ත ෆ්‍රැන්සිස්ගේ තෙවැනි නිකායේ සිරි කුරුසයේ ප්‍රාදේශීය ගුරු සොයුරියන් (සංස්ථාපන)" - "[Provincial Teaching Sisters of the Holy Cross of the Third Order of Saint Francis in Menzingen (Incorporation)]" යන තේමාවෙන් වූ කෙටුම්පතක් ද 10 වන වගන්තියට අනුරූප නොවන බවට නිගමනය කරන ලදී.[8] ප්‍රථම වතාවට විරෝධය පාන්නා විසින් 9 වන වගන්තියේ[9] සහය ලබා ගන්නා ලද අතර, ඔහුගේ තර්කය වූයේ ද්‍රව්‍යමය සහ වෙනත් වාසි සපයමින් ක්‍රිස්තියානි ආගම පැතිරවීම බෞද්ධාගමේ පැවැත්මට පවා බලපාන බවයි. පෙනෙන පරිදි, අධිකරණයේ තර්කය වූයේ, ආගමක් ප්‍රකාශ කිරීමට ඇති අයිතියට (14(1)(ඉ) වගන්තිය) ආගමක් පැතිරවීම හෝ ආගමික දැනුම පැතිරවීම අන්තර්ගත නොවන බවයි. අධිකරණය ප්‍රකාශ කර සිටින්නේ මෙන්සින්ගන් නිකාය සංස්ථාපනය කිරීමට අවසර දීම යනු බෞද්ධාගම පෝෂණය කිරීමට රජය සතු වගකීම හා පිළිගැටුමක් ඇති කරවන නීතියක් පැනවීම යන්නද? එසේ නම්, එම අර්ථනිරූපණය මගින් ආගමික නිදහස අයුතු ලෙස සීමා කරයි.

එමෙන්ම, ප්‍රථම වතාවට මෙම නඩු තීන්දුවේ, සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියේ (ICCPR) 18(2) වන වගන්තිය පිළිබඳ සහ විශ්වාසයක් වෙනස් කරවීමට බලහත්කාරය යෙදවීම

---

[7] එම

[8] අංක. 19/2003 දරණ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව.

[9] ශ්‍රී ලංකා ජනරජය බෞද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දෙන අතර ඒ අනුව, සෑම ආගමකටම 10 වන සහ 14(1)(ඉ) වගන්තියෙන් ලබාදී ඇති අයිතීන් ගැන සහතික වෙමින්, බෞද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම රජයේ වගකීම වේ.

තහනම්[10] කර තිබීම ගැන සඳහන් කර තිබුණි. අර්ථනිරූපණය පිළිබඳව මතු වූ ගැටළුවකදී ප්‍රකාශයට පත් වූයේ ''බලහත්කාරය'' යන්න සමහර අර්ථයන්හි යෙදෙන විට සදාචාරාත්මක බලහත්කාරය ලෙස හැඳින්විය හැකි බවයි. එනම් එවිට අරමුණ වන්නේ තෑගි මත වෙනත් ද්‍රව්‍යමය වාසි ලබා දීමෙන් වෙනත් ආගමකට හැරවීමයි. මෙම නඩු තීන්දුවේදී, ග්‍රීක නඩු[11] වලදී *යුරෝපීය මානව හිමිකම් අධිකරණය* සහ *ස්ටැනිස්ලෝස් එදිරිව මධ්‍ය ප්‍රදේශයේ රජය*[12] යන නඩුවේදී ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නඩු තීන්දු සඳහන් කර ඇත. සඳහන් කළ යුතු තවත් කරුණක් වන්නේ, මෙම නඩු තීන්දු වලින් අර්ථනිරූපණය වූයේ වෙනත් ආගමකට හරවා ගැනීමට එරෙහි නීතින් වන බවත් සංස්ථාපනය කිරීම සම්බන්ධ නඩු වලදී ඒවා අර්ථයෙන් පිට පැවති බවත්ය.

අවසාන නඩු තීන්දුවේ අලුතින් ඇතුළත් වී ඇත්තේ 9 වන වගන්තිය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දුටු ආකාරයයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්[13] ආගම පැතිරවීමේ මූලික මිනිස් අයිතිවාසිකමක් සහතික කර නොමැත යන කරුණ සඳහන් කරමින් අධිකරණය කියා සිටියේ, එමනිසා ''කෙනෙකුගේ ආගම වෙනස් කර තමන්ගේ ආගමට හරවා ගැනීමට උත්සාහයන් ගතහොත් එම ක්‍රියාවන් මගින් බෞද්ධ ශාසනයේ නිති පැවැත්මට බාධා පමුණුවන බවයි.'' අධිකරණය ''උත්සාහයන්'' යන්නෙන් අදහස් කළේ ද්‍රව්‍යමය සහ වෙනත් වාසි සැපයීම වන අතර, ඒවාට අධ්‍යාපනික, සෞඛ්‍ය සහ වෙනත් සමාජ සේවාවන් ඇතුළත් විය හැක.

---

10 මෙම වගන්තිය, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ ආගමික නිදහස පිළිබඳ 18 වන වගන්තිය විස්තර කරමින් තවදුරටත් දක්වන්නේ, ''තමාගේ කැමැත්ත අනුව ආගමක් හෝ ඇදහීමක් පවත්වා ගැනීමට හෝ පිළිගැනීමට ඇති නිදහසට හානි සිදු කරන බලහත්කාරකමට කිසිදු පුද්ගලයෙකු භාජනය නොවිය යුතුයි.''

11 *Kokkinakis v. Greece* (1944) 17 EHRR (යුරෝපීය මානව හිමිකම් වාර්තා) 397, *Larissis v. Greece* (1998) 27 EHRR (යුරෝපීය මානව හිමිකම් වාර්තා) 329.

12 AIR (All India Reports) 1977 SC 908.

13 ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 25(1) වගන්තිය මගින් ''නිදහසේ ආගමකට බැඳීමට, අනුගමනය කිරීමට සහ පැතිරවීමට ඇති අයිතිය'' සහතික කර ඇත. *ස්ටැනිස්ලෝස්* නඩු තීන්දුවේදී පැතිරවීම - (Propagate) යන්න දැඩි ලෙස සීමා කරමින් අර්ථනිරූපණය කර ඇති අතර, එයින් අදහස් වන්නේ, කෙනෙකු වෙනත් ආගමකට හැරවීමට ඇති අයිතිය නොවන නමුත්, තම ප්‍රතිපත්ති ප්‍රදර්ශනය කිරීම මගින් කෙනෙකුගේ ආගම සම්ප්‍රේෂණය කිරීම හෝ ප්‍රචාරය කිරීමයි.

මෙම නඩු තීන්දුවෙන් 14(1)(ඉ) වගන්තියට සාපේක්ෂව 9 සහ 10 වගන්තිවල ආගමික නිදහසේ විෂය පථය වැරදි සහගත ලෙස අඩුකර ඇත. සිතීමේ හෘද සාක්ෂියේ සහ ආගමික නිදහස යන සංකල්ප තුළ සෑම ආගමක් සහ ඇදහීමක්ම අන්තර්ගතව ඇති හෙයින් අවශ්‍ය වූ විටක යම් යම් ප්‍රකාශනයන් සීමා කිරීමට ඇති අයිතිය රජය සතුව තබා ගැනීම අත්‍යවශ්‍ය විය. එබැවින් 15(7) වන වගන්තිය[14] සමඟ කියවිය යුතු 14(1)(ඉ) වගන්තියේ එකම කාර්යය වූයේ එයයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන වගන්තියේ දැක්වෙන ආගමික නිදහස පරම අයිතියක් වන අතර එය නීතියක කාර්ය පටිපාටියකින් හැර සීමා කිරීම් වලට භාජනය නොවන අතර, එයට විශේෂ බහුතරයක් ඇති අතර එය ජනමත විචාරණයකින් ද අනුමත වී තිබේ.[15] ඉන්දියාවේ තත්ත්වය මෙය නොවේ. එහිදී ආගමික නිදහස වෙනස් වූ ආකාරයකට ප්‍රකාශ කර ඇති අතර එය පරම අයිතියක් ද නොවේ.[16]

---

14 ක්‍රියාවට නැංවීමේදී "14 වන වගන්තියෙන් ප්‍රකාශයට පත් කර ඇති මූලික අයිතීන්... ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ පොදු සෞඛ්‍යය සහ සදාචාරයේ ආරක්ෂාව, හෝ අන් අයගේ අයිතීන් හා නිදහස සඳහා ඇති නිසි පිළිගැනීම සහ ගෞරවය සුරක්ෂිත කිරීමේ අභිප්‍රාය වෙනුවෙන්, හෝ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනය සඳහා වූ සාධාරණ අවශ්‍යතා සපුරාලීම යන කරුණු වල යහපත වෙනුවෙන් නීතිය මඟින් නියම කර ඇති යම් සීමාවන්ට යටත් වේ." යම් වාතාවරණයකදී සීමාවන් පැනවීම නියත වශයෙන්ම අවශ්‍යදැයි තීරණය කිරීමට යම්තාක් ප්‍රමාණයකට අගයක් රජය වෙත ඇති බවට අධිකරණය විසින් පිළිගනු ඇත. මූලික අයිතිවාසිකම් සංක්ෂේප කිරීමට අධිකරණ වලට කිසිදු අයිතියක් ලබාදී නොමැත. මෙය ජනාධිපති නීතිඥ එච්. එල්. ද සිල්වා මහතා විසින් "ශ්‍රී ලංකාවේ සුළුජන අයිතීන් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී ඇති ආරක්ෂාවන් (Constitutional Protections of Minority Rights in Sri Lanka)" යන මැයෙන් ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ සංගමය (Ceylon Muslims Association) අමතා කළ කතාවේදී මෙම කරුණ ඉදිරිපත් කරන ලදී. නියම ආකාරයෙන්ම ව්‍යවස්ථාදායකයේ කාර්යයක් වූ මූලික අයිතිවාසිකම් හා නිදහස මත සීමාවන් පැනවීමට උත්සාහ කිරීම තුළින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීමේ විෂය පථයෙන් ඔබ්බට ගොස් ඇති බව, ඔහු විසින් ඉහත නඩු තීන්දු තුන පිළිබඳව කළ විග්‍රහයෙන් දක්වා තිබේ. තමුත් 21 වන පිටුව බලන්න.

15 83 වන වගන්තිය.

16 25 වන වගන්තිය "හෘද සාක්ෂියේ සහ නිදහසේ ආගමක් වැළඳ ගැනීමේ, සහ අනුගමනය කිරීමේ සහ පැතිරවීමේ නිදහස - 1. මහජන සාමය, (සැලකිය යුතුයි - ජාතික ආරක්ෂාව බැහැර කර ඇත) සදාචාරය සහ සෞඛ්‍යය සහ මෙම කොටසේ වෙනත් ප්‍රතිපාදනයන්ට ද යටත්ව සෑම පුද්ගලයෙකුටම හෘද සාක්ෂියේ සහ නිදහසේ ආගමක් වැළඳ ගැනීමට, අනුගමනය කිරීමට හා පැතිරවීමේ නිදහසට සමානව අයිතියක් ඇත." (සැලකිය යුතුයි - ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ආගමක් ප්‍රකාශයට පත් කිරීමට ඇති නිදහස පිළිබඳව වෙනම සඳහන් කර නොමැත) රාම්ජි

සංස්ථාපනයක් ලබාගැනීමට අසමත් වීම මගින් මෙම පල්ලිවල ක්‍රියාකාරකම් නතර කිරීමට නොහැකි වූ බව ප්‍රකට කරුණක් වූ අතර වෙනත් ආගම් මත ක්‍රිස්තියානි ආගම මගින් සිදු කරන හදිසි ආක්‍රමණ

ලාල් මෝඩි එදිරිව උත්තර් ප්‍රදේශයේ රජය (Ramji Lal Modi v. *State of Uttar Pradesh)*, AIR 1957 SC 620 - යන නඩුවේදී, ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා සිටියේ, ආගමික නිදහසට ඇති අයිතිය විශේෂයෙන්ම මහජන සාමය යනාදී දෙයට යටත්ව ඇති කරන ලද අතර, එබැවින් "මහජන සාමය පවත්වාගෙන යාම මත ආගමික නිදහසේ කිසිදු සම්බන්ධයක් තිබිය නොහැකි බව හෝ ආගමකට අදාළව වරදක් නිර්මාණය කරන නීතිය, කිසිම වාතාවරණයක් යටතේ වුවත්, එම නීතිය පැනවූයේ මහජන සාමයේ යහපත වෙනුවෙන් යැයි කියා සිටිය නොහැකි බවද ප්‍රකාශ කළ නොහැක." වෙනත් නඩුවක් වූ, *අරුන් ගෝෂ් එදිරිව බටහිර බෙංගාල රජය (Arun Gosh* v. *State of West Bengal)* AIR 1970 SC 1228, හිදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ, යම්කිසි දෙයකින් හුදෙක් එක් පුද්ගලයෙකුට බලපෑමක් සිදුවීම නොව සමාජයේම දිවිය පවත්නා මහට යම් බාධා කිරීමක් සිදුවෙයි නම් එය මහජන සාමය කැළඹීමක් ලෙසට සලකනු ලැබේ. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් *ස්ටැනිස්ලෝස්* නඩු තීන්දුවේදී දුන් තීන්දු ප්‍රකාශ වූයේ, රජයේ ක්‍රියාවන් සාධාරණීකරණය කිරීමෙන් අදහස් වන්නේ සමාජයේ හෘද සාක්ෂියට බාධාවක් වන ආකාරයට සිදු කරන එක් ආගමකින් තවත් ආගමකට හරවා ගැනීම තහනම් කිරීම මගින් මහජන සාමයට ඇතිවිය හැකි කැළඹීම් වැළැක්වීමයි - යන කාරණයයි. මෙය ආගම ක්‍රමවත් කිරීමක් ලෙස නොදකින ලද නමුත් මහජන සාමය (රජය යටතේ වූ විෂයක්) කඩකිරීම සම්බන්ධව නීති පැනවීම සඳහා රජය සතු වූ බලය ක්‍රියාවට නැංවීමක් ලෙස දකින ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් දෙක අතර වූ වෙනස්කම් සැලකිල්ලට ගැනීමකින් තොරව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ස්වකීය තීන්දුවේදී, *ස්ටැනිස්ලෝස්* නඩුව උපුටා දක්වා ඇත. වෙනත් ආගමකට හරවා ගැනීමට විරුද්ධව ඉන්දියානු රජයේ වූ නීතින් (ඉහත සඳහන් කළ පරිදි) ආගමික නිදහස මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පනවා ඇති සීමාවන් යටතට වැටේදැයි සලකා බැලීමට ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණයට සිදුවිය. වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්හිදී, ආගමික නිදහස පරම අයිතියක් විය හැකි වුවත් ප්‍රකාශයට පත්කිරීම මහජන සාමය හෝ වෙනත් යම් කොන්දේසියකට යටත්ව හිමිව තිබේ. ග්‍රීක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ, "වන්දනාමානයන් හි පිළිවෙත් ඉෂ්ට කිරීම මගින් මහජන සාමයට හෝ මහජන සදාචාරයට අගතියක් සිදු නොවිය යුතුයි යන්නයි." (13(21) වගන්තිය) තුර්කි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, යාඥා කිරීම්, වන්දනාමානයන් සහ ආගමික මෙහෙයන් යනාදිය "රටේ භෞමික අඛණ්ඩතාවයට සහ ජාතියේ එක්සත්කමට රහසේ පිඩා පැමිණවීමේ අදහස ඇතිව" ක්‍රියාත්මක කළ නොහැක. (14(1) වගන්තිය) යුරෝපීය මානව හිමිකම් අධිකරණය විසින් (The European Court of Human Rights), *ලයිලා සහින් එදිරිව තුර්කිය (Leyla Sahin* v. *Turkey)* යන නඩුවේදී (2004 ජූනි 29) රජයේ උසස් අධ්‍යාපන ආයතන තුළ ඉස්ලාමීය හිස් සළුව පැළඳ සිටීම චක්‍රලේඛයක් මගින් තහනම් කළ අතර එය තහවුරු කරන ලදී. එමෙන්ම එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන පාඨශාලාවන්හි ආගම නොඉගැන්විය යුතුය (Principle of Secularism) යන ප්‍රතිපත්තිය මගින් සාධාරණීකරණය කර ඇති අතර එය රජයට තීරණයක් ගැනීමට යම්තාක් ප්‍රමාණයකට ලබාදී ඇති අගයට ද අන්තර්ගත වේ.

නිසා වෙනත් ආගමකට හරවා ගැනීමට විරුද්ධව අපරාධ නීතියක් ඇති කරවන ලෙසට උද්ඝෝෂණයක් විය. ඇති වූ තර්කය වූයේ ක්‍රිස්තියානි ආගමේ ඉතිහාසය කුමක් වුවත්, කෙනෙකු වෙනත් ආගමකට හරවා ගැනීමේ අයිතිය ක්‍රියාත්මක කරමින් තම ආගම පැතිරවීම, සමහර අවස්ථා වලදී විශ්වාසය නැති අයවලුන් එලෙස තම ආගමට හරවා ගැනීමේ වගකීමක් ලෙස, පල්ලිවාදය තුළින් දැන් පිළිගෙන ඇති බවයි. එලෙස හරවා ගැනීමට යම් යම් සීමාවන් ඇති අතර එම සීමාවන් කඩ කිරීම මඟින් සිදු කරන හරවා ගැනීම් ආචාර ධර්මයන්ට පටහැනි හරවා ගැනීම් වේ. බලය යෙදීම, වෙනත් ආගමික සංකේත විනාශ කිරීම ආදිය තහනම් කිරීම සීමා පැනවීමේ ආරම්භය වූ අතර ඊට පසුව නූතන කාලයට අදාළ වෙනත් ආකාරයේ ක්‍රමෝපායයන් එනම් ආගම වෙනස් කිරීමට අදාළව ගත්විට වෙනත් අර්ථයකින් ලබාදිය හැකි වංචාව සහ රැවටීම වැනි ක්‍රමයන් භාවිතය තහනම් කිරීම සිදුවිය. ''පෙළඹවීම'' යනු අවසන් කරුණ වන අතර එයින් අවධාරණය කරන්නේ ආචාර විරෝධීව වෙනත් ආගමකට හැරවීම ශාරීරික බලහත්කාරකමකින් පමණක් සිදුවීම අවශ්‍ය නොවන බවයි. නමුත් වඩාත්ම මතභේදයට තුඩු දුන් කරුණ ද එයයි. වත්මන, යම් ආගමක් කෙරෙහි වැඩි බදු අය කරන්නන්ගේ මතය දැරීමට කැමති අයට ''පෙළඹවීම'' යනු වෙනත් ආගමකට හැරවීමට විරුද්ධව පැනවෙන නීතිවල කේන්ද්‍රය වේ. එමෙන්ම, එය ඉතා පටු ලෙස නිර්වචනය කර ඇත්තේ ව්‍යවස්ථාවෙන් සෑම දෙනෙකුටම සහතික කොට ඇති සෑම ආගමක්ම ඇදහීමට ඇති නිදහසේ අයිතිය උල්ලංඝණය කිරීමෙන් පැහැදිලි ලෙස ඉවත් වී සිටීමටයි. සරදමට කරුණක් වන්නේ, වෙනත් ආගමකට හරවා ගැනීමට පෙළඹවීම යොදාගැනීම තහනම් කිරීම මුලින්ම පිළිගන්නා ලද්දේ ග්‍රීසියේ වීමත් එය ශාස්ත්‍රීය ක්‍රිස්තියානි පල්ලියකට ආරක්ෂාව සැපයීමක් ලෙස දැකීමත්, දැන් එයම ක්‍රිස්තියානි නොවන්නන් නව මාදිලියේ ක්‍රිස්තියානි ආගමකින් ආරක්ෂා කිරීම සඳහා කැපී පෙනෙන ලෙස යොදා ගැනීමත්ය.

ඉහත දක්වන ලද පරිදි, සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියේ 18 වන වගන්තියෙන්, පුද්ගලයෙකුගේ ආගමක් වෙනස් කිරීම සඳහා බලහත්කාරය යෙදවීම තහනම් කිරීම මඟින් ආගමක් පැතිරවීමට ඇති සීමාවන් සලකා බලනු ලැබේ. බලහත්කාරය යන්න නිර්වචනය කර නොමැති බැවින්, වංචනික ක්‍රමයන් පමණක් නොව පෙළඹවීම හා කරට කර පැමිණිය හැකි සදාචාරාත්මක බලහත්කාරයෙන් එයට අන්තර්ගතය යන කරුණ විවාදයට විවෘතව

ඇත.[17] මෙම වගන්තියම ආගමික පදනම මත සිදුවන සෑම ආකාරයකම නොරිස්සුම්සහගත සහ වෙනස් කොට සැලකීම් මුලිනුපුටා දැමීම් ප්‍රකාශනයේ ඇති නමුත්, එය නිදහස් සහ මානව හිමිකම් සුරැකීමේ යුරෝපීය සම්මුතියෙහි නොමැති අතර, එමගින් සදාචාරාත්මක හා සදාචාරාත්මක නොවන ලෙස වෙනත් ආගමකට හැරවීම යනු කුමක්ද? යන ගැටළුව මහ හැර ඇත.

බලහත්කාරය භාවිතා කිරීම තහනම් කිරීමට, යම් පුද්ගලයෙකුට තම ආගම අත්හැර පවත්වා ගැනීමට ඇති අයිතිය පිළිගැනීම අයත් වේ. ආගමික නිදහස තුළ කෙනෙකුට ආගම වෙනස් කිරීමට ඇති නිදහස හෝ වෙනත් ආගමක් පිළිගැනීමට ඇති නිදහස ආවේණික වුවත්, එහිදී කෙනෙකුගේ ආගම සුරක්ෂිත කිරීමට ඇති නිදහස පිළිබඳව ප්‍රකාශිතව දක්වා නැත. නමුත්, සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියේ පොදු විවරණ අංක. 22 න් දක්වන්නේ ''ආගමක් පවත්වා ගැනීමට හෝ පිළිගැනීමට'' ඇති නිදහස අනිවාර්යයෙන්ම ප්‍රතිඵලයක් ලෙස උපදවන්නේ ''කෙනෙකුගේ ආගමක හෝ විශ්වාසය අත්හැර පවත්වා ගැනීමට ඇති අයිතිය'' වන අතර එමගින් කුමන ආකාරයකින් හෝ වූ බලහත්කාරය හා කෙනෙකුගේ වර්තමාන ආගම හෝ විශ්වාසය අතර සම්බන්ධකමක් ඇති කරයි.

3. බලහත්කාරයෙන් වෙනත් ආගමකට හැරවීමට එරෙහි ව්‍යවස්ථා කෙටුම්පත

වෙනත් ආගමකට හැරවීමට එරෙහිව නීති පැනවීමට ඇති ඉඩ ප්‍රස්ථාව නිසා, මහජන සංවාද සහ එවැනි නීති වලට එරෙහිව හා එකඟව

---

17 ග්‍රීක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එක් ආගමක් අතහැර වෙනත් ආගමක් වැළඳ ගැනීමේ වාදය තහනම් කිරීමටත් පෙර සිට (13(2)1 වන වගන්තිය බලන්න) එලෙස එක් ආගමක් අතහැර වෙනත් ආගමක් වැළඳ ගැනීමේ වාදයෙහි (Prosetytism) නියුක්තවීම සාපරාධී ක්‍රියාවක් විය. එය නිර්වචනය කර ඇත්තේ ''යම් ආකාරයක පෙළඹවීමක් හෝ ලාභයක් පිළිබඳව හෝ සිත දිරිමත් කිරීමක් හෝ ද්‍රව්‍යමය සහයක් පිළිබඳ පොරොන්දුවක් හෝ වංචනික ක්‍රමයන් හෝ අනෙක් පුද්ගලයාගේ පළපුරුදු නැතිකම, විශ්වාසය අවශ්‍යතාවය අඩු බුද්ධි මට්ටම හෝ අව්‍යාජත්වයෙන් ප්‍රයෝජන ගැනීම මගින් හෝ වෙනත් ආගමික දෘෂ්ටියක් ඇති පුද්ගලයෙකුගේ ආගමික විශ්වාසයන් වලට හානි කිරීමේ අරමුණ ඇතිව සෘජුව හෝ සෘජු නොවන ආකාරයට එම පුද්ගලයාගේ ආගමික විශ්වාසයන් මත බලපෑම් කිරීමට උත්සාහ දැරීම'' යනුවෙනි.

ආධාර දෙන කරුණු ප්‍රබලව ලබා දෙන පාඨක ප්‍රතිචාර ඇති කරවීය: සිංහල පුවත්පත් වලට ලිපි එවන්නන් බොහෝ වශයෙන්ම එම නීතීන් වලට එකඟව ලිපි ලියන ලදී. බුද්ධ ශාසන ජනාධිපති කොමිසම විසින් 2003 වර්ෂයේ අවසාන කාර්තුවේ පළ කරන ලද වාර්තාවෙන් සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති ක්‍රිස්තියානි සංවිධාන 110 ක ලැයිස්තුවක් නිකුත් කරන ලද අතර, නව මිෂනාරි හෝ බයිබලය පරම සත්‍යය සේ පිළිගන්නා කණ්ඩායම් (New Missionary or Fundamentalist Groups) ලියාපදිංචි කිරීම සඳහා සෑම ආගමකම නියෝජිතයින්ගෙන් සමන්විත වුණු අන්තර්සාමයික උපදේශන මණ්ඩලයකින් (Interfaith Advisory Council) අනුමැතිය ලබාදිය යුතු යැයි ද යෝජනා කරන ලදී. (*සන්ඩේ ටයිම්ස්*, 2004 ජනවාරි 04) වෙනත් ආගමකට හැරවීමට එරෙහිව නීතියක් ඇති නොකිරීම සඳහා වැදගත් කරුණු ඉදිරිපත් කරමින් කතෝලික අගරදගුරුවරුන්ගේ සභාව විසින් ප්‍රකාශ කරන්නට යෙදුණේ "මෙම වත්මන් වාතාවරණය ඇතිවී තිබෙන්නේ සදාචාරාත්මක නොවූ" ලෙස එක් ආගමකින් තවත් ආගමකට හරවා ගැනීම් සිදුවේ යැයි විශාල සැලකිල්ලක් ඇතිවී තිබෙන නිසා බව අප දන්නා කරුණකි. තම ආගමට හරවා ගැනීමට පුද්ගලයින් දිනා ගැනීම පිණිස ද්‍රව්‍යමය අල්ලස් භාවිතය පිළිබඳ අපගේ පැහැදිලි අප්‍රසාදය ප්‍රකාශ කර සිටිනවා" යනුවෙනි. (*අයිලන්ඩ්*, 2004 ජනවාරි 17) ඒ අතරතුර, සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය (Civil Rights Movement) විසින් 2004 වසරේ ජනවාරි 25 වන දින නිකුත් කළ ප්‍රකාශයෙන්, වෙනත් ආගමකට හැරවීමට එරෙහිව නීතියක් නොපැනවීම සඳහා කරුණු ඉදිරිපත් කරන ලදී:

> "කෙනෙකුගේ ආගම හෝ විශ්වාසය ප්‍රකාශනයට ව්‍යවස්ථානුකූලව ලබාදී ඇති අයිතිය ආරක්ෂා කරන අතරම, 'සදාචාර විරෝධී' ක්‍රම මගින් පුද්ගලයෙකු වෙනත් ආගමකට හැරවීම යන්න ව්‍යවස්ථානුකූලව නිර්වචනය කිරීමට උත්සාහ දැරීම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි හෝ සුදුසු ක්‍රියාවක් නොවේ. එවැනි නීතියක් අවශ්‍යයෙන්ම සියුම් නොවන ලෙසට අර්ථ නිරූපිත විය යුතුය. කෙනෙකුට උප්පත්තියෙන් හිමි වන ආගම අත හැරීමට ඇති අයිතියත් තම කැමැත්තට අනුව ආගමක් වැළඳ ගැනීමට ඇති අයිතියත් සෑම විටම අප සමාජය විසින් පිළිගෙන ඇත. මිනිසුන් විවිධාකාර වූ හේතූන් නිසා ස්වකීය ආගම් වෙනස් කරනු ලැබේ. සමහරවිට ඒවා ඉතා පෞද්ගලික හේතූන් වේ. සිතිවිලි සහ විශ්වාසය යන විෂය පථයේදී මිනිසුන්ගේ සිත් තුළට කිඳා බැසීමට නීතියට නොහැක."

වෙනත් ආගමකට හැරවීමට එරෙහිව නීතියක් පැනවීමට රජයේ අනුග්‍රහය නොලැබෙන බව පැහැදිලිව පෙනුණු විට, මෑතකදී පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයට පත්වූ බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් විසින්, නව වරදක් නිර්මාණය කිරීමට "බලහත්කාරයෙන් එක් ආගමකින් වෙනත් ආගමකට හැරවීම තහනම් කිරීම" යන ශීර්ෂයෙන් යුතුව පෞද්ගලික ව්‍යවස්ථා කෙටුම්පතක් හදුන්වා දෙන ලදී. එයින් ප්‍රකාශ කර සිටියේ, ඉවැන්ජලිකානුවන් විසින් සිදු කරන්නේ යැයි කියනු ලබන ආකාරයේ සදාචාර විරෝධීව පුද්ගලයින් වෙනත් ආගමකට හැරවීම් නතර කිරීමට අවශ්‍ය බවත්, අවසර ලබාදී ඇති පරිදි හා සම්පූර්ණයෙන්ම රටේ පිළිගෙන ඇති සහ දැන් 9 සහ 10 වන වගන්ති වලින් පවා සහතික කර ඇති ලෙසට වූ අව්‍යාජ හෝ සත්‍යාකාර ලෙස විශ්වාසයක් වෙනස් කිරීම්, නතර කිරීමට අවශ්‍ය නොවන බවත්ය. "බලය හෝ පෙළඹවීම් හෝ වංචනික ක්‍රම භාවිතයෙන්" එක් ආගමකින් තවත් ආගමකට පුද්ගලයින් හරවා ගැනීමට පමණක් මෙම නීතිය අදාළ වීම සීමා කිරීමට තරම් ව්‍යවස්ථා කෙටුම් පතේ දීර්ඝ ශීර්ෂයෙන් ප්‍රවේශම් වී ඇත. ප්‍රාරම්භයේ සඳහන් කර ඇත්තේ, බහුතර ජනයා විසින් බැඳී සිටින සහ අනුගමනය කරන ප්‍රමුඛ ආගම වන්නේ බෞද්ධාගම බවත්, බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම රජයේ වගකීම බවත්, බලහත්කාරයෙන් හෝ පෙළඹවීමෙන් හෝ වංචනික ක්‍රමෝපායන් මගින් බලහත්කාරයෙන් වෙනත් ආගමකට හැරවීමට හෝ ආගම අතහැර වෙනත් ආගමක් වැළඳ ගැනීමේ වාදයට හසුවීමේ බරපතල තර්ජනයකට බෞද්ධ හා බෞද්ධ නොවන අය භාජනය වී ඇති බවත්, මේ සම්බන්ධව ආගමික සහජීවනය ප්‍රවර්ධනය කිරීමේ හා සුරැකීමේ අවශ්‍යතාවය ආගමික නායකයින් විසින් අවබෝධ කරගෙන ඇති බවත් යන කරුණුය. වැඩි වශයෙන්ම විරුද්ධත්වයක් ඇති වූයේ, වෙනත් ආගමකට හැරවීම ලියාපදිංචි කිරීමේ ප්‍රතිපාදන වලට අවසර දීමට නොහැකි බවට, පොදුවේ පිළිගත් පසු, පෙළඹවීම - (allurement) යන වදන සඳහන් කර තිබීමයි.

ව්‍යවස්ථා කෙටුම්පතේ 2 වන වගන්තියෙන් වංචාව භාවිතා කොට (පුළුල් අර්ථයෙන් ගත් කල) එක් පුද්ගලයෙකුට ඔහුගේ ආගම අත් හැරීමටත් වෙනත් ආගමක් වැළඳ ගැනීමටත් හේතු වන දේවල් සිදු කිරීම හෝ සිදු කිරීම උත්සාහ කිරීම තහනම් කර ඇති අතර 4(අ) වගන්තිය මගින් එය සාපරාධී වරදක් බවට පත්කර ඇති අතර එය අවුරුදු 5 ක් දක්වා වූ කාලයකට සිරකර තැබීමටත් රු. 150,000/- ක් දක්වා වූ දඩයක් ද සහිත දණ්ඩනයකටත් යටත් කර ඇත. එම වරද සඳහා අනුබල දීම වෙනුවෙන් මෙම දණ්ඩනයම හිමි වේ. 4(අ) වගන්තියේ අතුරු විධානය

සහ 1 වන උපලේඛනය මගින් බාල වයස්කාරයකු, (අවුරුදු 18 ට අඩු) කාන්තාවක (විවාහ වූ අයකු විය හැක) හෝ උපලේඛනයේ සඳහන් (වර්ග 11 ක් සම්පූර්ණයෙන් දක්වා ඇත.) ඕනෑම අයෙකු වෙනත් ආගමකට හැරවීම, බරපතල වරදක් බවට පත් කර ඇති අතර ඒ සඳහා දණ්ඩනය අවුරුදු 7 ක සිරදඬුවමක් හා රු. 500,000/- ක දඩයක් බවත් දක්වා තිබේ.[18] මෙම වරද පූජකයෙකු, පැවිද්දකු, දේවගැතිතුමෙකු හෝ වෙනත් ආගමක පදවියක් දරන්නකු පමණක් නොව වෙනත් ඕනෑම අයෙකු විසින් ද සිදු කළ හැක. එසේ වරදකරු කිරීම මගින් මෙලෙස වෙනත් ආගමකට හරවා ගැනීම ශූන්‍ය බවට පත්වන්නේ නැත.

3 වන වගන්තිය අනුව ස්ව කැමැත්තෙන් වුවත් නව ආගමක් වැළඳ ගන්නා විට, එලෙස ආගම වෙනස් කළ තැනැත්තා හා එසේ වෙනස් කිරීමට වගකිව යුතු තැනැත්තා විසින් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඒ පිළිබඳව දැන්වීම (වඩාත් සුදුසු ලෙස රෙගුලාසියක් මගින් අමාත්‍යවරයා විසින් වෙනත් ආගමකට සිදු කරන හරවා ගැනීම් සඳහා නියම කර ඇති පොතක වාර්තා කිරීමයි.) අවශ්‍යතාවයක් විය. එසේ නොකළහොත්, ඔවුන් වසර 05 ක සිරදඬුවමකින් හා රු. 150,000/- ක දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරුවන් බවට පත්වේ. 3 වන වගන්තියෙන් අදහස් කර ඇති පරිදි මෙම වරද සීමා කරන එකම සාධකය නම්, එලෙස වෙනත් ආගමකට හැරවීමට වගකිව යුතු පුද්ගලයා හෝ එසේ පහසුකම් සැලසූ පුද්ගලයා වරදකරුවෙකු කිරීමට නම්, එසේ වෙනත් ආගමකට හැරවීම සඳහා යම් ආකාරයක උත්සවයක් (පූජා විධි) පවත්වා තිබිය යුතුය.

'අගතියට භාජනය වූ පුද්ගලයකු (person aggrieved)' විසින් කළ පැමිණිල්ලක් මත ක්‍රියා කරමින් පොලිසියට අමතරව මහේස්ත්‍රාත්

---

[18] සැබවින්ම අවුල් ජාලයක් වූ ලැයිස්තුවකි. සමෘද්ධිලාභීන්, සිරකරුවන් පුනරුත්ථාපන කඳවුරුවල හෝ සරණාගත කඳවුරු වල හෝ රැඳවුම් කේන්ද්‍ර වල රැඳවියන්, ශාරීරිකව හෝ මානසිකව ආබාධිත වූවන්, සංවිධානවල සේවකයන්, පොලිසියේ හෝ යුධ හමුදාවල සාමාජිකයින්, ශිෂ්‍යයින්, රෝහල්ගත රෝගීන්, අමාත්‍යවරයා විසින් නියම කරන ලද වෙනත් ඕනෑම වර්ගයක පුද්ගලයින්.

සසඳා බලනු - තම ආගම අතහැර වෙනත් ආගමක් වැළඳ ගැනීමේ වාදයට වූ ග්‍රීක අර්ථනිරූපණය, එනම් - පුද්ගලයෙකුගේ පළපුරුදු නැතිකම, විශ්වාසය, අවශ්‍යතාවය, අඩු බුද්ධි මට්ටම හෝ අව්‍යාජත්වයෙන් ප්‍රයෝජන ගැනීම ඉතා බරපතල වාතාවරණයක් ලෙස නොසැලකූ නමුත්, පාසලක හෝ පරහිතකාමී ආයතනයක් තුළදී මෙවැනි වරදක් සිදුකිරීම එසේ බරපතල වාතාවරණයක් ලෙස සලකනු ලැබේ.

අධිකරණයේ අපරාධ චෝදනා ගොනු කිරීමට 5 වන වගන්තිය මගින් බොහෝ පුද්ගලයින්ට බලය පවරා දී ඇත. උදාහරණයක් වශයෙන්, 'මහජන සුභ සිද්ධිය පිණිස ක්‍රියා කරන' හෝ 'අමාත්‍යවරයා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයකුට' මෙලෙස චෝදනා ගොනු කිරීම ඇරඹිය හැක.

ව්‍යවස්ථා කෙටුම්පතේ ප්‍රධානතම වචන, එනම්, 'වෙනත් ආගමකට හරවා ගැනීම (convert),' 'පෙළඹවීම (allurement),' 'බලහත්කාරය (force),' 'වංචනික (fraudulent),' වැනි වචන අර්ථනිරූපණය කරන්නේ 8 වන වගන්තියෙනි. වෙනත් ආගමකට හරවා ගැනීම යන්න ඉතා පටු ලෙස අර්ථනිරූපණය කර තිබුණේ යම් පුද්ගලයෙකුට තම ආගම අත්හැර වෙනත් ආගමක් වැළඳ ගැනීමට ක්‍රියා කිරීම යන අර්ථය ගෙන දෙන ලෙසයි. එය ආගම වෙනස් කිරීම මිසක ආගම හෝ විශ්වාසය වෙනස් කිරීම නොවේ.[19] පෙළඹවීම යන්න ආකර්ෂණීය යමක් පහත ආකාරව පිරිනැමීම ලෙස විස්තර කර ඇත. එනම්, (i) මුදල් හෝ වෙනත් ආකාරයේ වූ තෑග්ගක් හෝ අල්ලසක්; (ii) මුදල්මය හෝ වෙනත් ආකාරයේ වූ ද්‍රව්‍යමය ලාභයක් ලබාදීම; (iii) රැකියාවක් ලබාදීම හෝ රැකියාවේ උසස්වීමක් ලබාදීම වේ.[20] බලහත්කාරය පිළිබඳ නිර්වචනයට, ඕනෑම ආගමක් හෝ ආගමික විශ්වාසයක් පිළිබඳව ආගමික අමනාපකම් හෝ නින්දා ඇති වීමේ තර්ජනය අන්තර්ගත විය.[21]

---

[19] සන්සන්දනාත්මකව බැලූ කල, ග්‍රීක නීතියට අනුව තම ආගම අතහැර වෙනත් ආගමක් වැළඳ ගැනීමේ වාදයෙන් අදහස් වූයේ, වෙනත් ආගමික දෘෂ්ටියක් ඇති පුද්ගලයෙකුගේ ආගමික විශ්වාසයන් මත බලපෑමක් ඇති කිරීම, (පාද සටහන 17 loc.cit) යන්න වූ අතර එමගින්, එකම ආගමක් තුළ විශ්වාසයන් වෙනස් කිරීම පිළිබඳව දඬුවම් ලබාදීමට ග්‍රීක අධිකරණ වලට බලය හිමිවිය. (1967) ඔරිස්සා ආගමික නිදහස පිළිබඳ පනතෙහි (Orissa Freedom of Religion Act) "එක් ආගමික විශ්වාසයකින් වෙනත් ආගමික විශ්වාසයකට" මාරුවීම තහනම් කර ඇත. නමුත්, මධ්‍ය ප්‍රදේශ් ධර්ම ස්වතන්ත්‍රය අධිනියම් පනතෙහි (1968) (Madhya Pradesh Dharma Swatantraya Adhiniyam Act) එක් ආගමකින් වෙනත් ආගමකට මාරුවීම තහනම් කර ඇත.

[20] නඩු තීන්දුව සඳහා භාවිතා කළ ව්‍යවස්ථා කෙටුම්පතේ ඉංග්‍රීසි පිටපතේ දක්වා ඇත්තේ මෙම නිර්වචනයයි. සිංහල පිටපතේ එය තරමක් වෙනස් ආකාරයට දක්වා ඇත. ඔරිස්සා පනතේ, 'පෙළඹවීම (inducement)' යන සංකල්පය භාවිතා කර ඇති අතර එහි නිර්වචනයට යම් ආකාරයක මුදල් හෝ වෙනත් තෑග්ගක් හෝ අල්ලසක් පිරිනැමීම සහ මූල්‍යමය හෝ වෙනත් ආකාරයක ලාභයක් ලබා දීම යනාදිය අන්තර්ගත වේ.

[21] ඔරිස්සා පනතේ දිව්‍යමය අප්‍රසාදයන්ට ලක්වීම හෝ සමාජයෙන් / දේව සභාවෙන් නෙරපීමේ තර්ජනයන් අන්තර්ගත විය.

මෙම ව්‍යවස්ථා කෙටුම්පත නියෝග පත්‍රයට ඇතුළත් කළ පසු, එහි ව්‍යවස්ථානුකූලභාවය පෙත්සම්කරුවන් 21 දෙනෙකු විසින් (වැඩියෙන්ම ආගමික සංවිධාන වූ නමුත් වඩාත් හොඳින් දන්නා ලෞකික මානව හිමිකම් කණ්ඩායම් හා පුද්ගලයින් ද ඒ අතර විය.) අභියෝගයට ලක් කෙරුණු අතර මැදිහත් පෙත්සම්කරුවන් 21 දෙනෙකු විසින් සහයෝගය ලබා දෙන ලදී. මානව හිමිකම් කොමිසම විසින් නීතිපති වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් ප්‍රතිපාදන උල්ලංඝණය කරන වගන්ති පිළිබඳ තමන්ගේ ඇති අවධානය ප්‍රකාශ කර සිටි අතර එම වාර්තාවේ අන්තර්ගත කරුණු අධිකරණය වෙත ඉදිරිපත් කරතැයි බලාපොරොත්තු විය. වාචික දේශන සීමා කෙරුණු අතර අඩුපාඩු මහ හරවා ගැනීමට ලිඛිත දේශන ගොනු කරන ලදී. නීතිපතිතුමාගේ ස්ථාවරය දැනගැනීම සඳහා නීතිපතිතුමන් නියෝජනය කළ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයාගෙන් අධිකරණය ඉතා ඕනෑකමින් ප්‍රශ්න අසන ලදී. ඔහුගේ පිළිතුරු වූයේ, කරුණු කිහිපයක් හැරෙන්නට, නීතිපතිතුමන් මෙම ව්‍යවස්ථා කෙටුම්පතට සහයෝගය දක්වන බවයි.[22] අධිකරණය, (විනිසුරු ටී.බී. වීරසූරිය, විනිසුරු එන්.ඊ. දිසානායක සහ විනිසුරු රාජා ප්‍රනාන්දු) සතු කාලය ව්‍යවස්ථාව මගින් සීමා කර ඇති බැවින් තම තීන්දුව ලබා දීමේදී ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් විසින් ඉදිරිපත් කරන ලද දේශනයන් සවිස්තරාත්මකව සලකා බැලීමට නොහැකි විය.

4. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව

ස්වකීය නඩු තීන්දුවේදී,[23] පෙළඹවීම මගින් (පසුව මෙය අනුවාද වූයේ, 'පුද්ගලයෙකුව තම ආගම අත්හැරීමට සිතෙන තරම් වශී කරවීමේ බලාපොරොත්තුවෙන්' යම්කිසි ලාභයක් පිරිනැමීම යනුවෙනි.) ආගම වෙනස් කරවීම තහනම් කිරීමේ කිසිදු වරදක් අධිකරණය විසින් නොදුටු නමුත්, එහි නිර්වචනය මගින් අධිකරණය විසින් යෝජිත සංශෝධනය එනම්, එම ආකර්ෂණීය යමක් ලබා දුන්නේ වෙනත් ආගමකට හරවා ගැනීමේ අරමුණ ඇතිව බව, එයින් අදහස් විය යුතු යැයි සිතීය. මෙම සංශෝධනයෙන් වැදගත් වෙනසක් සිදු නොවේ. ත්‍යාගශීලී හා පුණ්‍යාධාර

---

22 ව්‍යවස්ථාපිත කරන කෙටුම්පත් *(The Incorporation Bills)*, සම්බන්ධයෙන් ඒවා වෙනුවෙන් විත්ති වාචක ඉදිරිපත් කිරීමට නීතිපතිතුමාට සිද්ධ නොවුණේ ඒවා ඔහු හරහා ඉදිරිපත් නොවුණ බැවිනි.

23 පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කළේ 2005 ජනවාරි 4 වන දින පමණයි.

කටයුතුවල නිරත වීමට ආගමික සංවිධාන වලට ඇති අයිතිය අධිකරණය විසින් ප්‍රශ්න නොකළ නමුත්, "මේ සම්බන්ධයෙන් අයෝග්‍ය කරුණ වන්නේ, වෙනත් ආගමකට හැරවීම සඳහා පුද්ගලයෙකු අත්පත් කර ගැනීම පිණිස ඕනෑකමින්ම ප්‍රයෝගකාරී ක්‍රියාවක නිරත වීම බව" එයට එක් කරන ලදී. මෙහිදී සඳහන් කර තිබූ එකම අධිකාරිය වූයේ *කොක්කිනාකිස් (Kokkinakis)* නඩුවේදී යුරෝපීය මානව හිමිකම් අධිකරණය විසින් ලබාදුන් නඩු තීන්දුවයි. නමුත්, සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියේ (ICCPR) 18(2) වන වගන්තිය පිළිබඳ සඳහන් කර තිබුණේ එමගින් බලහත්කාරය භාවිතා කිරීම තහනම් කර ඇති බැවිනි. පෙළඹවීම පිළිබඳ නිර්වචනය යෝජිත සංශෝධනයට යටත්ව, එහි 2 වන වගන්තිය ව්‍යවස්ථා විරෝධී නොවන බවට තීන්දු කරන ලදී. 2 වන වගන්තිය මගින් 9 වන සහ 10 වන වගන්තීන් කඩකිරීමක් සිදුවන බව පෙන්වීමට විරෝධය පාන්නන් විසින් ගන්නා ලද උත්සාහයන් අසාර්ථක විය.

ඒත්තු නොගැන්වෙන ලෙසට, දණ්ඩ නීති සංග්‍රහයේ 169(ඇ)(2)(ආ)[24] වගන්තිය පිළිබඳ කරන ලද සඳහන් කිරීමක් මගින් 'බලහත්කාරය' යන්නට දී ඇති දීර්ඝ අර්ථය සාධාරණීකරණය කර ඇත. ඒ හා සමානව, 'වංචනික' යන වදනේ අර්ථනිරූපණය, ඕනෑකමින්ම සිදුකරන ක්‍රියාවන්ට පමණක් සීමා වන්නේ නම් අවසරය ලබා දෙමින්, එයද පෙළඹවීම සම්බන්ධයෙන් වූ සංශෝධනයටම යටත් කරන ලදී.

3 වන වගන්තියෙන්, වෙනත් ආගමකට හැරීමේදී ඒ පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරයාට දැනුම් දිය යුතු යැයි දක්වන ලද අවශ්‍යතාවය, පුද්ගලයෙකුට සිතීමට, හෘද සාක්ෂියට සහ ආගමට ඇති නිදහස මත පනවන තහනමක් වන බැවින් එය 10 වන වගන්තියට අනුකූල නොවන බවට තීන්දු කරන ලදී. මෙලෙස වාර්තා කිරීමට පනවන ලද වගකීම මගින් කෙනෙකුගේ ආගම සම්පූර්ණයෙන්ම පෞද්ගලික කටයුත්තක් ලෙස පවත්වා ගැනීමට ඇති අයිතිය උල්ලංඝණය කරයි. සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියේ (ICCPR) 18 වන වගන්තියට අදාළ පොදු විවරණ අංක. 22 හි ප්‍රකාශිත පරිදි, "18(2) වන සහ 17 වන වගන්තීන්ට අනුකූලව කිසිම පුද්ගලයෙකුට, ආගමික ඇදහීම් වලට

[24] මෙම වගන්තිය මගින් ඡන්දදායකයෙකුට දිව්‍යමය අප්‍රසාදයට හෝ ආත්මීය අවලාදයට ඔහු භාජනය විය හැකි බවට ඒත්තු ගැන්වීමට පෙළඹවීම මගින් ඡන්දය දීමට ඇති අයිතිය නිදහසේ ක්‍රියාත්මක කිරීමට නොදී ඇහිලි ගැසීම, මැතිවරණ නීති කඩකිරීමක් බවට පත් කරන ලදී.

අදාළව ඔහුගේ සිතිවිලි හෝ භක්තිවන්තකම එළිදරවු කිරීමට බල කිරීමක් කළ නොහැක.''

බලහත්කාරයෙන් වෙනත් ආගමකට හැරවීමේ (4 වන වගන්තිය) වරදට දෙන දණ්ඩනයන් අධික හෝ විසමානුපාතික (excessive or disproportionate) ලෙස නොසැලකුන නමුත්, අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ ප්‍රතිපාදනයන් උපයෝගීවීම බැහැර කිරීම, හිතුවක්කාර සහ අයුක්ති සහගත (arbitrary and irrational) ලෙස සලකන ලදී.

එමෙන්ම, මෙම දෝෂය නිවැරදි කිරීමට මෙම වගන්තිය කපා ඉවත් කරන ලෙසට අධිකරණය යෝජනා කරන ලදී. (මහේස්ත්‍රාත්වරයෙකුට සාමාන්‍ය දණ්ඩනයන් පිළිබඳ බලතල හිමිකර දෙන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 14 වන වගන්තිය අධිකරණය විසින් සඳහන් කළේ ඇයි දැයි පැහැදිලි නැත.) බලහත්කාරයෙන් වෙනත් ආගමකට හැරවූ විට, වැඩි කරන ලද දණ්ඩනයන්ට යටත් වීමට සිදුවන, එසේ වෙනත් ආගමකට හැරෙන පුද්ගලයින් තෝරාගෙන ඇති ආකාරයෙහි කිසිඳු වරදක් අධිකරණය විසින් නොදකින ලද නමුත්, අමාත්‍යවරයා විසින් එම ලැයිස්තුව දීර්ඝ නොකළ යුතු බව දක්වන ලදී. ලැයිස්තුවට කාන්තාවන් අන්තර්ගත කර තිබීම අමුතුම ආකාරයකට සාධාරණීකරණය කර තිබුණේ, 12(4) වන වගන්තිය මඟින් ඔවුන්ට විශේෂ ආරක්ෂාවක් ලබා දේ යන තර්කය මතය.

චෝදනා ගොනු කිරීමට බලය ලත් පුද්ගල කණ්ඩායම් (5 වන වගන්තිය) අයුක්ති සහගත හා හිතුවක්කාර ලෙස දුටු අතර එය 12 (1) වන වගන්තිය ද උල්ලංඝණය කරයි. 6 වන වගන්තිය මඟින් ලබාදී ඇති නීති සම්පාදනය කිරීමේ බලය, ප්‍රමාණය ඉක්මවා පුළුල් වූ සහ බහු අර්ථ ඇති එමෙන්ම 76(1) වන වගන්තිය මඟින් පාර්ලිමේන්තුවට ලබාදී ඇති ව්‍යවස්ථාදායක බලතල වලට අනුකූල නොවන බවට අධිකරණය තීරණය කරන ලදී.

නඩු විමසීමේදී, 9 වන වගන්තියෙන් බෞද්ධාගමට ප්‍රමුඛස්ථානයක් ලබා දුන්නද, එය 10 වන වගන්තිය හා අනුකූල වී, සෑම ආගමකටම සම්පූර්ණ නිදහසක් සහතික කරදීම දක්වා පුළුල් වී ඇත යන තර්කයට අධිකරණය අවධානය යොමු කරන ලදී. නව පල්ලිවල සැක සහිත ක්‍රියාකාරකම් මඟින් බෞද්ධාගම රටෙන් සෝදාපාළු වී යෑම වැළැක්වීම මෙහි අරමුණ වූ බවට ඉදිරිපත් කරන ලද ප්‍රතිවාදයට පිළිතුරු ලෙස ඉහත කරුණ ගෙන හැර දක්වන ලදී. මෙම ව්‍යවස්ථා කෙටුම්පතට පක්ෂව කරුණු ඉදිරිපත් කරන ලද ජ්‍යෙෂ්ඨ නීතිඥවරයාගේ අවධානය

වීරසූරිය විනිසුරුතුමා විසින් පොදු විවරණ අංක: 22 හි 9 වන ඡේදය වෙත යොමු කරන ලදී. එනම්, "කිසියම් ආගමක් රාජ්‍ය ආගම ලෙස පිළිගෙන තිබීම හෝ එය නීත්‍යානුකූලව හෝ සම්ප්‍රදායානුකූලව ප්‍රතිෂ්ඨාපනය වී තිබීම හෝ එහි අනුගාමිකයන් ගණන ජනගහණයෙන් බහුතරයකින් සමන්විත වීම යන කරුණු නිසා, 18 සහ 27 වන වගන්ති ඇතුළුව ප්‍රඥප්තිය යටතේ හිමිවන අයිතීන් භුක්ති විඳීමට හානි කිරීමක් හෝ වෙනත් හිමිවන අයිතීන් භුක්ති විඳීමට හානි කිරීමක් හෝ වෙනත් ආගම්වල භක්තිවන්තයින් හෝ විශ්වාසයන් නොමැති අයට එරෙහි වෙනස් ආකාරයකට සැලකීමක්, ප්‍රතිඵල ලෙස ඇති නොවිය යුතුය."

එක් පෙත්සම්කරුවකු වූ, සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය විසින් බලවත් ලෙස පෙරැත්ත කරමින් කියා සිටියේ, 9 වන වගන්තිය මගින් 10 සහ 14(1)(ඉ) වගන්ති වලට ලබාදී ඇති ආරක්ෂාව වන්නේ 15(7) වගන්තිය උපයෝගී කරගනිමින් 14(1)(ඉ) වගන්ති මත සීමාවන් පැනවිය නොහැකි බව යන්නයි. ආගමක් හෝ ඇදහීමක් තෝරා ගැනීමට ඇති නිදහස සේ අර්ථවත් ලෙස ක්‍රියාවේ යෙදවීම 14(1)(ඉ) වගන්තියේ සහතික කර ඇති නිදහසේ පිහිට උපයෝගී කරගනිමින් වෙනස් ආකාරයේ වූ ආගම් හා ඇදහීම් පිළිබඳ දැනුමින් පරිපූර්ණත්වයට පත්වීම මත, අවශ්‍යයෙන්ම රඳා පවතියි.

නඩු විමසීමේදී ඇති කරන ලද බලාපොරොත්තු වලට පටහැනිව අධිකරණය විසින් 2 වන වගන්තියට වූ විරුද්ධත්වයන් තහවුරු කළේ නැත. "තමන්ගේ කැමැත්තට අනුව ආගමක් හෝ ඇදහීමක් පවත්වා ගැනීමට හෝ පිළිගැනීමට ඇති නිදහසට හානි සිදු කරන බලහත්කාරයට කිසිම පුද්ගලයෙකු භාජනය නොවිය යුතුය" යනුවෙන් දක්වා ඇති සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියේ 18(2) වගන්තිය මගින් හා කොක්කිනාකිස් එරෙහිව ග්‍රීසිය *(Kokkinakis* v. *Greece)* යන නඩුවේ බහුතර මතයෙන් උපුටා ගන්නා ලද කොටසක් මගින්, පෙළඹවීම යොදා වෙනත් ආගමකට හැරවීම තහනම් කිරීම, අනුමත කරන ලදී. 15(7) වන වගන්තිය පිළිබඳ කිසිදු සඳහනක් නොවීය. ග්‍රීක නඩුවෙන් උපුටා ගන්නා ලද කොටයින්, ක්‍රිස්තියානි වන්දනාමාන පැවැත්වීමෙහි සහ අයෝග්‍ය ලෙස තම ආගම අත්හැර වෙනත් ආගමක් වැළඳ ගැනීමේ වාදය අතර පැහැදිලි වෙනස්කමක් දක්වයි. විශේෂයෙන්ම, තම ආගම අතහැර වෙනත් ආගමක් වැළඳ ගැනීමේ වාදය - "පල්ලියකට නව සාමාජිකයින් දිනා ගැනීමේ අදහස ඇතිව ද්‍රව්‍යමය හෝ සාමාජීය ලාභ ප්‍රයෝජන පිරිනැමීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම, දුප්පත් හෝ ආපදාවට පත්වූ පුද්ගලයින් මත අයුතු පීඩනයක් යෙදීම යන ආකාර ගත හැක;

සමහර විට සැහැසිකම හෝ මානසික පීඩනයක් මගින් පුද්ගලයින්ගේ අදහස් වෙනස් කිරීම ද (brain washing) ඇති කරවිය හැක; වඩා වැඩි ලෙස පැවසුවහොත්, එය වෙනත් අයගේ සිතීමට, හෘද සාක්ෂියට හෝ ආගමට ඇති නිදහසට ඇති ගෞරවය හා අනුකූල නොවේ." අවසාන වගන්තිය පොදු විවරණ අංක: 22 හා නොගැලපේ. එනම්, පොදු විවරණ අංක : 22 න් ප්‍රකාශිත වන්නේ, පුද්ගලයින්ව තම ආගම අත්හැරීම සඳහා බලයෙන් යොමු කරවන බලහත්කාරකම් 18(2) වන වගන්තියෙන් තහනම් කරන බවයි. කොක්කිනාකිස් (*Kokkinakis*) සහ වෙනත් ග්‍රීක නඩු පිළිබඳ යුරෝපීය අධිකරණයේ මතයන් ප්‍රකාශ කරන ලද්දේ, බටහිර රටවල ක්‍රිස්තියානි ආගම රාජ්‍ය ආගම වශයෙන් පැවති ඓතිහාසික පසුබිමක් යටතේ බව, සිහි තබා ගත යුතුය. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය හෝ සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියටත් පෙර සිටම ග්‍රීසියේ, තම ආගම අතහැර වෙනත් ආගමක් වැළඳ ගැනීමේ වාදය තහනම් කර තිබූ අතර එය සාපරාධී වරදක් බවට ද පත් කර තිබුණි. ජෙහෝවාගේ සාක්ෂිකරුවන් (*Jehovah witnesses*) රාශියකට විරුද්ධව ග්‍රීසියේදී චෝදනා ඉදිරිපත් කිරීමෙන් පසුව, ප්‍රථම වතාවට කොක්කිනාකිස් (*Kokkinakis*) නඩුවේදී යුරෝපීය මානව හිමිකම් අධිකරණයේදී, තම ආගම අතහැර වෙනත් ආගමක් වැළඳ ගැනීමේ වාදය සාපරාධී වරදක් බවට පත් කිරීම අභියෝගයට ලක් කෙරුණි. ආගමික නිදහස පිළිබඳ වගන්තිය නීතියට අනුකූල නොවන බවට පිළිගැනීමට යුරෝපීය අධිකරණය මැලිකමක් දැක්වූයේ මෙම හේතුව නිසා බව කෙනෙකුට අනුමාන කළ හැක. අපේ රටේ සම්ප්‍රදාය මෙයට වඩා ප්‍රතිවිරුද්ධය. එනම් තමන් පිළිනොගන්නා දේට පවා ඉඩ හැරීමේ සම්ප්‍රදායක් ඇති අතර අප සතුව රාජ්‍ය ආගමක් නොමැත. පුදුමසහගත කරුණ නම්, වෙනත් ආගමකට හැරවීමට එරෙහි නීතියක අවශ්‍යතාවය සාධාරණීකරණය කිරීමට, 2004 වසරේදී අධිකරණයට ග්‍රීක නීතින් හා නඩුවල පිහිට පැතීමට සිදුවීමයි.

5. අවසානය

ජය හෝ පැරදුම ලැබූ කිසිවෙකු නොවීය. මෙම නඩු තීන්දුව මගින් දෙපාර්ශවයටම යමක් ලබාදී ඇති අතර වෙනත් ආගමකට හැරවීමට එරෙහිව නීතියක් පැනවීමට නොහැකිවන ලෙස බාධකයන් ද පැනවී ඇත. ව්‍යවස්ථා කෙටුම්පතේ ගැටළු සහගතම කරුණ වූ 2 වන වගන්තිය, ඉවත් නොකළ අතර, එය මෙම කෙටුම්පතට විරුද්ධත්වය පැ

බොහෝ දෙනාගේ කණගාටුවට හේතුවිය. නමුත් පැහැදිලිවම අනර්ථදායී ප්‍රතිපාදන වලට විවේචනයන්ගෙන් ගැලවීමක් හිමි නොවීය. විශේෂයෙන්ම, අනුන්ගේ දේ සෙවීමට කැමති ඕනෑම අයෙකු විසින් අපරාධ චෝදනා ගොනු කිරීමට හැකි ඉඩ ප්‍රස්ථාව, පැමිණිල්ලක් ගොනු කිරීම සඳහා නීතිපතිතුමාගේ අනුදැනීම ලබා ගැනීමේ අවශ්‍යතාවය මත ඉවත් කරන ලදී. කෙසේ වුවත්, සමාජයට ලාභ ප්‍රයෝජන ලබා දෙන අව්‍යාජ, සද්භාවයෙන් යුතු ක්‍රියාවන් සහ රටේ දීර්ඝ කාලයක් පුරාවට පිළිගැනීමක් ඇති කටයුතු වලට සැලකිල්ලක් දැක්වුවද, නඩු පවරතැයි පැවති බිය අඩු වුවත්, යහපත් පුද්ගලයින් හා සංවිධාන තුළ, ඔවුන්ගේම කටයුතු පිළිබඳ නොසන්සුන් බවක් ඉතිරි කර යනු ඇත. තවත් පුදුමසහගත කරුණක් වන්නේ, ලබාදෙන දණ්ඩනයන් අධික හෝ විසමානුපාතික ලෙස නොසැලකීම හෝ 'වින්දිතයින්' විශේෂ කණ්ඩායම් ලෙස වර්ග කර තිබීමේ අවශ්‍යතාවය ප්‍රශ්න නොකිරීමයි. කාන්තාවන්, මානසිකව ආබාධිත වුවන් හා සිරකරුවන් යනාදීන් සමඟ එක ගොඩකට එක් කිරීම මෙවන් කාලයක හා යුගයකදී පිළිගත නොහැක. නීතිපතිතුමා පවා කාන්තාවන් මෙම ලැයිස්තුවෙන් ඉවත් කරන ලෙසට ඉල්ලා සිටියේය.

දෙවන වගන්තිය අර්ථනිරූපණය කිරීමට 10 වන වගන්තිය තීරණාත්මක සාධකයක් වූ අතර පෙනී සිටි සෑම ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකුටම පෙළ පොත් හා තීරණය වූ නඩු තීන්දු උපුටා දක්වමින් මේ පිළිබඳව ප්‍රකාශ කිරීමට කුමක් හෝ තිබිණි. නමුත් අධිකරණය විසින් 2 වන වගන්තිය පිළිබඳ කරන ලද විශ්ලේෂණයේ 10 වන වගන්තිය පිළිබඳ යම්තම් සඳහනක් පමණක් දක්වා ඇත. (පෙරේරා එදිරිව වීරසූරිය) 2 ශ්‍රී.නී.වා. 177 යන නඩුවේ රණසිංහ විනිසුරුතුමා විසින් ලබාදුන් නඩු තීන්දුවේ එක් ඡේදයක්, එනම්, ''ඉල්ලීමේ අරමුණ ඉතා විස්මාකාර, පැහැදිලිවම ආගමික-නොවන දෙයක් නොවන්නේ නම්'' ව්‍යවස්ථාමය ආරක්ෂාව ලබාදීම සඳහා ආගමික ඇදහිලි, පිළිගැනීමට හැකි, තර්කානුකූල, අනුරූප හෝ අවබෝධ කරගත හැකි දේ වීම අවශ්‍යම නොවේ, යන්න, පහත දැක්වෙන ලෙස වෙනස් වී ඇත. එනම්, ''කෙතරම් විස්මාකාර හෝ අයුක්තිසහගත වුවත්, ඔහු (එනම්-පුද්ගලයෙකු) ගේ කැමැත්තට අනුව දරා සිටින ඕනෑම ආගමික ඇදහීමක් නිසැකයෙන්ම 10 වන වගන්තියෙන් ආරක්ෂා කරනු ලැබේ'' යන්නයි. මෙමගින් පැමිණි නිගමනය වූයේ, ආගමක් තෝරා ගැනීම පැන නගින්නේ, ''කෙනෙකුගේ තේරීම මොනම ආකාරයකින්වත් විකෘති කරන කිසිම බාධාවකින් තොරව'' පුද්ගලයෙකුගේ සිතිවිලි හා හෘද සාක්ෂිය නිදහසේ මෙහෙයවීමෙන් බවයි: එනම්, ඇදහීමේ වෙනසක් ඇති කරවීම සඳහා වෙනත් පුද්ගලයෙකු විසින්

දරණ උත්සාහයකින් තොරවීමයි. මෙහිදී මහහැරුණ වැදගත් කරුණක් නම් 14(1)(ඉ) වගන්තිය පිළිබඳව ඍජු නොවන ලෙසට කරන ලද සඳහනයි. පෙළඹවීම යනාදියෙහි නිර්වචනයන් පිළිබඳ සඳහන් කිරීමෙන් අනතුරුව සහ ඒවා සුළු වෙනස්කමක් සහිතව අනුමත කිරීමෙන් පසු පහත නිගමනයට එළඹ ඇත: "එබැවින්, 14(1)(ඉ) වගන්තිය මත 15(7) හරහා ව්‍යවස්ථා කෙටුම්පත මඟින් පැනවීමට අදහස් කරන ලද සීමාවන් සකස් කර තිබුණේ, මහජන සාමය, සදාචාරය සහතික කිරීමට සහ ප්‍රජාතාන්ත්‍රික සමාජයක පොදු සුභ සාධනය උදෙසා අවශ්‍ය යුක්තිසහගත අවශ්‍යතාවයන් සපුරාලීමේ අරමුණ ඉටු කිරීමටයි," නමුත්, 2 වන වගන්තිය පිළිගැනීම පිළිබඳව අධිකරණය විසින් ඉදිරිපත් කර ඇති කරුණු දෙස බැලුවහොත් එළඹී ඇති නිගමනය ලබා දුන් සාක්ෂි සලකා බැලීමෙන් එළඹියක් නොවන බව පැහැදිලි වේ. නීතිය හා සාමය ආරක්ෂා කිරීම ගැටළුවක් බවට පත්ව ඇති බව දැන්වීමට අධිකරණය අමතමින් කිසිදු තර්කයක් ඉදිරිපත් නොවිණි. කෙටියෙන් කිවහොත්, සාක්ෂි තිබුණේ ඊට විරුද්ධ අතටය: එනම්, පල්ලි, දේවගැතිවරුන් සහ ඔවුන්ගේ දේව සභාවේ සාමාජිකයින් වෙත ප්‍රහාර එල්ල වී ඇති බවත්, ඒ සම්බන්ධව පොලිසිය ක්‍රියා කර නොමැති බවත්ය. 1987 වසරේ සිට 2004 වසර දක්වා වාර්තා වී ඇති ක්‍රිස්තියානි-විරෝධී සිදුවීම් පිළිබඳ වාර්තාවක්, ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලිකානු සන්ධානය (The National Christian Evangelical Alliance) සතුව තිබේ. 2003 වසරේ සිට 2004 ජනවාරි දක්වා වූ කාලය තුළ සිදුවීම් 135 ලැයිස්තුගත වී ඇත. දේශීය පුවත්පත් වලද පල්ලි වලට සිදුකරන ලද පහරදීම් වාර්තා වී ඇත. ආගමික නිදහස ගැටළුවක් බවට පත්වීම නිසා මානව හිමිකම් සහ වෙනත් ආගමකට හැරවීම පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කිරීමට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් විශේෂ වාර්තාකරුවෙකු පත් කිරීමට පියවර ගන්නා ලදී. මෙම වාර්තාව තවමත් ප්‍රකාශයට පත් කර නොමැත. මේ සියල්ලම, වෙනත් ආගමකට හැරවීමට එරෙහි ව්‍යවස්ථා කෙටුම්පතට පෙර සිදු විය.

කලින් පෙන්වා දුන් පරිදි, ඉන්දියානු ව්‍යවස්ථාවේ ප්‍රකාශිත ආගමික අයිතිවාසිකම පරම අයිතියක් නොවන නමුත්, අප ව්‍යවස්ථාවේ 10 වන වගන්තියෙන් අධිකරණමය පිළිගැනීමක් සහිතව ආගම සෑම පුද්ගලයෙකුගේම පරම හෝ කොන්දේසි විරහිත අයිතියක් බවට පත්කර ඇත. නමුත් පුද්ගලයකු තම ආගම ප්‍රකාශයට පත් කරන ආකාරය, (එනම්, හෙළිදරව් කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම) සැබවින්ම නීතිය මඟින් සීමාවන්ට යටත් කළ හැකි කාරණයක් වන අතර, උදාහරණයක්

ගතහොත්, පුද්ගලයෙකු ඉතා අවිවේකී මාර්ග සන්ධියක, පෙට්ටියක් උඩ නැඟගෙන දේශනා කිරීම වැළැක්විය හැක. ඒ හා සමානව, ඝෝෂාකාරී සංගීත වාදනයත් හා එක්වූ යාඥාවන් මඟින් අවට ජීවත්වන පුද්ගලයින්ට බාධා කිරීම හෝ අන් අයගේ ආගමික ඇදහිලිවල පෞද්ගලිකත්වය නොනැවතී සහ සතුටින් නොපිළිගන්නා විටත් සිදු කරන බලෙන් ඇහිලි ගැසීම්, සුදුසු නීතීන් මඟින් පාලනය කළ හැක. මිනිසුන් බිලිදීම හෝ පූජා විධියක් ලෙස තෝරාගත් වින්දිතයින් මත තුවාල සිදු කිරීම වැනි අන්තවාදී අවස්ථා සලකා බැලීමට අවශ්‍ය නොවේ. පූජෝත්සව කාලයට ධාර්මික පුද්ගලයින් නිර්වස්ත්‍රව ඉන්දියාවේ වීදි පුරා ඇවිදීම, හෝ කතරගමදී ආගමික ශික්ෂණයක් ලෙස තමාටම කසෙන් තලා ගැනීම හෝ තමාටම වධදීම වැනි සමහර ආගමික අනුගමනයන් පිළිගැනීම සඳහා ඉඩ හැරිය යුතුය. නමුත්, අහිංසක පුද්ගලයින් අපරාධ නීතිය නැමැති උවදුරින් පෙළන, බලහත්කාරයෙන් වෙනත් ආගමකට හැරවීමට එරෙහි ව්‍යවස්ථා කෙටුම්පත වැනි දරුණු නීති පැනවීම, සම්පූර්ණයෙන්ම වෙනස් කාරණයකි.

වඩාත්ම අදාළ වන්නේ, මෙම නඩු තීන්දුව මඟින් වෙනත් ආගමකට හැරවීම පිළිබඳ අර්ථනිරූපණයේදී 'ආගම' යන්නට අර්ථයක් ලබා දිය හැකිව තිබීමයි. කිසිදු මානව හිමිකම් ලේඛනයක ආගම යන්න නිර්වචනය කර නොමැති අතර එය පටු ලෙස අවබෝධ කරගත් දෙයක් ද නොවේ. සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියේ (ICCPR) පොදු විවරණ අංක: 22 හි දැක්වෙන්නේ "18 වන වගන්තිය මඟින් ඊශ්වරවාදීන්, (theistic), නොවන (non-theistic) අය සහ නාස්තිකවාදී (atheistic) ඇදහිලි මෙන්ම ආගමකට හෝ ඇදහීමකට බැඳී නොසිටීමට ඇති අයිතියත් ආරක්ෂා කරනු ලැබේ. ඇදහිලි සහ ආගම යන පද පුළුල් ලෙස වටහා ගත යුතුය. 18 වන වගන්තිය අදාළ වීමේදී, එය සම්ප්‍රදායික ආගම් වලට හෝ සම්ප්‍රදායික ඇදහිලි වලට සමානකම් ඇති චාරිත්‍රමය ලක්ෂණ හෝ අනුගමනයන් සහිත ආගම් වලට හෝ ඇදහිලි වලට සීමා වී නැත." යුලිතා හයිඩ් එරෙහිව රජය (*Yulitha Hyde* v. *State*) (1973) AIR 116 (Orissa) නඩුවේදී ඔරිස්සා මහාධිකරණය විසින් මැවුම්කරුවෙකු පිළිබඳ විශ්වාසය සහ ඔහුගේ පැවැත්මට කරන නමස්කාරයන්ගෙන් යුත් ආගම මත වූ සීමාවන් නිවැරදි ලෙස ප්‍රතික්ෂේප කළේය. එයට හේතුව වූයේ, "දෙවියකු පිළිබඳව හෝ බුද්ධිමත් මූල නිධානයක් (Intelligent First Cause) පිළිබඳව විශ්වාස නොකරන බෞද්ධාගම සහ ජෛන ආගම වැනි වඩා හොඳින් දන්නා ආගම් ඉන්දියාවේ ඇත." යන්නයි. අධිකරණය තවදුරටත් කියා සිටියේ, ආගමක්, "යම් ආගමකට බැඳී සිටින්නන් විසින් ඔවුන්ගේ

ආත්මීය සහ පැවැත්මට හේතු වන සේ සලකනු ලබන ඇදහිලි හෝ න්‍යායන් පද්ධතියක් මත පදනම් වී තිබෙන නමුත්, ආගම යනු වෙනත් කිසිවක් නොව න්‍යායක් හෝ ඇදහීමක් පමණක් යැයි පැවසීම නිවැරදි නොවේ. තම අනුගාමිකයින්ට පිළිපැදීම සඳහා සදාචාරාත්මක නීතීන් සංග්‍රහයක් නියම කර දැක්වීමට ආගමකට හැකි වේ. එපමණක් නොව, ආගමක අවශ්‍යම කොටස් ලෙස සලකන චාරිත්‍ර විධි සහ පිළිපැදීම්, පූජා උත්සව සහ වන්දනාමාන විධි නියම කළ හැකි වේ. එමෙන්ම, මෙම විධි සහ පිළිපැදීම්, ආහාර හා ඇඳුම් සම්බන්ධව ද ව්‍යාප්ත විය හැක. එම්මැනුවෙල් එදිරිව කේරළ රජය *(Emmanuel* v. *State of Kerala)* AIR 1987 SC 748 නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කර සිටියේ "ප්‍රශ්නය වන්නේ, ඇදහීම යන්න ආගමකට බැඳී සිටීමේ හෝ අනුගමනය කිරීමේ කොටසක් ලෙස අව්‍යාජව හෝ හෘද සාක්ෂියට අනුකූලව පිළිගන්නේ ද යන්න නොවේ. අපගේ පෞද්ගලික මත හා ප්‍රතිචාර අදාළ නොවේ" යනුවෙනි.

මෙම නඩු තීන්දුව අසමත් වන්නේ, ආගමික නිදහසේ විෂය පථය පිළිබඳව පැහැදිලි අර්ථනිරූපණයක් ලබා නොදුන් බැවිනි. ආගමික ඇදහීමකට සහ ආගමක් පිළිගැනීමට ඇති අයිතීන් කොන්දේසි විරහිත විය හැකි වුවත්, ආගමක් පැතිරවීමට ඇති අයිතිය මත කෙසේ? සහ කවර වූ? සීමාවන් පැනවිය හැකිද යන ගැටළුව තවමත් ඉතිරිව පවතී. සිතීමේ සහ හෘද සාක්ෂියේ නිදහසේ අවශ්‍යම කොටසක් ලෙස ආගමික නිදහස පිළිගත් මානව හිමිකමක් බවට පත්වූ විට එය, එහි දේවධර්ම වාදයේ හා දර්ශනවාදයේ මුල් වලින් ඉවත් කර වටිනාකමක් ඇති දෙයක් බවට පත්විය. එය අනෙකුත් වටිනාකම් හා සමතැන් ගත යුතු වූ අතර, මෙහිදී වඩාත් වැදගත් දෙය වූයේ පුද්ගලයෙකුගේ ආගම අත් නොහැර පවත්වා ගැනීමට ඇති අයිතිය සහ ආගම ප්‍රකාශයට පත්කිරීම මත නෛතිකමය සීමාවන් පැනවීමට ඇති අයිතියයි. "වැරදි සහ නීත්‍යානුකූල නොවන ක්‍රම" මගින් වෙනත් ආගමකට හරවා ගැනීම, කතෝලික රදගුරුවරුන්ගේ සභාව විසින් හෙළා දැකි අවස්ථාවේදී, ඉහත කරුණ පිළිගන්නා ලදී. (අයිලන්ඩ්, 2003 දෙසැම්බර් 19) 15(7) වන වගන්තිය මගින් හැර ආගමික නිදහස සීමා කිරීමක් ලෙස බලහත්කාරය ඉදිරිපත් කරන්නේ කෙසේද? අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන වගන්තියෙන් නොකියවී ඉතිරි වී තිබෙන කොටස සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියේ 18(2) වගන්තියෙන් සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශිතයි. 18(2) වගන්තිය ඇතුළුව සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියට අත්සන් තැබීම නිසා, 10 වන වගන්තිය අර්ථනිරූපණය කිරීමේදී අප

අධිකරණ වලට, 14(1)(ඉ) හෝ 15(7) වගන්ති පිළිබඳ සඳහන් කිරීමකින් තොරව, ආගමක් පිළිගැනීමට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීමේදී බලහත්කාරය භාවිතා කිරීම තහනම් කර තිබීම සැලකිල්ලට ගත හැක. මෙහිදී බලහත්කාරය යන්නෙන් සඳහන් වන්නේ ආගමික ඇදහීමක් සම්බන්ධව වෙනත් අයෙකුගේ තීරණයක් පාලනය කිරීම සඳහා පුද්ගලයෙකුට ලබා දී ඇති අයිතියක් අනිසි ලෙස භාවිතා කිරීම යන්නයි. බලහත්කාරය ලෙස සැලකිය හැකි දේ නීතියෙන්, විශේෂයෙන්ම අපරාධ නීතියෙන් පිටත තැබීම වඩාත් සුදුසුය.

ඉතා පුළුල් කරුණක් වූ රජය හා ආගම අතර ඇති සම්බන්ධතාවය පිළිබඳව සඳහන් කිරීමට විනිසුරුවන් සතුව පැවතියේ ඉතා කෙටි කාලයකි. ඔවුන් ලබා දුන් පණිවිඩය වූයේ, වඩාත් නරක ආකාරයට එනම්, යහපත් ලෙස හැසිරීමේ සීමාව ඉක්ම වූ ආකාරයට ආගමික අදහස් ප්‍රචාරය කරන පුද්ගලයින්ට දඬුවම් කිරීමේ අයිතිය රජය සතුවන බවයි. යුරෝපීය මානව හිමිකම් අධිකරණයේ පෙටිෂි විනිසුරුවාගේ (Judge Pettiti) වචන මතකයේ තබා ගැනීම වඩාත් සුදුසුය:

> අධ්‍යාත්මීය, හා ආගමික හෝ දර්ශනවාදීමය ඇදහීම් විෂයයන් අයත් වන්නේ ඇදහීම් නැමති ආත්මීය විෂයට හා ඒවා ප්‍රකාශ කිරීමට ඇති අයිතියටයි. පුරවැසියන්ට කිසිඳු ආරක්ෂාවක් නොමැතිව යටපත් කිරීමේ පද්ධතියක පැවැත්මට ඉඩදීම භයානක වන අතර, පුද්ගලික නිදහස නැති කරන බලවත් රාජ්‍ය පාලනයන් විසින් ඇති කරන ලද උපද්‍රවයන් අප දැක ඇති අතර, ඒවා තමන්ගේ ව්‍යවස්ථා වලින් ආගමික නිදහස ප්‍රකාශයට පත් කරන අතරම, පරපුටුවාදය, 'විප්ලවකාරී බව' හෝ තම ආගම අතහැර වෙනත් ආගමක් වැළඳ ගැනීමේ වාදය (Parasitism, 'Subversiveness' or proselytism) මත අපරාධ වරදවල් ඇති කිරීම මගින් එය සීමා කරනු ලැබේ.

(කොක්කිනාකිස් එරෙහිව ග්‍රීසිය (1994) යුරෝපීය මානව හිමිකම් වාර්තා-397-428 වන පිටුව. (*Kokkinakis* v. *Greece)* (1994)17 EHRR 397 at 428.)

IV

ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය

අසංග වැලිකල *

1. ශ්‍රී ලංකාවේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ ව්‍යවස්ථාපිත හා නෛතික ව්‍යුහය

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනය යටතේ නියෝජනයකින් සහ වගකීමකින් යුතු රජයක් පිළිබඳ මූලධර්මය මුල් වරට වර්ෂ 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් අතර, එය වැඩිහිටි ඡන්ද ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ ලංකාව සතු නොකැළල් දිගු ඉතිහාසයේ මූලික අඩියර ලෙස දැක්විය හැකිය. මෙයට පෙර දේපළවල වටිනාකම මත වූ සීමිත ඡන්ද අයිතියක් ප්‍රදානය කොට තිබුණි. සර්වජන ඡන්ද බලය 1947, 1972 සහ 1978 යන පසු කාලීන ව්‍යවස්ථාවන් මගින් අත්‍යාවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී අංග සියල්ලකින් ශක්තිමත් කර ඇති නමුත් එම ව්‍යවස්ථාපිත ලියවිලි මගින් සකස් කරන ලද ඡන්ද දායකයන් දේශපාලන වශයෙන් නියෝජනය කිරීම පශ්චාත් අධිරාජ්‍යවාදී ගැටුම් වලට ප්‍රධාන හේතුව වී ඇත.

---

* එල්.එල්.බී., විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නීති හා ව්‍යවස්ථා කටයුතු අංශයේ පර්යේෂණ සහායක.

ශ්‍රී ලංකා ජනරජයේ දැනට පවතින 1978 ව්‍යවස්ථාවට අනුව ස්වාධිපත්‍යය ජනතාව මත තබා ඇත. ව්‍යවස්ථාවෙහි තෙවැනි වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුව ස්වාධිපත්‍යයට: රජය, මානව අයිතිවාසිකම් හා ඡන්ද බලය යන බලයන් ඇතුළත් වන අතර මෙම ප්‍රතිපාදන ව්‍යවස්ථාවෙහි දරදඬු විධි විධාන යටතේ පමණක් සංශෝධනය කළ හැකි ලෙස තහවුරු කර ඇත. ව්‍යවස්ථාවේ 4(ඉ) වගන්තිය ඡන්ද බලය ජනතාවගේ ස්වාධිපත්‍යයට විවෘත වූ ආකාරයකින් භුක්ති විඳිය හැකි සහ භාවිතා කළ යුතු ආකාරයෙන් සහතික කොට ඇති අතර ඊට සුදුසුකම් ලැබූ සහ ලියාපදිංචි වූ පුරවැසියන්ට ජනරජයේ ජනාධිපතිවරණය, මහ මැතිවරණය සහ ජනමත විචාරණයන් හිදී සිය බලය භාවිතා කළ හැකි වේ.

ව්‍යවස්ථාවේ 14 වන පරිච්ඡේදය ඡන්ද බලය සහ මැතිවරණ පිළිබඳව ප්‍රකාශ කරයි. එමෙන්ම ඡන්ද බලය ප්‍රකාශ කිරීමේ මූලික පියවර, ඡන්ද දායකයෙකුගේ අයිතීන්, ඡන්දදායකයෙකු නොවීමට ඇති තත්ත්වයන්, මහජන නියෝජිතයෙකු ලෙස තරඟ කිරීමට ඇති සුදුසුකම්, සමානුපාතික නියෝජනය පිළිබඳ ක්‍රමවේදය හා ඡන්ද පිළිබඳ යන්ත්‍රණය පරිපාලනය ද මෙම පරිච්ඡේදයේ සඳහන් වේ.

දහහතරවන, පහළොස්වන හා දහහත්වන ව්‍යවස්ථා සංශෝධන යටතේ 14 වන පරිච්ඡේදයේ මැතිවරණ හා ජනමත විචාරණ පිළිබඳ දක්වන ක්‍රියා පටිපාටිය හා ව්‍යවස්ථාපිත හරය නීති මගින් දියුණු කිරීමක් සිදුවේ. දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය මගින් බලය බෙදා හැරීමට යටත් පළාත් සභා ඡන්දය සඳහා ද මෙම ව්‍යවස්ථාපිත රාමුව විහිදෙයි.[1]

ශ්‍රී ලංකාවෙහි ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ කරුණු ශ්‍රේෂ්ඨාධිකරණයට සෘජුව කෙරෙන ඉල්ලීමක් මගින් බලාත්මක කළ හැකි බව දක්වයි. එහෙත් සඳහන් කළ යුතු විශේෂ කරුණක් වන්නේ ඉන් නිශ්චිතව ඡන්දය දීමේ අයිතිය පිළිනොගැනීමයි. කෙසේ නමුත් කතා කිරීමේ නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

---

[1] සංශෝධිත 1981 අංක. 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත: 2004 අංක. 14 දරණ මැතිවරණ (විශේෂ විධි විධාන) පනත: සංශෝධිත 1981 අංක. 15 දරණ ජනාධිපතිවරණ පනත: සංශෝධිත 1988 අංක. 2 දරණ පළාත් පාලන ආයතන මැතිවරණ පනත: සංශෝධිත 1946 අංක. 53 දරණ ප්‍රාදේශීය සභා ආඥා පනත: 1981 අංක. 7 දරණ ජනමත විචාරණ පනත තවදුරටත් බලන්න. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. **The right to Vote and the Law relating to Election Petitions** යන ප්‍රකාශය කොළඹ: CPA., 2000).

මූලික අයිතිවාසිකම් යටතේ බලාත්මක කළ හැකි (14 වගන්තියේ (1)(අ)) අතර අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට ආවේනික අංගයක් ලෙස ඡන්දය දීමේ අයිතිය පවතින බවට ශ්‍රේෂ්ඨාධිකරණය අර්ථකථනය කර ඇත.

මැතිවරණ කොමසාරිස්වරයාගේ අභිමතය අයුක්ති සහගත ලෙස පළාත් සභා මැතිවරණය කල් දැමීම සඳහා යොදා ගැනීම, අදහස් ප්‍රකාශ කිරීම යටතේ අංගයක් වන පෙත්සම්කරුගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය උල්ලංඝණය කිරීමක් බව කරුණාතිලක එදි. දිසානායක (අංක. 01), හි දක්වා ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු මාර්ක් ප්‍රනාන්දු මහතා අධිකරණ තීන්දුවෙන් ප්‍රකාශ කළ පරිදි.

> 14 වන පරිච්ඡේදයේ (1)(අ) වගන්තිය කතා කිරීමේ නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තහවුරු කිරීමේදී ඉන් සියලුම ආකාරයේ කථා සහ අදහස් ප්‍රකාශ කිරීම් සහතික කර ඇත. ශබ්ද කෝෂයක කථාව 'X' ලෙසද අදහස 'Y' ලෙසද දක්වයි නම් කථාව හා අදහස් ප්‍රකාශ කිරීම X එකතු කිරීම Y ලෙස දක්වන්නා සේ කෙනෙකුට මෙම වගන්තියේ සීමාව නිර්ණය කිරීම කළ නොහැක. ව්‍යවස්ථාවේ තිඹිරිගෙය වන ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතිය ආධිපත්‍යය පිළිබඳ වන සෛද්ධාන්ත මත 'නීතිය ඉදිරියේ සමානාත්මතාවය', 'නීතියේ සමාන ආරක්ෂාව', 'කථා කිරීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස' හා ප්‍රකාශන කිරීමේ නිදහස යන සංකල්ප පුළුල් අර්ථනිරූපණයකට ලක්විය යුතුය... මහජන නියෝජිතයෙකු ලෙස පත්වීම සඳහා දෙදෙනෙකු හෝ ඊට වැඩි නියෝජනයන් අතර කෙරෙන තරඟය මැතිවරණයක් වෙයි. ප්‍රජාතන්ත්‍රවාදයට අනුව තමා පාලනය කිරීමට හෝ තමාට සේවය කිරීමට සුදුසු නියෝජිතයන් ඡන්ද අපේක්ෂකයන් අතුරින් තෝරා ගැනීමට අයිතිය ඇත්තේ ඡන්ද දායකයාටයි. ඒ අනුව ඡන්ද දායකයෙකුට ඡන්ද අපේක්ෂකයන්ගේ ඊට ප්‍රථම පාලන කාලය පිළිබඳව හෝ අනාගත පාලන කාලයට ඇති සුදුසුකම පිළිබඳ තම අභිමතය ප්‍රකාශ කිරීමට හැකිය. වාචිකව මෙවැනි අභිමතයක් ප්‍රකාශ කළ හැකි අතර උදාහරණ ලෙස එක්තරා අපේක්ෂක කණ්ඩායමක් සිය ධූර කාලයේ කොතරම් අයහපත් ලෙස කටයුතු කළේ ද යත් ඔවුන් නැවත පත් නොකළ යුතු බව හෝ වෙනත් අපේක්ෂක පිරිසක් නැවත පත්කිරීම අවශ්‍ය බව යන්න සෘජුව අපේක්ෂකයන්ටම ප්‍රකාශ කිරීම හෝ වෙනත් ඡන්ද දායකයන්ට ප්‍රකාශ කිරීම කථා කිරීම සහ අදහස් ප්‍රකාශ කිරීම යටතට අයත් වේ. එසේම කථා කිරීම සහ අදහස් ප්‍රකාශ කිරීම

යන්නට වාචික ක්‍රමය හැරුණු විට වෙනත් නොයෙකුත් ක්‍රම ඇති බවට ද සැකයක් නැත. සාමාන්‍ය ඡන්දදායකයෙකුට මෙවැනි විවෘත ක්‍රමයකින් තම අදහස ප්‍රකාශ කිරීමට හැකිවීම වැදගත් වුවත් එමගින් අපේක්ෂකයෙකු අදාළ ධුරයට පත්කිරීම හෝ ඉන් ඉවත් කිරීම ඍජුව සිදු නොවන අතර එම ප්‍රකාශ මගින් තවත් ඡන්දදායකයන් තම මතයට නම්මවා ගැනීමට නොහැකි වීමට ද ඉඩ ඇත. මීට හාත්පසින්ම වෙනස් වූ සහ ඡන්දදායකයාට හා තම පවුලේ අයට අවම තර්ජනයක් ඇතිව ඉතාමත් සාර්ථක ලෙස අදහස ප්‍රකාශ කළ හැක්කේ නිහඬව තම ඡන්ද පත්‍රිකාව ඡන්ද කුටියේ රහස්‍යතාවය තුළදී ලකුණු කොට ප්‍රකාශ කිරීමෙනි. පුරවැසියකු එක් අපේක්ෂකයෙකුගෙන් තවත් අපේක්ෂකයකු වෙත තමන්ගේ ඇති කැමැත්ත නිහඬව සහ රහසේ තම ඡන්දය ප්‍රකාශ කිරීම මගින් දැක්වීම, දේශපාලන වේදිකාවක් මත කෙරෙන චතුර කථාවක ඇති කථා කිරීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට දෙවැනි නොවේ. එය එසේ නොවන බවට තීරණය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පදනමටම හානි කිරීමකි.[2]

2. ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ ශ්‍රී ලංකාවට ඇති අන්තර්ජාතික බැඳීම්

මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී, සම්මුතීන් යටතේ ශ්‍රී ලංකාවට ඇති අන්තර්ජාතික බැඳීම් පුරවැසියන් වෙනුවෙන් ඉටු කිරීමට රජය බැඳී සිටින බව ශ්‍රේෂ්ඨාධිකරණය නිරතුරුව දක්වා ඇත. සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR) ඇතුළු ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සුරැකීම සඳහා වූ බොහෝමයක් අන්තර්ජාතික ලියවිලි වලට ශ්‍රී ලංකාව අත්සන් තැබූ පාර්ශවකරුවෙකු වේ. සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියෙහි 25 වන වගන්තිය පුරවැසිභාවය සහ දේශපාලනික සහභාගීත්වය පිළිබඳ පුළුල් අයිතීන් දක්වන අතර, ඡන්දය

[2] කරුණාතිලක එරෙහිව දිසානායක (අංක. *01*) (1999) 1 ශ්‍රී ලංකා නීති වාර්තා 157 හි 173-4 දක්වා, අවධාරණයෙන් එක්කර ඇත.

[3] *සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR)* 25 වන වගන්තියෙන් ප්‍රකාශිත පරිදි: සෑම පුරවැසියෙකුටම, 2 වන වගන්තියේ සඳහන් කර ඇති වෙනස් කිරීම් වලට ලක්වීමකින් තොරව සහ අසාධාරණ සීමාකිරීම් වලට ලක්වීමකින් තොරව පහත සඳහන් දෑ කිරීමට අයිතිය සහ අවස්ථාව හිමිවිය යුතුය: එනම්, (අ) පොදු කටයුතු මෙහෙයවීමට ඍජුව හෝ නිදහසේ තෝරාගත් නියෝජිතයින්

ප්‍රකාශ කිරීමට ඇති අයිතිය පැහැදිලිවම දක්වා ඇත.[3] ශ්‍රේෂ්ඨාධිකරණය මෑතකදී තීරණය කළ ප්‍රධාන අමාත්‍යවරයා සම්බන්ධ නඩුවේදී ප්‍රකාශ කරන ලද්දේ:

> ඡන්ද හිමියන්ට මුහුණ දී ඔවුන්ගේ සහයෝගය ලබා ගත් පුද්ගලයන් ඡන්ද කොට්ඨාශය නියෝජනය කිරීම පිළිබඳ අයිතිය මීට අදාළ වේ... මෙය සෑම පුද්ගලයෙකුටම පොදු කටයුතු වලදී ඍජුව හෝ නිදහසේ තෝරා ගත් නියෝජිතයෙකු[4] මගින් හෝ සහභාගි වීමට ඇති අයිතිය පිළිගන්නා අතර එය සම්පූර්ණයෙන්ම 25 වන වගන්තිය (ICCPR) ට අනුරූප වෙයි.

3. ජනමත විචාරණ සහ මැතිවරණ පැවැත්වීම් සඳහා අදාළ වන යන්ත්‍රණ

අනෙකුත් දේ අතරම ශ්‍රී ලංකාව තුළ මැතිවරණ පැවැත්වීමේ ක්‍රමයට අදාළ මූලික කරුණු වෙනස් කිරීම සඳහා වූ දහහත් වන ව්‍යවස්ථා සංශෝධනයක් 2001 වසරේ අගභාගයේදී සම්මත කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට නව XIV(අ) ලෙස පරිච්ඡේදයක් ඇතුළත් කෙරුණු අතර ඉන් පැරණි මැතිවරණ කොමසාරිස්වරයාගේ ධුරය අහෝසි කර ඒ වෙනුවට මැතිවරණ කොමිසමක් බිහි කරන ලදී. දහහත් වන සංශෝධනයෙන් සැණෙකින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ මූලික කරුණ වූයේ මැතිවරණ දේශපාලනීකරණයෙන් තොරව පැවැත්වීමයි.

මගින් සහභාගී වීමට හැකිවීම: (ආ) ඡන්ද හිමියන්ගේ නිදහස් මතය ප්‍රකාශ කිරීම සහතික කරමින් විශ්ව සහ සමාන ඡන්ද අයිතියකින් සහ රහස්‍ය ලෙස ඡන්දය ප්‍රකාශ කිරීම මගින් පවත්වනු ලබන නිවැරදි කාලීන මැතිවරණ වලදී ඡන්දය ප්‍රකාශ කිරීම සහ තෝරා පත්වීමට හැකිවීම: (ඇ) තම රටේ ඇති රාජ්‍ය සේවය වෙත සමානාත්මතාවය යන පොදු පදනම යටතේ ප්‍රවේශය ලබා ගැනීමට හැකිවීම. විශේෂයෙන්ම S. Joseph, J. Schultz & M. Castan බලන්න. *සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය: නඩු තීන්දු, වැදගත් තොරතුරු සහ විවරණය (Oxford: Oup 2000), Chapter 22. [The International Covenant on Civil and Political Rights: Cases, Materials and Commentary).*

[4] *විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (වගකීම්) ලිමිටඩ් ආයතනය සහ වෙනත් අයෙකු එරෙහිව දයානන්ද දිශානායක, මැතිවරණ කොමසාරිස්වරයා සහ වෙනත් අය* (2003)1 SLR 277 හි 291 මුල් ලේඛනයට අවධාරණය එක්කර ඇත. එම වාර්තාවේදී, අධිකරණය විසින් සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 25 වන වගන්තිය ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 25 වන වගන්තිය ලෙස යොදා ඇති බව සලකන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපති විසින් නව ස්වාධීන මැතිවරණ කොමිසම පත් කිරීමට නියමිත විය. ව්‍යවස්ථා සභාව 'අධ්‍යාපනය හෝ පරිපාලනය යන අංශ වලින් හෝ වෙනත් වෘත්තියක නිරත වන්නන් අතර කීර්තිමත් පුද්ගලයන්' තෝරාගෙන එම යෝජිත පුද්ගලයන් නිර්දේශ කිරීමට නියමිත විය.[5] මෙම කොමිසමෙන් බලාපොරොත්තු වූයේ නිදහස් හා සාධාරණ මැතිවරණ සහ ජනමත විචාරණ පැවැත්වීමයි.[6]

මැතිවරණ සහ ජනමත විචාරණ කෙරෙහි අදාළ නීති බලාත්මක කිරීම සඳහා වූ පුළුල් බලයන්ගෙන් මෙම කොමිසම සමන්විත වෙයි. මැතිවරණයකදී එක් දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයකු පිළිබඳ ප්‍රචාරය ලබාදීම හෝ එය නතර කිරීම සඳහා රජය සතු හෝ රාජ්‍ය සංස්ථා සතු නිශ්චල හෝ චංචල දේපළ උපයෝගී කර ගනිමින් සිදු කළ හැකි පොදු දේපළ අයථා පරිහරණය නැවැත්වීමට ඊට බලතල පවතියි. අපක්ෂපාතී හා සාධාරණ මැතිවරණ ප්‍රචාරයන් ස්ථාපිත කිරීමට අදාළ නිර්ණායක ඉදිරිපත් කිරීමට ද ඊට බලය ඇත. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මෙම නිර්ණායක උල්ලංඝණය කරන අවස්ථාවකදී මැතිවරණය අවසන් වන තෙක් මැතිවරණ කටයුතු වලට අදාළ හෝ දේශපාලන වැඩසටහන් පරිපාලනය පිළිබඳ බලපෑම් කළ හැකි නිසි බලධරයෙකු පත් කිරීමට ද කොමිසමට බලය ඇත. නිදහස් හා ස්වාධීන මැතිවරණයක් සහතික කිරීම සඳහා අවශ්‍ය හමුදා සහ පොලිස් යෙදවීම් සඳහා අවශ්‍ය බලතල ද කොමිසම සතුව පවතියි. එහි නියෝජිතයන්ට විරුද්ධව ඔවුන් නිල වශයෙන් සිදු කරන කාර්යයන් සඳහා නඩු පැවරිය නොහැකි නමුත් ශ්‍රේෂ්ඨාධිකරණයේ රිට් සහ මූලික අයිතිවාසිකම් අධිකරණ බලයට ද මැතිවරණ පෙත්සම් විභාග කිරීමට අභියාචනාධිකරණයට ඇති අධිකරණ බලයට ද මෙම කොමිසම යටත් වෙයි.

වර්ෂ 2004 අප්‍රේල් මස පැවති මහ මැතිවරණය සමයේදී මැතිවරණ කොමිසම සංස්ථාපනය වී නොතිබූ නමුත් අත්හැරීමේ වගන්තිය වන දහහත්වන ව්‍යවස්ථා සංශෝධනයේ 27 වන වගන්තිය මගින් මෙම සංශෝධනය ක්‍රියාත්මක වනතුරු ඊට පෙර ක්‍රියාත්මක වූ මැතිවරණ කොමසාරිස්වරයාහට මැතිවරණ කොමිසම සතු බලතල ක්‍රියාත්මක

[5] 103(1) වන වගන්තිය.

[6] 103(2) වන වගන්තිය.

කිරීමේ හැකියාව පවරා තිබුණි. දහහත්වන ව්‍යවස්ථා සංශෝධනයේ මැතිවරණ සම්බන්ධව නීති ක්‍රියාත්මක වූ මුල්ම අවස්ථාවේ ඒවා ක්‍රියාත්මක කිරීමට මැතිවරණ කොමිසමක් නොමැතිවීම හා මැතිවරණ කොමසාරිස්වරයා මහින්ම එම නීති ක්‍රියාත්මක කිරීමට සිදුවීම සරදමක් ලෙස දැක්විය හැකිය. මෙම කරුණ පිළිබඳ අපි නැවත සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

4. පොදු ප්‍රතිපත්ති විවාදය තුළ මැතිවරණ සංශෝධන - මැතිවරණ සංශෝධන පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ අතුරු වාර්තාව (2004 ජනවාරි)

වර්තමාන මැතිවරණ ක්‍රමයට සංශෝධන සිදු කිරීම සම්බන්ධව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් 2003 අගෝස්තු මස පාර්ලිමේන්තු මන්ත්‍රී දිනේෂ් ගුණවර්ධන මහතාගේ සභාපතිත්වයෙන් යුතුව සියලුම පක්ෂවල සහභාගිත්වයෙන් ඇති කරන ලදී. පාර්ලිමේන්තු මැතිවරණ, පළාත් සභා මැතිවරණ, ප්‍රාදේශීය සභා මැතිවරණ මෙන්ම ඊට අනුකූල ව්‍යවස්ථාමය සංශෝධන සඳහා වූ යෝජනා සඳහා විමසීම මෙම කාරක සභාවට අදාළ විය. තේරීම් කාරක සභාව දේශපාලන පක්ෂ වලින් සහ සාමාන්‍ය වැසියන්ගෙන් මැතිවරණ සංශෝධන සඳහා වූ පුළුල් කරුණු දැන්වීමක් සඳහා ඉඩ ලබා දුන් අතර ඒ කරුණු අතර:

1. තැපැල් ඡන්ද, දේශපාලන පක්ෂ හඳුනා ගැනීමේ ව්‍යුහය, ඡන්ද නාම යෝජනා භාර ගන්නා කාල පරිච්ඡේදය, මැතිවරණ දිනය නියම කිරීම, ඡන්ද අවලංගු වීම, මැතිවරණ පෙත්සම් පිළිබඳ විධි විධාන ආදී මැතිවරණ සංශෝධන:
2. පාර්ලිමේන්තුවේ සාමාජිකයන් සංඛ්‍යාව:
3. ඡන්ද ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවයක් ලෙස ජාතික හැඳුනුම්පත හඳුන්වා දීම:
4. විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ උපකරණ හඳුන්වා දීම සහ ඡන්ද නාම ලේඛන පරිගණක ගත කිරීම:
5. ඡන්ද බලය සහ මැතිවරණ පිළිබඳ පාර්ලිමේන්තු ස්ථාවර කාරක සභාවක් ඇති කිරීම:
6. ඡන්ද අපේක්ෂකයන් විසින් සිය වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයක් කිරීම:
7. කාන්තා නියෝජනය.

මෙම බොහෝමයක් කරුණු සම්බන්ධව අතුරු විධානයන් කිහිපයක් නිර්දේශ කිරීම කාරක සභාව විසින් 2004 ජනවාරි මස ඉදිරිපත් කෙරුණු අතුරු වාර්තාව[7] මගින් සිදුකර ඇත. 'පළමු වැන්නා ලෙස දිනුම් කණුවට ළඟාවීම' යන මූලයන් අඩංගු වූ මිශ්‍ර ක්‍රමයට අයත් සමානුපාතික නියෝජනය යන මූලධර්මය, මැතිවරණ සංශෝධනය යටතට හසුවිය යුතුය යන බහුතර මහජන මතය කාරක සභාව මගින් ද අනුමත කර තිබීම ඉතා වැදගත් කරුණු අතර වෙයි. කෙසේ නමුත් මේ සම්බන්ධව කාරක සභාව විශේෂිත යෝජනා නොකළේ යොදා ගත යුතු ක්‍රමය සහ ඊට අනුගමනය කළ යුතු පිළිවෙළ සහ විශේෂතා සම්බන්ධව නිශ්චය කිරීම තවත් සැලකිල්ලට භාජනය විය යුතු බැවිනි.

2004 මැතිවරණය පිළිබඳ සාපේක්ෂ වර්ධනය සැලකීමේදී, අතුරු වාර්තාවෙහි අඩංගු වඩාත්ම වැදගත් යෝජනාව වූයේ ජාතික හැඳුනුම්පත ඡන්දය ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවයක් ලෙස හඳුන්වා දීමය. ප්‍රතිපත්තිමය වශයෙන් මේ සඳහා මැතිවරණ නිලධාරීන්ගේ, දේශපාලන පක්ෂවල සහ සිවිල් සමාජයේ පුළුල් සහයෝගයක් ලැබුණු සංශෝධනයක් විය. කෙසේ නමුත් රජය මීට අදාළ නෛතික ප්‍රතිපාදන 2004 ඔක්තෝබර් මස ඉදිරිපත් කිරීමේදී ප්‍රායෝගික ප්‍රශ්න කිහිපයක් ඇති විය. ඒවා ජය ගෙන මිස මේ ප්‍රතිපාදනය මැතිවරණයකට අවශ්‍ය සාධාරණ නීතිමය අවශ්‍යතාවයන් ලෙස හඳුන්වා දීම අපහසු විය. මෙම කරුණු සවිස්තරාත්මකව පසුව සාකච්ඡා කරනු ඇත.

5. මැතිවරණ කොමිසම සංස්ථාපනය නොකිරීම සහ 17 වන සංශෝධනයේ 27 වන වගන්තියේ බලපෑම

මීට ප්‍රථම සාකච්ඡා කළ ආකාරයට දහහත් වන ව්‍යවස්ථා සංශෝධනයන් සම්මත වීමෙන් පසු කැඳ වූ 2004 අප්‍රේල් මහ මැතිවරණය වනවිට මැතිවරණ කොමිසම ස්ථාපනය කර නොතිබුණි. මීට හේතු වූයේ ජනාධිපතිනිය සහ ව්‍යවස්ථාදායක සභාව අතර ව්‍යවස්ථාදායක සභාව විසින් මැතිවරණ කොමිසමේ සභාපතිවරයා ලෙස යෝජනා කළ පුද්ගලයා සම්බන්ධව මත ගැටුමක් හට ගැනීමයි. ජනාධිපතිනිය අදාළ යෝජනාව නැවත සලකා බැලීම සඳහා ව්‍යවස්ථාදායක සභාව වෙත

---

[7] මැතිවරණ ප්‍රතිශෝධන පිළිබඳ තේරීම් කමිටුවේ අන්තර් වාර්තාව (2004 ජනවාරි), පාර්ලිමේන්තු වාර්තා අංක. 24, පස්වන පාර්ලිමේන්තුව (2 වන සැසිවාරය).

යැවීය. ඒ අනුව ව්‍යවස්ථාදායක සභාව ජනාධිපතිගේ විරෝධතාවය පදනම් වී තිබූ චෝදනා සම්බන්ධව (මූලිකව දේශපාලන පක්ෂයකට පක්ෂග්‍රාහී බව) විමසන ලදී. සභාව එම චෝදනා පදනම් විරහිත ඒවා බවට තීරණය කර එම නාම යෝජනාව ජනාධිපතිනිය විසින් පත් කිරීම සඳහා නැවත ඉදිරිපත් කරන ලදී. කෙසේ නමුත් ජනාධිපතිනිය එම පත්කිරීම සිදු කිරීම ප්‍රතික්ෂේප කර ඇත. මේ අනුව මතුවන නීතිමය ගැටළුව වන්නේ ව්‍යවස්ථාදායක සභාව විසින් මැතිවරණ කොමිසම සඳහා යෝජනා කළ අයෙකු පත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට ජනාධිපතිනියට හැකියාවක් ඇත්ද යන්නයි.

41 ආ(1) දක්වා ඇති පරිදි "මෙම වගන්තියේ අදාළ උපලේඛනයේ සඳහන් කොමිසම් හි සභාපති හෝ සාමාජිකයෙකු ලෙස කිසිම පුද්ගලයෙකු (ව්‍යවස්ථාදායක) සභාවේ අනුමැතියකින් තොරව ජනාධිපතිවරයා විසින් පත් නොකළ යුතුය." (අවධාරණය කර ඇත) අවශ්‍යතාවය පැන නඟින ආකාරයට සභාව විසින් ජනාධිපතිගේ අදාළ පත්කිරීම් සම්බන්ධව යෝජනා කිරීමේ වගකීමක් 41(ආ)(3) වගන්තිය සභාවට පවරා ඇත. එබැවින් (1) වන ඡේදය යටතේ මැතිවරණ කොමිසම පත්කිරීමේ එකම අරම්භකයා සහ සහතිකලත් පූර්ණ බලධරයා ව්‍යවස්ථාදායක සභාව වන අතර (3) වන පරිච්ඡේදය එවැනි පත්කිරීමක් එළඹුණු විට සභාව එම පත්කිරීම අතපසු කිරීම වළක්වාලයි.

මෙම යෝජනාවන් අනුව පත්කිරීම් සිදු කිරීමේදී ජනාධිපතිනියට හුදෙක් රාජ්‍ය නායිකාව ලෙස චාරිත්‍රානුකූල ක්‍රියාවක් මිස වෙනත් සැලකිය යුතු බලයක් නොමැත. මෙම නියමයන්ගේ වචන වලින් ප්‍රකටව පැහැදිලි වන්නේ මැතිවරණ කොමිසමෙහි පත්කිරීම් සම්බන්ධව ජනාධිපතිනියගේ අභිමතය මත ප්‍රතික්ෂේප කිරීමක් බලාපොරොත්තු නොවන බවයි.

ව්‍යවස්ථාදායක සභාව නිර්මාණය කිරීමේ ප්‍රධාන නෛතික බලාපොරොත්තු වූයේ දේශපාලන ක්‍රියාකාරීන් වෙත තිබූ ඇතැම් පත් කිරීම් සඳහා වූ බලතල අපක්ෂපාතී කීර්තිමත් පුද්ගලයන්ගේ නියෝජනයක් ඇති ආයතනයක් වෙත ලබාදීමයි. මැතිවරණ පරිපාලනය සම්බන්ධව ශක්තිමත් බලසම්පන්න ව්‍යූහයක් තුළ මැතිවරණ කොමිසම ස්ථාපනය වූ අතර එහි ස්වාධීනත්වය මෙම නව පත්කිරීමේ පටිපාටිය මඟින් රැක ගැනීමට බලාපොරොත්තු විය. ජනාධිපතිනිය දේශපාලන පක්ෂයක නායිකාව වශයෙන් සහ තෝරාගනු ලැබූ ප්‍රධාන විධායකවරිය ලෙස නව ආයතනයෙහි පත්කිරීම් සඳහා වූ අභිමතය තමා වෙත තබා ගැනීමෙන් 41(ආ) වගන්තිය මඟින් දැක්වෙන සැලැස්ම සම්පූර්ණයෙන්

නිශ්ඵල කරයි. කෙසේ වුවද පත්කිරීම් සහ දහහත්වන සංශෝධනයේ හරයට පටහැනි ලෙස අද වනතුරු ද මැතිවරණ කොමිසම ස්ථාපනය කිරීම සිදු කොට නැත.

එසේ වුවද මැතිවරණ කොමිසම ස්ථාපනය නොකොට ඇති විට පවා දහහත් වන ව්‍යවස්ථා සංශෝධනයේ 27(2) වගන්තිය අනුව සංශෝධනයට ප්‍රථම මැතිවරණ කොමසාරිස්වරයාගේ ධූරය දරණ පුද්ගලයාහට මැතිවරණ කොමිසමට අදාළ බලතල එය පිහිටුවන තෙක් භාවිතා කිරීමට ඉඩ සලසා ඇත. මේ අනුව මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතාහට ස්ථාපනය නොකළ මැතිවරණ කොමිසම සතු බලතල 2004 අප්‍රේල් මස පැවැති මහා මැතිවරණයට යොදා ගැනීමට හැකි වූ අතර එමඟින් වැදගත් නීතිමය තත්ත්වයන් කිහිපයක් 2004 දී මතු විය. විශේෂයෙන් රාජ්‍ය මාධ්‍ය මැතිවරණ ව්‍යාපාරය පවත්වාගෙන ගිය ආකාරය හා එමඟින් මැතිවරණයට කෙරුණු බලපෑමත්, දෙවනුව මැතිවරණ කොමිසමට (ස්ථාපනය නොකළ) අදාළ බලතල මැතිවරණ කොමසාරිස්වරයා විසින් භාවිතා කිරීමේදී එම ක්‍රියාකාරකම් සහ නොකර හැරීම් වලට අදාළ අධිකරණමය විවේචන සඳහා වූ අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ අධිකරණ බලතල පිළිබඳ ගැටළුය. මෙම දෙවන කරුණ මූලිකවම ඇති වූයේ ප්‍රධාන ලෙස මතභේදයට ලක් වූ මැතිවරණය හා නියෝජනය හා කරුණට අදාළ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට පත් කිරීම සම්බන්ධවය.

6. රාජ්‍ය මාධ්‍ය වල භූමිකාව

මීට ප්‍රථම ප්‍රකාශිතු පරිදි 104ආ(5) වගන්තිය මැතිවරණ කොමිසමට සමස්ථයක් ලෙස මාධ්‍ය සම්බන්ධයෙන් සහ විශේෂිතව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව (ශ්‍රී.ලං.ගු.ස.) සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (ශ්‍රී.ලං.රූ.ස.) පාලනය සඳහා බලතල ලබාදී ඇත. 104අ(5)(අ) වගන්තිය යටතේ කොමිසම සතු බලතල අනුව නිදහස් සහ සාධාරණ මැතිවරණයක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට අවශ්‍ය යැයි හැඟෙන නිර්ණායක ඕනෑම ගුවන් විදුලි හෝ රූපවාහිනී විකාශන ආයතනයකට හෝ පුවත්පත් ප්‍රකාශක හෝ හිමිකරුවකුට හෝ නිකුත් කිරීමට කොමිසමට හැකියාව ඇත. 104(ආ)(5)(ආ) වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ප්‍රධානීන්ට විශේෂ වගකීමක් පවරා ඇත්තේ "(අ) උපඡේදය යටතේ ඔවුනට නිකුත් කර ඇති නිර්ණායක අනුගමනය කිරීමට ගත යුතු සියලුම පියවර ගත යුතු" බවයි. 104ආ(5)(ඇ) වගන්තිය ප්‍රකාර එවැනි

නිර්ණායක උල්ලංඝණය කරන කිසියම් රාජ්‍ය මාධ්‍යයක් වේ නම් කොමිසම විසින් නිසි බලධරයෙකු පත්කළ යුතුය. ඔහු/ඇය පත්කිරීම සිදු කළ දිනයේ සිට ක්‍රියාත්මක පරිදි [ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව]... දේශපාලන විකාශන කටයුතු හෝ මැතිවරණයට බලපෑම් කළ හැකි බවට කොමිසම සිතන වෙනත් විකාශන කටයුතු පරිපාලනය මැතිවරණය අවසාන වනතෙක් සිය යටතට ගැනීම එම පුද්ගලයා කළ යුතුය. නිසි බලධරයෙකු විසින් එසේ පරිපාලනය සිදු කරන කාලය තුළ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට එවැනි පරිපාලන කටයුතු සඳහා සහභාගී විය නොහැකිය.

104ආ(5)(ඇ) වගන්තියෙන් ප්‍රකාශිත නිසි බලධරයාගේ බලතල වෙන වෙනම විස්තරාත්මකව 2002 අංක. 3 දරණ නිසි බලධරයා (බලතල හා කාර්යයන්) පනත මඟින් දක්වා ඇත. නිසි බලධරයාහට 2 වගන්තියේ (අ-ඔ) දක්වා ඇති උප වගන්තිය දහසය යටතේ ලැබී ඇති බලතල අනුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ කාර්යයන් අධීක්ෂණය සහ පාලනයන් පොදු යහපත උදෙසා සහ නිදහස් සහ ස්වාධීන මැතිවරණයකට අවශ්‍ය ඉහළ ගුණාත්මක භාවයක් යටතේ වැඩසටහන් පවත්වාගෙන යාමක් කළ හැකිය. නිසි බලධරයා මෙම සංස්ථා වලට පවරා ඇති සහ ඊට බලය ලබාදී ඇති නීතීන් සියල්ලක බලය පවරා ගන්නා අතර[8] එය පරිපාලනයට පමණක් නොව වැඩසටහන් නිෂ්පාදනය, වෙළෙඳ දැන්වීම් හා ඇතුළත් කරුණු යන සියල්ලටම අදාළ වෙයි. නිසි බලධරයා එම පනතේ 3 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සිය මැතිවරණ කොමසාරිස්වරයා නිකුත් කළ නිර්ණායක මත පමණක් නොව[9] ව්‍යවස්ථාපිතව සලසා ඇති ආකාරයට මනා රසාස්වාදයක්, සංවර බවක්, සමබර බවක්, නිවැරදි බවක් මෙන්ම අපක්ෂපාතී සහ පොදු යහපත සඳහාත් වූ තත්ත්වයන් ද ඇති වන ලෙස පවත්වා ගෙන යා යුතුය.

[8] 1996 අංක. 37 දරණ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත සහ 1982 අංක. 6 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත.

[9] 104(ආ)(5)(අ) වගන්තිය.

ශ්‍රී ලංකාවේ මැතිවරණ වලදී බොහෝවිට සිදු වන ලෙස 2004 දී ද රාජ්‍ය මාධ්‍යයන්හි භූමිකාව මතභේදයට ලක් විය. මැතිවරණ කොමසාරිස්වරයා 2004 මාර්තු මස මාධ්‍ය වෙත නිර්ණායක ඉදිරිපත් කළේය. මැතිවරණ කටයුතු අතර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවෙ හි කටයුතු නිර්ණායකයන්ට වඩා අඩු තත්ත්වයකින් පවතින බවත් ව්‍යවස්ථාපිතව සහ නෛතිකව ඔවුන්ගෙන් බලාපොරොත්තු වන සමබර සහ අපක්ෂපාතී බව නොමැති බවත් පෙනී යන ලදී. මැතිවරණ කටයුතු වල අවසාන සතියේදී මෙම ආයතන දෙක උදෙසා නිර්ණායක ක්‍රියාවේ යෙදවීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා නිසි බලධරයෙක් පත් කරන ලදී.

නිදහස් සහ සාධාරණ ප්‍රචාරණ සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ නිර්ණායක ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව 2004 මාර්තු 31 ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සමක් මගින් අභියෝගයකට ලක් කෙරුණු අතර කොමසාරිස්වරයා පත් කළ නිසි බලධරයා මගින් අදාළ නිර්ණායක හා නොගැලපෙන ඇතැම් ප්‍රවෘත්ති සහ දේශපාලන වැඩසටහන් තම පාලනයට ගැනීම ද ඊට අදාළ විය. පෙත්සම්කරුගේ අභියාචනයේ ඉල්ලා තිබුණු නිර්ණායක අත්හිටුවීම, අතුරු තහනම් නියෝගයක් සහ නිසි බලධරයා පත් කිරීම අත්හිටු වීමත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

මෙම සිද්ධීන් වඩාත්ම අපූර්ව වන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානය (එ.ජ.නි.ස.) මාධ්‍ය ආයතන තම ජීව අංග ලෙස සලකා නීතිමය ව්‍යායාමයන් මුලාවේ දැමීමට උත්සාහ දැරීම මතයි. නොදැනුවත්ව හෝ මෙය තියුණු ලෙස පැහැදිලි කරනුයේ රාජ්‍ය මාධ්‍ය ආයතන සහ ඒවා පාලනය කරන දේශපාලන පක්ෂ වල ඇති නියම බැඳීමයි. මෙම සිද්ධිය දරුණු ශාස්ත්‍රීය හෝ දේශපාලන විවේචනයකින් ඔබ්බට යන අපගේ රාජ්‍ය මාධ්‍ය ආයතනවල ඇති කිසියේත්ම අනුමත කළ නොහැකි ස්වභාවය පෙන්වා දෙයි. දහහත් වන ව්‍යවස්ථා සංශෝධනය මගින් (සහ එය බලාත්මක කරන නෛතික තත්ත්වයන් වන 2002 අංක. 3 දරණ නිසි බලධරයා (බලතල සහ කාර්යයන්) පනත පවා) මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලබාදී තිබූ බලතල පවා රාජ්‍ය මාධ්‍ය දේශපාලන පක්ෂ අවශ්‍යතා මත භාවිතා කිරීමට කරන ලද උත්සාහය වැළැක්වීමට ප්‍රමාණවත් නොවීය.

7. නම් කරන ලද නෛතික සාමාජිකත්වය සහ ජාතික ලැයිස්තුව පිළිබඳ සිද්ධාන්තය

2004 අප්‍රේල් මස පැවති මහ මැතිවරණයෙන් පසු මාස කිහිපය තුළ ජාතික ලැයිස්තුව මගින් කෙරුණු නාම යෝජනාවන්හි වලංගුභාවය පිළිබඳ ඇතැම් අභියෝග මතු වන්නට විය. ජාතික ලැයිස්තු පත්කිරීම් සම්බන්ධව ඓතිහාසික වශයෙන් ද, පුළුල්ව ව්‍යවස්ථාමය ව්‍යුහය අනිසි ලෙස යොදා ගෙන ඇත. මූලිකවම දේශපාලනික හේතුන් වලින් ආධාර සැපයෙන නම් කරන නෛතික සාමාජිකත්වය යන සංකල්ප සලකා බැලීම, 2004 ඇතිවූ තත්ත්වය සාකච්ඡා කිරීමට ආරම්භයක් වනු ඇත.

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ලංකාවේ සෙනෙට් මණ්ඩලයේ අඩක් තෝරා ගැනීම, වෙනත් අයෙකුට පැවරිය හැකි වූ සමානුපාතික තනි ඡන්දයක් මගින් සිදු විය. ඉතිරි 15 දෙනා එනම් වගකිව යුතු රජයක කැබිනට් මණ්ඩලය ලෙස සැලකෙන ගවනර්-ජෙනරල් විසින් පත් කෙරුණි. ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනයන් ලෙස සැලකූ මෙම නෛතික පත් කිරීම් සම්බන්ධව සාධාරණීකරණයක් සෝල්බරි ව්‍යවස්ථා වාර්තාවේ සඳහන් වේ.[10]

"දුරදිග නොබලා සහ වැරදි ලෙස සලකන ලද නීතිය ව්‍යවස්ථාපිත වීම වැළැක්වීම"[11] සහ "ප්‍රතිචාර සහ සලකා බැලීම සඳහා අවශ්‍ය කාලය ලබාදීමට"[12] සහ ඊට අදාළ කල් යැවීම මෙහි ප්‍රධාන අරමුණ විය. ඉන් තවදුරටත් තර්ක කෙරුණේ සුළු ජන නියෝජනය, පත් කළ සාමාජිකයන් හේතුවෙන් වඩා ශක්තිමත් වන බවයි. මීට අමතරව උපකල්පනය කෙරුණේ "පොදු ජනතාවගේ දේශපාලන අධ්‍යාපනයට වැදගත් දායකත්වයක් කළ හැකි" සමාජයේ කීර්තිමත් සහ කැපී පෙනෙන වෘත්තිකයන් මෙම පත්කළ සාමාජිකයන් වූ බවයි. මෙම උසස් බුද්ධියක් සහ පුළුල් අත්දැකීම් සහිත කීර්තිමත් පුද්ගලයන් කලබගැනි සහිත වූ පාර්ලිමේන්තු මැතිවරණ මගින් දේශපාලන ජීවිතයකට එළඹීමට අප්‍රිය අය වීමත්, තම ඡන්ද බලාපොරොත්තු මත ඇතිවිය හැකි අතුරුඵල සලකා බැලීමට තමන් බැඳී සිටින්නේ යැයි යන හැඟීමකින් තොරව

---

10 *ශ්‍රී ලංකාව: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිශෝධන කොමිසමේ වාර්තාව* (1945 සැප්තැම්බර්), Cmd. 6677: XIV වන පරිච්ඡේදය.

11 එම., 295 වන ඡේදය.

12 එම., 304 වන ඡේදය.

සහ පක්ෂ හෝ වාර්ගික වැනි බැඳීම් ඔවුනගේ උරහිස් මත අවම වීම නිසා ඔවුනට තමන්ගේ අදහස් නිදහසේ සහ ඍජුව ප්‍රකාශ කිරීමට හැකි බව[13] කොමිසම තර්ක කර ඇත. කොමිසම තවදුරටත් තර්ක කර සිටියේ, හොඳින් හෝ නරකින් "බහුතරයකගේ ක්‍රියාවන්ගෙන් තර්ජනයට ලක් වූ බව සිතන පුද්ගලයන්, දෙවන මණ්ඩලයක් හුදෙක්ම ඉක්මණින් නීති සම්පාදනය සිදු කරන ආයතනයකට වඩා ප්‍රකෝපකාරී කෙරුණු සන්සුන් වාතාවරණයක හැසිරවීමට හැකි"[14] ලෙස සලකනු ඇති බවයි.

මේ අනුව පත්කළ සෙනෙට් සභිකයන්ගෙන් නීති සම්පාදනයේදී දෙවන මණ්ඩලය විසින් පොදු මතවාද එතරම් ජනප්‍රිය නොවන විට පවා ඊට බලධාරී හඬක් එක් කිරීමට, අවශ්‍ය සාකච්ඡා වලට යොමු කිරීම හෝ පරීක්ෂාවට ලක් කිරීම හා වැඩි දියුණුවක් මෙන්ම ප්‍රමාණවත් තරම් ඡන්ද පදනමක් නොමැති සුළුතර ජාතීන්ට නියෝජනයක් ලබාදීමත්, අවසාන වශයෙන් සෙනෙට් සභාවේදී ප්‍රති බහුතරවාදී උපයෝගීත්වය ශක්තිමත් කිරීමත් බලාපොරොත්තු විය. නමුත් අවසානයේදී පෙනී ගියේ සෝල්බරි සෙනෙට් සභාව ඉන් බලාපොරොත්තු වූ වැදගත් අරමුණු කිසිවක් සාර්ථක නොවූ අතර ඒ හේතුව මත 1953 ජෙනින්ස්ගේ තියුණු තක්සේරුවෙහි දැක්වූයේ, බලාපොරොත්තු සාර්ථක වී ඇත්තේ එක් අංශයකින් පමණි යන්නයි. 1945 දී මෙම සෝල්බරි කොමිසම පිළිබඳ යෝජනාවට විරුද්ධත්වය ප්‍රශ්න කෙරුණු සාකච්ඡාවේදී ප්‍රබල ලෙස ඊට විරුද්ධ නොවීමට තීරණය වූයේ "ඉන් කිසිදු හානියක් නොවනු ඇත"[15] යන්න මතයි.

තනි ව්‍යවස්ථාපිත මණ්ඩලයක් යටතේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මුල් කාලය තුළදී ද ව්‍යවස්ථාදායක සභිකයන් පත්කිරීම සඳහා ප්‍රතිපාදන නොතිබිණි. එහෙත් 1988 දී වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දුන් දහහතර වන ව්‍යවස්ථා සංශෝධනයේ හි 99(අ) වගන්තිය (සහ පසුව පහළොස්වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත) දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වලට පත් නොවූ සාමාජිකයන්ගෙන් සමහරක් පාර්ලිමේන්තුව සඳහා

---

13 ශ්‍රී ලංකාව: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිශෝධන කොමිසමේ වාර්තාව, op. cit., 296 වන ඡේදය.

14 එම., 298 වන ඡේදය.

15 අයි. ජෙනින්ග්ස්ගේ, *ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව*, 3 වන සංස්කරණය (Oxford: OUP, 1953), 99.

යෝජනා කිරීමට ප්‍රතිපාදන ඇති කරන ලදී. තම ඡන්ද කොට්ඨාශවල දැක්වෙන ප්‍රතිඵල මත පක්ෂ සඳහා වූ නියමිත ආසන ප්‍රමාණය තීරණය විය.

කෙසේ නමුත් පත්කළ සාමාජිකයන් සඳහා වූ ප්‍රතිපත්තිය පිළිබඳ අවශ්‍යතාව සහ හේතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පාඨ මගින් පැහැදිලි නැතත් 99(අ) වගන්තියේ හතරවන ඡේදයෙ හි, සාර්ථක වීමට බලාපොරොත්තු, අඩු තරමින් එක් අරමුණක් දැක්වෙයි. එමගින් මැතිවරණ කොමසාරිස්වරයාහට "යම්කිසි ජන වර්ගයක, කොට්ඨාශයක හෝ වෙනත් ආකාරයකට පත්වී ඇති පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාව ඊට අදාළ ජාතික ජනගහන ප්‍රතිශතයට අනුකූලව, (යෝජනා කිරීම සිදු කරන පක්ෂය) ප්‍රායෝගිකව හැකි උපරිම ලෙස, සියලු ජන වර්ග ජාතික ජනගහනයේ ප්‍රතිශතයකට අනුව නියෝජනය වන ලෙසට යෝජනා කිරීමට ඉල්ලා සිටීම පිළිබඳව තීරණය කළ හැකිය. සමානුපාතික නියෝජනය දේශපාලන පක්ෂ වලට යම් තරමක ජනවාර්ගික හා ආගමික වෙනස්කම් මත තම නාම යෝජනා සිදු කිරීම තහවුරු කිරීමට බලපෑම් කර ඇති බැවින්, මෙම අවශ්‍යතාව මුළුමනින්ම පාහේ අතිරික්ත තත්ත්වයට පත්වී ඇත. අනෙක් අතට කුඩාම සුළු ජනතාව වූ මැලේ හා බර්ගර් ජාතිකයන්හට මෙම නියෝජනය යටතේ හිමිකම නොලැබෙනු ඇත.

ඡන්ද බලය ප්‍රධාන දේශපාලන හරයක් ලෙස පවතින නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයක, ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් පත්කිරීම පිළිබඳ න්‍යාය සෝල්බරි වාර්තාවේ අරමුණු හෝ අඩුම තරමින් සහතික කරයි නම් එම පත්කිරීම් පිළිබඳ ව්‍යූහය ආරක්ෂා කිරීමට හැකියාවක් තිබිය හැක. සෙනෙට් සභාව පත් කරන (සහ ඒ මගින් විශ්වාස පිළිබඳ බරපතල අර්බුදයක් ඇති) ෆෙඩරල් කැනඩාවෙහි ව්‍යවස්ථාවේ අනුගමනය කළ යුතු මිණුම් පිළිබඳ දක්වා ඇත. මීට ෆෙඩරල් අවශ්‍යතාවයක් වන මධ්‍යයේ පවතින පළාත් නියෝජනය ඇතුළත් ය. එසේ නමුත් මෙම අරමුණු ඉටු නොවීම වාර්තා වෙයි.

ශ්‍රී ලංකාවේ යෝජිත පුද්ගලයන් පිළිබඳ එකම අවශ්‍යතාවය නම් ඔවුන් මැතිවරණයට ප්‍රථම පක්ෂය විසින් ඉදිරිපත් කෙරෙන ජාතික ලැයිස්තුවේ අපේක්ෂකයෙකු වීම හෝ එම පුද්ගලයා මහ මැතිවරණයේ (පරාජිත) අපේක්ෂකයෙකු වීමයි.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලාත්මක කිරීමේදී 62 වගන්තියේ ප්‍රතිපාදන දක්වා ඇත්තේ ඍජුව ඡන්දයෙන් තේරුණු සාමාජිකයන්

එකසිය අනුභය දෙනෙකුගෙන් පාර්ලිමේන්තුව සමන්විත විය යුතු බවයි. නමුත් දහහතර වන ව්‍යවස්ථා සංශෝධනය (1988) මගින් වර්තමානයේ පවතින දෙසිය විසි පහක් වූ සංඛ්‍යාව දක්වා වැඩි කරන ලදී. මේ සංශෝධනයෙන් ඉදිරිපත් කෙරුණු 99(අ) වගන්තිය ප්‍රකාර වැඩි කෙරුණු සාමාජිකයන් විසිනව දෙනා එක් එක් පක්ෂය මැතිවරණයේදී ලද ජන්ද ප්‍රමාණය මුළු ප්‍රකාශිත ජන්ද සංඛ්‍යාවට සමානුපාතික ලෙස ගෙන ඊට අනුකූලව පක්ෂ වලට ලබා දෙයි. මැතිවරණ කොමසාරිස්වරයා විසින් එක් එක් පක්ෂයේ අයිතිය පිළිබඳ තීරණය කළ පසු එම පක්ෂවල ප්‍රධාන ලේකම්වරයා විසින් ජාතික ලැයිස්තුව ලෙස හැඳින්වෙන ලැයිස්තුවේ නම් අතරින් (හෝ ජන්ද අපේක්ෂක ලැයිස්තුවේ සිටි එහෙත් පත් නොවූ පුද්ගලයන් අතුරින්) නම් යෝජනා කරනු ලැබේ.

99අ වගන්තියේ දක්වා ඇති විධි විධාන පරිදි ජාතික ලැයිස්තුව, නියමිත කාලය තුළදී මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලබා දිය යුතුය. එය සිදු කිරීමෙන් අනතුරුව සහ නියමිත කාලය අවසන් වීමෙන් පසු මැතිවරණ කොමසාරිස්වරයා විසින් වහාම එම ලැයිස්තු ගැසට් පත්‍රයේ පළකළ යුතු අතර ඊට අමතරව එම ලැයිස්තු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත් වල ද පළකළ යුතුය. මෙම විධානයන් යහපත් ඒවා වෙයි. අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලියවිල්ලට දහහතරවන ව්‍යවස්ථා සංශෝධනය මගින් නම් කළ ව්‍යවස්ථාදායක සාමාජිකයන් පත් කිරීමේ ප්‍රතිපත්තිය නැවත හඳුන්වා දීම මගින් මෙම ක්‍රියාවලිය හැකි තරම් ප්‍රජාතන්ත්‍රවාදි කිරීමේ පරීක්ෂාකාරී අවශ්‍යතාව මැතිවරණ කොමසාරිස්වරයාට පැවරුණු අතර ජන්දදායකයන් සෘජු මැතිවරණය සඳහා වූ පක්ෂවල අපේක්ෂකයන් පිළිබඳ පමණක් නොව ඔවුන් මැතිවරණයෙන් පසු පත්කිරීමට බලාපොරොත්තු වන අය පිළිබඳව ද දැනුම ඇතිව සිටින බවද සහතික කර ගත යුතු විය.

මීට පෙර පැහැදිලි කළ අන්දමට, කොමසාරිස්වරයා මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශ කිරීමෙන් අනතුරුව පක්ෂ අතර අමතර ආසන සංඛ්‍යාව බෙදා වෙන්කර ඒ පිළිබඳව දන්වා සිටියි: කොමසාරිස්වරයාගේ දැන්වීමෙන් සතියක් ඇතුළත අමතර ආසන සඳහා සුදුසුකම් ලැබූ පක්ෂ ජාතික ලැයිස්තුවේ හෝ මැතිවරණ අපේක්ෂක ලැයිස්තුවේ හෝ ඇති අය අතුරින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ලෙස ප්‍රකාශ කළ යුතු වූ තම යෝජනා සිදු කළ යුතුය. මෙම පසුව සඳහන් විධි විධාන එනම්, මැතිවරණයකදී ප්‍රතික්ෂේප කෙරුණු පුද්ගලයන් නම් කිරීමට පක්ෂ වලට ඉඩ ලබාදීම අන්තගාමී ලෙස ප්‍රතිගාමී වීමක් වුවත් අඩුම තරමින් පක්ෂ මගින් පුද්ගලයන් නම් කිරීම යම් තරමකට සීමා කරයි.

එසේ නම් කරනු ලැබිය හැකි පුද්ගලයන් පිළිබඳ 99අ වගන්තිය පනවා ඇති සීමා අතර මුලින්ම එම පුද්ගලයා 90 සහ 91 වගන්ති යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත් වීමට සුදුසු අයෙකු විය යුතුය. දෙවන කොන්දේසිය පෙර පැහැදිලි කළ පරිදි යෝජිත පුද්ගලයාගේ නම මැතිවරණ කොමසාරිස්වරයා වෙත නියමිත කාලය තුළ ලබා දුන් ලැයිස්තුවේ (ජාතික ලැයිස්තුවේ හෝ සෘජු මැතිවරණයකට ඉදිරිපත් වූ අපේක්ෂකයෙකු වීම) තිබීමයි.

99අ වගන්තියේ තෙවන ඡේදය ප්‍රකාශිතවම මෙය තවදුරටත් පැහැදිලි කරයි. ඒ අනුව එක්ස්ප්‍රසිඕ යුනිඅස් ඒ එක්ස්ක්ලුසිඕ ඇල්ටේරිස් (*expressio unius est exclusio alterius*) (එක් කරුණක් පිළිබඳ සෘජු තේරුම තව එකක් අත් හැරීමයි.) යන ආප්තය 99අ වගන්තිය අර්ථකථනය කිරීමේදී යොදා ගත යුත්තේ එම වගන්තියේ නෛතික අවශ්‍යතාවයන් අඩු කිරීම කිසි ලෙසකින් කළ නොහැකි අයුරිනි.[16] යම් පුද්ගලයෙකුගේ නම මැතිවරණ කොමසාරිස්වරයාට පක්ෂයක් විසින් ලබාදී ඇති ලැයිස්තු දෙකෙන් එකක හෝ නොමැති නම් මැතිවරණයෙන් පසු පාර්ලිමේන්තුව සඳහා එම පුද්ගලයා යෝජනා කිරීමට නොහැක.

කෙසේ වුවත්, 1981 අංක. 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතින් සංශෝධිත 99අ වගන්තියෙහි, අතිරේක ව්‍යවස්ථා පක්ෂ වලට ප්‍රයෝජනයට ගත හැකි පරිදි හිඩැස් ඇති වන ලෙස සිතාමතාම සිදුකළ කපටි කෙටුම්පත් කිරීමක් බව පෙනී යයි. මෙම අවස්ථාවේදී පනතෙහි 64 වන වගන්තියෙහි පදානුගත අර්ථය අනුව පෙනී යන්නේ ජාතික ලැයිස්තු සාමාජිකයෙකු ඉල්ලා අස්වූ අවස්ථාවක අදාළ පක්ෂයට එම පක්ෂයේ ඕනෑම සාමාජිකයෙකු නම් කිරීමෙන් එම පුරප්පාඩුව පිරවීමට හැකි බවයි. මෙම ක්‍රමය මගින් පුරප්පාඩු පිරවීමේදී ව්‍යවස්ථාවෙන් අපේක්ෂා කළ අභිමතයට අනුව ඡන්ද අපේක්ෂක ලැයිස්තුවේ හෝ කලින් ප්‍රකාශයට පත්කළ ජාතික ලැයිස්තුවේ සඳහන් නමක් තෝරා ගැනීමට සීමා කෙරෙන තත්ත්වයකට වඩා පුළුල් වූ තෝරා ගැනීමක් 64වන වගන්තියේ පදානුගත අර්ථය මගින් දේශපාලන පක්ෂ වලට ලබාදී ඇත. ඇත්තෙන්ම 64වන වගන්තියේ මෙම අර්ථකථනය පදනම් වූ විනාශකාරී භාවිතය වර්තමානයේ දේශපාලන පක්ෂ අතර පැතිරී ඇති අතර එය

[16] මෙම ආප්තෝපදේශයේ නිදර්ශන සහිත පැහැදිලි කිරීමකට, *තොම්සන් එරෙහිව හිල්* (1870)LR 5CP 564 බලන්න: *ඉන් රේ (In re) කේරළ ප්‍රාන්තයේ අධ්‍යාපන පනත් කෙටුම්පත* (1958)AIR 956 SC; *කාරියප්පර් එරෙහිව විජේසිංහ* (1967) 70 නව නීති වාර්තා 49.

2004 දී ද එලෙසම සිදු විය. මේ හේතුවෙන් පෙනී යන්නේ පක්ෂ වලට ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් වූ ජාතික ලැයිස්තුව මැතිවරණයට පෙර ප්‍රකාශයට පත්කිරීමේ අවශ්‍යතාවය මහ හැරීම මගින් 64 වන වගන්තිය ශ්‍රී ලංකාවේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ ක්‍රියාවලිය හැල්ලුවට ලක්කර ඇති බවයි. මෙම විධි විධාන ශ්‍රී ලාංකික ඡන්දදායකයන්ගේ මැතිවරණ තෝරා ගැනීම යොදා ගනිමින් පක්ෂ ධූරාවලිය ශක්තිමත් කිරීම සිදු කරයි.

කෙසේ නමුත්, සටහන් කළ යුතු කරුණක් වන්නේ පළාත් සභා නීතියේ[17] විරුද්ධ විධි විධාන මගින් සිදු කළ පත්කිරීම් වල නීත්‍යානුකූලභාවය මෑතකදී අභියෝගයට ලක් කළ අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ ඉල්ලා අස්වීමකින් ඇති වන පුරප්පාඩුවක් සම්පූර්ණ කිරීමට දේශපාලන පක්ෂ වලට තම පක්ෂයේ ඕනෑම සාමාජිකයෙකු පත්කිරීම සිදු කළ නොහැකි බවයි. නාම යෝජනා කළ යුතු පුද්ගලයාගේ නම පක්ෂයේ නාම යෝජනා පත්‍රවල සඳහන් අයෙකුගේ විය යුතුය යන පෙත්සම්කරුගේ ස්ථාවරය අධිකරණය විසින් අනුමත කරන ලදී. අභියාචනාධිකරණ තීන්දුව ඉවතලමින් මාර්ක් ප්‍රනාන්දු විනිසුරුතුමා නිරීක්ෂණය කළ අන්දමට,

> ආණ්ඩු ව්‍යවස්ථා හෝ ව්‍යවස්ථාමය විධි විධාන අර්ථකථනය කළ යුතු වූ විට ඊට අර්ථකථන දෙකක් ඇති බව පෙනී යයි. වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන්ට අනුරූප විකල්පයක් තිබියදී අධිකරණයක් ප්‍රජාතන්ත්‍රවාදී නොවූ අර්ථකථනයන් යොදා ගැනීම සාධාරණීකරණය කළ නොහැක්කේ, හුදෙක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හෝ ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදී නොවන බව පෙනී යන වෙනත් විධි විධාන ඇති බැවිනි.[18]

---

17 *විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ සරවනමුත්තු එරෙහිව දිශානායක, වීරවන්නි සහ වෙනත් අය සහ එදිරිසිංහ එරෙහිව දිශානායක, වීරවන්නි සහ වෙනත් අය,* ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචන අංක: 26/2002 සහ 27/2002, ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා 2003 මැයි 27.

18 *විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ සරවනමුත්තු එරෙහිව දිශානායක, වීරවන්නි සහ වෙනත් අය සහ එදිරිසිංහ එරෙහිව දිශානායක වීරවන්නි සහ වෙනත් අය,* op, cit., 10.

8. 2004 අප්‍රේල් මස පැවති මහා මැතිවරණයට ආනුෂංගික ජාතික ලැයිස්තු නාම යෝජනා

කෙසේ වුවත්, සිදුවීමට යන දේ පිළිබඳව 2004 මැතිවරණ ව්‍යාපාරය ආරම්භයේදීම හැඟවීමක් ලැබුණේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (UPFA) නාම යෝජනා ලැයිස්තුවේ හෝ ජාතික ලැයිස්තුවේ හිටපු අග්‍රාමාත්‍යවරයෙකු සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වූ රත්නසිරි වික්‍රමනායක මහතාගේ නම නොමැති බව හෙළි වීමෙනි. ඒ කෙසේ වුවත්, වික්‍රමනායක මහතාගේ නම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (UPFA'S) ජාතික ලැයිස්තුවේ[19] මුල්ම නම ලෙස සලකන බව සහතික කිරීම සඳහා ජනාධිපතිතුමිය විසින් පෙබරවාරි මස මාධ්‍ය ප්‍රකාශයක් පවා නිකුත් කරන ලදී. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස ප්‍රකාශයට පත්කළ විටම 'නියම' අපේක්ෂකයින්ට ඉඩ සලසා දෙනු වස් ඉල්ලා අස්වන 'ව්‍යාජ' අපේක්ෂකයින් නම් ලැයිස්තුවට ඇතුළත් කිරීමේ පුරුද්ද මෙම අවස්ථාවේදී ද අදහස් කළ බව මෙසේ පැහැදිලි විය.

බලාපොරොත්තු වූ ලෙසම, ජාතික ලැයිස්තුවේ සාමාජිකයෙකු ලෙසට වික්‍රමනායක මහතාගේ නම ඔහුගේ පක්ෂයෙන් යෝජනා කළවිට, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඔහු තෝරා පත්කළ බවට ප්‍රකාශ කරමින් එම යෝජනාව පිළිගන්නා ලදී. එමෙන්ම, එම පත්කිරීමට එරෙහිව රිට් ආඥා ලබා ගැනීම සඳහා අභියාචනාධිකරණය වෙත ඉල්ලීම් රාශියක් ගොනු කරන ලදී. මෙය ලියන අවස්ථාව වන විටත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ රොහාන් එදිරිසිංහ මහතා විසින් ගොනු කරන ලද මෙම ඉල්ලීම් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සලකා බලමින් පැවතිණි.

කරුණු කිහිපයක් පදනම් කරගෙන, වගඋත්තරකරුවන් වෙනුවෙන් මූලික විරෝධතා ඉදිරිපත් කරන ලදී. විශේෂයෙන්ම, 104(උ) වගන්තිය සැලකූ විට මෙම කරුණු පිළිබඳ නඩු විමසීමකට අභියාචනාධිකරණය සතුව අධිකරණ බලය ඇතිදැයි යන්න හා මෙම කරුණු තීරණය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කළ යුතු වේද? එසේ නම්, එවිට මෙම ගැටළුව නිශ්චය කිරීම සඳහා එය 125 වන වගන්තියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමුකළ යුතුවීම යනාදියයි.

---

[19] 2004, පෙබරවාරි මස 26 දිනැති ඩේලි මිරර් පුවත්පත.

9. 104 ඌ ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය සතු අධිකරණ බලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන වගන්තිය මගින් ශ්‍රී ලංකාවේ රිට් ආඥා පිළිබඳ මුල් අධිකරණ බලය (සංශෝධිත පරිදි 141 වන වගන්තිය අදාළ වියයුතු, (හබයාස් කෝපුස් (*Habeas Corpus*) හැරෙන්නට) අභියාචනාධිකරණය මත පවරා ඇත. මැතිවරණ කොමසාරිස් කාර්යාලය සම්බන්ධව අභියාචනාධිකරණය සතු අධිකරණ බලතල පිළිබඳ තර්ක කිරීමේදී වගඋත්තරකරුවන් විසින් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දුන් 104ඌ වගන්තියේ සහය ලබා ගත් අතර, 17 වන සංශෝධනයේ 27 වන වගන්තිය අනුව කොමිසමේ බලතල ක්‍රියාත්මක කිරීමේදී, මැතිවරණ කොමසාරිස්වරයා මත බලහත්කාරය යෙදවීම යන කරුණ ඉවත් කරන ලදී. 140ඌ වගන්තියෙන් ප්‍රකාශ වන්නේ, 140 වන වගන්තිය යටතේ අභියාචනාධිකරණය සතු අධිකරණ බලතල, මැතිවරණ කොමසාරිස් කාර්යාලය ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී පැන නැඟිය හැකි ඕනෑම ගැටළුවක් සම්බන්ධව, ඒවා ශ්‍රේෂ්ඨාධිකරණයට ක්‍රියාත්මක කළ හැකි බවයි. එබැවින්, දැනට පවතින ගැටළුව වන්නේ, මැතිවරණ කොමසාරිස් කාර්යාලය ව්‍යවස්ථාපිත නොවී පැවතීමේ තත්ත්වයක් තුළ, කොමසාරිස් කාර්යාලයේ බලතල, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කිරීම පිළිබඳව 104ඌ වගන්තිය අදාළ වේද? යන්නයි. එසේ අදාළ වන්නේ නම්, ඉහත විවාදයට ලක්වූ නඩු සම්බන්ධව රිට් ආඥා පිළිබඳ මුල් අධිකරණ බලය හිමිවන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට මිස, අභියාචනාධිකරණයට නොවේ.

104ඌ වගන්තියට (104 අ(අ)) වගන්තිය සමඟ කියවිය යුතු) අදාළ ගැටළුව, ගානි එරෙහිව දයානන්ද දිශානායක *2004*[20] යන නඩුවේදී, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් 5 දෙනෙකුගෙන් සමන්විත පූර්ණ විනිසුරු මණ්ඩලයක් විසින් අවසානාත්මකව විසඳා ඇති බව පෙනෙන්නට ඇත. මෙම නඩුවේදී, 2002 වසරේ පළාත් පාලන මැතිවරණයේදී කොළඹ නගර සභාවට තරඟ වැදුණු අපේක්ෂකයකු විසින්, ඔහුට නැවත ගණන් කිරීමක් ලබාදීම උද්දේශිතව ප්‍රතික්ෂේප කිරීම නිසා මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන්ට විරුද්ධව මැන්ඩාමුස් (*mandamus*) සහ සර්ෂියෝරාරි (*certiorari*) රිට් ආඥාවක් ලබා ගැනීමට උත්සාහ කරන ලදී.

---

[20] ගානි එරෙහිව දයානන්ද දිශානායක, මැතිවරණ කොමසාරිස්වරයා (2004) 1 SLR 17 (SC).

මැතිවරණ කොමසාරිස්වරයා සහ ඔහුගේ නිලධාරීන් වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින්, *(වෙනත් දේ අතර)* 104උ වගන්තියට අදාළව අධිකරණ බලතල සම්බන්ධව මූලික විරෝධතාවයක් නඟා සිටි අතර, අභියාචනාධිකරණය විසින් එය පිළිගන්නා ලදී.[21] එයට එරෙහිව ඉදිරිපත් වූ අභියාචන ඉල්ලීමේදී, 104උ වගන්තිය සම්බන්ධව අභියාචනාධිකරණය විසින් ඉදිරිපත් කළ තර්ක වාද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. අධිකරණය වෙනුවෙන් මාර්ක් ප්‍රනාන්දු විනිශ්චයකාරවරයා විසින් පහත ආකාරයට ප්‍රකාශ කරන ලදී.

> අදාළ ප්‍රතිපාදනයන් අර්ථනිරූපණය කිරීම ආරම්භ කළ යුතු වන්නේ, 'මැතිවරණ කොමසාරිස් කාර්යාලය' යන්නෙන් අර්ථවත් වන්නේ, තවමත් සංස්ථාපනය කිරීමට තිබෙන මැතිවරණ කොමසාරිස් කාර්යාලය මිසක්, එහි නිලධාරීන්වත්, මැතිවරණ කොමසාරිස්වරයාවත් නොවන බවයි...[22] 104උ වගන්තිය අනිවාර්යයෙන්ම 104 අ(අ) වගන්තිය සමඟ එකට කියවිය යුතුය. එසේ, ඒවා එක්වගෙන කියවීමෙන් ප්‍රකට වන්නේ, මෙම ප්‍රතිපාදන දෙක මගින් අභියාචනාධිකරණය සතු රිට් ආඥා පිළිබඳ අධිකරණ බලයෙන් කොටසක් මෙම අධිකරණය වෙත පැවරීම පැහැදිලි ලෙසම අරමුණු කරගත් බවයි. එනම්, විශේෂයෙන්ම *මැතිවරණ කොමසාරිස් කාර්යාලය* විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී පැන නැඟිය හැකි ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් සහ 104උ 126(1) සහ 130 යන වගන්ති යටතේ හැර *මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ* තීරණ, නිර්දේශ සහ පියවර අවසානාත්මක සහ ඒවා අධිකරණමය විමර්ශනයන්ගෙන් නිදහස් කිරීම වේ. එනයින්ම පැහැදිලි වන්නේ, මෙම වගන්තිය මැතිවරණ කොමසාරිස්වරයාගේ හෝ එහි නිළධාරීන්ගේ ක්‍රියාවන්ට සහ පැහැර හැරීම් වලට අදාළ නොවන බවයි...[23] එය වෙනත් ආකාරයකට පැවසුවහොත්, 104උ වගන්තිය මගින්, *මැතිවරණ කොමසාරිස් කාර්යාලය විසින්ම*, තම බලතල ක්‍රියාත්මක කිරීමක් සම්බන්ධව පමණක් අභියාචනාධිකරණයේ අධිකරණ බලතල වල බලපෑම ඇති කරයි. මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ බලතල වෙනත් පුද්ගලයන් විසින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව 104උ

---

[21] වාර්තාගත නොවූ, අභියාචනාධිකරණ නඩු තීන්දුව, 2002 වසරේ ඔක්තෝබර් 17.

[22] *ගාමිනී එරෙහිව දයානන්ද දිශානායක*, op. cit., 26.

[23] එම, මුල් පිටපත අවධාරණය කරයි.

> වගන්තිය අදාළ නොවේ. නමුත් කොමසාරිස් කාර්යාලය - (but the Commission) යන වදන්, සීමාවක් පැනවීමේ වදන් වේ. මෙම බලතල මැතිවරණ කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද 104ඌ වගන්තිය අදාළ විය යුතු යැයි පාර්ලිමේන්තුව අදහස් කළේ නම්, එසේ සීමා කිරීම සඳහා පැනවූ වදන් එය විසින් ඉවත් කරනු ඇති අතර, එවිට 104ඌ වගන්තිය පහත ආකාරයට කියවෙනු ඇතः එනම්, ... 'කොමසාරිස් කාර්යාලය - (by the Commission)' සහ 'එය මත - (on it)' යන වදන් ඉවත් කර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ වෙනත් ආකාරයේ නීතියක් මගින් කොමසාරිස් කාර්යාලය වෙත ප්‍රදානය කර, ඇති බලතල ක්‍රියාත්මක කිරීමේදී පැන නැඟිය හැකි ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන්' යනුවෙනි.[24]

පහත දැක්වෙන ආකාරයට 17 වන සංශෝධනයේ 27 වන වගන්තියේ අර්ථය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පැහැදිලි කරන ලදී:

> 27(2) වන වගන්තිය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇති කරන ලද 17 වන සංශෝධනය) යනු තාවකාලික ප්‍රතිපාදනයක් වන අතර, එමගින්, මැතිවරණ කොමසාරිස්වරයාට, එම කාලය තුළ (අ) මැතිවරණ කොමසාරිස්වරයාගේ නිලයේ (දැනට පවතින නීතීන්ට යටත්ව) සහ (ආ) මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ බලතල හා කටයුතු, ක්‍රියාත්මක කිරීමට හා ඉෂ්ට කිරීමටත් ඉඩ සලසා දෙයි. 27(2) වන වගන්තිය මගින්, මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට බලතල පැවරෙන නමුත්, එසේ සිදු කරන ක්‍රියාව හෝ එලෙස බලතල ක්‍රියාත්මක කිරීමක් ලෙස නොසැලකේ. 104ඌ(7) වගන්තිය එයට ඉතා හොඳ උදාහරණයකි: එමගින් අභියාචනාධිකරණයේ රිට් ආඥා පිළිබඳ අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීමට බලය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දේ: එසේ ක්‍රියා කිරීමේදී, එය ශ්‍රේෂ්ඨාධිකරණයේ ස්වරූපය දරන එහෙත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීමක් බවට පත්වෙන අතර, එලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් බලතල ක්‍රියාත්මක කිරීමේදී එය අභියාචනාධිකරණය විසින් බලතල ක්‍රියාත්මක කිරීමක්වත් එසේ ක්‍රියාත්මක කිරීමක් යැයි පෙනීමක්වත් සිදු වෙතැයි තර්ක කළ

[24] Ghany, op. cit., 26-27 මුල් පිටපත අවධාරණය කරයි.

> නොහැකිය. ඒ ආකාරයටම, මෙම අවස්ථාවේදී, මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ බලතල කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කළත්, එය මැතිවරණ කොමසාරිස්වරයා විසින් බලතල ක්‍රියාත්මක කිරීමක් වේ.[25]

ඒ අනුව, රත්නසිරි වික්‍රමනායක මහතා පත්කිරීම පිළිබඳ පැවති අභියෝග අතර, වගඋත්තරකරුවන් විසින් අධිකරණ බලය සම්බන්ධව නඟා සිටි මූලික විරෝධතාවය, අභියාචනාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. 2004 ජූලි මස 7 වන දිනැති අභියාචනාධිකරණ නඩු තීන්දුවේදී මාර්සුප් විනිසුරුතුමා (P/CA) අවසානාත්මකව දක්වා සිටියේ, ''මැතිවරණ කොමසාරිස් කාර්යාලය සංස්ථාපනය කරන කාල වකවානුව තෙක් මැතිවරණ කොමසාරිස්වරයා මත අධීක්ෂණ අධිකරණ බලතල (Supervisory Jurisdiction) අභියාචනාධිකරණය විසින් නොකඩවා ක්‍රියාත්මක කරන තරමටම, මෙම අධිකරණය ගානි (*Ghany*) නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නඩු තීන්දුවෙන් බැඳී සිටියි.''[26] යනුවෙනි.

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 125 වන වගන්තිය අර්ථනිරූපණය කිරීම

1981 අංක. 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 වන වගන්තියේ අදාළ වීම අභියාචනාධිකරණය විසින් සලකා බැලිය යුතුය යන කරුණ මත, වගඋත්තරකරුවන් වෙනුවෙන් මූලික විරෝධතාවයක් ගෙන හැර පෑ අතර, ඒ සඳහා අවශ්‍යයෙන්ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ වගන්තිය අර්ථනිරූපණය කළ යුතු වේ. කරුණු එසේ වූයේ නම්, අනිවාර්යයෙන්ම අභියාචනාධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ගැටළු විනිශ්චය කිරීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කළ යුතුය. ඒ මන්ද යත්? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීම, එම අධිකරණයේ තනි සහ අනන්‍ය (sole and exclusive) අධිකරණ බලතල යටතට වැටෙන බැවිනි.[27]

---

[25] එම, 28.

[26] *එදිරිසිංහ එරෙහිව මැතිවරණ කොමසාරිස්වරයා* අභියාචනාධිකරණ අංක: 799/2004 (වාර්තාගත නොවූ) 6 වෙනි පිට.

[27] 125(1) වන වගන්තිය.

අභියාචනාධිකරණය විසින් 2004 ජූලි මස 7 වන දිනැති වූ ස්වකීය නඩු තීන්දුවෙන් මෙම විරෝධතාවය ප්‍රතික්ෂේප කරන ලදී. මාර්සූෆ් විනිසුරුතුමා (P/CA) ප්‍රකාශ කළේ:

> මෙම ඉල්ලීම විමසීමේ සහ විනිශ්චය කිරීමේ කාල සීමාව තුළදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීමට සම්බන්ධ ගැටළු පැන නැගී දැයි අනාගත වාක්‍යය ඉදිරිපත් කිරීමට තවමත් කල් වැඩියි... මෙම අධිකරණයට 125(1) වගන්තිය මගින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීමට සිදුවන ගැටළුවක් හෝ ගැටළු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමට බලය ලබා දී ඇතත්, එලෙස අර්ථනිරූපණය කරනු පිණිස අර්ථනිරූපණ ගැටළුවක් හෝ ගැටළු ඇති වුවහොත් සහ ඇතිවූ අවස්ථාවකදී පමණක් එලෙස යොමු කිරීමක් කළ හැක. පෙත්සම්කරු වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා විසින් ඉදිරිපත් කළ දේශන වලින් වටහා ගත හැක්කේ, මේ මොහොතේ ඔවුන් වඩාත් වාද කරන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිදන්ගත කර ඇතැයි පැවසෙන 'මැතිවරණ පිළිවෙත (elective principle)' පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වගන්තිය අර්ථනිරූපණය කිරීමේදී ද අදාළ විය යුතු බවයි. අධිකරණයේ මතය අනුව, සාමාන්‍ය පාර්ලිමේන්තු පනතක් අර්ථනිරූපණය පිණිස සමහර ව්‍යවස්ථාදායකමය පිළිවෙත් සහ ප්‍රතිපාදන අදාළ කරවීම ද සම්බන්ධ වේ. අධිකරණයේ මතය අනුව මේ තාක් කල් මෙම නඩුකරයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීම පිළිබඳ ගැටළුවක් පැන නැගී (arise) නොමැත...[28]

මෙසේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හුදෙක් *අදාළ කරවීම (application)* (අභියාචනාධිකරණයට එය කිරීමට ශක්තුතාවයක් ඇත.) සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව *අර්ථනිරූපණය (interpretation)* කිරීම (එවිට 125(1) වගන්තිය අදාළ වේ.) අතර, පැහැදිලි වෙන් කිරීමක් සිදු කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය වෙතින් අභියාචනා කිරීමට අවසර ඉල්ලීමේ උත්සාහයක් මගින් වගඋත්තරකරුවන් විසින් වෙනත් දේ අතර, මෙම තීන්දුව විසංවාදයට ලක් කළ අතර ඔවුන්ගේ තර්කය වූයේ, 64(5) වගන්තියෙහි 99(අ) වගන්තිය පිළිබඳ සඳහන් කිරීමක් ඇති බැවින්, 64(5) වගන්තිය අර්ථනිරූපණය කිරීමේදී, 99(අ) වගන්තිය ද

---

28 *එදිරිසිංහ එරෙහිව මැතිවරණ කොමසාරිස්වරයා*, op. cit., 8 (*Edirisinha* v. *Commissioner of Elections*,).

අර්ථනිරූපණය කිරීම අවශ්‍ය බවයි. ඔවුන් අයැද සිටි 64(5) වගන්තියේ විශේෂිත අර්ථනිරූපණය සඳහා, 99(අ) වගන්තිය හුදෙක් අදාළ කරවීම සහ සමහර සහජ ව්‍යවස්ථාමය පිළිවෙත පිළිබඳ නිසි සමාලෝචනයක් ලබාදිය යුතු යැයි පෙත්සම්කරුවන්ගේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් විසින් ආයාසයෙන් සිදු කළ තර්කවාදයන් කිසිවෙක්, ශ්‍රේෂ්ඨාධිකරණයට ඒත්තු ගැන්වීමට අපොහොසත් විය.

මෙම අවස්ථාවේදී, 125(1) වගන්තිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ ආකාරය දැක්වෙන පෙර අධිකරණ අධි බලයන් (prior judicial authority) සලකා බැලීම වැඩදායක වනු ඇත. *බිල්ලිමොරියා එරෙහිව ඉඩම් අමාත්‍යවරයා* (*Billimoria* v. *Minister of Lands*) (1978-79-80) යන නඩුවේදී ශර්වානන්ද අගවිනිසුරුතුමා ප්‍රකාශ කළේ:

> ව්‍යවස්ථාදායකමය ආරවුලක් සම්බන්ධයෙන් නඩු තීන්දුවක් ලබාදීමට, ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා අපට ආරාධනා කර තිබේ. අභියාචනාධිකරණ තීන්දුවෙන් පෙනී යන පරිදි, තර්කවාදයන් මධ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීම පිළිබඳ සමහර ආරවුල් පැන නැගී ඇති බවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීම පිළිබඳ ඕනෑම ආරවුලක් මෙම අධිකරණය වෙත යොමු කළ යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125 වන වගන්තියෙන් නියම කර ඇත. 125 වගන්තියේ අරමුණු කර ඇත්තේ, නඩු කාර්යය පටිපාටියක් තුළදී පැන නගින 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණයට සම්බන්ධ ඕනෑම ගැටළුවක්' යන්නයි. දෙපාර්ශවයක් අතර, එකිනෙකට විරුද්ධවාදී නඩු ක්‍රියාපටිපාටියක් තුළදී එම පාර්ශවයන් අතර පවතින සැබෑ ගැටළුවක් හෝ මතභේදයක් පිළිබඳ විනිශ්චය කිරීමකදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අර්ථනිරූපණය කිරීම සඳහා යම් අවශ්‍යතාවයක් පැන නැගිය යුතු බව, මෙමගින් අභාවයි, යම් පාර්ශවයක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයක් මත හුදෙක් විශ්වාසය තැබීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කළ යුතුද යන ගැටළුව අනිවාර්යයෙන්ම සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය නොවේ. මතවාද පවතින පාර්ශවකරුවන් අතර අර්ථනිරූපණය පිළිබඳව ආරවුලක් පැවතිය යුතුය. පෙනෙන ආකාරයට 125 වන වගන්තිය ඉතා සීමාකාරී වන අතර එය නියම ආරවුල තුළට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීමක් ඇදා ගෙන ඇති නඩු සම්බන්ධයෙන් පමණක් ක්‍රියා කරන දෙයක් ලෙසට වටහා ගත යුතුමය. එමෙන්ම එවැනි ගැටළුවක් පාර්ශවයන් දෙකක් අතර පවතින සෘජු ගැටළුවක් ලෙස ඉදිරිපත් විය යුතුය. එසේත් නැතහොත්

යම් ගැටළුවක් මත බලපෑමක් ඇති කළ යුතු අතර එක් පාර්ශවයකගේ නඩුවේ කොටසක් ලෙස සමන්විත විය යුතුය: එමෙන්ම එයට අනෙක් පාර්ශවය විසින් විරුද්ධත්වයක් දැක්විය යුතුය: එවිට එම ගැටළුව විසඳාලීමේදී අධිකරණය විසින් අවශ්‍යයෙන්ම එය විනිශ්චය කළ යුතුය.[29]

ඒ හා සමානව, මහින්දසෝම එරෙහිව මෛත්‍රීපාල සේනානායක සහ අනෙකුත් අය (1996) යන නඩුවේදී, මෙම ඉල්ලීමේ හරය පිළිබඳ පාර්ශවයන් විසින් ඉදිරිපත් කළ තර්කවාද වචනයෙන් විස්තර කිරීමෙන් පසුව අතුරු සහන ප්‍රදානය කරමින්, ගුණවර්ධන විනිසුරුතුමා ප්‍රකාශ කළේ: ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ආ) (8)(ඇ) වගන්තිය යටතේ කටයුතු කිරීමේදී ආණ්ඩුකාරවරයාට අභිමතානුසාරී බලයක් හිමිවේද යන වැදගත් නෛතික ගැටළුව පැන නැඟී ඇති අතර, එය විනිශ්චය කළ හැකි වන්නේ සම්පූර්ණ තර්කවාදයන්ට සවන් දීමෙන් පසු සහ, වගඋත්තරකරුවන්ට ඔවුන්ගේ විරෝධතා ගොනු කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව පමණි.''[30]

එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය පිළිබඳ ප්‍රශ්න ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සලකා බැලිය යුත්තේ, අභියාචනාධිකරණය විසින් එවැනි ප්‍රශ්න ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කළ අවස්ථාවකදී පමණක්ය යන යෝජිතයට, ප්‍රබල අභියාචන අධිබලයන් (appellate authority) තිබේ. කිසිදු සැකයකින් තොරවම 125(1) වගන්තිය මගින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීම සම්බන්ධව අනන්‍ය අධිකරණ බලය (exclusive jurisdiction), ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලබාදී ඇත. එමගින්, ඕනෑම නඩු කාර්ය පටිපාටියක් තුළදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීම සම්බන්ධව පැන නගින ගැටළු අභියාචනාධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමේ අවශ්‍යතාවය දක්වා ඇති කාර්ය පටිපාටිය ද විස්තර කරයි. එවැනි යොමු කිරීමක් සිදු කළ හැක්කේ ඉල්ලා සිටින අයිතියේ හරය පිළිබඳව පාර්ශවයන් විසින් සම්පූර්ණ කරුණු ඉදිරිපත් කිරීමක් කළ පසුව පමණකි: එයට හේතුව නම් එවිට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලධර්ම සහ/හෝ ප්‍රතිපාදන හුදෙක්

---

29 *බිල්ලිමොරියා එරෙහිව ඉඩම් අමාත්‍යවරයා* (1978-79-80)1 SLR 10 (SC) 16-17 පිටු, අවධාරණයක් එක්කර ඇත. (*Billimoria* v. *Minister of Lands*)

30 *මහින්දසෝම එරෙහිව මෛත්‍රීපාල සේනානායක සහ අනෙකුත් අය* (1996) 1 SLR 366(CA) 366 හිදී. (*Mahindasoma* v. *Maithripala Senanayake and Others*)

අදාළ කරවීමක් නොව, ඇත්තවශයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය පිළිබඳ ගැටළුවක් ඇතිවී ඇති බව විනිශ්චය කර ගැනීමට අභියාචනාධිකරණයට අවස්ථාවක් එළඹෙන බැවිනි. ඒ අනුව, ගැටළුවක් ශ්‍රේෂ්ඨාධිකරණයට අත්පත් වන්නේ, අභියාචනාධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණයට අදාළ ගැටළු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමෙන් පසු පමණකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125(1) වගන්තියේ අර්ථය 1978 ශ්‍රේෂ්ඨාධිකරණ රීති හි 64(1) මගින් බලවත් කරයි. එමගින් දැක්වෙන්නේ:

> විනිශ්චයක කටයුතු හෝ අර්ධ විනිශ්චයක කටයුතු (judicial or quasi-judicial functions) ක්‍රියාත්මක කිරීමට හෝ යුක්තිය ඉෂ්ට කිරීමට නීතිය මගින් බලය පවරා දී ඇති වෙනත් අධිකරණයක් හෝ මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125(1) වගන්තිය යටතේ විනිශ්චය කිරීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඕනෑම ගැටළුවක් යොමු කරන විට, එම අධිකරණය, මණ්ඩලය හෝ වෙනත් ආයතනයක් විසින් -
>
> (අ) විනිශ්චය කළ යුතු ගැටළුව සංක්ෂිප්තව හා පැහැදිලිව දක්වමින් ලිඛිත යොමු කිරීමක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුයි.

යන කරුණයි.

තවදුරටත්, 64(1) නීතිය මගින් නියම කර ඇත්තේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීම පිළිබඳ විශේෂිත ගැටළු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු බවයි. ඒ අනුව, ඉහත නඩුවේදී, 125(1) වගන්තියේ ප්‍රතිපාදන ක්‍රියාත්මක වී නැතැයි තර්ක කළ හැක. එනම්, අභියාචනාධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථනිරූපණයට අදාළ විශේෂිත ගැටළු සපයා නොමැති බැවින්, එම ගැටළුව මත ශ්‍රේෂ්ඨාධිකරණය සතු අනන්‍ය අධිකරණ බලතල යෙදවිය හැක.

කෙසේ වුවත්, අවසර ලබා දීම සඳහා වගඋත්තරකරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට පහත කරුණු ඡත්තු ගන්වන ලදී. එනම්, 64(5) වගන්තිය සම්බන්ධව පෙත්සම්කරුවන්ගේ තර්කයන් තුළින්, 99අ වගන්තිය අර්ථනිරූපණය කිරීමේ අවශ්‍යතාවයක් අනිවාර්යයෙන්ම ඇති කර ඇති බවයි. එමෙන්ම, එලෙස 99අ වගන්තිය අර්ථනිරූපණය කිරීමේ පරම

සහ අනන්‍ය අධිකරණ බලය, ශ්‍රේෂ්ඨාධිකරණය සතුව පවතින බවත්ය. අධිකරණය විසින් සලකා බැලීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීමේ ගැටළු ක්‍රමවත්ව සකස් කර දීමට අධිකරණය විසින් අදාළ ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් යොමු කරවන ලදී.

11. 2004 වර්ෂයේ අංක. 14 දරණ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත

තම ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීමේ කොන්දේසියක් ලෙස, ඡන්දදායකයින්ට වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් ඉදිරිපත් කිරීමට නියම කිරීම පිණිස මැතිවරණ නීති සංශෝධනය කිරීම සඳහා රජය විසින් 2004 වර්ෂයේ ඔක්තෝබර් මස, පාර්ලිමේන්තුව වෙත පනත් කෙටුම් පතක් ඉදිරිපත් කරන ලදී. මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම් පතේ මූලික අරමුණ වූයේ, ඔහුට හෝ ඇයට (*2* වන සහ *3* වන වගන්ති බලන්න) ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර, තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා වලංගු හඳුනා ගැනීමේ ලේඛනයක් ඡන්දදායකයා විසින් ඉදිරිපත් කළ යුතුයි යන අවශ්‍යතාවය සපුරා ලීමයි. ඒ අනුව, පනත් කෙටුම්පත මගින් තවදුරටත්, පාර්ලිමේන්තු මැතිවරණ (II වන කොටස), ජනාධිපතිවරණ (III වන කොටස), පළාත් සභා (IV වන කොටස) සහ ප්‍රාදේශීය සභා (V වන කොටස) මැතිවරණ මෙන්ම ජනමත විචාරණයකදී (VI වන කොටස) ඡන්දය භාවිතා කිරීමේ ක්‍රම යනාදියට අදාළ නීති වලට වැදගත් සංශෝධනයන් සපයන ලදී.

කැබිනට් මණ්ඩලය විසින් මෙම පනත් කෙටුම්පත, ජාතික යහපත සම්බන්ධයෙන් ඉතා හදිසි කරුණක් බවට සහතික කළ අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන වගන්තිය යටතේ එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල දැයි විනිශ්චය කිරීම සඳහා ජනාධිපතිතුමිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරන ලදී. පනත් කෙටුම්පතට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇති අනුකූලතාවය සලකා බැලීම සඳහා පැන නගින ලද කරුණු පහත ඒවා පමණක් බව ශ්‍රේෂ්ඨාධිකරණයේ අදහස විය. එනම්, (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඉ) වගන්තිය මගින් ලබාදී ඇති ඡන්ද බලයට එමගින් ප්‍රතිවිරුද්ධ බලපෑමක් ඇති කරයිද? යන්න, සහ (ආ) එය සෑම පුද්ගලයෙකුටම නීතියේ සමාන ආරක්ෂාවක් සහතික කර ඇති 12(1) වගන්තියට පටහැනිද? යන්නයි.

පළමුවෙනි ප්‍රශ්නයට අදාළ විනිශ්චය ලබා දෙමින්, අගවිනිසුරු සිල්වා, යාපා සහ උදලාගම යන විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල විසින් ප්‍රකාශ කළේ, "...සුදුසුකම් ලත්

ඡන්ද හිමියකු වූ සෑම පුරවැසියෙකුටම, මැතිවරණ වලදී සහ ජනමත විචාරණයකදී තම ඡන්ද බලය ක්‍රියාත්මක කිරීමට ඇති අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් සහතික කර ඇත. ඡන්ද හිමි නාම ලේඛනයට අදාළ පුද්ගලයාගේ නම ඇතුළත් කර තිබීම, ඡන්ද බලය ක්‍රියාත්මක කිරීමට පෙරාතුව සම්පූර්ණ කළ යුතු අවශ්‍යතාවයකි. *අපගේ අදහස අනුව, යෝජිත සංශෝධනයන් පුද්ගලාරූඪණයට (impersonation) එරෙහි වූ ආරක්ෂක උපක්‍රමයක් වන අතර, එමගින් ඡන්දය භාවිතා කිරීමේ කාර්යය සඳහා, ඡන්ද හිමි නාම ලේඛනයේ නම ඇතුළත් කර තිබෙන පුද්ගලයා වෙත පමණක් ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීම සහතික කිරීම මගින් ඡන්ද බලය ක්‍රියාත්මක කරන ආකාරය වැඩි දියුණු වේ."*[31] ඊට සහය පිණිස උදාහරණයක් වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 93 වන වගන්තිය අධිකරණය මගින් ගෙන හැර දැක්වූ අතර එම වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන් ඉහත යෝජිත සංශෝධනයන් මගින් තවත් වැඩි දියුණු කරන බව ප්‍රකාශ කරන ලදී. 93 වන වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන් නම්, ඡන්දය භාවිතා කිරීම, නිදහස්ව, සමානව සහ රහසින් ඡන්දය දීම මගින් සිදු කළ යුතු යැයි නියම කිරීමයි.

මෙම පනත් කෙටුම්පත් 12(1) වගන්තිය හා අනුරූපී යැයි අවසානාත්මක ලෙස දක්වමින්, අධිකරණය ප්‍රකාශ කර සිටියේ:

> මෙම සංශෝධනයෙන් අවශ්‍යයෙන්ම හඟවන්නේ, වලංගු හඳුනා ගැනීමේ ලේඛනයක් මගින් අනන්‍යතාවය නිර්ණය කළ නොහැකි පුද්ගලයෙකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් නොකළ යුතු බවයි. *මෙලෙස නීතිය මගින් වලංගු හඳුනාගැනීමේ ලේඛනයක් මගින් අනන්‍යතාවය නිර්ණය කළ හැකි පුද්ගලයින් සහ එලෙස අනන්‍යතාවය නිර්ණය කළ නොහැකි පුද්ගලයින් අතර වෙන් කිරීමක් සිදු කරයි. ... අපගේ අදහස නම් මෙලෙස වෙන්කිරීමක් සිදු කිරීම සාධාරණ බවයි. එයට හේතුව නම් එහි අරමුණ වී ඇත්තේ පුද්ගලාරූඪණය (impersonation) වැළැක්වීම සහ එය පදනම් වී ඇත්තේ වටහාගත හැකි නිර්ණායකයක් මත වීම නිසයි.*[32]

---

31 SC (SD) අංක. 24/2004, හැන්සාඩ්, 2004 වර්ෂයේ අගෝස්තු 17:clns 1191-1192, අවධාරණයක් එක් කර ඇත.

32 එම, cln. 1192, අවධාරණයක් එක්කර ඇත.

පනත් කෙටුම්පත පුරාම "වලංගු හඳුනාගැනීමේ ලේඛනයක් - valid identity document" යනුවෙන් සඳහන් කර තිබුණත් කිසිඳු විටෙක, ජාතික හැඳුනුම්පත (NIC), ගමන් බලපත්‍රය, යනාදී වශයෙන් විශේෂ හඳුනාගැනීමේ පත්‍රයක් සඳහන් කර නොතිබුණි. කෙටුම්පතේ 3 වන වගන්තියෙන් 'වලංගු හඳුනා ගැනීමේ ලේඛනයක්' යන්න විස්තර කර තිබුණේ, "ඕනෑම අවශ්‍යතාවයක් සඳහා එම ලේඛනය හිමි පුද්ගලයාගේ අනන්‍යතාවය නිර්ණය කර ගනු පිණිස, ඕනෑම නීතියකට අනුව ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ඕනෑම ලේඛනයක්" යන අර්ථය ගෙනදීමටයි. කෙටියෙන් කිවහොත්, මෙම වගන්තියේ පුළුල් ස්වභාවය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය ස්වකීය තීන්දුවේදී ප්‍රකාශිතව සඳහන් කළ අතර එය තමාගේම සැක නැති කර ගත්තේ "...මෙම නිර්වචනයේ අදහස තුළට, ගමන් බලපත්‍ර, රියදුරු බලපත්‍ර හෝ තැපැල් හඳුනාගැනීමේ පත්‍ර යනාදී ලේඛන ද ඇතුළත් වෙන බව ප්‍රකාශ කරමිනි.[33]

එනයින්ම පැහැදිලි වන්නේ, මෙම පනත් කෙටුම්පතේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එහි ඇති අනුකූලතාවය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් තීන්දුවේ හෝ විරුද්ධත්වය පෑමට තරම් කිසිවක් නොමැති බවයි. මෙමගින් විසඳීමට බලාපොරොත්තු වූ අපකාරය (mischief) නම් මැතිවරණ වලදී සිදුකරන පුද්ගලාරූඪණය (impersonation) වන අතර මෙය ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පවත්නා මැතිවරණ දූෂණ ක්‍රියාවක් වේ: එමෙන්ම එය වැළැක්වීමේ උපක්‍රමයක් ලෙස ඡන්ද හිමි නාම ලේඛනයේ ඇති නමකට අනුරූපීව වලංගු හඳුනාගැනීමේ ලේඛනයක් ඉදිරිපත් කිරීමට නියම කිරීම යන කරුණ, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය කිරීමේ කේන්ද්‍රය (CMEV) - (Centre for monitoring Election Violence) වැනි මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් පමණක් නොව, නැවත නැවතත් මැතිවරණ කොමසාරිස්වරයා විසින්ම පවා සහය දැක්වූ කරුණකි. ඉහත සඳහන් කරුණම ප්‍රකාශ කළ මැතිවරණ ප්‍රතිශෝධන පිළිබඳ තේරීම් කමිටුවල තම අන්තර් වාර්තාවේදී, ඡන්ද බලය ක්‍රියාත්මක කිරීමේදී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම හඳුන්වා දිය යුතු යැයි යෝජනා කළ අතර, තව දුරටත් ඉදිරියට යමින් යෝජනා කර සිටියේ එය නීත්‍යානුකූල කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවයි.[34]

---

33 හැන්සාඩ්, op. cit., cln. 1191.

34 පාර්ලිමේන්තු සැසිවාර, *අංක. 24 හි 45 පිටුව:* සහ උපග්‍රන්ථ II. (Parliamentary Series, No. 24 act 45 et seq; and Appendix II)

මෙහි සඵලත්වය මූලධර්මයක් ලෙස නොසලකා සිටියත්, මෙම යෝජිත නීතිය ඉතා ඉක්මණින් බලාත්මක *(immediate force)* කළහොත් ඇතිවිය හැකි ප්‍රායෝගික අපහසුතාවයන් සියුම්ව නිරීක්ෂණය කළ විට වැටහෙන්නේ මෙමහින් ශ්‍රී ලංකාවේ ඡන්දදායකයන්ගෙන් බහුතරයකට බැරෑරුම් විපාක ඇති කරවිය හැකි බවයි.

1968 අංක. 22 දරණ පුද්ගලයින් ලියාපදිංචි කරවීමේ පනත පුරා දශක 3 ක කාලයක් තිස්සේ බලාත්මකව පැවති බව යන කරුණ එසේ තිබියදීත් ඇතිවී තිබෙන තත්ත්වය නම් 3,873,276 ක් වූ බහුතර පුරවැසියන් (එනම්, ලියාපදිංචි ඡන්දදායකයින් 12,920,719 ක ගෙන් 4 මිලියනයක් පමණ), හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි මුළු ඡන්දදායකයින්ගේ 30% සතුව ජාතික හැඳුනුම්පත් නොමැති වීමයි. 2004 අප්‍රේල් මස පැවති මහා මැතිවරණයේ සංඛ්‍යාලේඛන වලට අනුකූලව අනුමාන කළ හැක්කේ, ජාතික හැඳුනුම්පත් රහිත විශාලතම ඡන්ද හිමියන් රාශිය සිටින්නේ උතුරු පළාතේ බවත් ඊට සාපේක්ෂව අඩු ප්‍රමාණයකට නැගෙනහිර පළාතේ ද ඌව සහ මධ්‍යම පළාත්වල වතුකර ජනතාව අතර ද සිටියි. උදාහරණයක් ලෙස, යාපනය දිස්ත්‍රික්කයේ 644,279 වූ ලියාපදිංචි ඡන්ද හිමියන්ගෙන්, එක් අයෙකු හෝ 0% ප්‍රතිශතයක් සතුව ජාතික හැඳුනුම්පත් නොමැත: ඇත්තවශයෙන්ම මුලතිව් සහ කිලිනොච්චිය සඳහා සංඛ්‍යාලේඛන නොමැත.

මෙම ප්‍රශ්නය මේ ප්‍රදේශවල වඩාත් උග්‍ර වුවත් එය එම ප්‍රදේශ වලට පමණක් සීමා නොවේ. උදාහරණයක් වශයෙන්, මධ්‍යම පරිපාලනය වෙත භෞතික වශයෙන් වඩාත්ම ආසන්න වූ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පවා පුද්ගලයින් 239,225 ක් ද පිළිවෙළින් ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල පුද්ගලයින් 314,461 සහ 143,067 සංඛ්‍යාවක් ජාතික හැඳුනුම්පත් වලින් තොර වූවන් වෙයි.

පනත් කෙටුම්පතින් බලාපොරොත්තු වූයේ රජය විසින් නිකුත් කරන ලද ඕනෑම ආකාරයක හඳුනා ගැනීමේ පත්‍රයක් වුවත්, ඉහත සංඛ්‍යා වලින් පෙන්නුම් කරන්නේ ජාතික හැඳුනුම්පත පිළිබඳ පමණක්ය යන තර්කය, අර්බුදකාරී එකක් වූ බවය. එයට හේතුව නම් පිටිසර සහ යුද්ධයෙන් විනාශ වූ උතුරු නැගෙනහිර ප්‍රදේශවල, වඩාත් මූලික ආකාරයේ තිල, හඳුනා ගැනීමේ පත්‍රය වූ ජාතික හැඳුනුම්පත නොමැති වීමෙන් ඇඟවෙන්නේ, ගමන් බලපත්‍ර සහ රියදුරු බලපත්‍ර වැනි අනෙකුත් ලේඛන පවා බොහෝ දුරට නොමැති බවයි. එබැවින්, සැබෑ ආකාරයට ගත් කල මෙම ගැටළුවේ ප්‍රධාන කාරණය වන්නේ, මෙම පනත් කෙටුම්පත

එහි මුල් ආකාරයෙන්ම ඉක්මණින් බලාත්මක කළහොත් එහි බලපෑම ලෙස ශ්‍රී ලංකාවේ ඡන්දහිමියන්ගෙන් 30% කගේ ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය අහෝසි වී යාමයි.

මැතිවරණ ප්‍රතිශෝධන පිළිබඳ තේරීම් කමිටුව (සහ මෙම කමිටුව විසින් මැතිවරණ කොමසාරිස්වරයාගේ යෝජනාවන් ද පිළිගන්නා ලදී.) වඩාත් සැලකිලිමත් වූයේ, ඡන්දය භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් ලෙස ජාතික හැඳුනුම්පත හඳුන්වා දුනහොත්, එවිට ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීම සඳහා සුදුසුකම්ලාභී සෑම පුරවැසියකුටම, නව පාලනය විසින් ප්‍රධානත්වය දිය යුතු කොන්දේසියක් ලෙස, ජාතික හැඳුනුම්පතක් ලබා දීමේ වගකීම සහතික කිරීම පිළිබඳවයි. එපමණක් නොව, කමිටුව විසින් "...යෝජනා කරන ලද්දේ ජාතික හැඳුනුම්පතක් නොමැති පුද්ගලයින්ට හය මසක කාල සීමාව ඇතුළත එය නිකුත් කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් ක්‍රියාකාරී වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිසි පියවර ගත යුතු බවයි."[35] මැතිවරණ කොමසාරිස්වරයාගේ යෝජනාවන් පිළිගනිමින්, කමිටුව විසින් තවදුරටත් යෝජනා කර සිටියේ, නව පාලනය වැඩකටයුතු ආරම්භ කිරීමට පෙර, එක් එක් පියවර ලෙස බෙදූ මිනුම්ක්‍රම යෙදූ කාර්ය පටිපාටියක් මඟින් සෑම ඡන්ද හිමියකුටම ජාතික හැඳුනුම්පතක් ලබාදීම සහතික කළ යුතු බවයි. එය මොන ආකාරයට මැන්නත් යෝධ පරිපාලනමය වගකීමකි. ඇත්තවශයෙන්ම මෙම කරුණ සම්බන්ධව කමිටුව විසින් සිදු කළ සෑම යෝජනාවක්ම ප්‍රකාශ කර ඇත්තේ, සෑම ඡන්ද හිමියකුම සතුව ජාතික හැඳුනුම්පත ඇතැයි යන කොන්දේසිය මතයි.

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ පනත් කෙටුම්පත, මෙම කාරණය මත ආරක්ෂා කළ නොහැකි එකක් විය. මෙම කරුණ ඉෂ්ට කිරීම සහතික කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වෙත නීත්‍යානුකූල බලයක්වත්, වේගවත් ක්‍රියාකාරී වැඩපිළිවෙළක් සඳහා මෙම දෙපාර්තමේන්තුවට අවශ්‍ය විශාල මුදල් ප්‍රතිපාදන ලබාදීමවත් මෙමඟින් සිදු නොවීය. නිල නොලත් තක්සේරුවකට අනුව වර්තමානයේ ජාතික හැඳුනුම්පත් නොමැති සෑම අයෙකුටම ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම සාර්ථක වීමට නම්, මෙම දෙපාර්තමේන්තුවට මිලියන 190 කට වැඩි මූල්‍ය පහසුකමක් අවශ්‍ය වේ.

[35] අන්තර් වාර්තාව, op cit., 45-46, අවධාරණයන් එක්කර ඇත.

මෙම වාතාවරණය යටතේ, විපක්ෂය (විශේෂයෙන්ම, එක්සත් ජාතික පක්ෂය සහ චතුකර ද්‍රවිඩ පක්ෂ) විසින් මෙම කෙටුම්පතට කම්වුවක් ලෙස සංශෝධනයන් කිරීම හඳුන්වා දීමට උත්සුක විය. මෙමගින් වෙනත් දේ අතර, ශ්‍රී ලංකාවේ ඡන්දය පාවිච්චි කිරීමට අයිතිය ඇති සුදුසුකම්ලාභී සෑම ඡන්ද හිමියකුම සතුව වලංගු හඳුනා ගැනීමේ පතක් ඇතැයි යන කරුණ පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා මෙන්ම පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂ නියෝජිතයින් ද තෘප්තිමත් වනතුරු මෙම යෝජිත නීතිය අදාළ වීම සහ බලාත්මක වීම කල් දැමීමට උත්සාහ දරන ලදී. මෙම උත්සාහයට පිළිතුරක් වශයෙන්, රජය තමන්ට වාසි වන ලෙසම, මෙම සංශෝධනයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තුවේ නියෝජිත පක්ෂවල රැස්වීමක් කැඳවන ලද අතර, එමගින් විපක්ෂය සැලකිලිමත් වූ කරුණු වලට ඉඩකඩ සලසන ලදී.

පසුව ඇතිවූ ගිවිසීම, 2004 අංක. 14 දරණ මැතිවරණ (විශේෂ විධි විධාන) පනතේ පොදු ප්‍රතිපාදන අඩංගු වූ නව 1 වන කොටසින් (Part 1) පෙන්නුම් කරන ලදී. සහතිකලත් දින (date of certification) සිට (එනම් 2005 නොවැම්බර් 18 සිට) එක් වසරක් ඉකුත්වන තුරු එය ක්‍රියාත්මක නොවන බවට ලබාදී ඇති විශේෂ වගකීම් සහතිකය පනතේ 1 වන වගන්තියේ අන්තර්ගත වේ. 2(1) වන වගන්තිය අනුව, මැතිවරණ කොමසාරිස් කාර්යාලය විසින් ඒ ලබාදී ඇති කාලය තුළදී හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අවශ්‍ය පරිපාලනමය වැඩපිළිවෙළවල් තෘප්තිමත් විය හැකි ආකාරයට යොදා ඇති බවට සහතික විය යුතුය.[36] එසේ සිදු කරන ලද්දේ, ඡන්දය පාවිච්චි කිරීමට අයිතිය ඇති පුද්ගලයින්, හඳුනාගැනීමේ පත්‍රයක් ලබාගැනීමෙන් වළක්වා ඔවුන්ගේ ඡන්ද බලය පාවිච්චි කිරීම වැළැක්වීමක් නොකිරීම සහතික කිරීම පිණිසයි. එමෙන්ම, මෙම වැඩපිළිවෙළවල් පිළිබඳව තමන් තෘප්තිමත් වූ බවට සහතිකයක් ගැසට් පත්‍රයේ පළ කිරීම, කොමසාරිස් කාර්යාලය විසින් කළ යුතු විය. 2(1) වගන්තියට ඇති අතුරු විධානයට අනුව තම සහතිකය පළ කිරීමට ප්‍රථම කොමසාරිස් කාර්යාලය විසින් පාර්ලිමේන්තුවේ නියෝජනයක් ඇති දේශපාලන පක්ෂ වල අදහස් පිළිබඳව නිසි සලකා බැලීමක් කළ යුතුය. තවදුරටත්, 2(2) වන වගන්තිය අනුව අවශ්‍ය නිසි වැඩපිළිවෙළවල් සකස් කර ඇති බවට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් සහතිකයක් මගින් තහවුරු කිරීම අත්‍යවශ්‍ය බවට, මැතිවරණ කොමිසම විසින් නියම කළ යුතුය.

[36] 1968 අංක. 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත, 14 වන වගන්තිය.

4 වන වගන්තිය අර්ථනිරූපණ වගන්තිය වන අතර එමගින් 'වලංගු හඳුනා ගැනීමේ ලේඛනයක් (valid identity document)' යන යෙදුම විස්තර කිරීමට උත්සුක වී ඇත. මෙයින් අදහස් වන්නේ, ඕනෑම අවශ්‍යතාවයක් සඳහා, එම ලේඛනය හිමි පුද්ගලයාගේ අනන්‍යතාවය තීර්ණය කරගනු පිණිස, ඕනෑම නීතියකට අනුව ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ඕනෑම ලේඛනයක් වන අතර, "... වෙනත් කිසිම හඳුනාගැනීමේ ලේඛනයක් තමන් සතුව නැති පුද්ගලයෙකු නම් ඔහුගේ ඡායාරූපය එයට ඇතුළත් කළ හැකි අතර, එය එම පුද්ගලයාගේ ඡායාරූපයම බවට ග්‍රාම නිලධාරීවරයකු විසින් හෝ අවශ්‍ය නම් වතු පරීක්ෂකවරයකු විසින් නිසි පරිදි සහතික කළ යුතු අතර, එය, එම පුද්ගලයා පදිංචි වී සිටින ... කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් හෝ මැතිවරණ කොමසාරිස් කාර්යාලය විසින් ... බලය ලබාදෙන ලද නිළධාරීවරයෙකු විසින් ... වලංගු බවට සහතික කළ යුතුය."

මෙම ප්‍රතිපාදනය පැහැදිලිවම උඩරට වතුකරයේ ඡන්ද හිමියන් විසින් ප්‍රයෝජනයට ගනු ඇත. එයට හේතුව නම්, විශේෂයෙන්ම අවශ්‍ය මූලික ලේඛන නොමැතිකම නිසා ඔවුන්ගෙන් අති විශාල බහුතරයක් තවමත් නිසි ලෙස ලියාපදිංචි වී නොමැති නිසයි. මෙම ජනතාව මුහුණ පාන අකරතැබ්බය පිළිබඳ ඉතා දැඩි සංවේදීතාවයක් දැක්විය යුත්තේ, අතීතයේදී ඔවුන්ගේ ඡන්ද අයිතිය සහ පුරවැසිබව අහෝසි කරමින් ඔවුන්ව දාමරික අපහාසයන්ට භාජනය කර තිබෙන බැවිනි. ඒ කෙසේ වුවත් ඉදිරිපත් කළ මූලික ප්‍රතිපත්තිමය යෝජනාවක් වූයේත්, මෙම පනතේ අරමුණ වූයේත් සෑම කෙනෙකුටම නියමිත හඳුනා ගැනීමේ ලේඛනයක් ලබාදීම සහතික කිරීම මිස වතු පරීක්ෂකවරයෙකු වැනි පුද්ගලිකව ක්‍රියාත්මක වන අයෙකු විසින් සෑම කෙනෙකුගේම ඡායාරූප සහතික කිරීම වැනි තත්කාර්ය වැඩ පිළිවෙළවල් මගින් එය දිග්ගැස්සවීම නොවේ යන්නයි.

මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් රජය අදාළ කරගත් ක්‍රියාපටිපාටිය පිළිබඳව තවත් එක් ගැටළුවක් මතු කිරීමේ අවශ්‍යතාවය පැන නැඟ ඇත. ශ්‍රී ලංකාවේ න්‍යාය පත්‍රය තුළ මැතිවරණ ප්‍රතිශෝධන යන්න දශකයක කාලයක් පුරා පැවතිණි. මෙම විවාදය තුළදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවයක් බවට ජාතික හැඳුනුම්පත හඳුන්වා දීමේ ප්‍රතිපත්තිය, ඉතාමත් අවම මතවාදයට ලක්වූ ගැටළුවකි: මෙය මැතිවරණ දූරාචාරය යන සංකල්පයට විසඳුමක් ලබාදීම සඳහා වූ හොඳ සහ යෝග්‍යතම පියවරක් ලෙස දේශපාලන පක්ෂ සහ සිවිල් සමාජයීය සංවිධාන යන දෙපිරිසම එකඟ වූහ. එසේ නම්, එය රහස්‍යභාවයකින්

වැසූ කඩිමුඩි ස්වභාවයක් ඇති කරමින්, ඉතා හදිසි පනත් කෙටුම්පතක් ලෙසට රජය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කළේ මන්ද?[37]

සාමාන්‍යයෙන් සිදු කරන ආකාරයටම මෙම පනත් කෙටුම්පත, පැනවීමට පෙර විවරණය කිරීමකට භාජනය වූයේ නම් එවිට, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත සම්පූර්ණ තර්ක කිරීමකින් ලැබෙන ප්‍රතිලාභය හිමිවනවා පමණක් නොව, එවිට, මෙය පැනවීමෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක වශයෙන් ඉහත සාකච්ඡා වූ සමහර ගැටළු පවා තම විචාරණයට ලක් කිරීමට හැකියාවක් ලැබෙනු ඇත. එවිට මෙම ප්‍රශ්න නැගීමට තරම් සෑහීමකට පත්විය හැක. මන්ද? මෙම සාකච්ඡාවේ විෂය පථයෙන් එපිට ඇති, වඩාත්ම මතභේදයට ලක්වූ කරුණ වන්නේ 122 වන වගන්තිය භාවිතා වන ආකාරයයි.

12. උතුරු සහ නැගෙනහිර පළාත්වල මහ මැතිවරණය

2004 අප්‍රේල් මස පැවති මහ මැතිවරණය සමස්ථයක් ලෙස මෑත ඉතිහාසයේ පැවති වඩාත් නිදහස් සහ ස්වාධීන මැතිවරණයක් ලෙසට ප්‍රකාශිතය. මෙහිදී එකම කැළලක් ලෙස පෙනී යන්නේ මැතිවරණ ප්‍රචාරණ කාලය තුළ උතුරු නැගෙනහිර පළාත්වල පැවති තර්ජනය කිරීම්, බියවැද්දීම් හා මිනී මැරීම් කිහිපයක් ඇතුළු ශාරීරික හිංසා කිරීම්ය.

මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) වැනි ස්වාධීන නිරීක්ෂකයන් ප්‍රකාශ කළේ:

> සියලුම දේශපාලන පක්ෂවල අපේක්ෂකයන් හට තම මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදු කිරීමේදී උතුරු නැගෙනහිර පළාත්වල පැවති මෙම ප්‍රබල අනාරක්ෂිත තත්ත්වය විශාල බලපෑමක් සිදු කරන ලදී. ඍජු තර්ජනය කිරීම් මෙන්ම බිය සහ පෙළඹවීම් සහිත වූ වාතාවරණය ඡන්ද අපේක්ෂකයන් කිහිප දෙනෙකුම ඉල්ලා අස්වීමට යොමු කරවීය. මීට අමතරව මැතිවරණ දිනය සඳහා ඡන්ද පොළ නියෝජිතයන් බඳවා ගැනීම දෙමළ ජාතික සන්ධානයට අයත් නොවූ

---

[37] 122(1)(ඇ) වගන්තිය මගින් තම විනිශ්චයන් ජනාධිපතිවරයාට සහ කතානායකවරයාට පමණක් සන්නිවේදනය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය යොමු කිරීමට ලක්වී ඇති බව සැලකිය යුතුය.

> අපේක්ෂකයන් බහුතරයක්හට ප්‍රශ්නයක් විය. මෙම සන්දර්භය යටතේ සියලුම ඡන්ද අපේක්ෂකයන්ට උතුරු නැගෙනහිර පළාත්වල තම ප්‍රචාරක කටයුතු කිරීමට හැකිවීම 'නිදහස් හා ස්වාධීන මැතිවරණයක් සඳහා අත්‍යාවශ්‍ය' බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය යළි ප්‍රතිඥා දෙමින් ප්‍රකාශ කළ අතර "ශ්‍රී ලංකාවේ සියලුම ඡන්දදායකයන්ට තම ඡන්ද බලය භාවිතා කිරීමට සහ දේශපාලන පක්ෂ හා ඡන්ද අපේක්ෂකයන් අතුරින් නිදහස් හා ස්වාධීන තෝරා ගැනීමක් කිරීමට ද හැකි විය යුතු බවට[38] වූ තම දැඩි මතය ද නැවත ප්‍රකාශ කළේය."

බිය වැද්දීම් හා පහරදීම් බොහෝමයක් එල්.ටී.ටී.ඊ. යේ සහාය ඇති ද්‍රවිඩ ජාතික සන්ධානයට විරුද්ධ පක්ෂ සහ ඡන්ද අපේක්ෂකයන්ට එරෙහිව සිදු වූ බව සටහන් කිරීම වටී. එල්.ටී.ටී.ඊ. ය උතුරු නැගෙනහිර පැහැදිලි දේශපාලන බලයක් භුක්ති විඳින අතර එය කිලිනොච්චි හා මුලතිවු දිස්ත්‍රික්ක වලින් පිටත ද ඇත. උතුරු නැගෙනහිර පාලනයේදී ස්ථාපිත නීතියෙහි දැක්වෙන ලෙස කටයුතු කිරීමට එල්.ටී.ටී.ඊ. ය දක්වන කැමැත්ත සහ එම ප්‍රදේශයන්හි ඔවුනට ඇත්තවශයෙන්ම ඇති සර්වබලධාරී රාජ්‍ය නොවන දේශපාලනයක භූමිකාවට ඉතා සමීප තත්ත්වය බරපතල සැක සංකා ඇති කරවයි. ඒ මැතිවරණයේ නීත්‍යානුකූලභාවයත් නිදහස් සහ ස්වාධීන මැතිවරණ ප්‍රචාරක කටයුතු සම්බන්ධ තත්ත්වයන් ඔවුනගේ බලපෑමට යටත් ප්‍රදේශ වලදී පමණක් ප්‍රශ්නගත වන හෙයිනි.

13. ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය

2004 මහ මැතිවරණයෙහිදී පොදුජන එක්සත් පෙරමුණෙහි මූලික ඕනෑකම වූයේ 1978 ව්‍යවස්ථාව වෙනස් කිරීම සඳහා ජනතාවගෙන් වරමක් ලබා ගැනීම හා එමඟින් ව්‍යවස්ථාවට බාහිර වූ යෝජනා ක්‍රමයකින් ප්‍රධාන වෙනස්කම් දෙකක් ඇති කිරීමයි. පො.එ.පෙ. මඟින් යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා වූ ද්විත්ව ප්‍රතිසංස්කරණ නම් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ පවත්නා මැතිවරණ

[38] *මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ කමිටුවෙහි (CMEV) මැතිවරණයට සම්බන්ධිත ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ අවසන් වාර්තාව, 2004 අප්‍රේල් මස මහ මැතිවරණය, 5 වෙනි පිටුව.*

ක්‍රමය සංශෝධනය කිරීමයි. එනමුත් අද වනතුරු එම වෙනස්කම් නිවැරදිවම මොනවාදැයි පැහැදිලි නැත. බොහෝ අවමානයට ලක් වූ වත්මන් සමානුපාතික නියෝජන ආකෘතියට ප්‍රතිසංස්කරණ අවශ්‍ය වීම නිසා නොවුණත්, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ විවාදයේ ප්‍රධාන තැන මැතිවරණ ක්‍රමයට අයත් වෙයි.

ශ්‍රී ලංකාව තුළ දැනට වසර ගණනාවක සිටම මැතිවරණ සංශෝධන පිළිබඳ විද්වත් සහ දේශපාලනික වශයෙන් විවාද පැවතිණි. කෙසේ නමුත් වර්තමාන සන්දර්භය යටතේ ඊට අදාළ කරුණුවල බහුවිධතාවය හඳුනා ගැනීම වැදගත් වේ. එවැනි ව්‍යායාමයකදී නැවත ප්‍රකාශ කිරීම වැදගත් කරුණු අතර ශ්‍රී ලංකාව තුළ නියෝජිතත්ව ප්‍රජාතන්ත්‍රවාදයේ විශේෂිත හැඩය (උදා: ආයතනගත ව්‍යූහය), අනුරූපී දේශපාලනික වටිනාකම් මෙන්ම අරමුණක් සාර්ථක කරගන්නේ කෙසේද යන්නට ප්‍රධාන ලෙසම විවාදයේ සංකල්පමය නැඹුරුව තිබේ. ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයේ ගැටළු සම්බන්ධව සහ ප්‍රතිසංස්කරණ සඳහා වූ විකල්ප නිසි ලෙස සකස් කිරීමට, තේරුම් ගැනීමට සහ පිළිතුරු සැපයීම කළ හැක්කේ අපට අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වභාවය පැහැදිලි කිරීමෙන් පමණි.

ශ්‍රී ලංකාව වැනි ප්‍රබල බෙදීම් සහිත සමාජයක වාර්ගික දේශපාලනයේ ආතතිය, ප්‍රජාතන්ත්‍රවාදය සහ එහි ක්‍රියාකාරීත්වය වැනි අංග ආවේණිකවම ප්‍රශ්නගත කරුණුය. බහුතර නීතිය ලෙස සරලව තේරුම්ගත් ප්‍රජාතන්ත්‍රවාදය සංඛ්‍යාත්මකව විශාල කණ්ඩායම් සිය ආධිපත්‍යය නිරන්තරයෙන් ශක්තිමත් කිරීමට සහ සංස්ථාගත කිරීමට යොදා ගනී. දේශපාලන තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් සමාජයේ සංඛ්‍යාත්මකව කුඩා කණ්ඩායම් ඉවත් කිරීමට මෙය හේතුවන අතර එමගින් ඉවත් කෙරුණු කණ්ඩායම්වල දේශපාලන සංස්ථාගත කිරීමට ඇති විශ්වාසය සෝදා පාලුවට ලක් කරයි. ශ්‍රී ලංකාවේ ගැටුම් සහ ස්වයං තීරණය පිළිබඳ වාර්ගික ඉල්ලීම් ද වාර්ගික දේශපාලන බහුත්වවාදය සහ රජයේ ව්‍යවස්ථාමය ව්‍යූහයේ පවතින වෙන්වී යාම වැළැක්වීම පිළිබඳ විෂමතාවය මගින් මෙම සංවිධිත සමාජය නිර්මාණය වී ඇත.

මැතිවරණ ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාවලිය තුළ සංගෘහිත වීමත්, සරල බහුත්වය හෝ 'මුලින් දිනුම් කණුව පසු කරන්නා' (එෆ්.පී.පී.) යන ක්‍රමය 1931 සිට 1989 දක්වා ක්‍රියාවේ යෙදී තිබීමත් යන කරුණු දෙකම විදහා දක්වනු ලැබුවේ බහුතර ජනතාවගේ හඳුනා ගැනීමට

අනුව ප්‍රජාතන්ත්‍රවාදය යනු විශේෂයෙන්ම බහුතරවාදයක් බවයි. එමෙන්ම ඉන් සුළු ජනයාට වෙනස්කම් කිරීම පිළිබඳ හඳුනා ගැනීම ස්ථාපිත කිරීමට සහ බලවත් කිරීමට යොදා ගත්තේය.

1978 ව්‍යවස්ථාවෙහි එක් ධනාත්මක ලක්ෂණයක් නම් සමානුපාතික නියෝජනය හඳුන්වාදීමයි. අපගේ වැනි සංස්කෘතීන් ගණනාවක් සහිත සමාජයක විවිධත්වය තුළ වූ ඒකීයභාවය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය ව්‍යවස්ථාවෙහි ඇති බොහෝ අංග අතර ජනවාර්ගික උපයෝගීත්වය ද අත්‍යාවශ්‍ය එක් අංගයක් වී ඇත. සුළුජන කොටස්වල නියෝජනය සහතික කිරීම මගින් නෛතික ආයතන තුළ ඔවුනගේ දායකත්වය පමණක් නොව එම ක්‍රියාවලිය මගින් සුළුජනයාගේ ඕනෑ එපාකම් සහ අවශ්‍යතාවයන් වඩා බරපතල ලෙස සැලකීමට රජය පෙළඹවීම ද සිදු කරයි.

සමානුපාතික නියෝජනය මගින් විශාල බහුතරතාවයක් ඇති වීම වළක්වන අතර එමගින් වගකීම් රහිත, ආක්‍රමණශීලී රජයක් බිහිවීමත් වළක්වා වඩා පරීක්ෂාකාරී සහ සංවේදී අන්තර්ගතවීම් සහතික කිරීමත් වැදගත් වේ. වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වූ සංස්කෘතියක් ඇති රජයක් මෙම සියලුම අංග මගින් ප්‍රවර්ධනය කිරීම දැකිය හැකිය.

එබැවින් ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේ අගය මත පදනම් වූ සාකච්ඡා ආරම්භයේදීම නියෝජිතත්ව ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය දේශපාලන ප්‍රතිපත්තියක් ලෙස සමානුපාතික නියෝජනය පිළිගත යුතු බව ඉතා පැහැදිලිය. මෙම සංකල්පය පදනම මත සිට විශේෂිත වූ සාධාරණ හා ප්‍රායෝගික ක්‍රමයකට ශ්‍රී ලාංකික මැතිවරණ ක්‍රමය නිර්මාණය කළ යුතුය.

1861 දී ජෝන් ස්ටුවර්ට් මිල් විසින් රචිත "කන්සිඩරේෂන්ස් ඔන් රෙප්‍රසන්ටේටිව් ගවර්න්මන්ට්" (Consideration on Representative Government) යන ශාස්ත්‍රීය ග්‍රන්ථයෙහි සිදු කළ නිරීක්ෂණයක් ශ්‍රී ලංකාවේ දැනට පවතින තත්ත්වයට දූරදර්ශී ලෙස සසඳා බැලූ විට කැපී පෙනෙන තත්ත්වයක් ඇත. ඔහු ප්‍රකාශ කළේ,

> ප්‍රජාතන්ත්‍රවාදය නැමැති නාමය යටතේ ඉතා වෙනස් වූ අදහස් දෙකක් සාමාන්‍යයෙන් පටලවා ඇත. ප්‍රජාතන්ත්‍රවාදයේ සුපිරිසිදු අදහස එහි නිර්වචනයට අනුව සමව නියෝජනය වූ සමස්ථ ජනතාව මගින් සමස්ථ ජනතාව පාලනය වීමයි. සාමාන්‍යයෙන් සිතා සිටින සහ මෙතෙක් භාවිත ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදය යනු සුවිශේෂිතව

නියෝජනය කෙරෙන සුළු බහුතරයක් වූ ජනතාවක් සමස්ථ ජනතාව පාලනය කිරීමයි. මුලින් සඳහන් අවස්ථාව සෑම පුද්ගලයෙකුටම සමානාත්මතාව ලැබීමට සමාන වෙයි. පසුව සඳහන් අවස්ථාව සංඛ්‍යාත්මක බහුතරයකට වාසිදායක වූ රජයේ ඕනෑම හඬක් ප්‍රායෝගිකව තමන්ට පමණක් අයත් වූ වරප්‍රසාදලත් පාලනයක් සමඟ ප්‍රබල ලෙස පටලවා ඇත. මෙසේ නොවැළැක්විය හැකි ප්‍රතිඵල ලබා දෙමින් ඡන්දදායකයන් වර්තමානයේ ගෙන යනු ලබන්නේ සුළුතරයෙහි ඡන්ද බලය සම්පූර්ණයෙන්ම අහෝසි වී යන ලෙසටය.

ඒ අනුව මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේදී අභියෝගය වන්නේ අතීතයේ වැරදි අනාගතයේදී නැවත ඇති නොවීම සහතික කිරීමයි.

14. මුලින් දිනුම් කණුව පසු කරන්නා (FPP) එදිරිව සමානුපාතික නියෝජනය (PR)

මුලින්ම දිණුම් කණුව පසු කරන්නා යන ක්‍රමය බ්‍රිතාන්‍යයන්ගෙන් ශ්‍රී ලංකාව ලද දායාදයකි. එය 1931 සිට 1948 දක්වා වූ ඩොනමෝර් ව්‍යවස්ථාවේත්, 1948 සිට 1972 දක්වා වූ සෝල්බරි ව්‍යවස්ථාවේත්, 1972 සිට 1978 දක්වා වූ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේත් සිට වර්තමාන ව්‍යවස්ථාව මඟින් සමානුපාතික නියෝජිත ක්‍රමය හඳුන්වා දෙන තෙක් පැවති මැතිවරණ ක්‍රමයයි.

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සඳහා පවත්වන මැතිවරණ තවදුරටත් මෙම ක්‍රමය යටතේම පවත්වනු ලබයි. එහිදී සාපේක්ෂව කුඩා ප්‍රාදේශික ඡන්දදායක මැතිවරණ කොට්ඨාශයක වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගන්නා අපේක්ෂකයා තේරී පත්වෙයි. එනම්, අනෙකුත් සියලුම අපේක්ෂකයන් එකතු වී ලබාගත් ඡන්ද ප්‍රමාණය ජයගත් අපේක්ෂකයාට වඩා වැඩි වුවත් එම දෙවනුව සඳහන් පුද්ගලයාම තේරී පත්වෙයි. ඇත්තෙන්ම ඡන්දදායක මැතිවරණ කොට්ඨාශයක වැඩි ජනතාවක් ජය ගත් අපේක්ෂකයාට එරෙහිව ඡන්දය ප්‍රකාශ කර තිබිය හැකි වීම මත විචාරකයන් මෙය ප්‍රජාතන්ත්‍රවාදී නොවන බවට තර්ක කරනු ලබයි.

එෆ්.පී.පී. ක්‍රමයේ ධනාත්මක ලක්ෂණයක් වන්නේ එය ඡන්දදායකයන් සහ ඔවුනගේ නියෝජිතයන් අතර කිට්ටු බැඳීමක් සඳහා උනන්දු කරවීමයි. එෆ්.පී.පී. ඡන්දදායක මැතිවරණ කොට්ඨාශවල ප්‍රාදේශික ප්‍රමාණය සාපේක්ෂකව කුඩා වන තත්ත්වයක් ඇති අතර නියෝජිතයාට

ඔහුගේ හෝ ඇයගේ ඡන්දදායකයන්ගේ අඛණ්ඩ සහයෝගය සහතික වීමට නිරන්තර සහ ඍජු සම්බන්ධතා පැවැත්වීම අවශ්‍ය වෙයි.

එෆ්.පී.පී. ක්‍රමයේ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් වන්නේ එය දේශපාලන පක්ෂ දෙකක් හෝ තුනක් සහිත තත්ත්වයක් මගින් ප්‍රබල පාර්ලිමේන්තු බහුතරතාවයක් ඇති කිරීමයි. එමනිසා එෆ්.පී.පී. ක්‍රමය නිතරම ශක්තිමත් රජයක් සඳහා වඩා සුදුසු දියුණු ක්‍රමයක් වෙයි. ස්ථාවර බව මැතිවරණ ක්‍රමයක් නිර්මාණය කිරීමේදී සැලකිය යුතු එක් සාධකයක් වන සේම මතක තබා ගත යුතු වන්නේ නොසලකා හැරිය නොහැකි අදාළ කරුණු අතර සාධාරණත්වය හා සමානව නියෝජනය ද ඇති බවයි.

ප්‍රබල බහුතරයකට ඉඩ සැලසීමේදී එෆ්.පී.පී. ක්‍රමය අඩු තරමින් අවස්ථා දෙකකදී අසතුටුදායක බව පෙනේ. මුලින්ම එෆ්.පී.පී. ක්‍රමය ජනතාවගේ බලාපොරොත්තු විශාල ලෙස විකෘති කරන බවක් අත්දැකීම් අනුව දක්වා ඇත. ඒ අනුව දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් වලට නියම ලෙස ලැබුණු ඡන්ද ප්‍රමාණයේ ප්‍රතිශතය බෙදා දැක්වීමේදී ආසන සංඛ්‍යාව මගින් කෙරෙන පක්ෂයේ නියෝජනය සමඟ එය නොගැලපෙයි. ඇතැම් අවස්ථා වලදී ප්‍රකාශිත ඡන්ද වලින් 50% හෝ නොලැබුණු පක්ෂ තුනෙන් දෙකක බලයක් සහිත රජයන් පිහිටවීම අප දැක ඇත. උදාහරණ ලෙස (වගුව බලන්න) 1970 මහ මැතිවරණයේදී ප්‍රකාශිත මුළු ඡන්ද වලින් 49% පමණක් ලැබූ එක්සත් පෙරමුණ 77% ක පාර්ලිමේන්තු නියෝජනයක් හෝ තුනෙන් දෙකක බහුතරයක් ලබා ගත්තේය. 1977 මහ මැතිවරණයේදී ඡන්ද 51% ලැබූ එක්සත් ජාතික පක්ෂය 83% තරම් වූ පාර්ලිමේන්තු ආසන සංඛ්‍යාවක් හෝ හයෙන් පහක බහුතරයක් ලබා ගත්තේය.

පාර්ලිමේන්තු මැතිවරණය - 1970

පක්ෂය	ඡන්ද ප්‍රමාණය	ආසන සංඛ්‍යාව	% ඡන්ද ප්‍රමාණය	% ආසන සංඛ්‍යාව
එක්සත් පෙරමුණ	2,440,476	116	49	77
එක්සත් ජාතික පක්ෂය	1,895,341	17	38	11
ෆෙඩරල් පක්ෂය	345,727	13	5	9
ද්‍රවිඩ කොංග්‍රසය	115,567	3	2	2
මහජන එක්සත් පෙරමුණ	46,571	0	0.93	0

පාර්ලිමේන්තු මැතිවරණය - 1977

පක්ෂය	ඡන්ද ප්‍රමාණය	ආසන සංඛ්‍යාව	% ඡන්ද ප්‍රමාණය	% ආසන සංඛ්‍යාව
එක්සත් ජාතික පක්ෂය	3,175,991	140	51	83
ශ්‍රී ලංකා නිදහස් පක්ෂය	1,683,753	8	30	5
ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ	399,043	18	6	11
ලංකා සමසමාජ පක්ෂය	227,548	0	4	0
කොමියුනිස්ට් පක්ෂය	159,326	0	3	0
ලංකා කම්කරු කොංග්‍රසය	35,743	1	0.5	0.6

ප්‍රජාතන්ත්‍රවාදී අගයන්ගේ සාපේක්ෂ වැදගත්කමේ සාධක මතම දේශපාලන පක්ෂයක් විසින් ලබාගත් මුළු ඡන්ද ප්‍රමාණයට අනුරූපී නොවන සුවිශාල පාර්ලිමේන්තු නියෝජනයක් කිසිසේත්ම අනුමත කළ නොහැකි වෙයි.

තවදුරටත් ප්‍රබල බහුතරයක් සහිත ප්‍රමාණයට වඩා විශ්වාසය තබාගත් රජයක් සන්ධාන මඟින් පාලනය වන රජයන්ට වඩා ඒකාධිපති ස්වරූපයක් ගැනීමට වැඩි ඉඩක් ඇත. පසුව සඳහන් සන්ධාන රජයන් වඩාත් විධායකය නියෝජනය කරන කණ්ඩායම් සහ අවශ්‍යතා පිළිබඳ වඩා හොඳ පිළිඹිඹුවක් වන අතර ඒවායේ සහයෝගය රජයට ලැබෙන්නේම යැයි සිතිය නොහැකිය.

එෆ්.පී.පී. ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව පාලනය කළ තුනෙන් දෙකක හෝ ඊට වැඩි බහුතරයක් තිබූ අවස්ථා දෙකකටම අයත් රජයන් ප්‍රජාතන්ත්‍රවාදී නොවන අයුරින් කටයුතු කිරීමට යොමු වූ ආකාරය අප දැක ඇත. මෙම කටයුතුවල වඩා අන්තගාමී අවස්ථා අතරට පාක්ෂිකයන්ගේ වාසියට ව්‍යවස්ථාමය වෙනස්කම් ඇති කිරීම සහ ජනයාගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතියට බාධා කිරීම ද අයත් වේ.

1970-77 වකවානුව තුළ එක්සත් පෙරමුණු රජය ව්‍යවස්ථාව උත්තරීතර විධායකයක් ලෙස (ජාතික රාජ්‍ය සභාව) නිර්මාණය කළ අතර එමඟින් වඩාත් බලවත් සාමාජිකයන් පිරිසකට අණදීමේ හැකියාවක්

අග්‍රාමාත්‍යවරයාට ලැබුණි. එමගින් අධිකරණයට දෙවන තැන ලබාදීම මෙන්ම එහි අපක්ෂපාතී බව දුර්වල කිරීම ද සිදුවන ලදී. අති විශිෂ්ට වූ භයෙන් පහක බහුතරයක් ලබා නැවත බලයට පත් එක්සත් ජාතික පක්ෂය ඉතාමත් ප්‍රබල විධායක ජනාධිපතිවරයෙකු නිර්මාණය කිරීමෙන් පාර්ලිමේන්තුව දුර්වල කරන ලදී. බහුතර ඡන්ද බලය හේතුවෙන් ව්‍යවස්ථාමය සංශෝධනයක් හඳුන්වා දී තම ආයු කාලය දිගු කර ගැනීමට ද ඔවුනට හැකි විය. පැහැදිලිව පෙනී යන කරුණක් වන්නේ මෙවැනි හැසිරීම් කිසිසේත්ම අනුමත කළ නොහැකි බවත් මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේදී අප කළ යුතු වන්නේ මැතිවරණයකදී ජනතාව බලාපොරොත්තුවන දෑ මත පදනම් වූ ක්‍රමයක් හඳුන්වාදීම මිස බලයේ සිටින දේශපාලන පක්ෂයක පහසුව සැලසීම නොවේ.

එෆ්.පී.පී. ක්‍රමයේ මෙම අවශ්‍යතාවයන් පිළිබඳ සමානුපාතික නියෝජනයෙහි (පී.ආර්.) දී මූලධර්මයක් වශයෙන් ආමන්ත්‍රණය කර ඇත. පී.ආර්. ක්‍රමයේ ප්‍රධාන අරමුණ දේශපාලන ආයතනයන්හි ඇති එක් එක් පක්ෂවල සහ කණ්ඩායම්වල නියෝජනය හැකි තරම් ඔවුන් තරඟ කර ලබාගත් ඡන්ද ප්‍රතිශතයට අනුකූල බවට වග බලා ගැනීමයි. ශ්‍රී ලංකාව වැනි බහු සංස්කෘතීන් ඇති රටවලට මෙය වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් පමණක් නොව කණ්ඩායමක නියෝජනය දේශපාලන ආයතනයක තහවුරු කර ගැනීමට පී.ආර්. ක්‍රමය අත්‍යවශ්‍ය වේ. සිහිතබා ගතයුතු වැදගත් කරුණක් වන්නේ පී.ආර්. ක්‍රමය අත්‍යාවශ්‍යයෙන්ම මූලධර්මයක් බවත්, පී.ආර්. ක්‍රමය මත පදනම් වූ එකිනෙකාට වෙනස් ක්‍රමයක් ලෝකයේ ඇති බවත්ය. ලෝකයේ 211 ක් වූ ඍජු මැතිවරණ සහිත රාජ්‍යයක් සහ භූමීන් අතුරින් 75 ක් යම් ආකාරයක පී.ආර්. ක්‍රමයක් භාවිතා කරන අතර ඉතිරි 68 එෆ්.පී.පී. ක්‍රමය යොදා ගනියි.

15. සමානුපාතික නියෝජනයේ ශ්‍රී ලාංකික ක්‍රමය: විවේචන සහ ප්‍රතිචාර

දැනට පවතින 1978 දී හඳුන්වා දෙනු ලැබූ ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය පී.ආර්. ක්‍රමය මත පදනම් වී ඇත. පක්ෂ ලැයිස්තු ක්‍රමය යොදා ගන්නා තනි පැවරිය හැකි ඡන්දය ශ්‍රී ලාංකික මැතිවරණ ක්‍රමයයි. එනම්, නාම යෝජනා කළ යුතු කාලය තුළ අපේක්ෂක ලැයිස්තුවක් ප්‍රසිද්ධ කළ එක් එක් දේශපාලන පක්ෂ අතුරින් එකකට මුලින් ඡන්දය ප්‍රකාශ කිරීමයි. දේශපාලන පක්ෂය තෝරා ගැනීමෙන් අනතුරුව ඡන්දදායකයා තෝරාගත් පක්ෂයේ ලැයිස්තුවෙන් අපේක්ෂකයන් තිදෙනෙකුගේ උපරිමයකට සිය මනාපය පළ කරයි. ඡන්දදායකයාගේ

තෝරා ගැනීම වඩා දියුණු කළ මෙම ක්‍රමය තනි පැවරිය හැකි ඡන්දය (එස්.ටී.වී.) ලෙස හඳුන්වයි.

1989 දී සිට භාවිතා වන වර්තමාන පී.ආර්. ක්‍රමය ප්‍රථම වතාවට එම වසරේ පාර්ලිමේන්තු මැතිවරණයේදී භාවිතා කළ අවස්ථාවේදී ප්‍රධාන වශයෙන් විවේචන හතරකට ලක් විය. මූලිකව තර්ක කෙරුණේ එක් පක්ෂයකට පාර්ලිමේන්තුව තුළ බහුතර බලයක් ලබා ගැනීම අපහසු වීම හේතුවෙන් මෙම ක්‍රමය රජය තුළ අකාර්යක්ෂමතාවක් ඇති කරන බවයි. මෙසේ වූ කල පාර්ලිමේන්තු මැතිවරණයකින් පසු පාර්ලිමේන්තු බහුතරය එකතු වී මැතිවරණයෙන් පසු ඇතිවන දූෂණ සහ කපටි ලෙස හෙට්ටු කිරීමට ඇතිවන හිඩැස ප්‍රකෘතිමත් කළ යුතුය. ඉන් දූෂණය සහ නියමිත දර්ශනයට සැහවුණු වෙළෙඳාමට මහ පැදුණි. තවදුරටත් සාකච්ඡාවට භාජනය වී ඇති පරිදි සන්ධාන රජයන්හි විශේෂයෙන් ජාතිකත්වය පදනම් වූ කුඩා පක්ෂ නොසුදුසු බලපෑමක් ආයුධයක් ලෙස යොදා ගන්නා බවයි.

මෙම විවේචනය සම්පූර්ණයෙන්ම නිවැරදි එකක් නොවේ. වෙනත් ක්‍රම වලින් සිදු නොවන තරම් පී.ආර්. ක්‍රමය කුඩා කණ්ඩායම් වලට නියෝජනයක් ලබා දෙයි. සන්ධාන රජයක් අත්‍යාවශ්‍යයෙන්ම නරක තත්ත්වයක් නොවන්නේ ඉන් පොදු බවත්, ඇතුළත් වීම අගය කිරීමත්, සම්පූර්ණයෙන්ම පාක්ෂික වූ තීරණ ගැනීම අපහසු වීමත් මතය. එය විධායකයේ බහුතර බලයක්, උදාහරණ ලෙස රජයක් එක් පක්ෂයක් පමණක් ආධිපත්‍යය සහිත වීම වළකා විශේෂයෙන්ම සුළුතර පක්ෂවල වැනි බහුවිධතාවය, දේශපාලන තීරණ ගැනීමේදී සැලකිය යුතු බව සහතික කරයි. තවදුරටත් අප මතක තබා ගත යුතු වන්නේ සුළුතර නියෝජනය යනු ජාතික හෝ ආගමික සුළුතරයන්ට පමණක් සීමා නොවන බවයි. ශ්‍රී ලාංකික දේශපාලන ක්‍රමය තුළ හොඳින් මුල් බැසගත් එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැරුණු විට වෙනත් පක්ෂ ඡන්දදායක මැතිවරණ කොට්ඨාශ හෝ මැතිවරණ කාලය මට්ටමේදී අවාසිදායක තත්ත්වයක පවතියි. සිංහල සහ බෞද්ධ සමාජයේ යම් මට්ටමක විකල්ප අදහස් නියෝජනය කරන ජ.වි.පෙ. සහ ජා.හෙ.උ. වැනි පක්ෂ පී.ආර්. ක්‍රමයේ දිස්ත්‍රික්ක මට්ටම පදනම් වූ විශාල මැතිවරණ ඒකක වටකර ගන්නා වූ ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක් නොවන්නට ඔවුනගේ පාර්ලිමේන්තු නියෝජනය විශාල ලෙස අඩුවීමක් දැකිය හැකි වනු ඇත. පො.එ.පෙ. හි ඇතුළත් ජ.වි.පෙ. සමහර දිස්ත්‍රික්කවල සිදු කළ අන්දමට මනාප ඡන්ද ක්‍රමය සන්ධානයේ කණිෂ්ඨ සාමාජිකයන්ට සන්ධානය තුළ වැඩි ජනප්‍රියත්වයක් හා වැඩි බලපෑමක් දිනාගැනීමට උපකාරී වී ඇත.

දෙවන විවේචනය වන්නේ පී.ආර්. ක්‍රමය මගින් ඡන්දදායකයා සහ නියෝජිතයා අතර වූ බැඳීම් බිඳ දමා ඇති බවයි. එනම් නියෝජිතයන් තෝරාගැනීම මැතිවරණ ඡන්ද කොට්ඨාශ මත පදනම් නොවී දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් මගින් ඉදිරිපත් කළ අපේක්ෂකයන් ලැයිස්තුවක් අතුරින් සහ මැතිවරණ දිස්ත්‍රික්කයේ වඩා විශාල ප්‍රාදේශීය ඒකක මත පදනම් වී සිදුවීමයි. මෙය සත්‍ය කරුණකි. අදාළ වූ තවත් විවේචනයක් වූයේ අපේක්ෂකයන් මැතිවරණ දිස්ත්‍රික්කයේ විශාල ප්‍රදේශයක ඡන්ද ව්‍යාපාරය කිරීමට සිදුවීමත් එම ක්‍රමය නිසා අපේක්ෂකයන්ට විශාල මුදලක් වැය කිරීමට සිදුවන අතර මේ හේතුව මත අධෛර්යයට පත් වී තරහ නොකිරීමයි. මෙය යම් තරමකට නිවැරදි වුවත් ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ තම අපේක්ෂක ලැයිස්තුව නිර්මාණය කිරීමේදී ප්‍රායෝගික තත්ත්වය නම් එක් එක් දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන වලට අදාළ ලෙස එම තෝරාගැනීම කරන බව මතක තබා ගත යුතු වැදගත් කරුණකි. මේ අනුව අපේක්ෂකයන් තම ඡන්ද ව්‍යාපාරය සහ දේශපාලන කටයුතු මුළු මැතිවරණ දිස්ත්‍රික්කයේම නොව කුඩා ඒකකයට අරමුණු කර ගනියි. ඇත්තෙන්ම දේශපාලන පක්ෂවල සංවිධායකවරු පත් කිරීම මැතිවරණ කොට්ඨාශ මත මිස මැතිවරණ දිස්ත්‍රික්ක මත සිදු නොවේ. උදාහරණ ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ කෝට්ටේ සඳහා එක්සත් ජාතික පක්ෂ සංවිධායකවරයා රවි කරුණානායක වන අතර ඔහුගේ ඒ.ජ.නි.ස. හි සගයා වන්නේ අර්ජුන රණතුංග වන අතර දෙදෙනාම කොළඹ දිස්ත්‍රික්කය සඳහා වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වෙයි.

ශ්‍රී ලංකාවේ පී.ආර්. ක්‍රමයට එරෙහිව නැගෙන තවත් විවේචනයක් එල්ල වන්නේ මනාප ඡන්ද වලට එරෙහිවයි. මනාප සඳහා වන තරඟය පක්ෂ අතර භයානක තත්ත්වයක් ප්‍රතිවාදීත්වයක් ඇති කරනවා පමණක් නොව පක්ෂ තුළත් එවැනි තත්ත්වයක් ඇති කරන නිසා එය මැතිවරණ සම්බන්ධ ගැටුම් වල සහ දූෂණ වල වැඩි වීමට හේතුවක් වන බව ප්‍රකාශිතය. මනාප ලකුණු කිරීමේ හැකියාව පී.ආර්. ක්‍රමයේ ධනාත්මක ලක්ෂණයක් වන අතර එමගින් ඡන්දදායකයාට පක්ෂ ලැයිස්තුවෙන් කුමන අපේක්ෂකයාට වඩා කැමැත්තක් ඇතිද යන්න ප්‍රකාශයට වැඩි අයිතියක් ලබාදෙයි. මනාප ඡන්ද හේතුවෙන් පක්ෂ තුළම ප්‍රතිවාදීත්වයක් උත්සන්න කිරීම සත්‍ය නොවන බව අත්දැකීම පවසයි. පක්ෂ අතර තරඟකාරීත්වය තියුණු වීම සහ ඒවායේ ප්‍රචණ්ඩ ප්‍රතිඵල අපගේ දේශපාලන සංස්කෘතියේ අසතුටුදායක ස්වභාවයට හේතු වනු මිස එයට මැතිවරණ ක්‍රමය හේතු නොවේ.

හතරවනුව, තර්ක කෙරෙනුයේ මෙම ක්‍රමයේ ඇති පක්ෂයේ ප්‍රධානත්වය ඉවත් කිරීමට මෙන්ම සාධාරණ සහ වඩාත් සමානුපාතික නියෝජනයක් ඇති කිරීමට වර්තමාන ක්‍රමයට සංශෝධන අවශ්‍ය බවයි. ශ්‍රී ලංකාව වඩා යෝග්‍ය යැයි කලක සිට යෝජනා වී ඇත්තේ පී.ආර්. ක්‍රමය මත පදනම් වූ ක්‍රමයක් වන ජර්මානු මිශ්‍ර ක්‍රමයයි. එහි එෆ්.පී.පී. හා පී.ආර්. යන ක්‍රම දෙකේම අංග එකතුවක් වෙයි.

16. ජර්මානු මැතිවරණ ක්‍රමය

ජර්මානු මැතිවරණ ක්‍රමයේ සංකල්පමය වශයෙන් සිත් ඇද ගන්නා සුළු වන්නේ එහි අදාළ පක්ෂ විසින් ලබාගත් ඡන්ද ප්‍රතිශතය මත ව්‍යවස්ථා නියෝජනය දැඩි ලෙස පදනම් කිරීමක් ඡන්දදායකයා සහ නියෝජිතයා අතර සම්බන්ධය වඩා කිට්ටු එකක් කිරීමට එෆ්.පී.පී. ක්‍රමයේ ඇති අංග ධනාත්මකව යොදා ගැනීමත්ය. ජර්මානු සංකල්පය මහින් බිහි වූ සංශෝධන යෝජනා පිළිබඳ නිතර කථා කෙරුණ ද පසුගිය දශකය තුළ කෙරුණු එම යෝජනා ජර්මානු සංකල්පයෙන් සැලකිය යුතු ලෙස ඉවත් වී ඇති බවයි.

(පසුගිය රජයේ පාලන අධිකාරිය සමයේ සිදු කළ යෝජනා සහ මෑතක සිදු කෙරුණු අවසන් පාර්ලිමේන්තුවේ මැතිවරණ සංශෝධන පිළිබඳ තේරීම් කාරක සභාවේ සමාලෝචනයක්)

ජර්මානු ෆෙඩරල් නීතිය යටතේ ඡන්දදායකයාට ඡන්ද දෙකක් ඇත. ජර්මානු පාර්ලිමේන්තුවෙහි (බුන්ඩස්ටාග් (Bundestag)) අඩක් වූ ජර්මානු ෆෙඩරල් විධායකය තෝරා ගනු ලබන්නේ එෆ්.පී.පී. ක්‍රමය යටතේ වූ ඡන්දදායක මැතිවරණ කොට්ඨාශ 328 ක සෘජු ඡන්දය මතයි. ඉතිරි සාමාජිකයන් 328 දෙනා පත්කිරීම පක්ෂ මහින් ඉදිරිපත් කරන වෛකල්පික අපේක්ෂක ලැයිස්තුව මත ප්‍රතිශතයකට අනුව සිදු කරයි.

ඡන්ද දෙකෙන් මුල් එක මැතිවරණ කොට්ඨාශ නියෝජිතයෙකුටත් දෙවැන්න දේශපාලන පක්ෂයටත් වේ. ඡන්දදායකයාට මැතිවරණ කොට්ඨාශ නියෝජිතයා සහ ලැයිස්තුව යන දෙකට අදාළව පක්ෂ දෙකම ඡන්ද ප්‍රකාශ කිරීමේ නිදහස ඇත. ජාතික මට්ටමේ ආසන ප්‍රමාණය දේශපාලන පක්ෂ අතර තීරණය කෙරෙන්නේ පක්ෂ ලද ඡන්ද සංඛ්‍යාව විමසීම මහිනි. (උදාහරණ ලෙස එක් එක් පක්ෂයේ ලැයිස්තුවට ලැබුණු ඡන්ද ප්‍රමාණය) ගණනය සිදු කෙරෙනුයේ නියමෙයර් (Niemeyer) ක්‍රමය නැමැති සංකීර්ණ සමීකරණයකට අනුවය. ඉන් එක්

එක් පක්ෂය ලබාගත් ඡන්ද ප්‍රතිශතයට ඉතාම ගැලපෙන ලෙස ආසන ප්‍රමාණය ගණනය කරනු බලයි.

එම තීරණයෙන් අනතුරුව මැතිවරණ කොට්ඨාශ මට්ටමින් පක්ෂ දිනා ඇති ආසන සංඛ්‍යාව මෙම අගයෙන් අඩු කරනු ලබයි. ඉතිරිවන අගය පක්ෂයේ ලැයිස්තුව අනුව සම්පූර්ණ කරනු ලබයි. ශ්‍රී ලංකාවේ තත්ත්වය මෙන් නොව ඡන්ද දායකයාට ලැයිස්තුව සම්බන්ධයෙන් මනාප ඡන්දයක් ප්‍රකාශ කළ නොහැක. ජර්මානු පක්ෂ ලැයිස්තුව ජාතික ලැයිස්තුවක් නොවන අතර පක්ෂ විසින් ප්‍රාන්තයකට එක් ලැයිස්තුවක් ප්‍රකාශයට පත්කරයි. එසේම ශ්‍රී ලංකාවේ මෙන් නොව මැතිවරණයෙන් පසු ලැයිස්තුවෙන් පත් කෙරෙන නියෝජිතයා පිළිබඳ පක්ෂයට කිසිදු අභිමතයක් නැත. එසේ වන්නේ මැතිවරණයට පෙර ලැයිස්තුගත නම්වල පිළිවෙළ ස්ථිර වන අතර පක්ෂයට අදාළ ප්‍රමාණය එම ස්ථිර ලැයිස්තුවෙන් පුරවනු ලබයි. ශ්‍රී ලංකාවේ පක්ෂ තුළ කෙරෙන බලපෑම් මත ලැයිස්තුවේ සිටින කුමන අපේක්ෂකයකු ව්‍යවස්ථාදායකය නම්කරනවාද නැතහොත් ලැයිස්තුවේ නැති පිටස්තර පුද්ගලයකු නම් කරනවාද වැනි දේ මෙම ක්‍රමය තුළ නැත.

ඇතැම් අවස්ථාවල පක්ෂයක් විසින් මැතිවරණ කොට්ඨාශ මට්ටමින් ජයගත් ආසන සංඛ්‍යාව එම පක්ෂය ලබා ගත් ඡන්ද ගණනයෙන් ලැබිය යුතු ආසන ගණනට වඩා වැඩි විය හැකිය. එවැනි අවස්ථාවක ජාතික ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන්ගේ ආසන සංඛ්‍යාව එම අමතර සාමාජිකයන් ප්‍රමාණය ඇතුළත් කළ හැකි ලෙස වැඩි කරනු ලබයි. එපමණක් නොව ප්‍රතිශතයක් ලෙස අනෙකුත් පක්ෂවල සාමාජිකයන්ට ද එම වරප්‍රසාදය ලැබෙන අතර එය හුදෙක් තම නියමිත ප්‍රමාණය ඉක්ම වූ පක්ෂයට පමණක් සීමා නොවේ.

මේ අනුව ජර්මන් ක්‍රමය එෆ්.පී.පී. සහ පී.ආර්. යන ක්‍රම වල හොඳම අංග මිශ්‍ර වූ: මැතිවරණ ක්‍රමයක් තුළ දේශපාලන පක්ෂ නායකත්වයේ නියමිත භූමිකාව, ස්ථාවරත්වය සඳහා වූ අවශ්‍යතා මෙන්ම සමාජයේ බොහෝමයක් නැතහොත් සියලුම වගකීම් දරන්නන් වශයෙන් සාධාරණ නියෝජනයක් සඳහා අවශ්‍ය ක්‍රමයකට කටයුතු සලසා ඇත.

V

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත් කෙටුම්පත සහ කාන්තා අයිතිවාසිකම් පනත් කෙටුම්පත පිළිබඳ විශ්ලේෂණය

අම්බිකා සත්කුනනාදන් *

1. හැඳින්වීම

වර්තමානයේ අන්තර්ජාතික මානව හිමිකම් නීතිය ස්ත්‍රී පුරුෂ භේදය මත වෙනස් ආකාරයෙන් සැලකීම ජාතික තලයේ සහ ජාත්‍යන්තර තලයේ හැසිරවිය යුතු ගැටළුවක් ලෙස වටහාගෙන ඇත. ශ්‍රී ලංකාව තුළ කාන්තා අයිතිවාසිකම් යම්තාක් දුරකට පිළිගනු ලැබ ඇතත් බෙහෝ කාන්තාවන් තවමත් වෙනස් කොට සැලකීමත්, ප්‍රචණ්ඩත්වයත් අත්විඳින අතර සමාජය තුළ ප්‍රතිලාභ හීන තත්ත්වයක් අත් කරගෙන සිටියි.

කාන්තාවට එරෙහි සියලු ආකාරයේ වෙනස් අන්දමින් සැලකීම් මුලිනුපුටා දැමීම පිළිබඳව වූ ජාත්‍යන්තර සම්මුතිය (සීඩෝ) සඳහා ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති නිසා අන්තර්ජාතික මානව හිමිකම් නීතිය යටතේ සීඩෝ සම්මුතියේ ප්‍රතිපාදන උල්ලංඝණය කිරීම් වලට එරෙහිව පියවර

* ජ්‍යෙෂ්ඨ පර්යේෂක/සම්බන්ධීකාරක, මානව අයිතිවාසිකම් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය වැඩසටහන, වාර්ගික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික මධ්‍යස්ථානය, කොළඹ.

ගැනීමේ වගකීමක් පවතී. කාන්තා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තිය ලෙස සැලකෙන මෙම සම්මුතිය සවිස්තරාත්මක සහ පෘථුල ලියවිල්ලක් වන අතර එතුළින් "කාන්තාව සහ පුරුෂයා අතර සම්පූර්ණ සමානත්වයක් උදාකරලීම සඳහා සමාජය තුළත්, පවුල තුළත් කාන්තාවට සහ පුරුෂයාට ලැබී ඇති සාම්ප්‍රදායික චරිතය හෙවත් ක්‍රියා පිළිවෙත වෙනස් කළ යුතුය" යන්න පිළිගෙන ඇත. සීඩෝ සම්මුතියේ 2 වගන්තිය මඟින් රාජ්‍යයන් කාන්තාවන්ට එරෙහි වෙනස් අන්දමින් සැලකීම් මුලිනුපුටා දැමීමේ ප්‍රතිපත්තියක් සකසා ගැනීම තහවුරු කිරීම සඳහා නොපමාව කටයුතු කළ යුතු බවත් එයට කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීමේ කිසිඳු ක්‍රියාවක් හෝ ක්‍රියා පිළිවෙත් පවත්වාගෙන යෑමෙන් වැළකීමත් එකී වගකීමෙන් පොදු ආයතන සහ අධිකාරීන් බැඳී සිටින බව තහවුරු කිරීමට කටයුතු කිරීමේ වගකීමෙන්ද බැඳී සිටින බවත් දක්වා ඇත. සීඩෝ සම්මුතිය මඟින් එයට බැඳුණු රාජ්‍යයන් කාන්තාවන්ට එරෙහිව වෙනස් අන්දමින් සැලකීම අන්තර්ගතව ඇති නීති, රෙගුලාසි, සිරිත් විරිත් හා ක්‍රියා පිළිවෙත් නවීකරණය හෝ අහෝසි කිරීම සඳහා වූ නව නීති ප්‍රතිසංස්කරණ ඇතුළු සුදුසු සෑම ක්‍රියාමාර්ගයක්ම ගත යුතුව ඇතැයි තවදුරටත් පවසා ඇත. ඒ අනුව එකී සම්මුතියට අත්සන් තබා ඇති රටක් වශයෙන් ශ්‍රී ලංකාව කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කර වර්ධනය කර තහවුරු කිරීමේ වගකීමෙන් බැඳී ඇත.

මෙම පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාව තුළ කාන්තා අයිතිවාසිකම් සඳහා වූ නෛතික රාමුව සවිබල ගැන්වීම සඳහා ඉලක්ක කරගත් පනත් කෙටුම්පත් දෙකක් එනම්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත් කෙටුම්පත සහ කාන්තා අයිතිවාසිකම් පනත් කෙටුම්පත පිළිබඳව අධ්‍යයනයක් සිදු කෙරේ.

2. කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වය

ප්‍රචණ්ඩත්වය යනු ශ්‍රී ලාංකික කාන්තාවන් බොහොමයක් දෙනා එදිනෙදා අත් විඳින සත්‍යයක් වී ඇත. වර්ෂ 2003 සංඛ්‍යාලේඛන අනුව කාන්තාවන්ට එරෙහි සුළු අපරාධ සිද්ධීන් 2,155 ක් වාර්තා වී ඇත. සුළු අපරාධ ගණයට ලිංගික හිංසනය, පහරදීම් සහ ශරීරය පීඩාවට පත්කිරීම් හා එවැනි වෙනත් දෑ අඩංගු වේ.[1] බරපතල අපරාධ ගණයට අයත් වන ස්ත්‍රී

---

[1] 2003 වර්ෂය සඳහා පොලිස් දෙපාර්තමේන්තු සංඛ්‍යා ලේඛන.

දූෂණ, මිනීමැරුම්, මිනීමැරීමට තැත්කිරීම්, බරපතල තුවාල සිදුකිරීම්, බරපතල ලිංගික අපයෝජන සහ ව්‍යාභිචාරය යනාදී අපරාධ 2003 වර්ෂය තුළ 1506 වාර්තා වී ඇත.[2] එසේම මෙම සංඛ්‍යාලේඛන තුළ 'ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය' යනුවෙන් වැරදි කොට්ඨාශයක් හඳුන්වා දී නොමැති බව සැලකිය යුතුය.

3. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහි ජාතික නෛතික රාමුව

ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහි සුවිශේෂ නීතියක් නොමැති අතර දණ්ඩ නීති සංග්‍රහය ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අපරාධයක් ලෙස හඳුන්වා දී නැත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහිව නඩු පැවරීම ඒ අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 324 පහරදීම වගන්තිය යටතේ හෝ 311 තුවාල සිදුකිරීම වගන්තිය යටතේ සිදුකළ යුතුය. කෙසේ වුවත් මෙකී ප්‍රතිපාදන භාවිතයට ගනු ලබන්නේ කලාතුරකිනි. කාන්තාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධි බලධාරීන්ට වාර්තා කිරීම සමාජමය හේතු නිසා වැළකී ඇති අතර, ඔවුන් එසේ වාර්තා කළද ඒවා බලධාරීන්ගේ අඩු සැලකිල්ලට ලක්වීම හෝ එම ගැටළු නිරාකරණයට අක්‍රමවත් සමථකරණ ක්‍රියාමාර්ග යොදාගැනීම සිදු කෙරේ.[3] 1995 වර්ෂයේ සිදුකළ දණ්ඩ නීති සංග්‍රහය පනතේ සංශෝධනය තුළින් 'බරපතල තුවාල සිදුකිරීම්' නැමැති අපරාධයේ නිර්වචනය පුළුල් කරනු ලැබුවද, එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වරදක් ලෙස සලකා නොමැත. මෙම සංශෝධන ශාරීරිකව සුළු තුවාල සිදුවුණු හෝ මානසිකව පීඩාවට පත්කළ වින්දිතයන් පිළිබඳව සැලකීමක් ද සිදුකර නොමැත.[4]

ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව වින්දිතයන්ගේ ආරක්ෂාව උදෙසා දික්කසාද නීතිය ද බලපෑමක් සිදු කරයි. ශ්‍රී ලංකාවේ නීතිය තුළ වෛවාහික වරදකින් තොරව දික්කසාදයක් ලබා ගැනීමේ සංකල්පයක් නොමැති අතර දික්කසාදයක් ලබාගත හැක්කේ ද්වේශ සහගත අතහැර

---

[2] එම.

[3] අමීනා හුසේන්, *සම්වයිම්ස් දෙයාර් ඊස් නෝ බ්ලඩ් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පෙදෙස්වල ස්ත්‍රී දූෂණ සහ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා* (කොළඹ, වාර්ගික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික මධ්‍යස්ථානය, 2000), පිට 11.

[4] එම.

යෑම, අනාචාරය හෝ සුවකළ නොහැකි ලිංගික බෙලහීනතාවය මත පමණි.[5] මෙම තත්ත්වය තුළ දික්කසාදයක් අපේක්ෂා කරන කාන්තාවකට එයට අදාළව සමාජය තුළ ඇති අපකීර්තිය හා සමඟ සටන් කිරීමට අමතරව මෙකී නෛතික ක්‍රමවේදය විසින් ද ඇති කරන්නේ සුවිශාල බරකි. අනුමිත ද්වේශසහගත අතහැරයෑම නැමති වෛවාහික වරද තුළ සහකාරයාගේ අපයෝජනයන් ද ඇතුළත් වුවත්, දික්කසාදයක් සඳහා මෙම පදනම යොදා ගැනීමේදී කාන්තාවට විශාල ඔප්පු කිරීමේ භාරයක් පැවරෙන අතර වෛවාහික නිවස අතහැර යෑමට ඇයට සිදුවූයේ ඇගේ ජීවිතයට හෝ ශරීරයට හානියක් සිදුවේයැයි යන බිය නිසා බව පැවසිය යුතුවේ. අධිකරණමය වෙන්වීමක් ලබාගැනීමට හැකි අතර එය අවුරුදු දෙකකට පසු දික්කසාදයක් බවට ද පත්කරගත හැකි වන නමුත්[6] විනිශ්චිත නඩු තීන්දු මගින් පෙන්නුම් කෙරෙන්නේ වෙන්වීම අපේක්ෂා කරන පාර්ශවය විත්තිකරුත් සමඟ තවදුරටත් එක්ව විසීම භයානක සහ දැරිය නොහැකි බව ඔප්පු කළ යුතු බවත් එසේම එම තත්ත්වය විත්තිකරුගේ නීති විරෝධී ක්‍රියාවන් තුළින් උද්ගත වූ බවත් පෙන්විය යුතු බවයි.[7]

4. අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන් සහ නිසි සැලකිල්ල පිළිබඳ සංකල්පය

1992 දී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මුලිනුපුටා දැමීමේ කමිටුව විසින් සාමාන්‍ය නිර්දේශ 19 ස්ථිර කරනු ලැබූ අතර එමගින් කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වය මානව හිමිකම් උල්ලංඝණයක් ලෙස අර්ථ දක්වන ලදී. එමගින් අවධාරණය කරනු ලැබුයේ පුද්ගලික ප්‍රචණ්ඩත්වයක් පිළිබඳව සිදුවීමක් වැළැක්වීමට හෝ එකී ප්‍රචණ්ඩත්වය සිදුවුණි නම් එය පිළිබඳව නිසි පරීක්ෂණයක් පවත්වා වරදකරුවන්ට දඬුවම් පැමිණවීමට නිසි සැලකිල්ලක් නොදක්වන්නේ නම් එකී පුද්ගලික ක්‍රියාවට රජය ද වගකිව යුතු බවයි.[8] මෙම කමිටුව කාන්තාවට ලිංගිකත්වය පදනම් කරගෙන සිදු කෙරෙන ප්‍රචණ්ඩත්වයෙන් සක්‍රියව

---

[5] *1907 අංක. 19 දරණ විවාහ (සාමාන්‍ය) ආඥා පනත,* 19 වගන්තිය.

[6] 1977 අංක. 20 දරණ පනතින් සංශෝධිත *සිවිල් නඩු විධාන පනත,* 608 වගන්තිය.

[7] හුසේන්. ඉහත සඳහන් කෘතිය, 13 පිට.

[8] පොදු නිර්දේශ 19(9), 11 වැනි සභාවාරය, 1992, වෙබ් ලිපිනය - http://www.un.org/womenwatch/daw/cedaw/recommendations/recomm.htm#recom19.

රැකගැනීම සඳහා රජයක් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී. ඒවාට ඇතුළත් වන්නේ:

- එලදායී නෛතික ක්‍රමවේදයන් එනම්, දඬුවම් ලබාදීම, සිවිල් නීති සහන, වන්දි ලබාදීම් යනාදිය මගින් සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ගෙන් කාන්තාවන් ආරක්ෂා කිරීම මෙකී ප්‍රචණ්ඩත්වයට පවුල තුළ සිදුවන හිරිහැර හා ප්‍රචණ්ඩත්වය සහ රාජකාරි ස්ථානයේදී ලිංගික ප්‍රහාරයන් සහ ලිංගික හිංසනයන් සිදුකිරීම.
- නිවාරණාත්මක ක්‍රමවේදයන් එනම්, කාන්තාව සහ පුරුෂයන්ගේ කාර්යභාරයන් සහ තත්ත්වය පිළිබඳව සමාජය තුළ ඇති ආකල්ප වෙනස් කිරීම අරමුණු කරගත් ජනතාව දැනුවත් කිරීම් සහ අධ්‍යාපන වැඩසටහන් යනාදිය පැවැත්වීම.
- ආරක්ෂක ක්‍රමවේදයන් එනම්, ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ හෝ ගොදුරුවීමේ අවදානමක් ඇති කාන්තාවන්ට රක්ෂාවරණය, උපදේශනය සහ පුනරුත්ථාපනය පිළිබඳ උපකාර සහ ක්‍රියාකාරකම් ඇති කිරීම.

නිසි සැලකිල්ල නැමැති සංකල්පය අන්තර් ඇමරිකානු මානව හිමිකම් අධිකරණය විසින් ලබාදුන් වෙලාස්කුවේස් රොඩ්රිකුවේස්[9] නඩු තීන්දුව මගින් වර්ධනය කරන ලදී. රාජ්‍යයක යුතුකම් පිළිබඳ අන්තර්ජාතික ස්ථාවරය බලධාරී ලෙස පිළිඹිබු වන අර්ථකථනයක් ලබාදෙන මෙම නඩුතීන්දුව පුද්ගලික ක්‍රියාවක් පිළිබඳව රාජ්‍යයේ වගකීම හුවා දැක්වෙන වඩාත් වැදගත්ම මෙන්ම සුවිශේෂී තීරණයකි. නිසි සැලකිල්ල නැමති අවශ්‍යතාවය පුද්ගලික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන්ට ප්‍රමාණවත් පිළියම් ලබාදීමත්, ක්‍රියාත්මක කරලීමත් බලගන්වයි. ඒ අනුව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට දඬුවම් පැමිණවිය හැකි නෛතික රාමුවක් පැවතීම පමණක් ප්‍රමාණවත් නොවන අතර එවන් සිදුවීම් පිළිබඳ නිසි විමර්ශන සිදුකොට වරදකරුවන්ට දඬුවම් පැමිණවීම සඳහා ආණ්ඩුව වගබලා ගන්නා බව සක්‍රිය ලෙස තහවුරු විය යුතුය. නිසි සැලකිල්ල

---

[9] මානව හිමිකම් පිළිබඳ අන්තර් ඇමරිකානු අධිකරණය, 1988, Ser. C 4, 9 මානව හිමිකම් නීති සඟරාව 212 (1988) *අන්තර්ජාතික මානව හිමිකම් නීතිය, දේශපාලනය හා ඓතිහාසික වටිනාකම්* (ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාල මුද්‍රණාලය, 2000), ස්ටෙයිනර් සහ එල්ස්ටන් පිටු 881-887.

සංකල්පයේ පැවැත්ම මැන බැලිය හැකි සාධක නම් ප්‍රචණ්ඩත්ව වින්දිතයන් ආරක්ෂා කර ගැනීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ගයන් සහ පොලිසිය සහ අනෙකුත් රාජ්‍ය ආයතන විසින් එකී අපරාධ විමර්ශනය උදෙසා ගන්නා ක්‍රියාමාර්ග යනාදිය වේ.

5. ශ්‍රී ලංකාවේ 3 වන සහ 4 වන කාල පරිච්ඡේද වාර්තාවන් පිළිබඳ සීඩෝ කමිටුවේ සමාප්ති නිරීක්ෂණයන්[10]

සීඩෝ කමිටුව ශ්‍රී ලංකාවේ 3 හා 4 කාලපරිච්ඡේද වාර්තාවන් පිළිබඳ ස්වකීය සමාප්ති නිරීක්ෂණයන් ඉදිරිපත් කරමින් ශ්‍රී ලාංකික කාන්තාව මුහුණපාන බරපතල ගැටලුවක් ලෙස කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හඳුන්වා ඇත. විශේෂ නීති කෙටුම්පත් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන කමිටුව වැඩි අවධානයක් ලක්විය යුතු කරුණු ලෙස පෙන්වා දී ඇත්තේ විවාහය තුළ බිරිඳ දූෂණයට ලක්වීම දණ්ඩනීය වරදක් කළ යුතු බවත් ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පැමිණිලි සම්බන්ධව සක්‍රිය සහ සබුද්ධික ලෙස මැදිහත්වීමට පොලිසියට ඇති නොහැකියාව යනාදියත්ය. යුධ ගැටුම් පැවති ප්‍රදේශ වලදී කාන්තාවට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වයන් තීව්‍ර කර පෙන්නුම් කරන කමිටුව එකී වින්දිතයන්ව කාන්තා අයිතිවාසිකම් පිළිබඳව සහ එවැනි උල්ලංඝණය කිරීම් වලට ගත හැකි ප්‍රතිකර්ම පිළිබඳව දැනුවත් කිරීමට රජයට ඇති වගකීම පෙන්වා දී තිබේ.

6. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ කෙටුම්පත් කර ඇති පනත් කෙටුම්පත

6.1 අභිමතාර්ථ, අර්ථනිරූපණ සහ භාෂාව

ශ්‍රී ලංකාවේ කාන්තා සංවිධාන විසින් අඛණ්ඩව ගෙන ගිය දැනුවත් කිරීමේ ව්‍යාපාරයකින් පසු වර්ෂ 2004 නොවැම්බර් 19 දින ශ්‍රී ලංකා ආණ්ඩුව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළේය. මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ආණ්ඩුව සිදු කළ අගය කළ යුතු කාර්යයක් වුවත් එය ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටළුවේ සමස්ථය ග්‍රහණය කරගත් දෘෂ්ටියකින් ඉදිරිපත් වූවක්

---

10 වෙබ් ලිපිනය http://www.1umn.edu/humanrts/cedaw/srilanka2002.html.

ලෙස නොපෙනේ. පනත් කෙටුම්පතේ දීර්ඝ නාමය තුළින් එය 'ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ හෝ එයට බැඳුනු හා ඒ අනුසාරයෙන් මතුවන ඕනෑම ක්‍රියාවක් පිටුදැකීමේ' අභිප්‍රායෙන් ඉදිරිපත් කර ඇතැයි පැවසුවද එය ඉලක්ක කරගෙන තිබෙන්නේ ආරක්ෂා වීමේ නියෝග නිකුත් කිරීම ගැන පමණි. මෙහිදී සිහි තබා ගත යුතු තත්ත්වයක් නම් ආරක්ෂා වීමේ නියෝග සාමාන්‍යයෙන් නිකුත් කළ හැක්කේ පළමු ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව හෝ ක්‍රියාවන් කිහිපය සිදුවීමෙන් අනතුරුව බවයි. ඒ අනුව ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව අපරාධ වරදක් ලෙස දක්වනවාට අමතරව මෙම පනත් කෙටුම්පත තුළින් පෙනී යන්නේ එම ක්‍රියාව සිදුවූ පසු වින්දිතයාව ආරක්ෂා කරගැනීමේ ක්‍රමයකි. ඒ අනුව මෙම කෙටුම්පත තුළින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ප්‍රබල අපරාධයක්ය යන පණිවුඩය ලබා නොදේ.

ඊට අමතරව මෙම පනත් කෙටුම්පතේ ප්‍රතිපාදන පිළිබඳව සරල බසින් සිදු කෙරෙන පැහැදිලි කිරීමක් සපයා නොමැති අතර එමගින් එය පොදු මහජනතාවගෙන් දුරස්ථ වී ඇත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ඕනෑම පනත් කෙටුම්පතක් ඵලදායී වීමට නම් එහි අඩංගු ප්‍රතිපාදන පිළිබඳව මහජනයා දැනුවත්වීම ප්‍රචලිත වීමත්, පොදු අධ්‍යාපනයක් ලබාදීමත් පිළිබඳ ක්‍රියාකාරකම් පැවතිය යුතු අතර ඒ සඳහා පැහැදිලි සහ පොදු ජනතාවට තේරුම් ගත හැකි උපදෙස් මාලාවක් පනත් කෙටුම්පත සමඟ නිකුත් කළ යුතුය.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව පත්කර ඇති එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිතවරිය ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවන් පිළිබඳව යොදා ගත හැකි පුළුල්ම නිර්වචනය යෙදිය යුතු යැයි නිර්දේශ කර ඇත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පනත් කෙටුම්පත ඉහත කී පරීක්ෂණයෙන් අසමත් වන අතර ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් යන්න අර්ථනිරූපණය කර ඇත්තේ 'I උපලේඛනයේ වරදක් ලෙස දක්වා ඇති ක්‍රියාවක්'[11] සහ 'හැඟීම් මඟින් අපයෝජනය කිරීමක්'[12] ලෙසය. I උපලේඛනයේ අඩංගු වන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ XVI පරිච්ඡේදයේ සඳහන් සියලු වැරදි එයට බරපතල තුවාල සිදු කිරීම සහ ගබ්සා කිරීම ද ඇතුළත් වන අතර 327 වගන්තිය 'සාපරාධී බියගැන්වීම' හා බලෙන්

[11] *කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂිකාවගේ වාර්තාව,* රධිකා කුමාරස්වාමි, E/CN 4/1997/47, 1997 පෙබරවාරි 12, 18 පිට.

[12] *ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත,* 22 වගන්තිය.

ලබාගැනීම අයත් වේ. ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ පුළුල් අර්ථනිරූපණයක් සිදු කරනු වෙනුවට පවතින දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන කිහිපයක් යළි ඇතුල් කිරීම තුළින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සාපරාධී වරදක් ලෙස හඳුන්වා දීමට ඇති නොකැමැත්ත පිළිබිඹු කරයි.

6.2 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වළක්වා ගැනීමට ගත හැකි අනෙකුත් පියවර

ඉහතදී සඳහන් කර ඇති පරිදි මෙම පනත් කෙටුම්පත ඉලක්ක කරගෙන සිටින්නේ සුරක්ෂිත කිරීමේ නියෝග ගැන පමණක් වන හෙයින් එය ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට හා එකී ප්‍රචණ්ඩත්ව වින්දිතයන් රැකගැනීමට වැදගත් වන අනෙක් කරුණු නොසලකා හරියි. උදාහරණයක් වශයෙන් මෙම කෙටුම්පත වෛද්‍ය සේවා සපයන අයවලුන්ට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන් පොලිසියට දැනුම්දීම අනිවාර්ය කර නොමැත. එසේම ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් පිළිබඳ පැමිණිල්ලක් ලැබුණු විට ක්‍රියා කළ යුතු අන්දම පිළිබඳව පොලිසියට මාර්ගෝපදේශයක් මෙමහින් සපයා නැත. මේ සම්බන්ධයෙන් කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් මුලිනුපුටා දැමීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය අනුගමනය කළ යුතුය. මෙම ප්‍රකාශනය මහින් අපරාධ වින්දිතයන්ට සහනය සැලසීම සඳහා ප්‍රමාණවත් නීති හා ක්‍රියාමාර්ග නීතිගත කිරීමට අමතරව රාජ්‍යයන් පහත සඳහන් ආකාරයෙන් ක්‍රියාත්මක විය යුතු යැයි පවසයි.

- කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වය සහමුලින්ම ඉවත් කිරීමට සුදුසු ජාතික සැලැස්මක් සංවර්ධනය කිරීම.
- විනිසුරුවරුන්, පොලිසිය සහ නීතිඥවරුන් පුහුණු කිරීම.
- ප්‍රචණ්ඩත්ව වින්දිතයන් සඳහා උපකාරක සේවා (රැකබලා ගැනීමේ මධ්‍යස්ථාන, නීතිමය සහ මනෝ වෛද්‍ය උපදේශන සේවා) ඇති කිරීම.[13]

පනත් කෙටුම්පත මහින් අතෘප්තියට පත් පාර්ශවයට සිවිල් හෝ අපරාධ නඩු පැවරීමට ඇති අයිතිය ඉවත් කර නොමැති වුවද[14] ව්‍යවස්ථාදායකය

[13] කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මුලිනුපුටා දැමීම පිළිබඳ ප්‍රකාශනය, 4 වගන්තිය පරිශීලනය කළ හැකි වෙබ් අඩවිය: http://www.un.org/documents/ga/res/48/a48r104.htm.

[14] ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළකීමේ පනත 20, වගන්තිය.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ එක් දෘෂ්ටිකෝණයකින් පමණක් බලා ඇති බව පැහැදිලිය. එනම්, සුරක්ෂිත කිරීමේ නියෝග නිකුත් කිරීම පමණි. එය අපරාධ හා සිවිල් නීති සහන ද කෙටුම්පත තුළට ඇතුළත් කිරීම හා එය පුළුල් පරාසයකින් යුක්තවීම යන කරුණු නොමැතිව පවතී. ව්‍යවස්ථාදායකයට ඉලක්ක කරගත යුතුව තිබුණු හොඳම ප්‍රතිපාදන නම්:

- යළි යළිත් සිදුවූ අපරාධ, කෲර පහරදීම් හා ආයුධ භාවිතයෙන් සිදු කළ ප්‍රචණ්ඩත්වයට ලබාදෙන දඬුවම් වැඩි කිරීම
- දඬුවම් දීම පිළිබඳ පැහැදිලි මාර්ගෝපදේශයන්
- ගැටුම් මැදිහත් වීමේ මධ්‍යස්ථාන, ක්ෂණික වෛද්‍ය රැකවරණ වැනි හදිසි සේවා
- වින්දිතයන්ට හා අපරාධකරුවන්ට ප්‍රතිකාර

6.3 ස්වීතත්‍වය

පනත් කෙටුම්පතට අනුව අපරාධයට භාජනය වූ පුද්ගලයා හෙවත් අතෘප්තියට පත් පාර්ශවයට හෝ ඇය වෙනුවෙන් පොලිස් නිලධාරියෙකුට සුරක්ෂිත කිරීමේ නියෝගයක් සඳහා අයදුම් කළ හැකිය.[15] අනතුරක් සිදුවේ යැයි බියෙන් හෝ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් එවන් අයැදුමක් නොකරන මෙසේ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වී ඇති අයෙකු වෙනුවෙන් වෙනත් අයෙකුට සුරක්ෂිත කිරීමේ නියෝගයක් සඳහා අයදුම් කිරීමට ප්‍රතිපාදන පනත් කෙටුම්පතකින් සපයා දී නොමැත. ප්‍රචණ්ඩත්ව වින්දිතයන්ගේ යහපත උදෙසා මෙසේ ඔවුන් වෙනුවෙන් වෙනත් අයෙකුට සුරක්ෂිත කිරීමේ නියෝග සඳහා අයදුම් කිරීමේ ඉඩ ප්‍රස්ථාව ලබාදීම අත්‍යවශ්‍ය වී තිබේ.

6.4 දණ්ඩනයන් සහ තහනම් කිරීම්

පනත් කෙටුම්පතේ ක්‍රියාත්මක කරවීම් අඩංගු කොටසේ පවතින දණ්ඩනයන් දුර්වල අතරම ඒවා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිටුදැකීමට හැකියාවක් පවතින ඒවා නොවේ. උදාහරණයක් වශයෙන් පනත්

---

15 එම, 2 වගන්තිය.

කෙටුම්පතේ සුරක්ෂිත කිරීමේ නියෝගයකට අවනත නොවන අයෙකුට විරුද්ධව අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කිරීමේ විධිවිධාන නොමැත. මේ නිසා සුරක්ෂිත කිරීමේ නියෝගයක් හෝ එවැනි අතුරු නියෝගයක් නිකුත් කරන සෑම අවස්ථාවකම අධිකරණය විසින් අදාළ වගඋත්තරකරු අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් ද නිකුත් කර, ඉහතකී නියෝගයේ අඩංගු කිසියම් තහනමක්, කොන්දේසියක්, වගකීමක් හෝ නියෝගයක් පිළිපැදීම ප්‍රතික්ෂේප කිරීමකට යටත්ව එකී වරෙන්තුව අත්හිටුවීමට සිදුවේ. මෙම වරෙන්තුව සුරක්ෂිත කිරීමේ නියෝගය ක්‍රියාත්මක වනතෙක් හෝ එය ඉවත දමන තෙක් බලාත්මක වේ. ඒ අනුව සුරක්ෂිත කිරීමේ නියෝගයක් හෝ ඒ සම්බන්ධ අතුරු නියෝගයක් උල්ලංඝණය වීමකදී නැවත වරක් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමේ ක්‍රියාවලියෙන් අතෘප්තියටපත් පාර්ශවය නිදහස් වීමක් අත්හිටවූ වරෙන්තුව මඟින් සිදුවේ. මෙම අත්හිටවූ වරෙන්තුවක් නිකුත් කර ඇති අවස්ථාවක සුරක්ෂිත කිරීමේ නියෝගයක් හෝ එම අතුරු නියෝගයක් උල්ලංඝණය කිරීමක් සිදුවී ඇති විට පොලිසියට වහාම වගඋත්තරකරු අත්අඩංගුවට ගැනීමේ හැකියාවක් පවතී. ඒ අනුව අතෘප්තියට පත් පුද්ගලයාට වහාම ලබාගත හැකි සහනයක් පවතී. මෙම ක්‍රියාවලිය යම් තරමකට "කැකිල්ලේ නඩු තීන්දුවක" ස්වරූපය පෙන්වනු ලැබුවද, ශ්‍රී ලංකාව තුළ තවමත් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය නීති රාමුවෙන් පිටස්තර වූ පුද්ගලික ක්‍රියාවල් ලෙස සලකන තත්ත්වය තුළ සහ වින්දිතයන්ට අසංවේදී සහ ආන්තික නීති ක්‍රමය තුළින් සහන ස්වල්පයක් පමණක් ලබා ගැනීමට ඉඩ ලැබී ඇති තත්ත්වයක් තුළ මෙවැනි පිළියමකින් පමණක් වින්දිතයන්ගේ ආරක්ෂාවරණය තහවුරු කර ගැනීමට හැකි වනු ඇත.

6.5 පොදු කරුණු

මෙම පනත් කෙටුම්පත වගඋත්තරකරුගේ සහ ඉල්ලුම්කරුගේ පුද්ගලිකත්වය සුරක්ෂිත කිරීමට ප්‍රතිපාදන සපයා නැත. වින්දිතයන් සිදුවීම පිළිබඳ ප්‍රචාරයක් සිදුවීමට බියෙන් හෝ ඔවුන්ගේ සමාජ වටපිටාව තුළ ලැජ්ජාවට පත්වේ යැයි සැකයෙන් මෙම අපරාධ හෙළිදරව් කිරීමෙන් වැළකී සිටින තත්ත්වයක් තුළ, මේ සම්බන්ධ නඩු විභාග මහජනයාට විවෘත නොවන අයුරින් පැවැත්වීම සහතික කිරීමත්, පැමිණිලිකාරියගේ සහ වගඋත්තරකරුගේ පුද්ගලිකත්වය හෙළිදරව් කරන පුද්ගලයන්ට හෝ මාධ්‍ය වලට දඬුවම් පැමිණවීමේ ක්‍රමයක් ද පැවතිය යුතුයි.

මහජන අධ්‍යාපනය සහ මහජන දැනුවත්වීම් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සහ වින්දිතයන් ආරක්ෂා කරගැනීම උදෙසා විශාල කාර්යභාරයක් සිදුකරන හෙයින් සෞඛ්‍ය අමාත්‍යාංශය, වනිතා කටයුතු අමාත්‍යාංශය වැනි රාජ්‍ය ආයතන වලට මේ පිළිබඳව මහජන අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කරලීම අනිවාර්ය කිරීමේ ප්‍රතිපාදන පනත් කෙටුම්පතේ අඩංගු විය යුතුය.

7. කාන්තා අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත

1992 දී සම්මත කර ගන්නා ලද කාන්තා ප්‍රඥප්තිය තුළින් දේශපාලන හා සිවිල් අයිතිවාසිකම්, පවුල තුළ අයිතිවාසිකම්, ආර්ථික ක්‍රියාකාරකම් වලට සහ එහි ප්‍රතිලාභ වලට ඇති අයිතිය, අධ්‍යාපනය සහ පුහුණුවට ඇති අයිතිය, සෞඛ්‍ය අයිතිවාසිකම්, සමාජය තුළ වෙනස් කොට සැලකීමෙන් සහ ලිංගිකත්වය මත ප්‍රචණ්ඩ ක්‍රියා වලට භාජනය වීමෙන් වැළකීමට ඇති අයිතිය පිළිබඳව සඳහන් කර ඇත. එහි II කොටස තුළින් අරමුණු කරගෙන ඇත්තේ කාන්තාව පිළිබඳව ජාතික කමිටුවක් ඇති කිරීමය. මෙම ප්‍රඥප්තිය නෛතික බැඳීමක් ඇති කරන ලියවිල්ලක් නොවූවද එමගින් කාන්තා අයිතීන් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනයට රජයක් ගත යුතු පියවර හෙළිදරව් කරයි. කාන්තාව පිළිබඳව වූ ජාතික කමිටුව මගින්, වෙනත් කටයුතු අතර, ස්ත්‍රී/පුරුෂ පදනම මත වෙනස් කොට සැලකීම් පිළිබඳ පැමිණිලි අදාළ බලධාරීන් වෙත යොමු කිරීම, ඔවුන් විසින් ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග නිරීක්ෂණය කිරීම, කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත වීම පිළිබඳව නීති සම්පාදනයේ සිදුවන සංවර්ධනය අධ්‍යයනය කිරීම යනාදිය සිදු කෙරෙනු ඇත. කාන්තා අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත මෙම ජාතික කමිටුව ජාතික කාන්තා කොමිෂන් සභාවක් දක්වා වැඩි බලතල සමඟ වර්ධනය කිරීම උදෙසා ආණ්ඩුව ගනු ලැබූ පියවරකි.

වර්ෂ 2004 දී වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත මහජනතාවගේ අවධානය පිණිස යොමු කර ඒ පිළිබඳව අදහස් සහ යෝජනා ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. මෙම පනත් කෙටුම්පත අංශ ගණනාවක අවධානය දිනාගන්නා ලද හෙයින් වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විවිධ සංවිධාන සහ පුද්ගලයන්ගෙන් සමන්විත යාකච්ඡාවක් කැඳවූ අතර එහිදී පනත් කෙටුම්පතට සැලකිය යුතු සංශෝධන රැසක් යෝජනා කෙරුණි. ඒ අනුව මෙම පනත් කෙටුම්පත විමර්ශනය කිරීමට

තාක්ෂණික කමිටුවක් පත් කරන ලදී. කාන්තාව පිළිබඳ ජාතික කමිටුව විසින් ඉහත කී කමිටුවට මහාචාර්ය සාවිත්‍රි ගුණසේකර, ආචාර්ය මරියෝ ගෝමස්, මනෝරි මුත්තෙට්ටුවේගම මිය, කුමුදිනී සැමුවෙල් මිය, අයිරීන් සිරිවර්ධන මිය සහ ආචාර්ය දීපිකා උඩගම යන අය පත් කරන ලදී.[16] වර්ෂ 2004 නොවැම්බර් 10 දින ඉහත කී කමිටුව සමඟ පැවති සාකච්ඡාවේදී ජාතික කාන්තා කොමිෂන් සභාව විසින් සංශෝධිත පනත් කෙටුම්පත අනුමත කරන ලදී.[17] මෙම පරිච්ඡේදය පහත කොටස තුළින් පනත් කෙටුම්පත පිළිබඳව කෙටි හැඳින්වීමක් සිදුකර ඉන්පසුව 2004 පෙබරවාරි සහ වර්තමාන (එනම් 2004 නොවැම්බර්) කෙටුම්පත් පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් සිදු කිරීම අපේක්ෂා කෙරේ.

7.1 පනත් කෙටුම්පතේ අරමුණු

පනත් කෙටුම්පතේ අරමුණු එහි 2 වගන්තිය මගින් දක්වා ඇත. පෙබරවාරි කෙටුම්පතේ 2 වගන්තිය නොවැම්බර් කෙටුම්පතේ 2 වගන්තියට වඩා පටු සීමාවක් ඇතිකර තිබේ. පෙබරවාරි කෙටුම්පතේ 2 වගන්තියේ සඳහන් කර ඇත්තේ එකී වගන්තියේ සඳහන් කර ඇති අයිතීන් ආරක්ෂා කිරීම ක්‍රියාත්මක කිරීමත් පනතේ උපලේඛනයේ දක්වා ඇති ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තියටත්, ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු වී ඇති කාන්තා අයිතීන් පිළිබඳ සම්මුතීන් වලට අනුකූලව කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීම, වර්ධනය කිරීම හා පැතිරවීම මෙම පනත් කෙටුම්පතේ අභිමතාර්ථය බවයි. වර්තමාන කෙටුම්පත කෙසේ වුවත් මීට වඩා පුළුල් ප්‍රවේශයක් ලබාදෙයි. වත්මන් කෙටුම්පතේ 2 වගන්තිය මගින් පනතේ අරමුණු ලෙස හඳුන්වා දී ඇත්තේ:

i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කාන්තාවන්ට සහතික කර දී ඇති සමානාත්මතාවය හා වෙනස් කොට නොසැලකීමේ මූලික අයිතිවාසිකම් ප්‍රතිෂ්ඨාපනය සහ ක්‍රියාත්මක කරලීම.

ii. කාන්තා අයිතිවාසිකම් පිළිබඳව ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති ජාත්‍යන්තර සම්මුතීන් සහ අනෙකුත් අන්තර්ජාතික ප්‍රමිතීන් තුළින් මතුවන වගකීම් සම්පූර්ණ කිරීමට කැපවීම.

---

16 *2004 පෙබරවාරි කාන්තා අයිතිවාසිකම් පනත් කෙටුම්පත පිළිබඳව තාක්ෂණික කමිටුවේ වාර්තාව*, 2004 නොවැම්බර් 16.

17 එම.

iii. 1993 කාන්තා ප්‍රඥප්තියේ හඳුන්වා දී ඇති අයිතීන් ආරක්ෂා කිරීමට කැපවීම.

iv. මෙම පනතින් පිළිගෙන ඇති අයිතීන් ගරු කිරීමට, වර්ධනය කිරීමට, ප්‍රචලිත කිරීමට හා ආරක්ෂා කිරීමට රජයේ සෑම ආයතනයක් තුළින්ම වගබලා ගැනීම ස්ථිර කිරීම.

v. මෙම පනත මගින් හඳුනාගෙන ඇති අයිතීන් ගරු කිරීමට වර්ධනය කිරීමට ප්‍රචලිත කිරීමට හා සුරක්ෂිත කිරීමට අධිකරණයෙන් ඉල්ලා සිටීම.

vi. මෙම පනත මගින් හඳුනාගෙන ඇති අයිතීන් ගරු කිරීමට, වර්ධනය කිරීමට, ප්‍රචලිත කිරීමට හා සුරක්ෂිත කිරීමට අනෙකුත් ආයතන සහ බලධාරීන්ගේ ඇති කැපවීම.

vii. මෙම පනත මගින් හඳුනාගෙන ඇති අයිතීන් සපුරාලීමට හා ඒවාට ගරු කිරීම, වර්ධනය කිරීම, ප්‍රචලිත කිරීම හා සුරක්ෂිත කිරීමේ අභිලාෂයෙන් ජාතික කාන්තා කොමිෂන් සභාවක් පිහිටුවීම.

7.2 කොමිෂන් සභාවේ සාමාජිකයෝ

මෙම පනත් කෙටුම්පතින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත[18] ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 9 දෙනෙකු[19]ගෙන් යුත් කාන්තාව පිළිබඳ කොමිෂන් සභාවක් පිහිටුවා ඇත. පෙබරවාරි කෙටුම්පත තුළ පැවතියේ ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය මත ඇමතිවරයා විසින් මෙම කොමිසමේ සාමාජිකයන් පත් කරන බවයි.[20] මෙම තත්ත්වය තුළ දේශපාලනීකරණය සිදුවීම වැළැක්වීමේ අරමුණින් වඩාත් පාරදෘශ්‍ය ලෙස සහ පත්කිරීම් අත්තනෝමතික නොවීම සඳහා මෙම සංශෝධනය ගෙන එන ලදී. තවදුරටත් ප්‍රකාශ කළ යුත්තේ, මෙම සාමාජිකත්වයට පත්වන අය සුදුසුකම් මත පමණක් පත්වීම සඳහාත්, සෑම විටකම කොමිෂන් සභාව, එයට අවශ්‍ය දක්ෂතා සහ පසුබිමක් සහිත සාමාජිකයන්ගෙන් යුත් ආයතනයක් වීම සහතික කිරීමටත් වර්තමාන කෙටුම්පතේ 4(ආ) වගන්තිය පැහැදිලිව දක්වා

---

18 4(අ) වගන්තිය.

19 එම.

20 කාන්තා අයිතිවාසිකම් පනත් කෙටුම්පත (පෙබරවාරි), 4(2) වගන්තිය.

සිටින්නේ කොමිෂන් සභාවේ සාමාජිකයන් අදාළ ක්ෂේත්‍රවල ප්‍රවීනයන් විය යුතු අතර කාන්තා අයිතිවාසිකම් සහ ස්ත්‍රී/පුරුෂ සමානාත්මතාවය වර්ධනය කිරීම උදෙසා ක්‍රියාකාරී දායකත්වයක් සැපයූ පුද්ගලයන් විය යුතු බවයි. අදාළ ක්ෂේත්‍රයන් ලෙස දක්වා ඇත්තේ, නීතිය, සංවර්ධනය, ආර්ථික විද්‍යාව, පරිසරය සහ ජනමාධ්‍ය යන පරාසයේ විහිදුණු ක්ෂේත්‍රයන්ය.

අතීතයේදී මානව හිමිකම් කොමිෂන් සභාව සහ රාජ්‍ය භාෂා කොමිසම වැනි ආයතන වල කාර්යක්ෂම සහ ඵලදායී ක්‍රියාකාරීත්වයට සිදුවූ බාධාවන් සලකා[21] මෙම කොමිසමේ සාමාජිකයන්ගෙන් අවම වශයෙන් තුන් දෙනෙකුවත් පූර්ණ කාලීන විය යුතු යැයි නියම කෙරී ඇත.[22]

පෙබරවාරි කෙටුම්පත අනුව කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ඉවත් කිරීමේ බලතල, ඇතැම් පදනම් මත, ඇමතිවරයාට පැවරී තිබුණි.[23] එවැනි ඉවත් කිරීමකින් පසු ඇමතිවරයාට වෙනත් අයෙකු එකී පුරප්පාඩුවට පත් කළ හැක.[24] එක් දේශපාලනික චරිතයකට මෙවැනි බලතල පැවරීම තුළින් කොමිසමේ ස්වාධීන සහ අපක්ෂපාතීභාවයට සිදුවිය හැකි හානිය සහ එතුළින් කොමිසම දේශපාලනිකව හැසිරවීමට ඇති ඉඩකඩ පිළිබඳව වැටහීමෙන් යුතුව වත්මන් පනත් කෙටුම්පත එවැනි ගැටළුවක් මතු නොවන අන්දමේ ආරක්ෂාකාරී ප්‍රතිපාදන යොදාගෙන ඇත. පනත් කෙටුම්පතේ 5 වැනි වගන්තිය අනුව ජනාධිපතිවරයා විසින් කොමිසමේ සාමාජිකයෙකු සුවිශේෂී හේතු මත එනම් අධිකරණයක් විසින් මානසික ආබාධිත යැයි තීරණය කර ඇති විටක[25] හෝ යහපත් චරිත ස්වභාවයට හානිදායක වන අන්දමේ අපරාධ වරදකට වරදකරු වූ විටක[26] ඉවත් කළ හැකිය. වෙනත් අවස්ථාවකදී ඉවත් කිරීමේ ක්‍රමවේදය නම් පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීන් ද ඇතුළුව සාමාන්‍ය බහුතරයක් විසින් තහවුරු කළ අවකල් ක්‍රියාවක් හෝ නොහැකියාව මත යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින්

---

21 අම්බිකා සත්කුනනාදන්, "මානව හිමිකම් කොමිෂන් සභාව", *ශ්‍රී ලංකාව: මානව හිමිකම් තත්ත්වය 2000* (කොළඹ: නීතිය හා සමාජ භාරය, 2000).

22 පෙබරවාරි කෙටුම්පත, 4(ඇ) වගන්තිය.

23 එම., 6(1)(අ)-(ඇ) වගන්තිය.

24 එම., 6(2) වගන්තිය.

25 5(1)(අ)(4) වගන්තිය.

26 5(1)(අ)(4) වගන්තිය.

ජනාධිපතිවරයාට ඉදිරිපත් කර ඔහු පාර්ලිමේන්තුව අමතා කරන නියෝගයක් මගින් සාමාජිකයෙකු තනතුරින් ඉවත් කළ හැක.[27] එම වගන්තිය වැඩිදුරටත් දක්වන්නේ එවැනි යෝජනා සම්මුතියක් පිළිබඳ දැන්වීමක් පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් එකකගේ (1/3) වත් අත්සනින් හා අවකල් ක්‍රියාව හෝ නොහැකියාව පිළිබඳ සවිස්තර වාර්තාවක් ද සමඟ නොමැත්තේ නම් එවැනි දැන්වීමක් කථානායකවරයා බාරගැනීම සහ එය න්‍යාය පුස්තකයට ඇතුළත් කිරීම නොකළ යුතු බවයි. විශේෂයෙන් සඳහන් කළ යුත්තේ කොමිසමේ සාමාජිකයෙකු ඉවත් කිරීමේ කාර්ය පටිපාටිය ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ විනිසුරුවරයෙකු ඉවත් කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය බවයි.[28]

7.3 කොමිෂන් සභාවේ බලතල සහ ක්‍රියාකාරකම්

8 වැනි වගන්තිය අනුව කොමිෂන් සභාවට පහත සඳහන් බලතල පවතී:

(අ) කාන්තා අයිතිවාසිකම් උල්ලංඝණයක් හෝ එසේ වීමට අත්‍යාසන්න සිදුවීමක් පිළිබඳව පරීක්ෂණ සිදු කිරීම සහ වාර්තා කැඳවීම.

(ආ) කාන්තා අයිතිවාසිකම් සම්බන්ධව ප්‍රසිද්ධ පරීක්ෂණ පැවැත්වීම.

(ඇ) කාන්තා අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් හෝ එසේ වීමට අත්‍යාසන්න සිදුවීමක් පිළිබඳව විභාග වෙමින් තිබෙන කවර හෝ අධිකරණයකට එකී අධිකරණයේ අවසරය ඇතිව එකී විභාගයට මැදිහත්වීම.

(ඈ) කාන්තාව සවිබල ගැන්වීමට හා කාන්තා අයිතීන් වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඉ) ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම.

(ඊ) ශ්‍රේෂ්ඨාධිකරණය හෝ වෙනයම් අධිකරණයක් විසින් කොමිසමට යොමු කරන කිසියම් කරුණක් පිළිබඳව අධිකරණය නියම කරන පියවර ගැනීම.

---

[27] 5(1)(ආ) වගන්තිය.

[28] 5(2) වගන්තිය.

(උ) අතෘප්තියට පත් පාර්ශවයක් විසින් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේදී දරන්නට සිදුවිණි යැයි සාධාරණව හැඟෙන කිසියම් මුදලක් ඇයට ගෙවන ලෙස නියම කිරීමට කොමිසමට ඇති පූර්ණ අභිමතය.

(ඌ) තමන්ට අදාළ ක්ෂේත්‍ර තුළ පනතින් පිළිගෙන ඇති කාන්තා අයිතිවාසිකම් හා කාන්තා ප්‍රඥප්තියේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කරලීම සඳහා අදාළ ආයතන ගෙන ඇති පියවර සම්බන්ධව ඔවුන්ගෙන් වාර්ෂික වාර්තා ලබාගැනීම.

(එ) කොමිසමේ ක්‍රියාකාරකම් සහ එහි අරමුණු සපුරා ගැනීම් පිළිබඳ වාර්තාවක් වසරකට එක් වරක්වත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

කොමිෂන් සභාවේ කාර්යභාරයන් අතරට අයත් වන්නේ; කාන්තා අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් හෝ එසේ වීමට අත්‍යාසන්න වූ විටක ඒ පිළිබඳව විමසීමට හා පරීක්ෂණ කටයුතු පැවැත්වීමටත්, ඒ සඳහා අවශ්‍ය නීතිමය සහන හෝ සමථකරණයන් සිදුකිරීමත්;[29] ව්‍යවස්ථාදායකය පිළිබඳ නිරීක්ෂණය හා තක්සේරු කිරීම් කිරීම සහ රාජ්‍ය ආයතන කාන්තා අයිතිවාසිකම් පිළිබඳව අනුගමනය කරන ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල සොයා බැලීමත්;[30] කාන්තා අයිතිවාසිකම් ගරු කිරීම, ප්‍රචලිත කිරීම, ආරක්ෂා කිරීම, වර්ධනය කිරීම සහ සම්පූර්ණ කිරීම පිළිබඳ කාරණා වලදී රජයට උපදෙස් ලබාදීමත්;[31] අන්තර්ජාතික මූලධර්ම වලට එකඟ වන පරිදි ජාතික නීතීන් හා ප්‍රතිපත්තිවල සිදුවිය යුතු වෙනස්කම් පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීමත්;[32] පැමිණිලි පිළිබඳව කටයුතු කිරීම සඳහා අදාළ ආයතන, බලධාරීන් සහ සංස්ථාවන් සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීමත්, එතුළින් පොදු මූලධර්ම ගොඩනඟා ගැනීමට කටයුතු කිරීමත්;[33] අන්තර් ජාතික සම්මුතීන්ට අනුව රාජ්‍යයේ ක්‍රියාකාරකම් සිදුවන ආකාරය නිරීක්ෂණය කිරීමත්;[34] සහ කාන්තා අයිතිවාසිකම් පිළිබඳව පුද්ගලික

[29] 7(ii) වගන්තිය.

[30] 7(iii)(අ) වගන්තිය.

[31] 7(iii)(ආ) වගන්තිය.

[32] 7(iii)(ඉ) වගන්තිය.

[33] 7(iii)(ඇ) වගන්තිය.

[34] 7(iii)(උ) වගන්තිය.

ව්‍යාපාරික අංශ සහ අනෙකුත් රජයේ නොවන ආයතනවල ක්‍රියාකලාපයන් සහ ප්‍රතිපත්ති නිරීක්ෂණය, තක්සේරු කිරීමත්[35] යනාදියයි.

විමර්ශන කටයුතු සඳහා කොමිෂන් සභාවට ඇති බලතල වැඩිදුරටත් තහවුරු වන්නේ එයට ඇති සාක්ෂිකරුවෙකුට සිතාසි නිකුත් කිරීමේ බලයත්,[36] එසේ වූ විටක කොමිසම හමුවේ පෙනී නොසිටින අයට විරුද්ධව කටයුතු කිරීමට කොමිසමට ඇති බලයත්[37] සහ සාක්ෂි ඉදිරිපත් නොකිරීමට විරුද්ධව පියවර ගැනීමට ඇති හැකියාවත්[38] තුළිනි.

පෙබරවාරි කෙටුම්පතට ඉදිරිපත් කළ බොහෝ ප්‍රගතිශීලී සංශෝධන තුළින් කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වත්මන් පනත් කෙටුම්පත, කාන්තා අයිතිවාසිකම් ප්‍රචලිත කිරීමට හා සුරක්ෂිත කිරීමට නිර්මාණය කරගන්නා ලද ව්‍යවස්ථාවක් යන්න තහවුරු වී ඇත. උදාහරණයක් වශයෙන් පෙබරවාරි කෙටුම්පතට අනුව අතෘප්තියටපත් අයෙකුට හෝ ඇය වෙනුවෙන් පෙනී සිටින අයෙකුට කොමිසම හමුවේ පැමිණිලි කිරීම සඳහා දැරිය යුතු වූ සාධාරණ මුදලක් වන්දි වශයෙන් ලබා ගැනීමට කොමිසමෙන් නියෝගයක් ලබා ගැනීමට හැකියාවක් නොතිබුණි. මෙම තත්ත්වය වත්මන් කෙටුම්පතින් නිවැරදි කර ඇති ,අතර, කෙටුම්පතේ 8(උ) වගන්තිය අනුව එවැනි වන්දියක් ගෙවීමට කොමිෂන් සභාවට බලය ඇත.

වර්තමාන කෙටුම්පතේ 8(2) වගන්තිය මගින් කොමිසම විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුට කාන්තාවක් අධිකරණ නියෝගයකින් හෝ අන්‍යාකාරයකින් රඳවා තබා ඇති ඕනෑම ස්ථානයක් නිරීක්ෂණය කිරීමටත්, එසේ රඳවා තබාගෙන ඇති තැනැත්තියගෙන් රඳවා තබා ගැනීමේ තත්ත්වය හා අපහසුතා පිළිබඳ විස්තර ලබා ගැනීම සඳහා පරීක්ෂණයක් පැවැත්වීමට හෝ තොරතුරු ලබා ගැනීමට බලය පවරා ඇත. මෙම බලය මානව අයිතිවාසිකම් කොමිෂන් සභාවට ලබා දී ඇති බලයට සමානුරූපී වන අතර එමගින් රඳවා තබා ගැනීමේදී කාන්තා අයිතිවාසිකම් උල්ලංඝණයවීම් වළක්වා ගැනීමට කොමිසමට මහෝපකාරී වේ.

---

35 7(iv) වගන්තිය.

36 *කාන්තා අයිතිවාසිකම් පනත් කෙටුම්පත*, II උපලේඛනය, 1(ඇ) වගන්තිය.

37 එම., II උපලේඛනය, 18 වගන්තිය.

38 එම., II උපලේඛනය 18(2)(ඇ) වගන්තිය.

පරීක්ෂණ සිදුකිරීම සම්බන්ධව කොමිෂන් සභාවට පවරා ඇති බලතල සැලකිය යුතු ප්‍රමාණයේ වන අතර එතුළින් කොමිෂන් සභාවට කාන්තා අයිතිවාසිකමක් උල්ලංඝණය වීමක් හෝ එසේ වීමට අත්‍යාසන්න වීමක් පිළිබඳව ලැබෙන පැමිණිල්ලක් හෝ එය විසින්ම සිදු කරනු ලබන විමර්ශනයක් සිදු කිරීමට හැකියාව ඇත.[39] එසේම විශේෂයෙන් සැලකිය යුත්තේ කොමිෂන් සභාවට තමන්ගේ උවමනාව මත කෙනෙක් සිදු කරන පැමිණිලි[40] පමණක් නොව, වෙනත් අයෙකුගේ යහපත පිණිස කිසිවෙකු කරන පැමිණිලිත්,[41] කිසියම් ජන කොටසක හෝ කණ්ඩායමක සාමාජිකයෙකු ලෙස එකී අයගේ උවමනාවන් වෙනුවෙන් කරන පැමිණිලිත්,[42] මහජන යහපත තකා කිසිවෙකු කරන පැමිණිලිත්,[43] සහ කිසියම් සංගමයක් එහි සාමාජිකයෙකුගේ යහපත පිණිස සිදු කරන පැමිණිලිත්[44] බාරගත හැක. මෙම වගන්තිය ස්ථිත්‍යය පිළිබඳ සංකල්පය පුළුල් කර මහජන අර්ථ සිද්ධි නඩුකර පිළිගන්නා අතර ඒ සඳහා ඉඩ සලසා දීම ද එමෙන්ම සිවිල් සමාජ සහ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ සංවිධාන වෙත වඩාත් ඵලදායී ලෙස කාන්තා අයිතිවාසිකම් වර්ධනය කර ආරක්ෂා කිරීමට ඉඩ සලසා දෙයි. පවතින නීතිරාමු පුළුල් කරන තවත් වගන්තියක් නම් 10(2) වගන්තිය වන අතර එමගින් කොමිෂන් සභාවට රජයේ සහ රජයේ නොවන ආයතනවල ක්‍රියාවන් විමර්ශනයට ඉඩ ලබා දෙයි. වර්තමානයේ පවතින නීතිරීති අනුව කොමිෂන් සභාවලට විධායක හෝ පරිපාලනමය ක්‍රියා මගින් මානව හිමිකම් උල්ලංඝණයවීම් හෝ අත්‍යාසන්නවීම් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට සීමා කර ඇති අතර රජයේ නොවන ආයතන විෂයෙහි එම පරීක්ෂණ බලතල ඉවත් කර ඇත. 10(2) වගන්තිය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් විෂයෙහි අභිවෘද්ධිය සඳහා තැබූ ඉදිරි පියවරක් වන අතර එහි විෂයපථය මානව හිමිකම් වර්ධනය සහ සුරැකීමටත්, කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වයන් වැළැක්වීමේ සිට කාන්තාවට සම ආර්ථික අයිතීන් ලබාදීම දක්වා පරාසයක විහිදී යයි. කොමිසම කිසියම් කාන්තා අයිතිවාසිකම් උල්ලංඝණයක් පිළිබඳව තහවුරු කරගැනීමක් සිදුකළ විට එය

[39] 10(අ)(1) සහ (2) වගන්තිය.

[40] 10(2)(අ) වගන්තිය.

[41] 10(2)(ආ) වගන්තිය.

[42] 10(2)(ඇ) වගන්තිය.

[43] 10(2)(ඇ) වගන්තිය.

[44] 10(2)(ඉ) වගන්තිය.

සමථකරණයක් සඳහා යොමු කිරීම[45] හෝ තවදුරටත් එකී උල්ලංඝණය සිදුවීම වැළැක්වීම සඳහා අදාළ පුද්ගලයාට හෝ ආයතනයට නිර්දේශ ඉදිරිපත් කිරීම,[46] හෝ එකී උල්ලංඝණය කිරීම සිදු කරන්නාට එරෙහිව නීතිමය පියවර ගැනීමට නිර්දේශ කළ හැක.[47] කාන්තා අයිතිවාසිකම් උල්ලංඝණය වන ආකාරයේ තීරණයක් හෝ ක්‍රියා පිළිවෙතක් පැවතීම පිළිබඳ කාරණයකදී[48] කොමිෂන් සභාවට එම තීරණය යළි සලකා බැලීමට සහ එම ක්‍රියා පිළිවෙත වෙනස් කිරීමට නිර්දේශ කිරීම[49] හෝ එම කාන්තා අයිතීන් උල්ලංඝණය වන තීරණය ගැනීමට ක්‍රියා පිළිවෙත පවත්වාගෙන යෑමට හේතු දක්වන ලෙස නිර්දේශ කළ හැක.[50]

12(7) වගන්තිය අනුව කොමිසම කිසියම් නිර්දේශයක් යම්කිසි පුද්ගලයෙකුට හෝ ආයතනයකට ඉදිරිපත් කර ඇති විටක, එකී නිර්දේශයන් ක්‍රියාවේ යෙදවීම සඳහා එකී පුද්ගලයා හෝ ආයතනය ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ සඳහන් කරමින් කොමිසම වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවේ. නිර්දේශ ක්‍රියාත්මක නොකළ අවස්ථාවක සිදුවන දේ පිළිබඳව පනත් කෙටුම්පතේ පැහැදිලි වී නැත. 12(8) වගන්තිය අනුව කොමිෂන් සභාව යම්කිසි ආයතනයක ප්‍රධානියෙකු වෙත ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තා කරන ලෙස දක්වා ඇති විටක, එය එකී නිර්දේශ ක්‍රියාවේ යොදවනු ඇතැයි බලාපොරොත්තු වන අතර, එකී ප්‍රධානියා එම නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමකදී කොමිසම ඒ බව නීතිපතිවරයාට ලිඛිතව දන්වා මහාධිකරණයෙන් නියෝගයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ හැක.[51] මහාධිකරණයට එම අවස්ථාවේදී කොමිසමේ වාර්තාවේ සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කරන මෙන් නියෝග කළ හැක.[52] කිසියම් ආයතනයක ප්‍රධානියෙකු නිර්දේශ ක්‍රියාත්මක නොකරන අවස්ථාවක ඒ පිළිබඳව මහාධිකරණයෙන් ඉල්ලීමක් කිරීමට කොමිෂන් සභාවට බලය දී ඇත්තේ ඇයි දැයි පැහැදිලි නැත. ඒ අනුව මෙම

45 12(2) වගන්තිය.

46 12(3)(iii)(අ) වගන්තිය.

47 12(3)(iii)(ආ) වගන්තිය.

48 12(4)(අ) සහ (ආ) වගන්තිය.

49 12(4)(ඇ) වගන්තිය.

50 12(4)(ඇ) වගන්තිය.

51 12(8)(1) වගන්තිය.

52 12(8)(2) වගන්තිය.

පනත් කෙටුම්පත කිසියම් පුද්ගලයෙක් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකරන අවස්ථාවකදී පවතින පිළියම් කවරේද යන්න අර්ථනිරූපණය කර නැත.

7.4 කොමිෂන් සභාවේ මූල්‍යය කටයුතු

පෙබරවාරි පනත් කෙටුම්පතේ 41(2)(අ) වගන්තිය අනුව කොමිසමේ මූල්‍ය ස්වාධීනත්වය ප්‍රශ්නකාරී වූ අතර එම වගන්තිය අනුව කොමිෂන් සභාවට මුදල් ප්‍රතිපාදන වෙන්කර දීම පිළිබඳව පාර්ලිමේන්තුවට අභිමතයක් ලබාදී තිබුණි. මූල්‍යමය අපහසුතාවයන්ට මුහුණපාන්නට ලැබුවහොත් කොමිෂන් සභාවේ කාර්යභාරයන් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස සිදුකිරීමට ඇතිවන බාධාවන් තේරුම් ගැනීම තුළින් එකී වගන්තිය තුළින් පාර්ලිමේන්තුවට ලබාදී ඇති අභිමතානුසාරී බලය ඉවත් කරමින්[53] පාර්ලිමේන්තුව කොමිෂන් සභාවට මුදල් ප්‍රතිපාදන වෙන්කර දිය යුතුයැයි නොවැම්බර් කෙටුම්පතේ සංශෝධිත වගන්තියෙන් කියැවිණි. මෙය 'පැරිස් මූලධර්ම' වලට එකඟ වන අතර එයින් කියවෙන්නේ "ජාතික ආයතනයට එහි කර්තව්‍යයන් ක්‍රමානුකූලව කරගෙන යා හැකි යටිතල පහසුකම් පැවතිය යුතු අතර එයට විශේෂයෙන්ම ප්‍රමාණවත් මූල්‍යාධාර අයත් විය යුතුය".[54]

7.5 අර්ථනිරූපණය

කාන්තා අයිතිවාසිකම් යන්න පනත් කෙටුම්පතේ ප්‍රමාණවත් තරම් පුළුල්ව අර්ථනිරූපණය කර ඇති අතර එය අන්තර්ජාතික හා දේශීය වශයෙන් පවතින නෛතික තත්ත්වයන්ට ගැලපෙන පරිදි සිදුකර ඇත. එයට අයත් වන්නේ:

i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කාන්තාවන් වෙත ලබාදී ඇති සමානාත්මතාවයේ අයිතිය, වෙනස්කොට නොසැලකීම හා වෙනත් මූලික අයිතිවාසිකම්.

ii. 1993 කාන්තා ප්‍රඥප්තියේ අඩංගු අයිතිවාසිකම්.

---

53 19(2)(අ) වගන්තිය.

54 *මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම සඳහා වූ ජාතික ආයතනවල තත්ත්වය සහ ක්‍රියාකාරීත්වය පිළිබඳව වූ පැරිස් මූලධර්ම අන්තර්ජාලය* www.unhchr.ch/html/menu6/2/fs19.htm#annex.

iii. කාන්තාවට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් වලින් නිදහස්වීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය සහ ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති එවැනි වෙනත් අන්තර්ජාතික ප්‍රඥප්ති මගින් නිරූපිත කාන්තා අයිතිවාසිකම්.

8. සමාප්තිය

නීති ප්‍රතිසංස්කරණ හරහා කාන්තා අයිතිවාසිකම් ආරක්ෂාවට හා වර්ධනය කිරීම උදෙසා රජය මෑතකාලීනව ගන්නා ලද පියවර පැසසිය යුතු අතරම ඒ තුළින් නීති ප්‍රතිසංස්කරණ හරහා ලැබිය යුතු ප්‍රතිලාභ ලබා ගන්නා අයට ඒවා හිමි කිරීමේදී මතුවන ප්‍රායෝගික තත්ත්වයන් පිළිබඳව ද හෙළිදරව් කෙරුණු බව පෙනේ.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ නෛතික රාමුව පසුගිය කාලවලදී කොතරම් පුළුල් ප්‍රතිසංස්කරණ වලට මුහුණ පෑවද කාන්තාවගේ තත්ත්වය වර්ධනය වී නැත. සාමාන්‍ය සමානාත්මතාවය ලබාගෙන ඇති නමුදු හරයාත්මක සමානාත්මතාවයෙන් අප තව කොතරම් දුරක් ඈත්ව සිටින්නෙමුද? කාන්තාවගේ තත්ත්වය වර්ධනය කිරීම සම්පූර්ණයෙන්ම නීති ප්‍රතිසංස්කරණ මත පමණක් බල නොපැවැත්වෙන අතර නීතිය ක්‍රියාවේ යෙදවීමේදී අනෙකුත් සමාජ-ආර්ථික කාරණා ද බලපැවැත්වේ. ඒ අනුව නීතිය සකස් විය යුත්තේ වින්දිතයන්ට සහන සැලසෙන ආකාරයට සහ සමාජ-ආර්ථික සංසිද්ධීන් පරිණාමනය වීමට රුකුල් දෙන අයුරින්ය. එලෙස බලන කල කාන්තා අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත කාන්තා අයිතීන් සුරක්ෂිත කර වර්ධනය කිරීමට දැරූ සූජාත උත්සාහයක් පිළිබඳ නිදර්ශනයකි. අනෙක් අතින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ පනත් කෙටුම්පත, නීතියේ ප්‍රතිඵල හෝ කාන්තාව මුහුණ දෙන සමාජ-ආර්ථික යථාර්ථයන් පිළිබඳ සැලකිල්ලක් නොදක්වමින් හුදු ජාත්‍යන්තර වගකීම් සපුරාලීම උදෙසාම කෙටුම්පත් කළ නීතියක් බව පෙනී යයි. ශ්‍රී ලංකා රජය ඒ අනුව සාමාන්‍ය සමානාත්මතාවය මත නොව හරයාත්මක සමානාත්මතාවය පිළිබඳ සැලකිලිමත් වී; නීතිය හමුවේ සමානව සැලකීම සඳහන් කිරීමෙන් පමණක් නොව; එකී නීතියට සැබෑ ක්‍රියාකාරීත්වයක් ලබාදීමෙන් කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වය නැවැත්වීමේ ක්‍රමවේදයන් ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතුය. එම නැඹුරුවේදී ඓතිහාසික, සමාජ-ආර්ථික සහ සංස්කෘතික යථාර්ථයන් ද සැලකිල්ලට ගතයුතු අතර ක්‍රමික සහ ආයතනගත අසමානත්වය දුරුලීමට පියවර ගත යුතුය.

I. උපලේඛනය

2004 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකාව විසින් අපරානුමත කොට ඇති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සම්මුතීන් හා ත්‍රස්තවාදය පිළිබඳව වූ ජාත්‍යන්තර සම්මුතීන්*

- *දරුණු තුවාල සහ ව්‍යාකූල ප්‍රතිඵල ඇති කරන්නා වූ ආයුධ පිළිබඳව තහනම් කිරීම සීමා කිරීම පිළිබඳව වන අතිරේක මූල පත්‍රය (විකිරණ උපකරණ බැඳ තැබීමේ IV වන මූල පත්‍රය)*
  2004 සැප්තැම්බර් මස 24 වන දින අත්සන් තබන ලදී.

- *දූෂණයට එරෙහි සම්මුතිය*
  2004 මැයි මස 11 වන දින අත්සන් තබන ලදී.

- *වධහිංසාව සහ අනෙකුත් අමානුෂික හා පහත් අන්දමේ සැලකීම් වලට හා දඬුවම් කිරීමට එරෙහිව ජාත්‍යන්තර සම්මුතිය*
  1994 ජනවාරි මස 3 වන දින අත්සන් තබන ලදී.

- *මනුෂ්‍ය වෙළඳාම සහ අන් අය වෛශ්‍ය වෘත්තියෙහි යෙදවීම මැඩපැවැත්වීමේ සම්මුතිය*
  1958 අප්‍රේල් මස 15 වන දින අත්සන් තබන ලදී.

- *කාන්තාවන්ට එරෙහිව සියලුම ආකාරයේ ප්‍රභේදයන් මුලිනුපුටා දැමීමේ සම්මුතිය*
  1981 ඔක්තෝබර් මස 5 දින අත්සන් තබන ලදී.

---

* සම්මුතියකින් බැඳී සිටීමට රාජ්‍ය පාර්ශවයක කැමැත්ත ප්‍රකාශ කරනුයේ රාජ්‍යයේ නියෝජිතයාගේ අත්සන මගිනි. කෙසේ නමුත් බොහෝ අවස්ථා වලදී, සම්මුතියෙහි වගන්තියක් මගින් හෝ සම්මුතියෙහි අන්තර්ගතය පිළිබඳව සාකච්ඡා කරනු ලබන අවස්ථාවේදී සම්මුතියෙන් බැඳී සිටීම සඳහා වන කැමැත්ත නියෝජිතයාගේ අත්සන තුළ පමණක් ප්‍රකාශ නොවන බවටත් සම්මුතියෙන් බැඳී සිටීම සඳහා රාජ්‍ය විසින් සම්මුතිය අපරානුමත කළ යුතු යයි පාර්ශවයන් එකඟතාවයට එළඹේ. මෙම පිළිවෙත අනුගමනය කරන සම්මුතීන් සම්බන්ධයෙන් නියෝජිතයාගේ අත්සන ප්‍රකාශ කරනුයේ සම්මුතියේ අන්තර්ගත අනුමත කිරීම පමණි. අපරානුමත කිරීමේ අරමුණ වනුයේ අදාළ රාජ්‍යයට සම්මුතියෙන් බැඳී සිටිනවා ද නැද්ද යන්න පිළිබඳව සලකා බැලීමට තවත් අවස්ථාවක් ලබා දීමයි. මූලික සාකච්ඡා වලට සහභාගී නොවූ රාජ්‍යයන්ට ද සම්මුතිය අපරානුමත කිරීම මගින් සම්මුතියට බැඳී සිටීමට එකඟතාව පළ කළ හැකිය. යම් රාජ්‍යයක් සම්මුතියකට පාර්ශවයක් වූ ආකාරය කුමක් වුවත් සම්මුතිය යටතේ ඇති සියලු අයිතීන් රාජ්‍යයට හිමිවනවා මෙන්ම සම්මුතිය යටතේ ඇති සියලු වගකීම් වලින් රාජ්‍ය පාර්ශවයන් බැඳී සිටී.

- තානාපති නියෝජිතයන් ඇතුළු අන්තර්ජාතික වශයෙන් ආරක්ෂිත පුද්ගලයින්ට එරෙහිව සිදු කරන අපරාධයන්ට එරෙහි වූ සම්මුතිය
  1991 පෙබරවාරි මස 27 දින අත්සන් තබන ලදී.

- මහා ජන සංහාරය වන අපරාධයට එරෙහිව දඬුවම් කිරීමක් හා වැළැක්වීම පිළිබඳ සම්මුතිය
  1950 ඔක්තෝබර් මස 12 වන දින අත්සන් තබන ලදී.

- දරුණු ආකාරයේ තුවාල හෝ ව්‍යාකූල ප්‍රතිඵල ඇති කරන්නා වූ සම්මුතිමය ආයුධ භාවිතය තහනම් කිරීම හා සීමා කිරීම පිළිබඳ සම්මුතිය *(I, II හා III මූලපත්‍ර සහිත)*
  1991 ජූලි මස 12 වන දින අපරානුමත කරන ලදී.

- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය
  1991 ජූලි මස 12 දින අත්සන් තබන ලදී.

- ආරක්ෂිත නැව් ගමනාගමනය හා සම්බන්ධ නීති විරෝධී ක්‍රියාවන්ට එරෙහි සම්මුතිය
  2000 සැප්තැම්බර් මස 6 වන දින අත්සන් තබන ලදී.

- ප්‍රාණ ඇපකාරත්වයට ගැනීමට එරෙහිව ජාත්‍යන්තර සම්මුතිය
  2000 සැප්තැම්බර් මස 6 වන දින අත්සන් තබන ලදී.

- ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මූල්‍ය සැපයීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය
  2000 සැප්තැම්බර් මස 6 වන දින අත්සන තබන ලදී.

- ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර පිටු දැකීමේ ජාත්‍යන්තර සම්මුතිය
  1999 මාර්තු මස 23 වන දින අත්සන් තබන ලදී.

- වර්ණභේද වාදය පිටු දැකීමට සහ දඬුවම් පැමිණවීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
  1982 පෙබරවාරි මස 18 දින අත්සන් තබන ලදී.

- විදේශ සේවා නියුක්තිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය
  1996 මාර්තු මස 11 වන දින අත්සන් තබන ලදී.

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
  1980 ජූනි මස 11 වන දින අත්සන් තබන ලදී.

- ආර්ථික, සමාජික හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
  1980 ජූනි මස 11 වන දින අත්සන් තබන ලදී.

- වර්ණභේදය අපරාධ සඳහා දඬුවම් පැමිණවීමේ සහ එම අපරාධ මර්දනය කිරීම පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තිය
1982 පෙබරවාරි මස 18 දින අත්සන් තබන ලදී.

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය සඳහා වන 1 වන වෛකල්පිත මූලපත්‍රය
1997 ඔක්තෝබර් මස 3 වන දින අත්සන් තබන ලදී.

- කාන්තාවන්ට එරෙහිව සියලුම ආකාරයේ ප්‍රභේදයන් මුලිනුපුටා දැමීමේ සම්මුතිය සඳහා වන 1 වන වෛකල්පිත මූලපත්‍රය
2003 ජනවාරි මස 15 වන දින අත්සන් තබන ලදී.

- සන්නද්ධ අරගලයන්ට මැදි වූ ළමයින් පිළිබඳ ළමා අයිතිවාසිකම් සම්මුතියේ 1 වන වෛකල්පිත සන්ධානය
2000 සැප්තැම්බර් මස 6 වන දින අත්සන් තබන ලදී.

- ළමා වෙළෙඳාම, ළමයින් ගණිකා වෘත්තියේ යෙදවීම හා ළමයින් අසභ්‍ය ප්‍රකාශන සඳහා යොදා ගැනීමට එරෙහිව ළමා අයිතිවාසිකම් සම්මුතියේ වෛකල්පිත මූලපත්‍රය
2002 මැයි මස 9 වන දින අත්සන් තබන ලදී.

- විශේෂයෙන් කාන්තාවන් හා ළමුන් ඇතුළු පුද්ගලයින් පැහැර ගැනීම, පිටු දැකීම, මැඩලීම හා දඬුවම් කිරීම සඳහා වූ මූලපත්‍රය ජාත්‍යන්තරව සංවිධානය වූ අපරාධ වලට එරෙහිව එක්සත් ජාතීන්ගේ සම්මුතියේ අතිරේකය.
2000 දෙසැම්බර් මස 15 වන දින අත්සන් තබන ලදී.

- සම්මුතිමය ආයුධ භාවිතය සීමා කිරීමේ හා තහනම් සම්මුතියට සම්බන්ධ පාතාල, මරුඋගුල් හා වෙනත් උපාංග භාවිතය තහනම් කිරීම හා සීමා කිරීම පිළිබඳ මූලපත්‍රය
2004 සැප්තැම්බර් මස 24 වන දින අපරානුමත කරන ලදී.

- අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධයන්ට එරෙහිව එක්සත් ජාතීන්ගේ සම්මුතිය
2000 දෙසැම්බර් මස 15 වන දින අත්සන් තබන ලදී.

- ගොඩබිමින්, මුහුදෙන් සහ ගුවනින් සංක්‍රමණිකයින් ජාවාරම් කිරීමට එරෙහි මූලධර්මය ජාත්‍යන්තරව සංවිධානය වූ අපරාධ වලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි අතිරේකය
2000 දෙසැම්බර් මස 15 වන දින අත්සන් තබන ලදී.

ශ්‍රී ලංකාව විසින් අපරානුමත කොට ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන්

සම්මුති අංකය	සම්මුතියේ නම	අපරානුමත කළ දිනය	වර්තමාන තත්ත්වය
C4	*රාත්‍රී වැඩමුර (කාන්තා) සම්මුතිය 1919*	1951.10.08	අහෝසි කොට ඇත
C5	*අවම වයස (කර්මාන්ත) පිළිබඳ සම්මුතිය 1919*	1950.09.27	අහෝසි කොට ඇත
C6	*තරුණ පුද්ගලයින් රාත්‍රී වැඩෙහි යෙදීම (කර්මාන්ත) පිළිබඳ සම්මුතිය 1919*	1950.10.26	අහෝසි කොට ඇත
C7	*අවම වයස් සීමා (සාගර) සම්මුතිය 1920*	1950.09.02	අහෝසි කොට ඇත
C8	*සේවා වියුක්ති වන්දි (මුහුදු බත්වීම) සම්මුතිය 1920*	1951.04.25	
C10	*අවම වයස් සීමා (කෘෂි පිළිබඳ කර්මාන්තය) සම්මුතිය 1921*	1991.11.29	අහෝසි කොට ඇත
C11	*සමාගමයේ නිදහස (කෘෂි පිළිබඳ කර්මාන්තය) සම්මුතිය 1921*	1952.08.25	
C15	*අවම වයස් සීමා (අතරමැදියෝ සහ ව්‍යාපාර වස්තු කරුවෝ) පිළිබඳ සම්මුතිය 1921*	1951.04.25	අහෝසි කොට ඇත
C16	*තරුණ පුද්ගලයින් සඳහා වෛද්‍ය පරීක්ෂණ (සාගර) පිළිබඳ සම්මුතිය 1921*	1950.04.25	

සම්මුති අංකය	සම්මුතියේ නම	අපරානුමත කළ දිනය	වර්තමාන තත්ත්වය
C18	කම්කරු වන්දි (වෘත්තිමය රෝගාබාධ) පිළිබඳ සම්මුතිය *1925*	1952.05.17	
C26	අවම වේතන නියම කිරීම පිළිබඳ (උපක්‍රමික) සම්මුතිය *1928*	1961.06.09	
C29	බලහත්කාර ශ්‍රමය පිළිබඳ සම්මුතිය *1930*	1950.04.05	
C41	රාත්‍රී වැඩ මුර (කාන්තා) සම්මුතිය (සංශෝධිත) *1934*	1950.09.02	අහෝසි කොට ඇත
C45	පතල් වැඩ (කාන්තා) සම්මුතිය *1935*	1950.12.20	
C58	අවම වයස් සීමා (සාගර) සම්මුතිය (සංශෝධිත) *1956*	1959.05.18	
C63	වේතන සහ වැඩමුර සඳහා වන සංඛ්‍යා ලේඛන පිළිබඳ සම්මුතිය *1938*	1952.08.25	අහෝසි කොට ඇත
C80	අවසන් ගිවිසුම් වගන්ති සංශෝධන සම්මුතිය *1946*	1950.09.10	
C81	කම්කරු විමර්ශන සම්මුතිය *1947*	1950.04.03	
C87	සමාගමයේ නිදහස සහ සංවිධානය වීමේ අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය *1948*	1995.11.15	
C89	රාත්‍රී වැඩමුර (කාන්තා) සම්මුතිය (සංශෝධිත) *1948*	1966.03.31	අහෝසි කොට ඇත

සම්මුති අංකය	සම්මුතියේ නම	අපරානුමත කළ දිනය	වර්තමාන තත්ත්වය
C90	*තරුණ පුද්ගලයින් රාත්‍රී වැඩෙහි යෙදීම (කර්මාන්ත) පිළිබඳ සම්මුතිය (සංශෝධිත) 1948*	1959.05.18	
C95	*වේතන සුරක්ෂිත කිරීම පිළිබඳ සම්මුතිය 1949*	1983.10.27	
C96	*පූර්ව ගෙවීමේ සේවායෝජන ආයතන පිළිබඳ සම්මුතිය (සංශෝධිත) 1949*	1958.04.30	
C98	*සංවිධානය වීම සහ සාමූහික කේවල් කිරීම පිළිබඳ සම්මුතිය 1949*	1972.12.13	
C99	*අවම වේතන නියම කිරීමේ උපක්‍රමික (කෘෂි කර්මාන්තයේ) සම්මුතිය 1951*	1954.04.05	
C100	*සමාන වැටුප් සම්මුතිය*	1993.04.01	
C103	*මාතෘ රැකවරණය පිළිබඳ සම්මුතිය (සංශෝධිත) 1957*	1993.04.01	
C105	*කම්කරු ශ්‍රමය සූරාකෑම තහනම් කිරීමේ සම්මුතිය 1957*	2003.01.07	
C106	*සති විවේක (වානිජ හා කාර්යාල) සම්මුතිය 1957*	1983.10.27	
C108	*මුහුදු ගාමීන්ගේ අනන්‍යතා ලේඛන පිළිබඳ සම්මුතිය 1958*	1995.11.24	

සම්මුති අංකය	සම්මුතියේ නම	අපරානුමත කළ දිනය	වර්තමාන තත්ත්වය
C110	වතු කම්කරුවන්ගේ සේවා කොන්දේසි පිළිබඳ සම්මුතිය *1958*	1995.04.24	
C111	වෙනස් කොට සැලකීම (සේවා හා වෘත්තීන්) පිළිබඳ සම්මුතිය *1958*	1998.11.27	
C115	විකිරණ ආරක්ෂාව පිළිබඳ සම්මුතිය *1960*	1986.06.18	
C116	අවසන් වගන්ති සංශෝධනය පිළිබඳ සම්මුතිය *1961*	1974.04.26	
C131	අවම වේතන නියම කිරීම පිළිබඳ සම්මුතිය *1970*	1975.03.17	
C135	කම්කරු නියෝජිතයන් පිළිබඳ සම්මුතිය *1971*	1976.11.16	
C138	සේවයට ඇතුළත් කිරීමේ අවම වයස් සීමා පිළිබඳ සම්මුතිය *1973*	2000.02.11	
C144	ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ත්‍රෛපාක්ෂික සාකච්ඡා පිළිබඳ සම්මුතිය *1976*	1994.03.17	
C160	කම්කරු සංඛ්‍යාලේඛන පිළිබඳ සම්මුතිය *1985*	1993.04.11	
C182	ළමා කම්කරු සේවයේ අයහපත් පැතිකඩ පිළිබඳ සම්මුතිය *1999*	2001.03.01	

ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර තිබෙන මානුෂවාදී නීති සම්මුති

- *යුධ හමුදාවන්ට යුද්ධයේදී සිදු වූ තුවාල සහ අසනීප තත්ත්වයන් දියුණු කිරීම සඳහා ජිනීවා සම්මුතිය, 1949*
  1959 පෙබරවාරි 28 අපරානුමත කරන ලදී.

- *මුහුදුගතව සිටින යුධ හමුදාවන්ට සිදුවන තුවාල, අසනීප සහ නැව් බිඳී යාමේ තත්ත්වයන් දියුණු කිරීම සඳහා ජිනීවා සම්මුතිය*
  1959 පෙබරවාරි 28 අපරානුමත කරන ලදී.

- *යුධ බන්ධනාගාරයන්ට සැලකීම පිළිබඳ ජිනීවා සම්මුතිය*
  1959 පෙබරවාරි 28 අපරානුමත කරන ලදී.

- *යුධ කාලයේ සිවිල් වැසියන් ආරක්ෂා කිරීම සඳහා ජිනීවා සම්මුතිය*
  1959 පෙබරවාරි 28 අපරානුමත කරන ලදී.

II. උපලේඛනය

ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර නොමැති ඇතැම් මානව හිමිකම් ලේඛන

- *සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ II වන වෛකල්පිත මූලපත්‍රය*
- *යුධ අපරාධකරුවන්ට හා මානව වර්ගයාට එරෙහි අපරාධයක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත සීමාවන් නොපැනවීමේ සම්මුතිය, 1968*
- *කාන්තාවන්ගේ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය*
- *සමාජ ආරක්ෂාව පිළිබඳ අවම ප්‍රමිතීන් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක. 102)*
- *විදේශ සේවා නියුක්තිකයන් අපයෝජනයට ලක්වීමේ තත්ත්වයන් හා විදේශ සේවා නියුක්තිකයන්ට සමාන අවස්ථා ලබාදීම පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක. 143)*
- *රැකී රක්ෂා ප්‍රතිපත්ති පිළිබඳ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය (අංක. 122)*
- *රාශිභූත කෝවල්ක්‍රම අනුග්‍රහ කිරීම් පිළිබඳව ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය (අංක. 154)*
- *ගම්බද කම්කරුවන්ගේ සංවිධාන පිළිබඳ සහ ආර්ථික හා සමාජ දියුණුව සම්බන්ධයෙන් ඔවුන්ගේ ක්‍රියාකලාපය පිළිබඳ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය (අංක. 141)*
- *රාජ්‍ය සේවයේ කොන්දේසි තීරණය කිරීමේ කාර්ය පටිපාටිය හා සංවිධානය වීමේ අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක. 151)*
- *රැකියා උසස්වීම් හා රැකියා හිඟයෙන් ආරක්ෂා වීම පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක. 168)*

- සරණාගතයින්ගේ තත්ත්වය පිළිබඳ සම්මුතිය, 1954
- 1967 සරණාගතයින්ගේ තත්ත්වය පිළිබඳ මූලපත්‍ර සම්මුතිය
- 1949 අගෝස්තු 12 අන්තර්ජාතික යුධ ගැටුම් මගින් පීඩාවට පත්වන්නන් පිළිබඳ ජිනීවා සම්මුතියෙහි අතිරේක මූලපත්‍රය (I වන මූලපත්‍රය)
- 1949 අගෝස්තු 12 අන්තර්ජාතික යුධ ගැටුම් මගින් පීඩාවට පත්වන්නන්ගේ ආරක්ෂාව පිළිබඳ ජිනීවා සම්මුතියෙහි අතිරේක මූලපත්‍රය (II වන මූල පත්‍රය)

III. උපලේඛනය

2004 වර්ෂයේදී තීන්දු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් නඩු තීන්දු

11 වන ව්‍යවස්ථාව

ජේ. එම්. විජිත අලගියවන්න එ. එල්. පී. ජී. ලලිත් ප්‍රේමා, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 433/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.11.30.

පතිරණගේ එරන්දක සහ තවත් අය එ. ගාමිණී හල්වෙල, පොලිස් පරීක්ෂක, පොලිස් ස්ථානය, හක්මන සහ තවත් අය ශ්‍රේෂ්ඨාධිකරණ (විශේෂ) අංක. 63/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.02.27.

ෂාහුල් හමීඩ් මොහොමඩ් නිලාම් සහ අනිකුත් අය එ. කේ. උඩුගම්පොල සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 68/2002, 73/2002, 74/2002, 75/2002, 76/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.01.29

උදේනි රේණුකා ගුණවර්ධන එ. ආචාර්ය ගුරුගේ එල්. විමලසිරි සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (විශේෂ) අංක. 69/1999 (මූ.අයි.), ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.01.26.

වේවලගේ රාණි ප්‍රනාන්දු මියගිය ළමා හේවගේ ලාල්ගේ බිරිඳ සහ අනිකුත් අය එ. පොලිස් පරීක්ෂක, සුළු අපරාධ, සීදූව පොලිස් ස්ථානය, සීදූව, සහ අනිකුත් අය ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 700/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.07.26.

12 වන ව්‍යවස්ථාව

අබ්දුල් මුතාලිෆ් ෆාරුක් එ. කේ. එම්. ධර්මරත්න, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 508/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.25.

අමුන්පුර සීලවංස හිමි එ. ටී.එම්.එම්. තෙන්නකෝන්, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 575/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.11.23.

අනුෂිකා මාධවී ජයතිලක එ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 280/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.25.

බී.ජ්. තිලකරත්න එ. එම්. එඩ්වින් අල්විස් සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (විශේෂ) අංක. 122/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.02.16.

ඩී. සූරසිංහ එ. ආර්.සී.ජ්. වැන්ඩගට් සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 213/03, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.19.

ආචාර්ය එල්. නුගලියද්ද එ. පී. පෙරියසාමි, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 730/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.19.

වෛද්‍ය එම්.එන්. ශ්‍රීස්කන්දරාජා එ. සී. අබේගුණවර්ධන, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 490/2000, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.25.

එච්.ආර්. ද සිල්වා එ. කොළඹ මහ නගර සභාව, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 209/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.21.

ජේ.ඒ.ඩී.එස්.කේ.එස්. ජයසිංහ එ. ජාතික ධීවර කර්මාන්තය සහ නැව් යන්ත්‍රාණුකරණ ශිල්පය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) 639/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.03.29.

කිත්සිරි බණ්ඩාර සමරකෝන් එ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 307/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.25.

ලුතිනන් කර්නල් ගන්ගාබොඩ ආරච්චිගේ අනුර ගාමිණී කුමාර එ. කර්නල් ඒ.එස්.එම්. විජේවර්ධන, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 191/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.26.

එම්.එන්.ඩී. පෙරේරා එ. කුසුම්සිරි බාලපටබැඳි සහ අනිකුත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) අංක. 27/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.19.

මධුභාෂිණී එස්. ලියනගම එ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 306/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.25.

පූජ්‍ය මාවනනේ සෝමින්ද හිමි එ. වී.කේ. නානායක්කාර, ලේකම්, මානව සම්පත් සහ සංස්කෘතික කාර්යයන් පිළිබඳ අමාත්‍ය මණ්ඩලය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) 146/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.07.15.

මහාචාර්ය ජේ.ඩබ්ලිව්. වික්‍රමසිංහ එ. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 587/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.01.29.

ෂාහුල් හමීඩ් මොහොමඩ් නිලාම් සහ අනිකුත් අය එ. කේ. උඩුගම්පොල සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 68/2002, 73/2002, 74/2002, 75/2002, 76/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.01.29.

උදේනි රේණුකා ගුණවර්ධන එ. ආචාර්ය ගුරුගේ එල්. විමලසිරි සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (විශේෂ) අංක. 69/1999 (මූ.අයි.), ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.01.26.

උස්හෙට්ටිගේ නිහාල් පෙරේරා එ. බී.එල්.වී. ද එස්. කොඩිතුවක්කු සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ අංක. 93/2002 (මූ.අයි.), ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.01.26.

ඩබ්ලිව් ජී. ජයන්ත ප්‍රේමදාස එ. සබරගමුව සංවර්ධන බැංකුව, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 508/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.19.

13 වන ව්‍යවස්ථාව

ෂාහුල් හමීඩ් මොහොමඩ් නිලාම් සහ අනිකුත් අය එ. කේ. උඩුගම්පොල සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 68/2002, 73/2002, 74/2002, 75/2002, 76/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.01.29.

වේවලගේ රාණි ප්‍රනාන්දු මියගිය ළමා හේවගේ ලාල්ගේ බිරිඳ සහ තවත් අය එ. පොලිස් පරීක්ෂක සුළු අපරාධ, සීදූව පොලිස් ස්ථානය, සීදූව, සහ අනිකුත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 700/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.07.26.

14 වන ව්‍යවස්ථාව

බී.ඒ. තිලකරත්න එ. එම්. එඩ්වින් අල්විස් සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (විශේෂ) අංක. 122/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.02.16.

එච්.ආර්. ද සිල්වා එ. කොළඹ මහ නගර සභාව, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 209/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.21.

එම්.එන්.ඩී. පෙරේරා එ. කුසුම්සිරි බාලපටබැඳි සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) අංක. 27/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.10.19.

මහාචාර්ය ජේ.ඩබ්ලිව්. වික්‍රමසිංහ එ. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 587/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.01.29.

උස්හෙට්ටිගේ නිහාල් පෙරේරා එ. බී.එල්.වී. ද එස්. කොඩිතුවක්කු සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ අංක. 93/2002 (මූ.අයි.), ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2004.01.26.

ශ්‍රී ලංකාව: මානව හිමිකම් තත්ත්වය 2005

මෙම වාර්තාව 2004 වර්ෂය තුළ ශ්‍රී ලංකාවෙහි සිදු වූ සිදුවීම් අළලා මෙරට මානව හිමිකම් තත්ත්වය පිළිබඳ ඉංග්‍රීසි භාෂාවෙන් පළ වූ වාර්තාවේ වැදගත් පරිච්ඡේදයන් 04 ක සහ සමස්ත සමාලෝචනයෙහි (සංස්කරණය කරන ලද) සිංහල පරිවර්තනයකි.

මෙම වාර්තාව මානව හිමිකම් ප්‍රවර්ධනයෙහි ලා අධිකරණමය කාර්ය භාරය, ආගමික නිදහස, ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත් කෙටුම්පත සහ භාෂා අයිතිවාසිකම් පනත් කෙටුම්පත පිළිබඳ විශ්ලේෂණය පිළිබඳ වාර්තා අඩංගු වේ. එම නිසා මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරිසරයෙහි වැදගත් පැති කඩක් නියෝජනය කරයි.

නීතිය හා සමාජ භාරය
3. කිංසි ටෙරසය
කොළඹ 08
ශ්‍රී ලංකාව
දුරකථන: 2691228/2684845
ෆැක්ස්: 2686843
ඊමේල්: lst@eureka.lk
වෙබ් අඩවිය: http://www.lawandsocictytrust.org

ISBN 955-1302-05-2

මුද්‍රණය සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ